මීගමුව සංවර්ධන සැලැස්ම
2021 - 2030

නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

මීගමුව සංවර්ධන සැලැස්ම - 2021 – 2030

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

නාගරික සංවර්ධන අධිකාරිය

මීගමුව සංවර්ධන සැලැස්ම - 2021-2030

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2021

සියළුම හිමිකම් ඇවිරිණි.මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා නැවතගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශය

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව

6 වන 7 වන හා 9 වන මහල, සෙත්සිරිපාය අදියර I,බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය: www.uda.gov.lk

විද්‍යුත් තැපෑල: info@uda.gov.lk

දුරකථන අංක: No+ 94112 873 637

ප්‍රකාශනය:2021

මීගමුව සංවර්ධන සැලැස්ම 2021 -2030, I වන කොටස, II වන කොටස සහ III වන කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමුවන කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, පසුබිම් අධ්‍යයනය , සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, ශ.දු.අ.ත විශ්ලේෂණය සහ සංවර්ධන සැලැස්මය. දෙවන කොටස 2021 -2030 කාල පරිච්ඡේදය සඳහා සැලසුම් සීමාවට අදාල සැලසුම් හා ගොඩනැගිලි නියමතා සහ කලාපීකරණ නියමතා වලින් සමන්විත වේ. III කොටස කලාප සීමා මායිම් ඛණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ. මීගමුව සංවර්ධන සැලැස්ම 2021-2030 සකස් කර ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය (බස්නාහිර පළාත) මගිනි.

අධීක්ෂණය

වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා සභාපති - නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී එච්.ඒ.දයානන්ද අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අ, නගර නිර්මාණ ශිල්පී එම්.පී. රණතුංග- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - නා.සං.අ., නීතිඥ සී.ජයවර්ධන උපදේශක (නීති) - නා.සං.අ. , නගර නිර්මාණ ශිල්පී එන්.ඒ.එස්.එන්. නිශ්සංක අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය) , නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න අධ්‍යක්ෂ (උපායමාර්ගික සැලසුම් අංශය) - නා.සං.අ.

සැලසුම් කණ්ඩායම

නගර නිර්මාණ ශිල්පී ඩබ් .ඒ .ආර් .රංජනී - නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), නගර නිර්මාණ ශිල්පී ජේ. සෝමසිරි - හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), නගර නිර්මාණ ශිල්පී එම්.එල්.එම්.යෙහියා - හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), නගර නිර්මාණ ශිල්පී එල්.එම්. සමන්ත කුමාර මහතා හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), නගර නිර්මාණ ශිල්පී එම් .ඒ .ඩී .ඒ. මුනුගල - හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), නගර නිර්මාණ ශිල්පී දයානි ෆ්‍රැන්සිස් - හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), නගර නිර්මාණ ශිල්පී පබසරා සත්කුමාර - සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) , නගර නිර්මාණ ශිල්පී නිශාන්ත කුරුනේරු - සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), නගර නිර්මාණ ශිල්පී ජේ.පී.යූ. විමලරත්න - හිටපු සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), එස්.එම්.ටී. ඇලෝසියස් - හිටපු සැලසුම් නිලධාරී, අතුල සමරසිංහ සැලසුම් නිලධාරී , , ඒ.ඒ.සී.ජේ.ආර්.අධිකාරි නගර නිර්මාණ ශිල්පී, එච්. අයි.ජයවර්ධන නගර නිර්මාණ ශිල්පී, පී.එම්. සයුරි එන්. ජයකොඩි - හිටපු නගර නිර්මාණ ශිල්පී , සුමේධා ජයමාලි - හිටපු සහකාර සැලසුම් නිලධාරි : ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය - නාගරික සංවර්ධන අධිකාරිය

ජීවන්ති කෞශලයා - නගර නිර්මාණ ශිල්පී : උපායමාර්ගික සැලසුම් අංශය - නාගරික සංවර්ධන අධිකාරිය., එස්.එම්.ජී.පී.සමරකෝන් : පාරිසරික සැලසුම්කරු , පරිසර හා භූ දර්ශන අංශය - නාගරික සංවර්ධන අධිකාරිය

සහාය කණ්ඩායම් - නාගරික සංවර්ධන අධිකාරිය

උපායමාර්ගික සැලසුම් අංශය - නා.සං.අ (අධීක්ෂණය, නියාමය සහ ගැසට් කිරීම)

පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අ (PORS,DRR, සංරක්ෂණය, සංස්කෘතික හා උරුම සැලසුම් සකස් කිරීම)

භූගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අ. (භූගෝලීය තොරතුරු දත්ත සැපයීම සහ තාක්ෂණික සහාය සැපයීම)

පර්යේෂණ හා සංවර්ධන අංශය - නා.සං.අ.(නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්ම)

ප්‍රණාමය

මීගමුව සංවර්ධන සැලැස්ම 2021-2030සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය - බස්නාහිර පළාත් අංශයේ මූලික අධීක්ෂණය යටතේ සිදු විය. "නීල හරිත තලයෙන් නැගෙන පුංචි රෝමය" නමැති දැක්ම පෙරදැරි කොටගත් මෙම සංවර්ධන සැලසුම් මඟින් අපේක්ෂා කරන්නේ මීගමුව සැලසුම් බල ප්‍රදේශය සතු ස්වාභාවික පරිසර පද්ධතිය, සංචාරක ආකර්ෂණය සහ සංස්කෘතික වටිනාකම් සහිත ස්ථාන ප්‍රධාන විභවතාවයන් ලෙස සලකමින් ධීවර, වාණිජ හා නේවාසික සේවා ඒකාබද්ධ වූ සහසම්බන්ධිත නගරයක් ලෙස සංවර්ධනය කිරීමයි. ඒ අනුව මීගමුව සංවර්ධන සැලැස්ම 2021-2030 අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම "ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සකස් කර ඇත.

මෙහිදී 1982 අංක 04 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධි විධාන යටතේ මීගමුව සංවර්ධන සැලැස්ම 2021-2030 සඳහා අනුමැතිය ලබාදීම සිදු කර ලද නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන විෂයභාර ගරු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ට අධිකාරියේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිමු.

තවද මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය මගපෙන්වීම හා සහාය ලබාදුන් නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා වෙත අපේ ස්තූතිය පුදකොට සිටිමු.

එමෙන්ම මීගමුව සංවර්ධන සැලැස්ම සාර්ථක කර ගැනීම සඳහා සුවිශාල දායකත්වයක් සහ නොමසුරු සහයෝගයක් දැක්වූ මීගමුව මහනගර සභාවේ ගරු නගරාධිපති දයාන් ලන්සා මැතිතුමාටත්, නාගරික කොමසාරිස් එන්.ඩී.ආර්.වී. ප්‍රනාන්දු මහත්මියටත්, නගර නිර්මාණ ශිල්පීන් එස්.කේ. අමරසේකර මහත්මියටත්, සංවර්ධන සැලසුම් සහකාර විජී සිවකුමාර මහත්මියත් ඇතුළු එම කාර්යාලයේ සියලුම නිලධාරීන්ටත් , රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සියලුම පාර්ශවකරුවන්හට මෙහිදී සැලසුම් කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තූතිය ප්‍රකාශ කරමි.

විශේෂයෙන් මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්යය හා මගපෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන්ද සිල්වා මහතාට, අධ්‍යක්ෂ ජනරාල්, නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර මහතාට , අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නගර නිර්මාණ ශිල්පී එච්.ඒ.දයානන්ද මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සැලසුම්), නගර නිර්මාණ ශිල්පී, එම්.පී.රණතුංග මහතාට , නගර නිර්මාණ ශිල්පී එන්.ඒ.එස්.එන්. නිශ්සංක අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය), නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක (නීති) නීතිඥ සී. ජයවර්ධන මහත්මියට හා උපාය මාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ, නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න මහත්මියට අධිකාරියේ ස්තූතිය පුදකර සිටිමු.

අවසාන වශයෙන් පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ වරලත් භූදර්ශන ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ.ඊ. කළුපහන මහත්මියට හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂක, නගර නිර්මාණ ශිල්පී ජේ.පී.එස්.සෝමසේකර මහත්මිය හා එම අංශයේ සියලුම නිලධාරින්ටත් ,බස්නාහිර පළාත් හිටපු අධ්‍යක්ෂ වයි,ඒ .පී .කේ .ගුණතිලක මහතාටත් , බස්නාහිර පළාත් හිටපු අධ්‍යක්ෂ ජනක් රණවීර මහතාටත් , නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් ඇතුළු අනෙකුත් සියලුම අංශයන්හි නිලධාරීන්ටත් මෙම කර්තව්‍ය සාර්ථකව අවසන් කිරීමට දැක්වූ දායකත්වය සඳහා සැලසුම් කණ්ඩායම වෙනුවෙන් ස්තූතිය පුද කරනෙමු.

ගරු අමාත්‍යතුමාගේ පෙරවදන

1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටවනු ලැබූ අතර එමගින් ප්‍රකාශිත නාගරික බල ප්‍රදේශ තුල විධිමත් සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා සක්‍රීය දායකත්වයක් මේ මොහොත වන විට ද සපයනු ලබයි.

රටේ සංවර්ධන ක්‍රියාවලියට ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම සමාන දායකත්වයක් සැපයෙන ආකාරයට භෞතික අවකාශය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස භාවිතයට ගැනීම මුලික කරගනිමින් පුළුල් සංවර්ධන සැලසුම් සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීමට කටයුතු යොදා ඇත.

මීගමුව නගරය විශාල ජන සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි. ඒ අනුව මීගමුව සැලසුම් බල ප්‍රදේශය සංචාරක,ධීවර, වාණිජ හා නේවාසික වශයෙන් තවදුරටත් සේවා සපයන නගරයක් බවට පත් කිරීමට විභවතාවයක් පවතී. ඒ අවට ප්‍රදේශය සතු ස්වාභාවික පරිසර පද්ධතිය හා සංචාරක ආකර්ෂණය සහ සංස්කෘතික වටිනාකම් සහිත ස්ථාන පිහිටා තිබීම මෙම විභවතාවය තවදුරටත් ඉහළ නංවයි. මෙම සංවර්ධන සැලසුම් මඟින් අපේක්ෂා කරන්නේ මීගමුව මහනගර සභා බලප්‍රදේශය එම විභවතාවයන් ප්‍රයෝජනයට ගෙන සහ සහසම්බන්ධිත නගරයක් ලෙස සංවර්ධනය කිරීමයි.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්තයක් බවට පත් කරනු වස් නව ප්‍රතිනාගරීකරණ වැඩසටහන් සහිතව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවන්ගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් සමඟ විශිෂ්ඨ තාක්ෂණික ක්‍රමවේදයක් හා නවෝත්පාදන ප්‍රවේශයක්ද මේ සඳහා ලැබී ඇත.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්යය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය තුලින් මීගමුව සංවර්ධන සැලසුම 2021-2030 සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

මහින්ද රාජපක්ෂ (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

ගරු රාජ්‍ය අමාත්‍ය

නූතන තිරසාර සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීමේ ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය සතුව විශාල වගකීමක් පැවරී ඇත. ඒ අනුව ගරු විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන බල ප්‍රදේශ සඳහා අංක 1982 අංක 04 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8අ(1)) අනුව සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත.

මෙලෙස සකස් කරනු ලබන සංවර්ධන සැලසුම් තුලින් සෞභාග්‍යයේ දැක්මෙහි ඇතුලත් මූලික අපේක්ෂාවන් වන ඵලදායි පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීම මූලික වශයෙන් අපේක්ෂා කරයි. තවද නාගරික ජනතාවගේ ආර්ථික ස්ථායිතාව ඇති කරමින් විධිමත් ප්‍රතිනාගරීකරණ සැලැස්මක් ඔස්සේ නාගරික ප්‍රදේශ සංවර්ධනය හා නියාමනය යන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට මෙම සංවර්ධන සැලසුම් මහත් පිටිවහලක් වනු ඇති බවට විශ්වාස කරමි.

එබැවින් මෙම සැලැස්ම පිලියෙල කිරීමේදී ඉතා වගකීමෙන් තම කාර්යභාරය ඉටු කරන ලද සැලසුම් කණ්ඩායමට හා නන් අයුරින් සහයෝගය දැක් වූ සැමට හෘදයාංගම කෘතඥතාවය පිරිනමන අතර සෞභාග්‍යයේ දැක්මේ අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා ඔබ සැමගේ දායකත්වය ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

ආචාර්ය නාලක ගොඩහේවා(පා.ම)

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,

අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය.

ගරු සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය

දශක හතරක් පුරාවට ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන සැලසුම් සකස් කිරීමටත් එම සැලසුම් බලාත්මක කිරීමටත් බලය හිමි ප්‍රධානතම ආයතනය නාගරික සංවර්ධන අධිකාරිය වේ.

නාගරික සංවර්ධන සැලසුම් තුලින් ප්‍රශස්ථ, ඵලදායි හා කාර්යක්ෂම භූමි පරිහරණ රටාවක් මෙන්ම පරිසරය ගුණාත්මක ලෙස කළමනාකරණය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරනු ලබයි. ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහ පැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය යන පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා මෙම සංවර්ධන සැලසුම් සකස් කරනු ලබයි.

1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ II කොටස 8අ(1) පරිදි අමාතයවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව අත්‍යවශ්‍ය කරුණක්ව ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය සතු මෙවලම් හා ක්‍රමෝපායන් තුලින් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මතු වූ අභියෝගයන්ට ඉතා සාර්ථකව මුහුණ දෙමින් ප්‍රාදේශීය , සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන මීගමුව මහනගර සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම 2021-2030 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙළ කර ඇත.

එබැවින් මෙම සැලැස්ම සාර්ථකව නිම කිරිම සදහා ඇපකැපවී කටයුතු කල නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම් හා නොයෙක් අයුරින් සහාය දැක්වූ සැමට මාගේ හෘදයාංගම ස්තුතිය පුදකරන අතරම මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී සියලු පාර්ශවයන්වයන්ගෙන් ලද සක්‍රීය දායකත්වය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සදහා ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා

සභාපති

නාගරික සංවර්ධන අධිකාරිය

ගරු නගරාධිපතිතුමාගේ පණිවිඩය

උපාය මාර්ගික සැලසුම් ප්‍රවේශය සමඟ මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ සුවිශේෂී ගුණාංග වැඩිදියුණු කිරීම සඳහා නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත අපගේ කෘතඥතාවය පළ කරමු. මීගමුව සැලසුම් ප්‍රදේශය ගම්පහ දිස්ත්‍රික්කය තුළ ප්‍රදේශයට ආවේණිකවූ ජල විභවයන් සහ කතෝලික සංස්කෘතිය ඇති නගරයක් ලෙස හඳුනාගත හැක. මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ මායිම ලෙස නීත්‍යානුකූලව ලියවී ඇති සීමාවන් සැබවින්ම පිළිඹිබු නොවන අතර, මෙම සංවර්ධන සැලැස්මේ සඳහන් දැක්ම සමඟ වර්ධනය වීමට අපේක්ෂා කෙරේ.

ආර්ථික සංවර්ධනය උදෙසා සංචාරක කර්මාන්තය, ධීවර කර්මාන්තය හා වාණිජ යන ප්‍රධාන ක්ෂේත්‍ර තුනෙහි ප්‍රවර්ධනය පිළිබඳව මීගමුව සංවර්ධන සැලැස්මේ මූලික අවධානය යොමුවී ඇති අතර, කලාපීය වශයෙන් ප්‍රධාන වාණිජ හා ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙසත්, අධ්‍යාපන පහසුකම් සැලසීම සහ සෞඛ්‍ය සේවා සැපයුම්කරුවෙකු ලෙසත්, කටයුතු කිරීමට යෝජනා කර ඇත.මෙම ප්‍රයත්නය මගින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයට ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම දිරිමත් කරන අතර, කලාපයේ ස්වයංපෝෂිත නගර ආර්ථිකයක් නිර්මාණය කිරීමටත් මග පෑදේ.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් මීගමුව නගර සැලසුම් සකස් කිරීම සඳහා මහජන නියෝජිතයින්ගේ නිර්දේශ,යෝජනා සහ විවේචනයන්ට අනුකූලව සහයෝගයෙන් සහ සහභාගීත්වයෙන් සිදුකරන ලද ප්‍රයත්නය මම අගය කරමි. ඒ අනුව මෙම සැලැස්ම අපගේ සැලැස්මක් ලෙස සලකා ඉදිරි වසර 11 ක කාලය තුළ මීගමුව නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා අපගේ සහයෝගය ලබාදෙන බව සහතික කරමු. එසේම මීගමුව නගර සංවර්ධන සැලැස්මේ සාමූහික දැක්මකින් යුත් දර්ශනය කෙරෙහි අවධානය යොමු කිරීමටත් සියලුම පුරවැසියන් සහ පාර්ශවකරුවන්ගෙන් ඉල්ලමි.

දයාන් ලන්සා
නගරාධිපති
මීගමුව මහ නගර සභාව

පූර්විකාව

නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් 1989.11.03 දින අංක 1000/3 දරණ ගැසට් නිවේදනය මගින්, 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ සමස්ත මීගමුව මහනගර සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2004 – 2025 කාල පරිච්ඡේදය සඳහා මීගමුව මහනගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම, 2005.06.07 දින අංක 1396/7 දරණ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත . මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ වර්තමාන ප්‍රවණතා සහ නැගී එන නාගරික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කරමින් නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍යතාවය මතු වී ඇත. ඒ අනුව මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ආර්ථික , සමාජීය හා පාරිසරික තත්වය සැලකිල්ලට ගෙන පවත්නා නීල හරිත පරිසරය ආරක්ෂා කර ගනිමින් විධිමත් සංවර්ධනයක් කර ළඟාවිය හැකි අයුරින් 2021 -2030 කාල සීමාව සඳහා මීගමුව සංවර්ධන සැලැස්ම සකස් කොට ඇත.

මීගමුව සංවර්ධන සැලැස්ම 2021 -2030 - I , II සහ III ලෙස කොටස් තුනකින් සමන්විත වන අතර , I වන කොටස පසුබිම් අධ්‍යනය, මූලික අධ්‍යයනය සහ සැලැස්මේ අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව,SWOT විශ්ලේෂණය සහ සංවර්ධන සැලැස්ම යන පරිච්ඡේද වලින් සමන්විත වන අතර II වන කොටස 2021 - 2030කාල සීමාව සඳහා සැලසුම් සීමාවට අදාළ සැලසුම් හා ගොඩනැගිලි නියමතා සහ කලාපීකරණ නියාමතා වලින් සමන්විත වේ. III කොටස කලාපීකරණ මායිම් වලට අදාළ බණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ .

පළමුවන කොටස - සංවර්ධන සැලැස්මේ 1 වන පරිච්ඡේදය සංවර්ධන සැලැස්මේ අර්ථය , එහි නෛතික සන්දර්භය, සැලැස්මේ පාර්ශවකරුවන්, විෂය පථය සහ එහි සැලසුම් ක්‍රියාවලිය විස්තර කරයි. 2 වන සහ 3 වන පරිච්ඡේදයන් සැලසුම් ප්‍රදේශය, ප්‍රදේශයේ ඉතිහාසය, සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම සහ සංවර්ධන සැලස්මේ අවශ්‍යතාවය විස්තරාත්මකව දක්වා ඇත . 4 වන පරිච්ඡේදයේ දැක්ම ,අරමුණු සහ උපායමාර්ගික සැලසුම් වලින් සමන්විත අතර 5 වන පරිච්ඡේදයේ එක් එක් පරමාර්ථයන් සඳහා වන මූලික SWOT විශ්ලේෂණය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් ඇතුළත්ය. එමෙන්ම සංවර්ධන සැලැස්මේ 6 වන පරිච්ඡේදයේ සංකල්පීය සැලැස්ම සහ යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම විස්තර කරයි. ඒ යටතේ මීගමුව සංවර්ධන සැලස්මේ ප්‍රධාන උපායමාර්ගික සැලසුම් වන අපර ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ග , ආර්ථික සංවර්ධන උපාය මාර්ග, තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග,සංස්කෘතික හා ජාතික උරුමන් කළමනාකරණ උපාය මාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග උප අංශ ලෙස සවිස්තරව දක්වා ඇත .

දෙවන කොටස - 7 වන පරිච්ඡේදය මඟින් සැලසුම් සහ ගොඩනැගිලි නියමතා දක්වා ඇති අතර 8 වන පරිච්ඡේදයේ හඳුනාගත් කලාප හා කලාපීකරණ නියමතා විස්තර කර ඇත . 9 වන පරිච්ඡේදයේ යෝජිත මාර්ග පළල , ගොඩනැගිලි සීමා සහ රක්ෂිත ඇතුළත්ය.

මේ අනුව, මෙම අධිකාරියේ සහ ශ්‍රී ලංකා රජයේ අරමුණ වන්නේ 2021-2030 මීගමුව සංවර්ධන සැලැස්ම නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කිරීමයි.

මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි(සංශෝධිත) පනතේ 8 “ඊ” වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2020 සැප්තැම්බර් 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,

17 හා 18 මහල,

“සුහුරුපාය,”

සුභූතිපුර පාර,

බත්තරමුල්ල.

2021 මාර්තු මස 30 **වන දින.**

ගැසට් නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2236/12 - 2021 ජූලි මස 13 වැනි අඟහරුවාදා - 2021.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

මීගමුව මහ නගර සහා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''ඒ'' වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2020 සැප්තැම්බර් 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2021 මාර්තු මස 30 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 සහ 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

07 - 539/1

1A - G 34627 — 60 (2021/07)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, 2021 ක් වූ මාර්තු මස 30 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, උක්ත පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

මහින්ද රාජපක්ෂ (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2021 ජූලි මස 12 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 සහ 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

07 - 539/2

මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 මාර්තු මස 30 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

වරලත් වාස්තු විද්‍යාඥ **හර්ෂාන් ද සිල්වා,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2021 ජූලි මස 12 වැනි දින,

07 - 539/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

පටුන

ප්‍රණාමය	iii
ගරු අමාත්‍යතුමාගේ පෙරවදන	iv
ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පෙරවදන	v
ගරු සභාපති තුමාගේ පෙරවදන	vi
නගරාධිපති තුමාගේ පණිවිඩය	vii
පූර්විකාව	viii
මීගමුව මහා නගරසභා බලප්‍රදේශයේ සංවර්ධන සැලසුම සඳහා අනුමැතිය (2021-2030)	ix
ගැසට් නිවේදනය	xi
පටුන	xiii-xiv
I වන කොටස	
01 වන පරිච්ඡේදය සංවර්ධන සැලැස්මේ පසුබිම	1
1.1 හැඳින්වීම	2
1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්	3
1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය	5
1.4 සැලසුම් ක්‍රියාවලිය	6
02 වන පරිච්ඡේදය මූලික අධ්‍යයනය	9
2.1 සැලසුම් ප්‍රදේශය	10
2.2 සැලසුම් සහ සහ තත්ව සන්දර්භය	12
2.3 සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම	17
03 වන පරිච්ඡේදය සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය	23
3.1 ස්වාභාවික පරිසරයේ පවතින විභවතා භාවිතා නොකිරීම	24
3.2 වෙරළ තීරවල ප්‍රශස්ථ මට්ටමෙන් භාවිතා නොවීම.	26
3.3 කලපුවේ සහ එහි අවට ප්‍රදේශයේ නොගැලපෙන ඉඩම් භාවිතය	29
3.4 ඇල මාර්ග ජලය සහ මහ ඔය හා අවට ප්‍රදේශය ප්‍රශස්ථ මට්ටමෙන් භාවිතයකට නොගැනීම.	30
3.5 කලපුව සහ අවට ප්‍රදේශය අනවසරයෙන් අල්ලා ගැනීම.	31
04 වන පරිච්ඡේදය සංවර්ධන සැලසුම් රාමුව	33
4.1 දැක්ම	34
4.2 දැක්මෙහි ප්‍රකාශය	34
4.3 අරමුණු	35
4.4 පරමාර්ථ	35
05 වන පරිච්ඡේදය ශ. දු.අ.ත. විශ්ලේෂණය - SWOT Anlysis	36
5.1 සාරාංශගත ශ. දු.අ.ත විශ්ලේෂණය	37
5.2 විස්තරාත්මක ශ. දු.අ.ත විශ්ලේෂණය	41-57
06 වන පරිච්ඡේදය සංවර්ධන සැලැස්ම	58
6.1 සංකල්පිත සැලැස්ම	59
6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම	61
6.3 අපර ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම	66
6.3.1 සේවා කළමනාකරණ සැලැස්ම	66
6.3.2 මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම	76
6.3.3. ජල සැපයුම් සැලැස්ම	79
6.3.4 විදුලි සැපයුම් සැලැස්ම	81
6.3.5 මළ හා අපජල කළමනාකරණ සැලැස්ම	84
6.3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම	87

6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම 91
6.4.1 ආර්ථික සංවර්ධන සැලැස්ම 91
6.4.2 කාර්මික සැලැස්ම 93
6.5 තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම 96
6.5.1. මීගමුව නගර සභා බල ප්‍රදේශය සඳහා වන තෙත් බිම් සැලැස්ම 98
6.5.2 භූ දර්ශන කළමනාකරණ සැලැස්ම 100
6.5.3. ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම 101
6.5.4.යෝජිත පොදු එළිමහන් සහ විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 102
6.6සංස්කෘතික හා ජාතික උරුමයන් කළමනාකරණ උපාය මාර්ගය 107
6.6.1ජාතික උරුමයන් ආශ්‍රිත ප්‍රදේශ 107
6.7 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය 110
6.7.1. උපායමාර්ගික සැලසුම් ව්‍යාපෘති 110-162
6.7.2 ආයතනික සැකැස්ම 163-170

II වන කොටස

07 වන පරිච්ඡේදය සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමනා 174
7.1. හැඳින්වීම 175
7.2 සංවර්ධන කලාප 175
7.3 කලාප සංගුණකය 177
7.4 සංවර්ධන ප්‍රදේශයට අදාළ පොදු නියමනා 181
08 වන පරිච්ඡේදය කලාපීකරණ නියමනා 186
8.1.අඩු ඝණත්ව නීල හරිත සංචාරක කලාපය 187
8.2 අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය 192
8.3 අධි ඝනත්ව විශේෂ වාණිජ කලාපය 196
8.4 අඩු ඝණත්වයෙන් යුතු උරුමයන් සහිත සංචාරක කලාප 201
8.5 අධි ඝණත්ව ධීවර නේවාසික කලාපය 203
8.6 අර්ධ ඝනත්වයෙන් යුතු නීල සංචාරක කලාපය 205
8.7 අර්ධ ඝනත්වයෙන් යුතු නේවාසික කලාපය 210
8.8 අඩු ඝනත්ව පරිසර සංරක්ෂණ කලාපය / තෙත්බිම් ආරක්ෂිත කලාපය 214
8.9 තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය 215
09 වන පරිච්ඡේදය යෝජිත මාර්ග පළල , ගොඩනැගිලි සීමා සහ රක්ෂිත 218
9.1 මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහා යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන් 219
9.2. දුම්රිය මාර්ග රක්ෂිත 222
9.2 ඇළ, දොළ, ගංගා සහ ජලාශ රක්ෂිත 222

III වන කොටස

සිතියම් ලැයිස්තුව 225
වගු ලැයිස්තුව 226
රූප සටහන් ලැයිස්තුව 228-229
ඇමුණුම් ලැයිස්තුව 230
ඇමුණුම් 232-293
අර්ථ කථනයන් 294
කෙටි යෙදුම් 295
උපලේඛනය 02 296
පරිශීලිත ග්‍රන්ථ 297

I වන කොටස

01 වන පරිච්ඡේදය



සංවර්ධන සැලැස්මේ පසුබිම

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

1.1 හැඳින්වීම

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 11 වන කොටසේ 8(අ) වගන්තියට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් ප්‍රකාශිත ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම පිණිස නාගරික සංවර්ධන අධිකාරියට නෛතික ප්‍රතිපාදන ලබාදී ඇත.1949 ජනවාරි මස 21 වන දින අංක 9939 දරණ ගැසට් නිවේදනය මගින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලදී. 1987 මැයි මස 12 වන දිනැති අංක 453/4 දරණ ගැසට් නිවේදනය මගින් කොච්චිකඩේ නගර සභා බල ප්‍රදේශය සහ කටාන ගම් සභා බල ප්‍රදේශයේ කොටසක් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයට අන්තර්ගත කරගන්නා ලදී. 2002 ජනවාරි මස 10 දිනැති අංක 1218/34 දරණ ගැසට් නිවේදනය මගින් ප්‍රදේශය තවදුරටත් පුළුල් කරන ලද අතර, අංක 1000/3 දරණ 1989 නොවැම්බර් මස 03 දිනැති ගැසට් නිවේදනය මගින් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලදී.

නගර සංවර්ධනය පිළිබඳව මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පළමු වැදගත් සිදුවීම ලෙස 2001 වර්ෂයේදී ප්‍රධාන පළාත් පාලන ආයතන තුනක් ඇතුළත් කර මීගමුව වර්ධක ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කිරීම හැඳින්විය හැක. 2004 වර්ෂයේදී මීගමුව මහනගර සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කරන ලද අතර එය 2005.06.07 දින අංක 1396/7 දරණ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත. මෙම සැලැස්ම මගින් ප්‍රදේශයේ භෞතික, පාරිසරික, ආර්ථික හා සමාජීය අංශ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාදී ඇත. මෙම සැලැස්ම 2004 වර්ෂයේ සිට අවුරුදු 20 ක කාලයක් සඳහා ක්‍රියාත්මක කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කර ඇත.ඒ තුළින් නැගී එන නාගරික අවශ්‍යතා සැලකිල්ලට ගෙන දැනට පවතින සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව පැනනැගී ඇති බැවින්, ප්‍රදේශයේ භෞතික, පාරිසරික, ආර්ථික හා සාමාජීය සුභසාධනය මෙන්ම සැප පහසු නගරයක් බිහිකිරීම සඳහා ඉදිරි වර්ෂ 11 ඉලක්ක කරගෙන මෙම නගර සංවර්ධන සැලැස්ම පිළියෙල කරනු ලැබේ.

සෞභාග්‍යයේ දැක්ම - හත්වන කොටස (භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය) යටතේ **මීගමුව සැලසුම් ප්‍රදේශය සහසම්බන්ධිත නගරයක්** ලෙසත් දක්වා ඇත. ඒ අනුව මීගමුව සංවර්ධන සැලැස්ම මගින් යෝජිත උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති හරහා මෙම නගරයට සංචාරක,ආර්ථික සහ ඓතිහාසික වටිනාකම් එකතු වීමෙන් ජාතික නගරයක් වන ගම්පහ නගරය සමඟ සහසම්බන්ධ වනු ඇත.ඒ අනුව මීගමුව සංවර්ධන සැලැස්ම මගින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයට උරුම වූ මූලික හරයන් සහ පවතින විභවතාවයින් හඳුනාගෙන **මීගමුව සංචාරක ගමනාන්තයක්** ලෙස ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා ගෙනයාමට එහි ස්වභාවික වරාය සහ වෙරළ ආසන්නව පිහිටි ජල ධාරා,මීගමුව කළපුව, මා ඔය සහ හැමිල්ටන් ඇළ කේන්ද්‍ර කොටගත් **නීලහරිත ජාලය** සහ **ජෛව විවිධත්වයත්**, රෝම වාතාවරණයෙන් යුත් බටහිර නවීන සංස්කෘතියත් ප්‍රධාන විභවතාවයන් ලෙස හඳුනාගෙන ඇති අතර එමගින් සංචාරක, ධීවර, වාණිජ යන කර්මාන්ත සහ අනෙකුත් අංශයන් ඔස්සේ සංවර්ධනයක් අපේක්ෂා කරයි.

1.2 සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන පියවරක් ලෙස පාර්ශවකරුවන්ගේ සංවර්ධන යෝජනා සහ අදහස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.මේ සඳහා ආරම්භක අදියරේදී පහත සඳහන් විවිධ පාර්ශවයන්ගේ උපදෙස් ලබාගන්නා ලදි.

වගු අංක 1.1 මීගමුව නගර සංවර්ධන සැලැස්මේ ප්‍රධාන පාර්ශවකරුවන්.

නම / තනතුර	**ආයතනය**
මූලික පාර්ශවකරුවන්	
මීගමුව ප්‍රාදේශීය ලේකම් ඇතුළු කාර්යාල නිළධාරීන්	මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
නාගරික කොමසාරිස්	මීගමුව මහනගර සභාව
නගර නිර්මාණ ශිල්පී	මීගමුව මහනගර සභාව
නාගරික ඉංජිනේරු	මීගමුව මහනගර සභාව
සංවර්ධන සහකාර	මීගමුව මහනගර සභාව
මූලික උපදේශක ආයතන	
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රාදේශීය ඉංජිනේරු	වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
සහකාර අධ්‍යක්ෂ	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්	මධ්‍යම පරිසර අධිකාරිය
සභාපති	මීගමුව හෝටල්කරුවන්ගේ සංගමය
සභාපති	ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය
අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
පාර්ශවකරුවන්ගේ කණ්ඩායම්	
සාමාන්‍යාධිකාරී	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්	මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රාදේශීය ඉංජිනේරු	ලංකා විදුලිබල මණ්ඩලය
සභාපති	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
සභාපති / ලාල් දිසානායක මහතා	ශ්‍රී ලංකා හෝටල් සංගමය
සභාපති	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අධ්‍යක්ෂ ජනරාල්	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල් / විධායක ඉංජිනේරු	මාර්ග සංවර්ධන අධිකාරිය
අධ්‍යක්ෂ ජනරාල්	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
ප්‍රාදේශීය ඉංජිනේරු	වාරිමාර්ග දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ	කලාප අධ්‍යාපන කාර්යාලය

කළමනාකරු	ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
අධ්‍යක්ෂ	කලාප අධ්‍යාපන කාර්යාලය
සාමාන්‍යාධිකාරී / ප්‍රාදේශීය ඉංජිනේරු	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
සභාපති	කලපුසංවර්ධන අධිකාරිය
සභාපති	මීගමුව වෙළඳ සංගමය
සභාපති	ත්‍රිරෝද රථ රියදුරන්ගේ සංගමය
සහකාර පොලිස් අධිකාරී	මීගමුව පොලීසිය මීගමුව පොලිස් අධිකාරී කාර්යාලය
පොදුජනතාව	මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

නාගරික සංවර්ධන අධිකාරිය මගින් මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහා ඉඩම් පරිහරණ සැලසුම්, ආර්ථික, භෞතික සහ පාරිසරික සැලසුම් ඒකාබද්ධ කර පුළුල් සැලැස්මක් සකස් කිරීමේ කාර්යයේ නිරතව සිටී. මෙම සැලසුම්වල යෝජිත විශේෂිත භූමි පරිහරණය පිළිබඳව කරුණු ඇතුළත්වී ඇත.යෝජිත භෞතික ව්‍යුහ සැලැස්මේ අපරව්‍යුහ පහසුකම් එනම්, ප්‍රදේශයේ මාර්ග, දුම්රිය මාර්ග, නගර මධ්‍ය ස්ථාන, විදුලිය, ජල සැපයුම, කසල අපහරණය වැනි තිරසාර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳව දක්වා ඇත.තවද මෙම අපරව්‍යුහ පහසුකම් නියමතා ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීම තුළින් අවිධිමත් සංවර්ධනය දුරුකරලීමට දායකවේ. යෝජිත ආර්ථික සංවර්ධන සැලැස්ම මගින් සංචාරක කර්මාන්තය, ධීවර කර්මාන්තය සහ අනෙකුත් සේවාවන් පවතින විභවතා භාවිතා කරමින් ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒමත්, පාරිසරික කළමනාකරණ සැලැස්ම මගින් පරිසරය සංරක්ෂණය කිරීමේ උපාය මාර්ග දැක්වීම, නීල හරිත ප්‍රදේශ හා සුදුසු පරිදි අවරෝධක වෙන්කිරීම, කලාපීකරණය විවෘත අවකාශයන් තීරණය කිරීම සිදුකෙරේ. පාරිසරික කළමනාකරණ සැලැස්ම, පොදු එළිමහන් විනෝද කටයුතු පිලිබඳ අවකාශීය සැලැස්ම හා සම්බන්ධ වන අතර, එමගින් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව දැනට භාවිතයට නොගන්නා විවෘත ප්‍රදේශ ක්‍රියාකාරී විවෘත ප්‍රදේශ බවට පත්කිරීමට යෝජිතය.

මීගමුව සංවර්ධන සැලැස්ම, ආර්ථික සංවර්ධනය පහසු කිරීම, උපයෝගීතාවය ප්‍රශස්ථ කිරීම සහ තිරසාර බව සහතික කිරීම යන ප්‍රධාන අරමුණු ත්‍රිත්වය මුල් කරගත් සහ සැලසුම් සහගතවූ, තිරසාර වූ සුනිත සුබල සුහුරු දැයක් සමග සුසැදි සුරැකි සොදුරු බිමක් අරමුණු කරගත් 2050 ජාතික භෞතික සැලැස්ම හා අනුකූල වේ. යෝජිත ශක්‍යතා කාර්යය ව්‍යාපෘති තුළින් සපථ ආර්ථිකයක් සහිත තිරසාර නාගරික ආකෘතියක් නිර්මාණය කිරීම,අනුරූප පරිසරයක් සහ පිළිගත හැකි සමාජ වාතාවරණයක් නිර්මාණය කිරීමේ පරමාර්ථය උදෙසා මීගමුව සංවර්ධන සැලැස්මේ ඉලක්කගත කාලසීමාව වසර 11 ක් වේ.මෙමගින් ආංශික හා වඩාත් ඉඩකඩ සහිත සංවර්ධනයක් ප්‍රවර්ධනය වන අතර, එමගින් නගරවාසීන්ගේ හා නොයෙකුත් සේවා භාවිතා කරන්නන්ගේ පැවැත්ම හා පරිසරය වඩාත් යහපත් ඉහළ තලයකට ඔසවා තැබීමට දායකවනු ඇත.

මීගමුව නගර සංවර්ධන සැලැස්ම, පවත්නා කාලසීමාව සහ මීගමුව වර්ධක ප්‍රදේශයේ පවතින සංකීර්ණතාවය මත තීරණය වේ. මෙම සංවර්ධන සැලැස්ම වසර 11 ක කාලයක් සඳහා සැලසුම් කරන බැවින්, මෙම සංවර්ධන සැලැස්මේ සීමා මායිම් ලෙස මීගමුව වර්ධක ප්‍රදේශය එනම්, කටාන ප්‍රාදේශීය සභාව, සීදූව නගර සභාව සහ මීගමුව මහනගර සභාව යන පළාත් පාලන ආයතනවලින් සමන්විත සැලසුම් මායිම තෝරා ගැනීම ගැටළු සහගත වේ. එබැවින් ඉහත සඳහන් සියලු කරුණු කෙරෙහි අවධානය යොමු කර සැලසුම් මායිම ලෙස මීගමුව මහනගර සභා බල ප්‍රදේශය තෝරාගන්නා ලදී.

1.4 සැලසුම් ක්‍රියාවලිය

රූප සටහන 1.1 - මීගමුව සංවර්ධන සැලැස්මේ සැළසුම් ක්‍රියාවලිය



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

මීගමුව සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී අදියර 10 කින් සමන්විත සැලසුම් ක්‍රියාවලිය අනුගමනය කරන ලද අතර, පසුබිම්අධ්‍යයනය , විෂයපථය, ගැටළු සහ සංවර්ධන විභවතාවයන් හඳුනාගැනීම, දැක්ම, පරමාර්ථ , අරමුණු සැකසීම, සවිස්තරාත්මක විශ්ලේෂණය, සැලසුම, උපාය මාර්ග සැකසීම, නියමතා සැකසීම, අනුමැතිය ලබා ගැනීම, අවසාන සැලසුම් වාර්තාව ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීම, නීතිගත කිරීම හා ප්‍රකාශනය මෙයට ඇතුළත් වේ.

පසුබිම් අධ්‍යයනයන්හි මුල් පියවර වන්නේ භූ දත්ත පරිගණක ගබඩාව නිර්මාණය කිරීම, මූලික දත්ත ගවේශනය, දත්ත පරතර හඳුනා ගැනීම, ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් හෝ වෙනත් ක්‍රම මගින්, දත්ත රැස් කිරීම මගින් මූලික දත්තයන් යාවත්කාලීන කිරීම, විශ්ලේෂණය සඳහා අවශ්‍ය අනෙකුත් දත්ත රැස්කිරීම සහ සකස් කළ දත්ත භූ දත්ත ලෙස ගබඩා කිරීමයි.මෙය 2017 ජූනි සිට 2018 ජනවාරි මස දක්වා සිදුකරන ලදී. මෙය දෙවන පියවර වන්නේ නාගරික ප්‍රදේශයේ වර්තමාන ක්‍රියාවලිය නාගරික සන්දර්භයට අනුව හඳුනා ගැනීම, ප්‍රදේශයේ සංවර්ධන ප්‍රවණතා සම්බන්ධ ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සහ නියමතා සමාලෝචනය, රථවාහන සහ පදිකයන් ආශ්‍රිත සමීක්ෂණ, ඉඩම් වටිනාකම්, පවත්නා සහ යෝජිත ව්‍යාපෘති සමාලෝචනය සහ ඒවායේ බලපෑම යන කරුණු වේ. ගැටළු සහ සංවර්ධන විභවතාවයන් හඳුනාගැනීමේ තෙවන පියවර වන්නේ ප්‍රදේශය තුළ ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම සහ ප්‍රදේශයේ සංවර්ධන විභවතාවන් හඳුනා ගැනීමයි. එසේම මහජන/පාර්ශවකරුවන්ගේ අදහස් සහ ඔවුන්ගේ යෝජනා උදෙසා සංවර්ධන සැලැස්ම ඔවුන් වෙත ඉදිරිපත් කිරීම ද මේ හා බැඳේ.පාර්ශවකරුවන්ගෙන් ලබා ගන්නා අදහස් හා යෝජනා නගර සංවර්ධන සැලැස්ම සැකසීමේදී උපයෝගී කරගනු ලැබේ.දැක්ම, පරමාර්ථ , අරමුණු සැකසීම හතරවන පියවරයන් වන අතර එමගින් නගරයේ භෞතික, පාරිසරික, ආර්ථික සහ සාමාජීය අංශයන්ට අනුකූලව එහි අනාගත ප්‍රතිරූපය සහ කාර්ය භාරය විවෘත කරයි. පස්වන පියවරයන් ලෙස සවිස්තරාත්මක විශ්ලේෂණය සිදු කර ඇති අතර එය සංවේදීතා විශ්ලේෂණය, සංවර්ධන පීඩන විශ්ලේෂණය, සම්බන්ධතා විශ්ලේෂණය, සිද්ධි සංසන්ධනය හා බහු නිර්ණායක යෝග්‍යතා විශ්ලේෂණය ඔස්සේ ආවරණය කර ඇත.

සැලසුම හා උපාය මාර්ග සැකසීම සංවර්ධන සැලසුමේ හයවන පියවරයන් වන අතර සංවර්ධන සැලසුමේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා භෞතික,ආර්ථික, සමාජීය, පාරිසරික පරිවර්තනයන් නාගරික සංවර්ධන ක්‍රියාවලියට යොදාගැනීම සිදු කර භෞතික, සාමාජීය, ආර්ථික සහ පාරිසරික බලපෑම් විශ්ලේෂණය මගින් ප්‍රමුඛතාකරණය කරන ලද ව්‍යාපෘති හඳුනා ගැනීම සිදු කොට ඇත.නියමතා සැකසීම හත්වන පියවරයන් වන අතර එතුලින් නියමතා ස්ථාපිත කිරීම් ,ඇගයීම සහ ආකෘති පාදක විශ්ලේෂණය සහිත නාගරික ව්‍යාපෘති සංයුතිය, ගොඩනැගිලි සහ සැලසුම්කරණ නීතිරීති හා නීතිමය බලපෑම් සහිත මාර්ගෝපදේශය, කලාපීකරණ නියමතා සහ සාමාජීය, දේශපාලන සංවේදීතාවය තවදුරටත් මෙතුළින් ආවරණය කරනු ලබයි. සංවර්ධන සැලසුමේ අටවන පියවරයන් ලෙස මහජන අදහස් දැක්වීම සඳහා කාලය ලබා දීමත් , පාර්ශවකරුවන්ගේ උපදේශන හා පළාත් පාලන ආයතන අනුමැතිය ලබා ගැනීමත් හඳුනාගනු ලැබේ. සංවර්ධන සැලසුමේ නවවන පියවරයන් ලෙස නිර්දේශයන් සඳහා සංවර්ධන සැලසුම ප්‍රධාන සැලසුම් කමිටුවට හා සංවර්ධන සැලසුම් අංශයට ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.

සංවර්ධන සැලසුමේ දහවන පියවරයන් ලෙස නීතිගත කිරීම හා ප්‍රකාශනය සිදුකරන අතර එය විධිමත් ක්‍රියාවලියක හා බැඳෙන අතර මහජන / පාර්ශවකරුවන්ගේ උපදේශන, පළාත් පාලන ආයතනයන්හි අනුමැතිය හා සංශෝධන සහ ප්‍රකාශන සම්බන්ධව

පාර්ශවකරුවන්, සැලසුම් කමිටුව සහ අභ්‍යන්තර සමාලෝචන කටයුතු සම්බන්ධීකරණ කිරීම, අමාත්‍යාංශ අනුමැතිය ලබාගැනීම සහ ගැසට් නිවේදනය නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම ඇතුළත් වේ.

02 වන පරිච්ඡේදය



මූලික අධ්‍යනය

02 වන පරිච්ඡේදය

මූලික අධ්‍යනය

2.1 සැලසුම් ප්‍රදේශය

මීගමුව නගරය, ගම්පහ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ බටහිර වෙරළ තීරය තුළ මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ වාණිජ අගනගරය වන කොළඹ සිට කිලෝමීටර් 35 ක් දුරින් සහ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලට හා නිදහස් වෙළඳ කලාපයට කිලෝමීටර් 7 ක් දුරින් පිහිටා ඇත. එය උතුරින් මා ඔයෙන්ද, දකුණින් දිය හොඳ ඇලෙන්ද, නැගෙනහිරින් රෝම ඇලෙන්ද, බටහිරින් මීගමු කලපුවෙන් සහ ඉන්දියන් සාගරයෙන් මායිම්වී ඇත

මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 2800 ක් වන අතර, එය ග්‍රාම නිලධාරී වසම් 39 ක් ඇතුළත් මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇත.මීගමුවේ මුළු ජනගහනය 155649 ක් වන අතර නිවාස 38912 ක් පමණ පවතී.

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප සිතියමට අනුව මීගමුව සැලසුම් ප්‍රදේශය අතරමැදි කලාපය හා තෙත් කලාපයට අයත් වේ. ප්‍රධාන වශයෙන් මැයි සිට අගෝස්තු මස දක්වාත්, ඔක්තෝබර් සිට ජනවාරි මස දක්වාත් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයට නිරිතදිග මෝසම් මැසි මගින් වර්ෂාව ලැබේ.ඉතිරි මාස කිහිපය තුළ සංවහන වැසි මගින් සුළු වර්ෂාපතනයක් ලැබෙන අතර සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2400 ක් පමණ වේ. සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 24 සිට 30 දක්වා වන අතර, පෙබරවාරි සිට අප්‍රේල් දක්වා ඉහළ ආර්ද්‍රතා මට්ටමක් පෙන්නුම් කරයි.

සිතියම 2.1 - මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ පිහිටීම.



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

2.2 සැලසුම් සහ සහ තත්ව සන්දර්භය

මීගමුව සැලසුම් ප්‍රදේශය සැලකිය යුතු ඓතිහාසික පසුබිමක් ඇති අතර, එය කාවන්තිස්ස රජු සමය දක්වා දිවයයි. මීගමුව යන සිංහල නාමය එම යුගය පසුබිම් කරගෙන ආරම්භවී ඇත.7 වන සහ 8 වන ශතවර්ෂවලදී මුස්ලිම් සහ අරාබිවරු කුරුඳු වෙළදාම සඳහා ලංකාවට පැමිණි අතර, ක්‍රම ක්‍රමයෙන් නැගෙනහිර- බටහිර වෙළඳ තීරයේ ආධිපත්‍ය පිහිටුවීය. මීගමුව කලපුව මුහුදු යාත්‍රා සඳහා අවශ්‍ය පහසුකම් සපයන අතර, මෙය ප්‍රධාන වරායන්ගෙන් එකක් විය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් වෙරළ බඩ ප්‍රදේශයන්හි පදිංචිවී කුරුඳු වෙළඳාම ඒකාධිකාරයක් ලෙස පවත්වාගෙන යන ලද අතර, යුරෝපය සහ මධ්‍යධරණී ප්‍රදේශයන්ට ප්‍රවාහනය කරන ලදී.

1500 දී පෘතුගීසි ආක්‍රමණයත් සමඟ මුස්ලිම් ජනතාව නෙරපූ අතර, මීගමුව කොටුවේ ඉදිකිරීම් ආරම්භ කර කුරුඳු වෙළඳාම බටහිරට භාරදෙන ලදි. සාම්ප්‍රදායික කුරුඳු නිෂ්පාදනය හා කළමනාකරණය පෘතුගීසීන් විසින් ප්‍රතිනිර්මාණය කරන ලද අතර,ශත වර්ෂයකට අධික කාලයක් ඔවුන්ගේ පාලනය යටතේ පවත්වාගෙන යන ලදී. ඔවුන් විසින් කතෝලික සංස්කෘතිය ප්‍රචලිත කරන ලද අතර, කතෝලික පල්ලි විශාල ප්‍රමාණයක් ස්ථාපිත කර කතෝලික විශ්වාසය ඇති කරන ලදී. මෙම හේතුවෙන් මීගමුව සැලසුම් ප්‍රදේශය පුංචි රෝමය ලෙස ජනප්‍රිය විය. 1646 දී ලන්දේසීන් විසින් පෘතුගීසීන්ගෙන් මීගමුව සැලසුම් ප්‍රදේශය අත්පත් කරගන්නා ලද අතර, වර්ෂ 10 ක් සඳහා සටන් විරාමයකට කතිකා කරගන්නා ලදී. 1672 වර්ෂයේදී අනෙකුත් ලන්දේසි ගොඩනැගිලි, පල්ලි සහ කිලෝමීටර් 120 ක් (සැතැප්ම 75) පමණ දිග විශාල ඇල මාර්ග, එනම්, දකුණු දෙසින් කොළඹ සිට මීගමුව හරහා උතුරු දෙසට පුත්තලම දක්වා ඉදිකරන ලදී.

රූප සටහන 2.1 - ඕලන්ද බල කොටුව

රූප සටහන 2.2 - ඕලන්ද බල කොටුවේ ඉදිරිපෙනුම

මූලාශ්‍රය - මීගමුව මහනගර සභාව,2021

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

18 වන ශතවර්ෂයේ බ්‍රිතාන්‍ය ආක්‍රමණයත් සමඟ කුරුඳු වෙළදාම 40% ක ප්‍රමාණයකින් පරිහානියට පත්විය. ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර, ෆ්‍රෙඩ්රික් නෝර්ත් මහතා විසින් ඉදිරිපත් කරන ලද දුර්වල ප්‍රතිපත්ති මෙම පරිහානියට හේතුවී ඇත. මෙම වාතාවරණය හේතුවෙන් 1830 දී කුරුඳු කර්මාන්තය පිළිබඳ වාණිජ පිබිදීම බිඳ වැටුණි.අනතුරුව බ්‍රිතාන්‍ය පාලනය යටතේ මීගමුව සැලසුම් ප්‍රදේශය නව මාවතකට යොමුවූ අතර, විශාල සංවර්ධන කටයුතු එනම්, ශ්‍රී ලංකාවම සම්බන්ධවන පරිදි අතිවිශාල දුම්රිය මාර්ග ව්‍යාපෘති මෙන්ම පොල්, තේ සහ කෝපි වගාවන් දිරිමත් කිරීමේ සංකල්ප ගෙන එන ලදී.

දැනට නගරයේ පවතින පාරිසරික ක්‍රමවේදය මගින් නගරයේ පාරිසරික තුලනය සහ දෘෂ්‍ය ගුණාත්මක භාවය ප්‍රධාන තැනක් ගන්නා අතර, පරිසරය, කලපුව ආශ්‍රිත ජලාශ, මුහුද, මා ඔය, හැමිල්ටන් ඇල සහ ස්වාභාවික ආකෘතියකින් යුත් වෙරළ තීරය යන අංගයන්ගෙන් සමන්විතය. ප්‍රදේශයේ පවතින විශේෂිතවූ සත්ව සහ වෘක්ෂලතාදිය, කඩොලාන, මුහුදු තෘණ,වෙරළබඩ

ප්‍රදේශයේ වැලි ජෛව විවිධත්වය නිර්මාණය කිරීමට හේතු පාදකවී ඇත.මෙවන් විශේෂිතවූ බාහිර ධනාත්මක සාධක මෙම සංසිද්ධිවල ප්‍රතිඵලයක් වේ. ප්‍රදේශයේ පවතින ජල මාර්ග නගර නිර්මාණයට මෙන්ම සංචාරකයින් සඳහා විනෝදාස්වාද ජනක ප්‍රවාහනය සඳහා විභවතාවයන් පෙන්නුම් කරන අතර, නගරයේ පවතින ස්වාභාවික ආර්ථික විභවතාවයන් නගරයේ ආරථිකය මෙන්ම සංචාරකයින් හා ධීවර කර්මාන්තයේ ප්‍රධාන ගමනාන්තයක් බවට මීගමුව පත් කරයි. වර්තමානයේදී මීගමුව නගරය, ගම්පහ දිස්ත්‍රික්කයේ වාණිජ හා ප්‍රවාහන මධ්‍යස්ථානයක් මෙන්ම අධ්‍යාපන පහසුකම් සහ සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකරයි. ප්‍රදේශයේ පවතින ප්‍රධාන මාර්ග ජාලය මෙන්ම දුම්රිය මාර්ග පද්ධතිය මේ සඳහා විශාල දායකත්වයක් දක්වයි. ජාතික වශයෙන් මීගමුව සැලසුම් ප්‍රදේශය දෙවන ගණයේ නගරයක් වන අතර, ජාතික භෞතික සැලැස්මේ බස්නාහිර පළාතේ නාගරික ධූරාවලිය අනුව මීගමුව සැලසුම් ප්‍රදේශය ප්‍රධාන ක්‍රියාකාරී ආර්ථික නගරයක් ලෙස හඳුන්වා ඇත.(*ඇමුණුම 01. මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය)*

මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පවතින ප්‍රවාහන ජාලය මගින් ජාතික, කලාපීය සහ ප්‍රාදේශීය සබඳතා වැඩිදියුණු කරනු ලබයි. මීගමුව සැලසුම් ප්‍රදේශය හරහා ප්‍රධාන මාර්ග කිපයක් වැටී ඇති අතර, එමගින් මිනුවන්ගොඩ, ජාඇල, දිවුලපිටිය, ගම්පහ සහ හලාවත යන ප්‍රධාන නගර සමඟ ඍජු සම්බන්ධතාවයක් පැවතීම තුළින් සේවා ලබාගැනීම පහසු කරයි. මීට අමතරව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක නිදහස් වෙළඳ කලාපය සහ කටුනායක අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරුව මීගමුව සැලසුම් ප්‍රදේශය ආසන්නයේ පැවතීම හේතුවෙන් නගරයේ සංචාරක ධීවර හා වාණිජ යන ක්ෂේත්‍රයන් වඩාත් ශකතිමත්වීම තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වේ.නගරයේ ආර්ථිකය, 45% ක් ධීවර කර්මාන්තයෙන්ද, 35% ක් සංචාරක කර්මාන්තයෙන්ද, 20% ක් වාණිජ හා අනෙකුත් සේවා මත රඳා පවතී.

ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස පවතින මීගමුව සැලසුම් ප්‍රදේශය වාර්ෂිකව සංචාරකයින් 350,000 ක් ආකර්ශනය කරගන්නා අතර, මොවුන් ප්‍රධාන වශයෙන් විවේක සුවය සඳහා පැමිණේ. මෑතකදී කරන ලද සමීක්ෂණයකට අනුව මීගමුව සැලසුම් ප්‍රදේශය කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ආසන්නයේ පිහිටීමත්, කොළඹ කටුනායක අධිවේගී මාර්ගය හරහා කොළඹ නගරය හා පවතින මනා සම්බන්ධතාවයත්, ප්‍රධාන ධීවර ගම්මානයක් ලෙස පරිවර්තනය වීමත් හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙරළාශ්‍රිත ගමනාන්තයක් ලෙස පසුගිය කාලයේ ජනප්‍රිය විය. විශේෂයෙන් මිළ පිළිබඳව සංවේදී සංචාරකයින් මේ සඳහා යොමු විය.

රූප සටහන 2.3 - ආර්ථිකයේ ප්‍රධාන අංශ තුන



මූලාශය - මීගමුව මහනගර සභාව, 2021

රූපසටහන 2.4 - මීගමුව මහනගර සහා බල ප්‍රදේශයේ සංචාරක ආකර්ශනය නියෝජනය



මූලාශ්‍රය - සංචාරක සංවර්ධන අධිකාරිය, 2021

මීගමුව සැලසුම් ප්‍රදේශය සක්‍රීය ධීවර නගරයක් වන අතර මත්ස්‍ය නිෂ්පාදනය අති විශාලය. ශ්‍රී ලංකාවේ ධීවර නිෂ්පාදනය පිළිබඳව තෙවන ස්ථානයේ පවතින මෙම නගරය ජාතික ආර්ථිකය සඳහා 16% ක දායකත්වයක් ලබාදේ. 80% සමුද්‍ර මාළු වන අතර, 20% ක් කලපු මාළු වේ.කකුළුවන් සහ ඉස්සන් ආර්ථිකය සඳහා විශාල දායකත්වයක් සපයන*(ඇමුණුම 02.මීගමු මහ නගර බල සහා බල ප්‍රදේශයේ ඉස්සන් අභිජනන ස්ථාන)* ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ (NARA) පරීක්ෂණ වාර්තා අනුව ආසියාවේ සිටින විශිෂ්ඨ මත්ස්‍ය විශේෂය මීගමුවේ බවට වාර්තාවේ.දැනට පවතින ධීවර වරාය, ධීවර කර්මාන්තය නැංවීම සඳහා දායක වේ.

රූපසටහන 2.5- ජාතික වශයෙන් මීගමුව මහනගර සහා බල ප්‍රදේශයේ මත්ස්‍ය නිෂ්පාදනය.



මූලාශ්‍රය- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,2014

රූප සටහන 2.6 - ධීවර දිස්ත්‍රික්ක අනුව මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය-



මූලාශ්‍රය- ධීවර හා ජලජ සම්පත් සංවර්ධනඅමාත්‍යාංශය,2015

2001 වර්ෂයේදී මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ජනගහනය 141,684 ක් ලෙස වාර්තාවූ අතර, 2012 වර්ෂයේදී 148000 ක් ලෙස වර්ධනයවී ඇත. එනමුත් නේවාසික ප්‍රදේශ වාණිජ ප්‍රදේශ බවට පරිවර්තනය වීම හේතුවෙන් ප්‍රදේශයේ සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය 0.11% ක් ලෙස පෙන්නුම් කරයි. ඒ අනුව ඇස්තමේන්තු ගත කල වර්තමාන ජනගහනය (2021) සහ අනාගත ජනගහනය (2030) පහත වගුව 2.1 මගින් ඉදිරිපත් කරනු ලැබේ.

වගුව 2.1 - මීගමුව සැලසුම් ප්‍රදේශයේ ජනගහන තොරතුරු

මීගමුව සැලසුම් ප්‍රදේශයේ ජනගහනය				සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය
2001	2012	2021	2030	
141684	148000	155649	170992	0.11

මූලාශ්‍රය- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2011, නාගරික සංවර්ධන අධිකාරිය,2021

මුළු ජනගහනයෙන් කතෝලික ජනගහනය 80% ක ප්‍රතිශතයක් පැවතීම මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන අතර, දැනට පවතින පල්ලි ජාලය හා ඒ හා බැඳුණු දිවා රාත්‍රී කටයුතු මගින් විශේෂ කතෝලික සංස්කෘතියක් සහ පිළිගත් බටහිර නවීන සංස්කෘතියක් නිර්මාණය කිරීමට දායක වේ. එමගින් සජීවී නගරයක් පවත්වා ගැනීම සඳහා වර්ෂය පුරා ක්‍රියාකාරී සංස්කෘතික හා නාගරික උත්සව එනම්, ධීවරයින්ගේ ශුද්ධවූ උත්සව, වේල් කරත්ත උත්සව, දේවස්ථානයන්හි පවත්වනු ලබන වාර්ෂික මංගල්‍ය සහ සරුංගල් සැණකෙලි ආදී සම්ප්‍රදායික උත්සව පවත්වාගෙන යෑම දිරිමත් කරයි.*(ඇමුණුම 03: මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පැවැත්වෙන නාගරික උත්සව)*

පූර්ව සැලසුම් මගින් මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහා විවිධාකාර යෝජනා ඉදිරිපත් කර ඇත. බස්නාහිර පළාත් මහනගර සැලැස්ම (CESMA) මගින් මීගමුව සංචාරක කලාපයක් ලෙසත් මීගමුව කලපුව ආශ්‍රිත ප්‍රදේශය ඒකාබද්ධ සංචාරක ගමනාන්තයක් ලෙසත් යෝජනා ඉදිරිපත් කර ඇත.මීට අමතරව මීගමුව කලාපයේ අපරවයුහ පහසුකම් එනම්, අධිවේගී මාර්ග සහ ප්‍රධාන මාර්ග ජාලය, ජලාශ්‍රිත ප්‍රදේශ සංරක්ෂණය කිරීම, කැළණි ගඟේ සිට මීගමුව කලපුව දක්වා සහ එම ප්‍රදේශ විනෝද කටයුතු සඳහා යොදා ගැනීමටත් යෝජනා ඉදිරිපත් කර ඇත*(ඇමුණුම 04: බස්නාහිර කලාපීය මහා නගර සැලසුම.(CESMA Plan)*. කොළඹ මහනගර කලාපීය ව්‍යුහ සැලැස්ම (CMRSP) මගින් මීගමුව ප්‍රදේශය, ගුණාත්මක බවින් යුතු වෙරළසහිත වෙරළ තීරයක් මෙන්ම අභ්‍යන්තර කලපු සහ ජලධාරා සහිත සංචාරක කලාපයක් ලෙස ප්‍රවර්ධනය කර ඇත.ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වැඩිදියුණු කිරීමත් යෝජනා කර ඇති අතර, තරු පහේ හෝටල්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, කැළණි ගඟ මූලික කරගත් ජල සම්පාදන ව්‍යාපෘති එනම්,උතුරු කොළඹ ජලසම්පාදන ව්‍යාපෘතිය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හරහා නළළිං ඉදිකිරීම, කටුනායක සීදූව හා මීගමුව ජල සම්පාදනය පුළුල් කිරීම, මලපවාහන පද්ධතිය හා වැසි ජල පද්ධතිය වැඩිදියුණු කිරීමටත් යෝජනා ඉදිරිපත් කර ඇත*(ඇමුණුම 5 මහ කොළඹ ව්‍යුහ සැලැස්ම (CMRSP)1998)*.

මුතුරාජවෙල මහ සැලැස්ම මගින් (1990) මීගමුව සැලසුම් ප්‍රදේශය අධිසංරක්ෂිත ප්‍රදේශයක් ලෙස සැලසුම් කිරීමට මැදිහත්වී ඇති අතර, ක්‍රාන්ති කලාප, විනෝද කටයුතු සහ සංචාරක භාවිතයන්, අක්කර 10 ක තේමා උද්‍යාන සහ ජනකලා කේන්ද්‍ර හා ජලාශ්‍රිත ක්‍රීඩා ව්‍යාපෘති යෝජනා කර ඇත*(ඇමුණුම 6 මුතුරාජවෙල මහ සැලැස්ම)*.

ජාතික භෞතික සැලැස්ම - 2050 මගින් නැගෙනහිර-බටහිර ආර්ථික කොරිඩෝව යෝජනා කර ඇති අතර, මීගමුව නගරයද එයට ඇතුළත් වේ. එම සැලැස්ම මගින් මූලිකව 2012 – 2050 වන විට ජනගහනය 20% – 25% දක්වා ප්‍රතිශතයක් වර්ධනය

කිරීමට අපේක්ෂා කරන අතර, වෙරළ තීරය ආශ්‍රිතව සංචාරක ප්‍රවර්ධන කලාපයක් ලෙස හඳුනාගෙන ඇත.බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්මේ මීගමුව දෙවන ගණයේ නගරයක් ලෙසත්, අලුත්ගම සිට මීගමුව දක්වා සංචාරක කලාපයක් ලෙසත්, ප්‍රවර්ධනය කර ඇත*(ඇමුණුම 07 ජාතික භෞතික සැලැස්ම)*

ගුවන් නගර සැලැස්ම මගින් මීගමුව නගරයට ආසන්නව පිහිටා ඇති කටාන ප්‍රදේශය දැවැන්ත සංවර්ධනයක් සඳහා යෝජනා කර ඇති අතර, ජාත්‍යන්තර ව්‍යාපාරික පහසුකම්, සම්මන්ත්‍රණ ශාලා, සම්මේලන මධ්‍යස්ථාන,විවිධ වැඩ සටහන්,උත්සව සහ සමාජ සංස්කෘතික,උසස් අධ්‍යාපන හා නවෝත්පාදන සමඟ වාණිජ සංචාරක ආකර්ශනය, සෞඛ්‍යය සහ සුවතා පහසුකම් සහ වාණිජ හා බැදුණු කටයුතු මේ අතර වේ.ගුවන්තොටුපළ ව්‍යාපාරික නගරයේ වාණිජ හා වෙළඳ මධ්‍යස්ථාන සංවර්ධනය, තීරුබදු රහිත සාප්පු සංකීර්ණය හා වෙළඳ නාම සහිත වෙළඳ සැල්, ගුවන්තොටුපළ ව්‍යාපාරික කුළුණු, ව්‍යාපාරික හෝටල් ප්‍රධාන සංවර්ධන අංගයන් වේ

මීට අමතරව කාර්යාල පරිපාලන හා සේවා මධස්ථාන, විශ්ව විද්‍යාල සහ අධ්‍යාපන මධස්ථාන එනම්, ගුවන් සේවා හා නවීන විද්‍යා විශ්ව විද්‍යාල, ව්‍යාවසායකත්ව පර්යේෂණ යටතේ කර්මාන්ත හා සම්බන්ධවූ අවකාශයන්, සංස්කෘතික කොරිඩෝවන්, කලාව, සංස්කෘතිය, විනෝදය, සංචාරක හෝටල් සහ මහල් නිවාස, සම්මන්ත්‍රණ ශාලා හා සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන, ව්‍යාපාරික රැස්වීම්, ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ, ක්‍රීඩා හා විනෝදාත්මක පහසුකම්ද, සංචාරක - වෛද්‍ය පාර්ශදයටතේ 'ස්පා' සහ ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන මෙන්ම සෞඛ්‍ය සහ සුවතා පහසුකම්ද, නාගරික ජනාවාස වැඩිදියුණු කිරීම යටතේ තට්ටු නිවාස, නාගරික අසල්වැසි උද්‍යාන,ජ්‍යෙෂ්ඨ පුරවැසි ගම්මාන, නැවත පදිංචි කිරීම, නිවාස පුනර්ජීවනය , මධ්‍යම ඝණත්ව තට්ටු නිවාස, නාගරික නිවාසද, පොදු පහසුකම් යටතේ, ප්‍රවේශ මාර්ග,සනීපාරක්ෂක පහසුකම් සහ උද්‍යානද යෝජනා කර ඇත.මීගමුව නගර සැලසුම්කරණය, පෙර සැලසුම් ක්‍රියාවලියෙන් වෙනස් වන අතර,මීගමුව ස්වයංපෝෂිත නගරයක් ලෙස පවත්වාගෙන යෑම සඳහා ස්වාභාවික පරිසරයේ ප්‍රධාන විභවතා සහ පෞරාණික කතෝලික සංස්කෘතිය නැඹුරු වන සමාජ සාරධර්ම කෙරෙහි පෙර සැලසුම්වල අවධානය යොමු කර නොමැත. එබැවින් මීගමුව සංවර්ධන සැලැස්ම, නගරයේ ප්‍රධාන ගැටළු හඳුනාගැනීම සඳහා ආකෘතියක් වන අතර, එයට අනුකූලව නගරවාසීන්ගේ මෙන්ම මීගමුව ප්‍රදේශය තම අත්දැකීම් කර ගන්නා මගීන්ගේ අභිවෘද්ධිය උදෙසා තිරසාර නාගරික ආකෘතියක් නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම සකසයි. *(ඇමුණුම 08: ගුවන් නගර සැලැස්ම හා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පිවිසුම් ව්‍යාපෘතිය 2017-2030).*

2.3.සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

මීගමුව මහා නගර බල ප්‍රදේශයෙහි මූලික සැලසුම් සීමාව නිර්ණය කිරීමේදී මූලිකව භූගෝලීය මායිම, ක්‍රියාකාරී මායිම සහ පරිපාලන මායිම යන ප්‍රධාන නිර්ණායක තුන හා බැඳේ. සිතියම 2.2 පෙන්වන පරිදි ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගුවන් තොටුපළ වන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ පළමු නිදහස් වෙළඳ කලාපය හා සම්බන්ධ වන ප්‍රධාන නගරය ලෙස මීගමුව සැලසුම් ප්‍රදේශය ක්‍රියාකරයි. සැලසුම් මායිම් සැකසීමේ මූලික අධ්‍යයන ප්‍රදේශය ලෙස සංචාරක කර්මාන්තය, ධීවර කර්මාන්තය සහ වාණිජ අංශ හරහා ආර්ථික දායකත්වය පිළිබඳ වැදගත්කම සැලකිල්ලට ගැනෙන අතර, මීගමුව, දිවුලපිටිය, හලාවත, හිරිඋල්ල, ජා-ඇල සහ අනෙකුත් නගරවල ආර්ථික ආකර්ශනයක් සහ සේවා ඉටුකිරීම මගින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ක්‍රියාකාරී සීමාවද නිර්මාණය කරයි. එපමණක් නොව සිතියම 2.3 පෙන්වන පරිදි පාරිසරික සම්පත්වලින් පිරී ඇති කලපු, මුහුද හා ඇලමාර්ග යන ස්වාභාවික නගර සීමාවන්ට අනුව පරිපාලන සීමාවන් ඉක්මවා භෞතික සංවර්ධනය පුළුල් කිරීමට හේතුවී ඇත.

ඉහත සඳහන් කරුණු හේතුකොට ගෙන මීගමුව මහනගර සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස 1997 නොවැම්බර් මස 03 දින අංක 1000/3 දරණ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කරන ලදී. එපමණක් නොව 2001 වර්ෂයේදී මීගමුව ප්‍රදේශය “වර්ධක ප්‍රදේශයක්” ලෙස හඳුන්වාදෙන ලද අතර, මේ සඳහා කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයත්, සීදූව - කටුනායක නගර සභා බල ප්‍රදේශයත් , මීගමුව මහනගර සභා බල ප්‍රදේශයත් ඒකාබද්ධ කරන ලදී. පුත්තලම - කොළඹ ප්‍රධාන මාර්ගය ජාතික හා කලාපීය ලෙස සම්බන්ධතා ඇති කරගන්නා ලද අතර, එමගින් මීගමුව නගරය වඩාත්ම සම්බන්ධතා ඇති නගරය ලෙස මාර්ග සම්බන්ධතාව පිළිබඳ විශ්ලේශනයේදී හඳුනා ගැනීමට හේතුවී ඇත. එය සිතියම 2.3 මගින් තවදුරටත් අවධාරණය කරයි.වර්තමානයේදී බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්මේ සංචාරක කලාපයේ පිහිටා ඇති 2 වන ගණයේ නගරයක් ලෙස මීගමුව හඳුන්වා ඇත.සිතියම 2.4 මගින් ඉදිරිපත් කරන සංවර්ධන පීඩන විශ්ලේෂණයේදී ඓතිහාසික සහ ලුවිස් පෙදෙස ආශ්‍රිත ප්‍රදේශ සංචාරක කර්මාන්තයට අදාළ භෞතික සංවර්ධනය සම්බන්ධව අධි සංවර්ධන පීඩනයක් ඇති බවට සනාථ කර ඇත.

මෙම නාගරික ප්‍රවණතා සහ කරුණු හේතු කොට ගෙන මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පරිපාලන මායිමෙන් ඔබ්බට මීගමුවේ ක්‍රියාකාරී සීමාව ඉස්මතු වන අතර පිටත පිහිටි නාගරික මධ්‍යස්ථාන විශාල ප්‍රමාණයක් මීගමුව ප්‍රධාන නගරය ලෙස භාවිතා කිරීමට පෙළඹී ඇත.*(ඇමුණුම 09 : සංවර්ධන පීඩන දර්ශක විශ්ලේෂණය සඳහාවූ නිර්ණායක)* මීට අමතරව සැලසුම් මැදිහත්වීමේ පහසුව සඳහා 1949 වර්ෂයේදී ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කරන ලද සහ 1987 හා 2002 වර්ෂයන්හිදී දීර්ඝ කරන ලද මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පරිපාලන සීමාවන් ඒ අයුරින්ම භාවිතා කරන ලදී. *(ඇමුණුම 10 : සැලසුම් සීමාව නිර්ණය කිරීම)* මීගමුව මහනගර සභා පරිපාලන සීමාව තුළ පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 39 ම මෙයට ඇතුළත් වේ.*(ඇමුණුම 11 : මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ඇති ග්‍රාම නිලධාරී වසම් ලේඛනය)*

සිතියම් අංක 2.2 - ගම්පහ දිස්ත්‍රික්කයේ නගර ධූරාවලිය.

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

සිතියම් අංක 2.3- මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ සංවේදීතා විශ්ලේෂණ.



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

සිතියම් අංක 2.4- මීගමුව මහනගර සහා බල ප්‍රදේශයේ මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය.



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

සිතියම් අංක 2.5- මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන පීඩන විශ්ලේෂණය.



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

03 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

03 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

නාගරික සැලසුම්කරණය තුළ සැලසුම් කිරීමේ අවශ්‍යතාවය තීරණාත්මක වන අතර, එය නගර සංවර්ධනය සඳහා පදනම සපයයි.මූලික වශයෙන් උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලියේදී ගැටළු හඳුනා ගැනීම මගින් සැලසුම් කිරීමේ අවශ්‍යතාවය තවදුරටත් ඉදිරියට ගෙන යෑමේ හැකියාව ඇත.මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පසුබිම, සන්දර්භය සහ විශාලත්වය සැලකීමේදී ප්‍රධාන වශයෙන් ගැටළු දෙකක් හඳුනාගෙන තිබේ.එය පහත සඳහන් ආකාරයට අර්ථ දැක්විය හැක.

3.1 ස්වාභාවික පරිසරයේ පවතින විභවතා භාවිතා නොකිරීම

මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පුළුල් නීල හරිත ජාලයක් පවතින අතර, එය කලපු, ගංගා, මුහුදු, ඇල, කඩොලාන සහ ජෛව විවිධත්වය යන ස්වාභාවික පාරිසරික පද්ධති හා බැඳී පවතී. මීගමුව කලපුව, මුහුද, මහඔය, හැමිල්ටන් ඇල, දෙපා ඇල නගරයේ පාරිසරික සමතුලිතතාවය රැකගැනීම සඳහා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. මීගමුව කලපුව කුරුළු වාසස්ථානයක් වන අතර, කොක්කු, දියකාවන්, කුඩා රාජාලියන්, මාන කොකුන්, තාරාවුන් යනාදී කුරුල්ලන් සඳහා අභිජනන ස්ථානයක් ලෙස ක්‍රියා කරයි. මීට අමතරව අලු රැන වටුවා, නිල් වලිගය සහිත මීමැස්සා, සුදු රෙදි හොරා, සිලින්තා සහ ප්‍රදේශයට ආවේණිකවූ කුරුළු විශේෂ ආදී සංක්‍රමික පක්ෂීන් සඳහා වාසස්ථාන සපයයි. ප්‍රදේශයේ කඩොලාන වර්ග 18 ක් මත්ස්‍ය අභිජනන ස්ථාන ලෙස ක්‍රියාකරන අතර, එමගින් ධීවර ක්ෂේත්‍රයට මෙන්ම මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ආර්ථිකයට දායකත්වයක් දරයි. එය වගු අංක 3.1 හා සිතියම 3.1. තුළින් නිරූපණය කරයි.

වගු අංක 3.1- මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ජෛව විවිධත්වය

	වර්ගය	කලපුව තුළ වර්ගයන්ගේ එකතුව	ඒකදේශික	ශ්‍රී ලංකාව තුළ වර්ගයන්ගේ එකතුව	ශ්‍රී ලංකාව තුළ ඒකදේශික එකතුව
සත්ව වර්ගයා	මත්ස්‍ය	46	5	82	44
	ඉස්සෝ	14	-		
	උභය ජීවීන්	17	4	119	103
වෘක්ෂලතා	මුහුදු තෘණ භූමි	4	-		
	කඩොලාන	18		20	

මූලාශ්‍රය - ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පරිසර ආකෘතිය, 2017.

සිතියම් අංක 3.1 - මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ නීල හරිත ජාලය



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

3.2 වෙරළ තීරවල ප්‍රශස්ථ මට්ටමෙන් භාවිතා නොවීම.

ක්‍රියාශීලී විවෘත හා විනෝදාත්මක ස්ථාන ලෙස නිර්මාණය කිරීම සඳහා නගරයේ වෙරළ තීරය ප්‍රධාන භූමිකාවක් ඉටුකරයි.ස්පාඤ්ඤයේ බාසිලෝනා නගරය,ඇමරික් එක්සත් ජනපදයේ පැනමා නගරය, ස්පාඤ්ඤයේ බෙනිඩෝම් නගරය,කැලිෆෝනියාවේ ශාන්ත කෲස් වෙරළ ලෝකයේ අනන්‍යතාවය පෙන්වන වෙරළ තීරයන් වේ. එය සංචාරකයින් සඳහා යෝග්‍ය ගමාන්තයකි.මීගමුව සතුව කිලෝමීටර් 24 ක් දිග ඍජු වෙරළ තීරය, සරක්කු කන්ද - කැපුන්ගොඩින් ආරම්භ කර බස්නාහිර පළාතේ අවසානය වන මහඔය දක්වා පැවතුනද එම මුහුදු තීරයේ 50% ක පමණ ප්‍රදේශයක් අඩු ආදායම්ලාභී ජනාවාස, නිවාසයන්හි පිටුපස ප්‍රදේශ සහ භාවිතයට නොගන්නා හිස් භූමි ලෙස පවතින බවට මෑතකදී කරන ලද දෘශ්‍යය ඡායාරූප සමීක්ෂණය සහ ඉඩම් පරිහරණ විශ්ලේෂණයේ දක්වා ඇත. එය රූප සටහන් 3.3,3.4,3.5 සහ 3.6.මගින් නිරූපණය කරයි.

වගු අංක - 3.2 මීගමුව වෙරල තීරය දිගේ ඉඩම් පරිහරණ ප්‍රතිශතය සංයුතිය

නම	ප්‍රදේශය (වර්ග මීටර්))	ප්‍රතිශතය
A&B මාර්ග	0.089	1.64
සුසාන භූමි	0.0125	0.23
පොල්	0.6167	11.37
වාණිජ	0.2042	3.77
අධ්‍යාපන	0.06	1.11
ධීවර	0.0229	0.42
ක්‍රීඩා භූමි	0.0511	0.94
ගෙවතු	0.7107	13.11
හෝටල්	0.4804	8.86
කර්මාන්ත	0.0066	0.12
ආයතනික	0.0136	0.25
ප්‍රාදේශීය මාර්ග	0.2105	3.88
මිශ්‍ර බෝග	0.0529	0.98
විවෘත අවකාශ හා හිස් ඉඩම්	0.4919	9.07
පොදු සේවා	0.0204	0.38
විනෝද කටයුතු	0.0054	0.10
ආගමික කටයුතු	0.049	0.90
නේවාසික	1.494	27.55
වැලි බිම්	0.7906	14.58
තෘණ භූමි	0.0064	0.12
භාවිත නොකළ ප්‍රදේශ	0.0293	0.54
හිස් ඉඩම්	0.0045	0.08

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූප සටහන 3.1 - මීගමුව වෙරළ තීරය දිගේ ඉඩම් පරිහරණ



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූප සටහන 3.2 -බ්‍රවුන්ස්වෙරළ භූමිය



රූප සටහන 3.4- ඒතුකාල භූමිය

රූප සටහන 3.3 - මීගමුව වෙරළ තීරය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූප සටහන 3.5- මෝරවල භූමිය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සීමිත ප්‍රවේශකත්වය මුහුදු වෙරළ ප්‍රශස්ථ භාවිතයක් සඳහා යොදා නොගැනීමට තවත් හේතුවක් වන අතර වෙරළ තීරයේ සිදුවන තිරස් හා සිරස් සංවර්ධනය හේතුවෙන් මුහුදු වෙරළට ඇතුළුවීම සීමා වේ. මෙයට හේතුවක් වශයෙන් ප්‍රවේශ මාර්ග කිහිපයක් පමණක් මුහුදු වෙරළ හා සම්බන්ධවීම හඳුනාගත හැකිය. තවද පුළුල් වෙරළ තීරයන් කරවල වේලීම සඳහා යොදා ගන්නා අතර,මෙමගින් ඇතිවන දුර්ගන්ධය හේතුවෙන් ආගන්තුකයින් පැමිණීම සීමාවී ඇත.පහත සදහන් හරස්කඩ මගින් ප්‍රවේශකත්වයේ පවතින බාධක පෙන්නුම් කරයි.

රූප සටහන 3.6 ඒතුකාල ප්‍රදේශයේ හරස්කඩ

රූප සටහන 3.8- දූව ප්‍රදේශයේ හරස්කඩ



රූප සටහන 3.9 - පිටිපන ප්‍රදේශයේ හරස්කඩ



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූප සටහන 3.7 හරස්කඩ පිහිටීම

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

3.3 කලපුවේ සහ එහි අවට ප්‍රදේශයේ නොගැලපෙන ඉඩම් භාවිතය

මීගමුව කලපුව ධීවර කර්මාන්තය හා සෘජුව සම්බන්ධ වන අතර, නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා දායක වේ. එය ප්‍රදේශයට දර්ශනීය සුන්දරත්වයක් ඇති කරන අතර, සංචාරක ගමනාන්තයක් ජනනය කරයි. ලෝකයේ කලපු පිළිබඳ විවිධ සිද්ධාන්ත සලකා බැලීමේදී කලපු ජලය සහ විනෝදාස්වාද සහ රැස්වීම් අවකාශයන් සහ ඇවිදින මංතීරු, සංචාරකයින් විශාල ප්‍රමාණයක් ආකර්ශනය කරයි.

වර්තමානයේදී කලපුව භාවිත කරන ආකාරයට එහි පවතින සුන්දරත්වය හා දෘෂ්‍ය ආකර්ශනය අධෛර්යමත් කරන අතර, කලපුව හා එහි අවට අපද්‍රව්‍ය බැහැර කිරීම, බෝට්ටු නැංගුරම් ස්ථාන ලෙස භාවිතා කිරීම, ගෙවතු සහ ජනාවාසයන්හි පිටුපස ප්‍රදේශ ලෙස පැවතීම මෙයට හේතුවී ඇත.දෘශ්‍යය ඡායාරූප ශිල්ප සමීක්ෂණයේදී ඉහත සදහන් කරුණු තහවුරු කර ඇත.

රූප සටහන 3.10- පිටිපන භූමිය දර්ශනය

රූපසටහන3.12-මුන්නක්කරය

රූපසටහන 3.1.3- කටුනායක

රූපසටහන 3.14- දුන්ගල්පිටිය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූප සටහන 3.11 නොගැලපෙන ඉඩම් භාවිත නිරූපණහි පිහිටීම

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

3.4 ඇල මාර්ග ජලය සහ මහ ඔය හා අවට ප්‍රදේශය ප්‍රශස්ථ මට්ටමෙන් භාවිතයකට නොගැනීම.

ඇල මාර්ග හා ගංගා නගරවලදී ඔවුන්ගේ භූමිකාව ඉටුකරන ආකාරය හඳුනා ගැනීම සඳහා ඇල මාර්ග හා ගංගා සඳහා වූ සංසන්දනාත්මක විශ්ලේෂණය සිදුකර ඇත. විශේෂයෙන්ම බර්මින් හැම්, එංගලන්තය, දකුණු දිල්ලි හරිත මාර්ගය, චුනස්කොමාටකට් සහ ප්‍රොවිඩන්සි ගංගා, ඉන්දියානා පොලිස් ඇල පදික මාර්ගය මේ සඳහා යොදාගෙන ඇත.ඔක්ලහොමා නගරය, ඇල මාර්ග හා ගංගා භාණ්ඩ ප්‍රවාහනය සඳහා පමණක් නොව ක්‍රියාකාරී පොදු අවකාශයන්, ඇවිදින මංතීරු සහ දීර්ඝ පාගමන්, ත්‍රාසය මූලික කරගත් ක්‍රීඩා ස්ථාන සහ සංස්කෘතික කාර්යයන් මූලික කරගත් අවකාශයන් සදහා යොදාගෙන ඇත. මෙම කරුණු පහත සඳහන් වගුව 3.2 හා රූප සටහන 16 මගින් දක්වා ඇත.

මීගමුව හරහා ගලා බසින ප්‍රධාන ඇල හැමිල්ටන් ඇල වන අතර, ගංගාව මහඔය වේ.මෙම ජලධාරා ජලජ පරිසර පද්ධතියේ ප්‍රධාන අංගයන් වුවද ඇල ඉවුර හා ගංගා ආශ්‍රිත ප්‍රදේශවලින් 51% ක අවභාවිතා කරන අතර, එම ප්‍රදේශ නිවාසවල පිටුපස ප්‍රදේශ ලෙසත්,බෝට්ටු නැංගුරම් ප්‍රදේශ ලෙසත් භාවිතා කරයි. මෙමගින් සංචාරක ආකර්ශනය තවදුරටත් හීන වේ.වර්තමානයේදී හැමිල්ටන් ඇල සංචාරක බෝට්ටු සේවාවන් සඳහා භාවිතා කරයි. ඇල මාර්ග ඔස්සේ බෝට්ටු නැංගුරම් දැමීමෙන් ක්‍රියාකාරී ජල ප්‍රවාහනයට බාධා ඇති වේ.

වගු අංක 3.3- හැමිල්ටන් ඇල සහ එහි අවට ඉඩම් භාවිතය

භූමි භාවිතය	භූමි ප්‍රමාණය (වර්ග කිමී)	%
A හා B වර්ගයේ මාර්ග	0.046	1.18
පොල්	0.3372	8.67
වාණිජ	0.6221	15.99
අධ්‍යාපන	0.1477	3.80
හිස්භූමි	0.029	0.75
නේවාසික	0.4577	11.76
හෝටල්	0.1773	4.56
ප්‍රාදේශීය මාර්ග	0.2106	5.41
වගුරු බිම්	0.0223	0.57
මිශ්‍ර වෘක්ෂ ලතා	0.0601	1.54
විවෘත ප්‍රදේශ හා හිස් භූමි ඉඩම්	0.1104	2.84
පොදු පහසු කම්	0.0019	0.05
දුම්රිය මාර්ග	0.0082	0.21
ආගමික	0.0698	1.79
නේවාසික	1.527	39.24
වැලි සහිත භූමි	0.0116	0.30
වගා නොකල භූමි	0.524	1.35

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය 2021

රූපසටහන 3.15- හැමිල්ටන් ඇල සහ එහි අවට ඉඩම් භාවිතය



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය 2021

3.5 කලපුව සහ අවට ප්‍රදේශය අනවසරයෙන් අල්ලා ගැනීම.

පරිසර විද්‍යාත්මක හෝ ජීව විද්‍යාත්මක වශයෙන් වැදගත් මුහුදු ප්‍රදේශ සඳහා විද්‍යාත්මක නිර්ණායක විස්තර කරන පර්යේෂණ අධ්‍යයනය මගින් නිරූපණය කරනු ලබන්නේ “මීගමුව කලපුව ශ්‍රී ලංකාවේ වඩාත්ම ඵලදායී මෝය වන බවයි”.මීගමු කලපුව දකුණේ සිට උතුර දක්වා කිලෝ මීටර් 12 ක දිගකින් යුක්ත වන අතර, වඩාත්ම පුළුල් ස්ථානය කිලෝ මීටර් 3.75 ක් පළල වේ.නොයෙක් කාර්යයන් සඳහා කලපුව යොදා ගැනීම හේතුවෙන් එහි භූමි ප්‍රමාණය අඩුවී ඇත.වාර්ෂිකව සංසන්දනය කිරීමේදී එය පැහැදිලිව හඳුනාගත හැක.1995 වර්ෂයේදී ආසන්න වශයෙන් හෙක්ටයාර් 3200 ක පමණ ප්‍රදේශයක් ආවරණය වූ අතර, 2017 වර්ෂයේදී දළ වශයෙන් හෙක්ටයාර් 2100 ක ප්‍රදේශයක් ආවරණය කරයි.අනවසරයෙන් අල්ලා ගැනීම හේතුවෙන් හෙක්ටයාර් 1100 ක් පමණ භූමි ප්‍රමාණයක් අඩුවී ඇත.මෙම සංසිද්ධියේ ප්‍රතිඵලයක් ලෙස නිල්සිරි ගම්මානය ඉස්මතු වී ඇත.දැනට මෙම ගම්මානයේ ජනාවාස 820ක් පමණ විසිරී ඇත. ප්‍රදේශයේ ජනතාව විසින් නාගරික සංවර්ධන අධිකාරියේ නීති උල්ලංඝනය කරමින් රක්ෂිත ප්‍රදේශයන්හි නිවාස හා මාර්ග ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත.

රූපය 3.16 - කලපුව අනවසරයෙන් අල්ලා ගැනීම විදහා පෙන්වීම



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

NDVI විශ්ලේෂණය මගින් කලපුවෙහි ඉදිකරන ලද නීත්‍යානුකූල නොවන ඉදිකිරීම් හේතුවෙන් කලපුවේ හැඩය සහ ඒ අවට පරිසරය වෙනස්වී ඇති ආකාරය සවිස්තරාත්මකව දක්වා ඇත.එය සිතියම 3.2 මගින් දක්වා ඇත.

සිතියම 3.2 – මීගමුව සඳහා NDVI විශ්ලේෂණය, 2005 - 2017



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

04 වන පරිච්ඡේදය



සංවර්ධන සැලසුම් රාමුව

04 වන පරිච්ඡේදය

සංවර්ධන සැලසුම් රාමුව

4.1 දැක්ම

"නීල හරිත තලයෙන් නැගෙන පුංචි රෝමය "

4.2 දැක්මෙහි ප්‍රකාශනය

මීගමුව මහානගර සභා බල ප්‍රදේශයට උරුමවූ මූලික හරයන් සහ පවතින විභවතා හඳුනා ගෙන මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහා දැක්ම සකස් කරන ලදී. එයින් භාවිතා කරන ලද ගැඹුරු අර්ථයන් අනාගත සැලසුම් සහ ප්‍රදේශයේ සැලසුම්කරණය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදෙයි.

ස්වාභාවික වෙරළ ආශ්‍රිත වෙරළබඩ හා අභ්‍යන්තර ජලජ සම්පත් හා ශාක පද්ධතිය **නීල හරිත තලය** ලෙස හැඳින්වේ. වෙරළාසන්නව පිහිටි ජල ධාරා සහ ඒ හා මුසුවූ ජල තීර වන මුහුද, මුහුදු වැලි සහිත වෙරළ කලපුව, මා ඔය සහ හැමිල්ටන් ඇල යන අංගයන්ගෙන් සමන්විතවූ නීල හරිත තලය නිර්මාණය කිරීමට ඉහත සඳහන් ස්වාභාවික අංගයන් පදනම් වේ. මූලික වශයෙන් මීගමුව ස්වයංපෝෂිත ආර්ථිකයක් මුල්කරගෙන ඇති අතර, එය සංචාරක කර්මාන්තය, ධීවර, වාණිජ හා අනෙකුත් අංශයන් ඔස්සේ සේවාවන් සපයයි. මීට අමතරව ප්‍රදේශයේ ආර්ථිකය ගොඩ නැගීම සඳහා හඳුනාගෙන ඇති නීලහරිත ජාලය සහ යටිතල පහසුකම්, ප්‍රදේශයේ ජෛව විවිධත්වය, වෙළඳ ප්‍රදේශය සහ විශේෂිත ප්‍රදේශ මීගමුව නගර ආර්ථිකය වැඩිදියුණු කිරීමට දායක වේ. මෙම ස්වයංපෝෂිත නගර ආර්ථිකය සමෘද්ධිමත්, නවීන පන්නයේ බටහිර සංස්කෘතියක් සහිත නගරයක් ලෙස හැඳින්වීම සඳහා දායක වේ. රෝම වාතාවරණයෙන් යුක්ත බටහිර නවීන සංස්කෘතිය, පල්ලි ජාලය, නොයෙකුත් ශිල්පීය ක්‍රම හා බැඳුනු කතෝලික ප්‍රජාව හා කතෝලික ක්‍රියාකාරකම් සහ උත්සව මගින් පිළිඹිබු වේ. මෙම අනන්‍යවූ සංසිද්ධියට අනුව මීගමුව සැලසුම් ප්‍රදේශය ශ්‍රී ලංකාවේ පිහිටි **කුඩා රෝමය** ලෙස හැඳින්විය හැක. අවසාන වශයෙන් මීගමුව සැලසුම් ප්‍රදේශය ප්‍රදේශවාසීන්ට මෙන්ම විවිධ අවශ්‍යතාවයන් සඳහා මීගමුව මහානගර සභා බල ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින්ට ගමනාන්තයක් ලබාදේ.

4.3 අරමුණු

මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහාවූ දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රධාන අරමුණු දෙකක් සකස් කරන ලදී.

01 විවිධ ජල සමතුලිතතාවයන් අතර අන්තර් සබඳතා ඇතිකිරීම තුළින් ස්වයං පෝෂිත නගර ආර්ථිකයක් නිර්මාණය කිරීම.

02 මීගමුව නගරයේ ඇති ප්‍රතිරූපය නගරයට අනන්‍යවූ රෝමානු වාතාවරණය තුළ විශාලනය කිරීම.

4.4 පරමාර්ථ

ඉහත දක්වා ඇති අරමුණු මූලික කරගෙන පහත සඳහන් පරමාර්ථ හඳුනා ගන්නා ලදී.

අරමුණ 01 විවිධ ජල සමතුලිතතාවයන් අතර අන්තර් සම්බන්ධතා ඇතිකිරීම තුළින් ස්වයං පෝෂිත නගර ආර්ථිකයක් නිර්මාණය කිරීම.

පරමාර්ථ

- භෞතික සම්බන්ධතාවය පවත්වාගෙන යමින් 2030 වර්ෂය වන විට හෙක්ටයාර් 1200 ක් වන මීගමු කලපුව හෙක්ටයාර් 156.3 ක් වන මහඔය සහ හෙක්ටයාර් 101.215 වන හැමිල්ටන් ඇළ ඇතුළු ප්‍රදේශයේ පවතින හෙක්ටයාර් 1458 ක් වන මුළු ජලාශ ප්‍රමාණය කළමනාකරණය කිරීම.
- 2030 වන විට සංවර්ධන සහ විනෝද කටයුතු සඳහාවූ ව්‍යාපෘති සඳහා 50% ක ජල තීරයක් විවෘත කිරීම.
- 2030 වර්ෂය වන විට මීගමුව කලපුව අනවසරයෙන් අල්ලා ගැනීම වැළැක්වීම සඳහා මීටර් 10 ක් පළල් වූ සංරක්ෂණ ක්‍රාන්ති කලාපයකින් යුත් ප්‍රදේශයක් පවත්වාගෙන යෑම.
- 2025 වර්ෂය වන විට අභ්‍යන්තර ජල පෝෂක යොදා ගනිමින් මීගමුව හරහා කොළඹ සිට පුත්තලම දක්වා ප්‍රාදේශීය මට්ටමේ ජල ප්‍රවාහන සම්බන්ධතාවයක් හඳුන්වාදීම සහ පවත්වාගෙන යෑම.
- 2030 වර්ෂය වන විට මීගමුව ධීවර වරාය 25% ක් දක්වා සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම.
- 2030 වර්ෂය වන විට ධීවර ගම්මානයක් ඉදිකිරීම සඳහා ලෙල්ලම ප්‍රදේශයෙන් හෙක්ටයාර් 05 ක භූමි ප්‍රමාණයක් වෙන් කිරීම.
- කැපුන්ගොඩ, තලාහේන, සරක්කු කන්ද, මොරවල, දුන්ගල් පිටිය, දූව, වැල්ල වීදිය, ඒතුකාල, ලුවිස් පෙදෙස සහ පෝරුතොට යන ප්‍රදේශවල අලුතින් සංචාරක ආකර්ශන ස්ථාන 10 ක් හඳුන්වාදීම සහ දැනට පවතින සංචාරක ආකර්ශන ස්ථාන 5 ක් වැඩිදියුණු කිරීම.

අරමුණ

02

මීගමුව නගරයේ ප්‍රතිරූපය නගරයට අනන්‍යවූ රෝමානු වාතාවරණය තුළ විශාලනය කිරීම.

පරමාර්ථ

- 2030 වන විට මීගමුව ලන්දේසි කොටුව හා ඒ අවට ප්‍රදේශයේ හෙක්ටයාර් 10 ක් පුනර්ජීවනය කිරීම.
- 2020 වන විට රෝම ගෘහ නිර්මාණාත්මක ආභාෂයෙන් ඉදිවූ හඳුනාගත් ගොඩනැගිලි 28 නීත්‍යානුකූල කිරීම.
- 2020වන විට හඳුනාගත් නාගරික හා සංස්කෘතික උත්සව සඳහා පහසුකම් සැලසීම.
- 2030 වන විට හඳුනාගත් කුඩා රෝම ප්‍රදේශය, ලෙල්ලම හා දර්ශන නැරඹුම් ප්‍රදේශය යන ස්ථානයන්හි පොදු විනෝද කටයුතු ස්ථාන 8 ක් ඇති කිරීම.
- 2025 වන විට කුඩා රෝමය වෙළඳ පොළ ප්‍රදේශය කලපු ප්‍රදේශය හා ආරුක්කු ප්‍රදේශයේ ඒකාබද්ධ වන පරිදි අන්තර් සම්බන්ධිත මාර්ග සහ පහසුකම් සහිත පදික මංතීරු ඇති කිරීම.
- 2030 වන විට වෙළඳ පොළ ප්‍රදේශය අවශ්‍ය පොදු පහසුකම් සහිතව විශේෂිතවූ ව්‍යාපාරික දිස්ත්‍රික්කයක් සඳහා පහසුකම් සැලසීම.

05 වන පරිච්ඡේදය

ශ.දු.අ.ත. විශ්ලේෂණය - SWOT Analysis

05 වන පරිච්ඡේදය

ශ. දු.අ.ත. විශ්ලේෂණය

5.1 සාරාංශගත ශ. දු.අ.ත විශ්ලේෂණය

වගු අංක 5.1.අරමුණු මූලික කරගත් සාරාංශගත ශ. දු.අ.ත විශ්ලේෂණය

අරමුණු 01

විවිධ ජල සමතුලිතතාවයන් අතර අන්තර් සබඳතා ඇතිකිරීම තුළින් ස්වයං පෝෂිත නගර ආර්ථිකයක් නිර්මාණය කිරීම.

ශක්තීන්

මීගමුව නගරයේ පවතින විවිධ ජලාශ්‍රිත ප්‍රදේශ හතර හා බැඳුන භෞතික සම්බන්ධතාවය

- කිලෝමීටර් 12 ක් දිග කලපු තීරයක් පැවතීම.
- සැලසුම් ප්‍රදේශය තුළ මීගමුව කලපුවේ හෙක්ටයාර් 2100 ක සමස්ථ භූමි ප්‍රමාණයක් පැවතීම.
- සැලසුම් ප්‍රදේශයේ උතුරු මායිම කිලෝමීටර් 15 ක් දිග මහඔය වීම.
- කිලෝමීටර් 24 ක් දිග මුහුදු තීරයක් පැවතීම.
- හැමිල්ටන් ඇළෙහි කිලෝමීටර් 7.65 ක් දිගින් සහ මීටර් 10 ක පළලින් යුත් උතුරු කොටස මීගමුව කලපුව හා සම්බන්ධවීම.

කලපුව සහ මුහුද සමඟ මුහුවූ සුවිශේෂී භූදර්ශනයක් සහ ජෛව විවිධත්වය සහිත බස්නාහිර කලාපයේ පිහිටි එකම නගරය මීගමුව වීම.

කලාපීය වශයෙන් පහසුකම් සපයන්නා ලෙස එහි භූමිකාව ඉටුකිරීම.

- 75000 වන සංසරණ ජනගහණය
- **පරිපාලන** - උසාවි සංකීර්ණය, රාජ්‍ය ආයතන, බන්ධනාගාරය
- **ප්‍රවාහන යටිතල පහසුකම්** - බස් මාර්ග 31 ක් සහිත ප්‍රධාන බස්නැවතුම්පළ සහ දුම්රියපළ
- **භෞතික අපරවුහ පහසුකම්** - විදුලිය : 98% , ජල සැපයුම : 95%
- **සමාජීය අපරවුහ පහසුකම්** - දිස්ත්‍රික් රෝහල, පාසැල් 44 ක් සහ අධ්‍යාපන ආයතන 7 ක් පිහිටා තිබීම.

...

තෙවන වැදගත් ධීවර වරාය ලෙස සැලකෙන මීගමු ධීවර වරාය පිහිටීම සහ එමගින් ජාතික ආර්ථිකයට 16% ක දායකත්වය

ශ්‍රී ලංකාවේ ඉස්සන් නිෂ්පාදනයෙන් 15% ක් මීගමුව ආශ්‍රිත ධීවර කටයුතුවලින් දායකවීම.

පවත්නා ධීවර ආශ්‍රිත පහසුකම්

- ශීතාගාර - 13, බෝට්ටු - 3024, මාදැල් පාරු - 22

මීගමුව නගරයේ ජනගහනයෙන් 8% ක් ධීවර කර්මාන්තයේ නියැලීම.

A3 ප්‍රධාන මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සහ පුත්තලම - කොළඹ දුම්රිය මාර්ගය පැවතීම හේතුවෙන් මීගමුව නගරය ගම්පහ දිස්ත්‍රික්කයේ වඩාත්ම සම්බන්ධතා ඇති නගරය වීම.

කටුනායක ජාත්‍යාන්තර ගුවන්තොටුපළ හා කටුනායක අපනයන ප්‍රවර්ධන කලාපය මීගමුව නගර ආසන්නයේ පිහිටීම සහ විනාඩි 15 ක පමණ කෙටි කාලයකින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ අගනගරය වන කොළඹ නගරයට පිවිසීමේ හැකියාව

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් 7% ක ප්‍රමාණයක් මීගමුව නගරයට පැමිණෙන අතර, එය වාර්ෂිකව 350,000 ක අගයක් ගැනීම.

දුර්වලතා

ප්‍රදේශයේ පවතින ජල තීරයන්හි වැඩි ප්‍රමාණයක් සංවර්ධනයන්හි පිටුපස ප්‍රදේශය ලෙස පැවතීම.

- කලපු තීරය - 50 %
- මුහුදු තීරය - 50%
- ඇළ තීරය - 50%

මීගමුව කලපුව අනවසරයෙන් අල්ලා ගැනීම ක්‍රමානුකූලව වර්ධනය වීම.

- 1995 – 3200 හෙක්ටයාර (Ha)
- 2017 – 2100 හෙක්ටයාර (Ha)

ප්‍රදේශයට අනන්‍යවූ ජල සම්පත් අවිධිමත් ලෙස භාවිතා කිරීම.

- හැමිල්ටන් ඇළ
- වෙරළ
- කලපුව

බෝට්ටු නැංගුරම කිරීම හේතුවෙන් මීගමු කලපුව දූෂණය වීම සහ තෙල් කාන්දුව හේතුවෙන් ජලය අපවිත්‍රවීම.

මෝටර් බෝට්ටු හේතුවෙන් කම්පන බලපෑම්.

- කලපුවේ භෞතික ආකෘතියට වන බලපෑම්
- කඩොලාන වර්ග 10% ක වේගයකින් පහත වැටීම.

ධීවර කටයුතු සහ ඒ හා බැදුනු අනෙකුත් මැදිහත්වීම හේතුවෙන් ජල දූෂණය හා ස්වාභාවික දර්ශනීය ස්ථාන අඩුවීම.

අවස්ථා

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මීගමුව කලපුව සංරක්ෂිත කලාපයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට ගෙන ඇති යෝජනාව

බස්නාහිර පළාත් මහනගර සැලැස්ම මගින් ජල ප්‍රවාහන මාධ්‍යයක් ලෙස හැමිල්ටන් ඇළ හඳුනා ගැනීම.

යෝජිත ගුවන් තොටුපළ නගර ව්‍යාපෘතිය මගින් විශාල වශයෙන් දේශීය මෙන්ම විදේශීය ජනගහනයක් ප්‍රදේශය කරා ආකර්ශනය කර ගැනීම.

තර්ජන

කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉදි කිරීම් කටයුතු නිසා මත්ස්‍ය අභිජනනයට සහ මත්ස්‍ය ජෛව විවිධත්වයට බාධා ඇතිවීම.

මුහුදු අභස් යාත්‍රා කලපුවට ගොඩ බෑමේදී මත්ස්‍ය අභිජනන ස්ථානවල ඇතිවන කම්පනය

අරමුණු 02

මීගමුව නගරයේ ඇති ප්‍රතිරූපය නගරයට අනන්‍යවූ රෝමානු වාතාවරණය තුළ විශාලනය කිරීම.

ශක්තීන්

මීගමුව මහනගර සභා බල ප්‍රදේශය තුළ කතෝලික පල්ලි 83 ක් පැවතීම සහ ඔවුන් හා බැදුණු සුවිශේෂී අනන්‍ය කතෝලික සංස්කෘතිය.

වාස්තු විද්‍යාත්මක ආභාෂය සහිත ගොඩනැගිලි 28 ක් පැවතීම.

ප්‍රදේශයේ ජනගහනයෙන් 7% ක් පමණ ප්‍රමාණයක් ඉතාලිය හා යුරෝපීය රටවල රැකියාවේ නිරත වී ඇති නිසා බටහිර නවීකරණ සංස්කෘතික බලපෑම.

කතෝලික ප්‍රජවගෙන් 70% ක් පමණ ප්‍රමාණයක් ඉතාලිය හා යුරෝපීය රටවල රැකියාවේ නිරතවී ඇති නිසා බටහිර නවීකරණ සංස්කෘතික බලපෑම.

කතෝලික ප්‍රජාවගෙන් 70% ක් පමණ කතෝලික සංස්කෘතියක් ආශ්‍රිත සමෘද්ධිමත් පරිසරයක් සඳහා දායකවීම.

ප්‍රදේශයේ වාර්ෂික සංචාරකයින් 350,000 (ශ්‍රී ලංකාවේ මුළු සංචාරක සංඛ්‍යාවෙන් 18% ක්) සහ ස්වදේශිකයන් සමඟ පවතින අන්තර් සම්බන්ධතාවය නිසා නවීකරණය කරන ලද බටහිර සංස්කෘතිය ශක්තිමත් වීම.

වසර පුරා සිදුවන ආගමික සමාජීය සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් මගින් ප්‍රදේශයට අනන්‍යවූ සංස්කෘතියට දායකවීම.

...

සාම්ප්‍රදායික කතෝලික සංස්කෘතිය හා බටහිර නවීකරණය කරන ලද සංස්කෘතිය හා බැදුණු විශේෂිතවූ ප්‍රජා චර්යාව හේතුවෙන් දිවා රාත්‍රී කාලයන්හිදී නගරය ප්‍රබෝධමත් වීම.

1678 වර්ෂයේදී ඉදිකර ඇති ලන්දේසි කොටුව පැවතීම.

දුර්වලතා

දැනට පවත්නා ලන්දේසි කොටුව ක්‍රමානුකූලව පිරිහීම.

නොසැලකිල්ල හේතුවෙන් රෝම ගෘහ නිර්මාණ ශිල්පයට අනුව පවතින පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ගොඩනැගිලි හා ස්මාරක ක්‍රමයෙන් පිරිහීම.

අවස්ථා

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ගොඩනැගිලි 6 ක් සංරක්ෂණය කිරීම සඳහා වැඩසටහන් ඉදිරිපත් කිරීම.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මීගමුව කලපු ප්‍රදේශය සංරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට ගෙන ඇති යෝජනාව.

බස්නාහිර පළාත් මහනගර සැලැස්ම මගින් ජලප්‍රවාහන මාධ්‍යයක් ලෙස හැමිල්ටන් ඇළ හඳුනා ගැනීම.

යෝජිත ගුවන්තොටුපළ නගර ව්‍යාපෘතිය මගින් විශාල වශයෙන් දේශීය මෙන්ම විදේශීය ජනගහනයක් ප්‍රදේශය කරා ආකර්ශනය කර ගැනීම.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් භාරගෙන ඇති යෝජිත නිවාස සංවර්ධන ව්‍යාපෘතිය

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජාත්‍යන්තර සාප්පු සංකීර්ණ ව්‍යාපෘතිය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

5.2 විස්තරාත්මක SWOT විශ්ලේෂණය

අරමුණු 01

විවිධ ජල සමතුලිතතාවයන් අතර අන්තර් සබඳතා ඇතිකිරීම තුළින් ස්වයං පෝෂිත නගර ආර්ථිකයක් නිර්මාණය කිරීම.

ශක්තින් (S) :

S1 - මීගමුව මහනගර සහා බල ප්‍රදේශයේ පවතින විවිධ ජල ප්‍රභේද 4 හි අඛණ්ඩ භෞතික සම්බන්ධතාවය

මෙම අඛණ්ඩ භෞතික සම්බන්ධතාවය සක්‍රීය වී ඇත්තේ කිලෝමීටර් 12 ක දිගින් යුතු මීගමු කලපුතීරය සහ හෙක්ටයාර් 2100 ක විශාලත්වයෙන් යුතු මීගමු කලපුව සැලසුම් ප්‍රදේශයේ පිහිටීම හේතුවෙනි.එය සිතියම 5.1. මගින් දක්වනු ලබයි.

මීගමුව කලපුව මීගමුව ප්‍රදේශය සඳහා පවතින ජල විභවයක් වේ. එය හෙක්ටයාර් 2100 ක් විශාලත්වයකින් යුක්ත වන අතර, මීගමුව මහනගර සභා බලප්‍රදේශය තුළ කිලෝමීටර් 12 ක ජල තීරයක් විවෘතව ඇත.

- සැලසුම් ප්‍රදේශය උතුරින් කිලෝමීටර් 15 ක දිගින් යුත් මහඔයෙන් මායිම් වීම.
- කිලෝමීටර් 24 ක වෙරළ තීරයක් පැවතීම.
- හැමිල්ටන් ඇලෙහි කිලෝමීටර් 7.65 ක දිගින් සහ මීටර් 10 ක පළලින් යුත් උතුරු කොටස මීගමුව කලපුව හා සම්බන්ධවීම.

මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේකිලෝමීටර් 24 ක් දිග වෙරළ තීරයක් පිහිටා ඇති අතර, එය මීගමුව කලපුව, මහඔය, මුහුද සහ හැමිල්ටන් ඇලෙන් වටවී ඇත. මෙම ප්‍රධාන ජල අවකාශයන් හතර විවිධාකාර අත්දැකීම් සපයයි.මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ උතුරු දිශාවේ පිහිටා ඇති මහ ඔය සහ අනෙකුත් අතු ගංගාවලින් අභ්‍යන්තර ජල මාර්ගයන් පිළිබඳවද, හැමිල්ටන් ඇල සහ කලපුව මගින් කිවුල් ජලය පිළිබඳවද අත්දැකීම් ලබාදෙයි. මුහුදු ජලයේ අත්දැකීම් මුහුද මගින් මිනිසුන් හට මෙන්ම සියලුම ස්වාභාවික සත්ව වර්ගයාට සහ වෘක්ෂලතාදියට ලබාදේ. මෙම මුහුද සහ කලපුව සමඟ මුසුවූ මෙම සුවිශේෂීවූ භූදර්ශනය සහිත බස්නාහිර කලාපයේ පිහිටි එකම නගරය මීගමුව වේ.

සිතියම 5.1 මීගමුව කලපුව සහ එහි ජල තීරය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය 2021

සිතියම 5.2: මීගමුව මහානගර සහා බල ප්‍රදේශයේ අද්විතීය ජල පරිසරයේ ලක්ෂණ



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය 2021

S2 - මුහුද සහ කලපුව සමඟ මුසුවූ මෙම සුවිශේෂීවූ භූදර්ශනය සහ ජෛව විවිධත්වය සහිත බස්නාහිර කලාපයේ පිහිටි එකම නගරය මීගමුව වීම.

කලපුව හා වෙරළ ප්‍රදේශය සුවිශේෂීවූ ජෛව විවිධත්වයකින් යුක්ත වන අතර, එමගින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ සුවිශේෂීවූ ප්‍රතිරූපය නිර්මාණය කරයි. එය වගුව 5.2 හා 5.3 මගින් දක්වනු ලබයි.

වගු අංක 5.2: මීගමුව කලපු ප්‍රදේශයේ ජෛව විවිධත්වය

මීගමුව කලපු ප්‍රදේශය			
සත්ව වර්ගයා	සත්ව විශේෂය	සංඛ්‍යාව	ඒකදේශික
	පක්ෂීන්	96	5
	සංක්‍රමික පක්ෂීන්	44	-
	උරගයින්	39	8
	සර්පයින්	23	4
	උභයජීවී	17	4
	කෘමීන්	72	5
	මාළු	46	5
	ඉස්සන්	14	-
වෘක්ෂලතාදිය	කඩොලාන	18	-
	මුහුදු තෘණ පාත්ති	04	-

මූලාශ්‍රය - ජාතික ජලජ සම්පත් ආයතනය,2017

වගු අංක 5.3: මීගමුව වෙරළ ප්‍රදේශයේ ජෛව විවිධත්වය

මීගමුව වෙරළ ප්‍රදේශය			
සත්ව වර්ගයා	සත්ව විශේෂය	සංඛ්‍යාව	ඒකදේශික
	පක්ෂීන්	96	5
	සංක්‍රමික පක්ෂීන්	44	-
	උරගයින්	39	8
	උභයජීවීන්	23	4
	කෘමීන්	17	5
	රීඩ්බෙඩ්ස්	14	-
වෘක්ෂලතාදිය	ලිටෝරට් බෙඩ්ස්	04	

මූලාශ්‍රය - ජාතික ජලජ සම්පත් ආයතනය,2017

S3 - නෙවන වැදගත් ධීවර වරාය ලෙස සැලකෙන මීගමු වරාය පිහිටීම සහ එමගින් ජාතික ආර්ථිකයට 16% ක දායකත්වය

S4 - ශ්‍රී ලංකාවේ ඉස්සන් නිෂ්පාදනයෙන් 15% ක් මීගමුව ආශ්‍රිත ධීවර කටයුතුවලින් දායකවීම.

S5 - පවත්නා ධීවර ආශ්‍රිත පහසුකම් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේපවතින ධීවර ආශ්‍රිත පහසුකම් ලෙස ශීතාගාර 13 ක් ද , බෝට්ටු 3024 ක් සහ මාදැල් පාරු 22 ක් හැදින්විය හැක.

S6 - මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේමුළු ජනගහනයෙන් 8% ක් ධීවර ආශ්‍රිත කටයුතුවල යෙදී සිටීම.

S7 - ස්වාභාවික අභිජනන ස්ථාන 17 ක් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පිහිටීම සහ විශේෂයෙන් මීගමුව කලපුවේ අභිජනන ස්ථාන සාරවත් බවකින් යුක්තවීම.

සිතියම 5.3: මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේමත්ස්‍ය අභිජනන ස්ථාන



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය 2021

S8 -කලාපීය පහසුකම් සපයන්නා ලෙස මීගමුව එහි භූමිකාව ඉටුකිරීම.

වගු අංක 5.4 කලාපීය පහසුකම් සපයන්නා ලෙස මීගමුව එහි භූමිකාව ඉටුකිරීම

භෞතික	සමාජික	පරිපාලන
- ප්‍රධාන බස්නැවතුම් පළ (බස්මාර්ග 31)	- දිස්ත්‍රික් රෝහල	- මහාධිකරණ සංකීර්ණය - සිරගෙදර
- පාසැල් - 44	- සංචාරන ජනගහනය 75,000	-
- විදුලිය - 98%	-	-
- ජල සැපයුම - 95%	-	-
- ඝන ද්‍රව්‍ය අපහරණය කිරීමේ ප්‍රධාන අංගනය කොච්චිකඩේ ඕවිටවත්තේ පිහිටා තිබීම.	-	-

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

S9 - A3 ප්‍රධාන මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හා පුත්තලම - කොළඹ දුම්රිය මාර්ගය මීගමුව සැලසුම් ප්‍රදේශය හරහා ගමන් කිරීම හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ වඩාත්ම සම්බන්ධතා ඇති නගරය වීම.

S10 -කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ හා කටුනායක අපනයන ප්‍රවර්ධන කලාපය මීගමුව නගර ආසන්නයේ පිහිටීම සහ විනාඩි 15 ක පමණ කෙටි කාලයකින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ අගනගරය වන කොළඹ නගරයට පිවිසීමේ හැකියාව.

කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය මීගමුව නගරයට කිලෝමීටර් 7 ක් පමණ ආසන්නයේ පිහිටීම.

S11-ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් 7% ක් පමණ ප්‍රමාණයක් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයට පැමිණෙන අතර, එය වාර්ෂිකව 350,000 ක අගයක් ගැනීම.

මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පවතින නීලහරිත පද්ධතිය හේතුවෙන් වාර්ෂිකව 350,000 ක සංචාරකයින් මෙම නගරයට පැමිණේ. මෙය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙන් 7% ක දායකත්වයක් දක්වයි.

සිතියම 5.4: කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ මීගමුව මහනගර සභා බල ප්‍රදේශයට ආසන්නව පිහිටීම නිරූපණය කිරීම



.මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

දුර්වලතා (W) :

W1 - ප්‍රදේශයේ පවතින ජල ප්‍රභවයන්ගේ එනම්, කලපු තීරය, වෙරළ තීරය සහ හැමිල්ටන් ඇල හි අවිධිමත් භාවිතය හා ජල ප්‍රභවයන් බහුතර ප්‍රමාණයක් නිවාසවල පිටුපස ප්‍රදේශ ලෙසත් පැවතීම.

ප්‍රදේශයේ පවතින ජල තීරයන් එනම්, කලපු තීරය, වෙරළ තීරය සහ ඇල තීරයන්ගෙන් 50% ක් ප්‍රමාණයක් නිවාසවල පිටුපස ප්‍රදේශ ලෙසත්, අඩු පහසුකම් සහිත ජනාවාස ලෙසත් පවතී. මෙම කරුණ භූමි පරිහරණ විශ්ලේෂණයේදී හා මෑතකදී සිදුකරන ලද ඡායාරූප සමීක්ෂණයෙන් තහවුරු කරයි. එය රූප සටහන 5.1,5.2,5.3,5.4.5.5 මගින් තවදුරටත් ද සඳහන් කරනු ලබයි.

රූප සටහන 5.1 කලපුවේ බෝට්ටු නැවතීම.

රූප සටහන 5.3 කලපුවේ කසළ බැහැර කිරීම .

රූප සටහන 5.4 නිවාසයන්හි පිටුපස ප්‍රදේශ

රූප සටහන 5.5 කලපු මුවදොර

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

රූප සටහන 5.2 මීගමුව කලපුව සහ අවට ප්‍රදේශය



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

වගු අංක 5.5: වෙරළ තීරයේ භූමි පරිහරණ ප්‍රතිශතය

නම	භූමි ප්‍රමාණය	ප්‍රතිශතය (%)
A හා B මාර්ග	0.089	1.064
සුසාන භූමි	0.0125	0.23
පොල්	0.6167	11.37
වාණිජ	02042	3.77
අධ්‍යාපන	0.06	1.11
ධීවර	6.0229	0.42
ක්‍රීඩා භූමි	6.0511	0.94
නේවාසික කටයුතු	0.7107	13.11
හෝටල්	0.4804	8.86
කර්මාන්ත	0.0066	0.12
ආයතන	0.0136	0.25
ප්‍රාදේශීය මාර්ග	0.2105	3.88
වෘක්ෂලතා	0.529	0.98
විවෘත ප්‍රදේශ හා හිස් භූමි	0.4919	9.07
පොදු කටයුතු	6.0204	0.38
විනෝද කටයුතු	0.0059	0.10
ආගමික	0.049	0.90
නේවාසික	1.494	27.55
වැලි සහිත භූමි	0.7906	14.58
ලඳු කැලෑ	0.0064	0.12
වගා නොකල භූමි	0.0293	0.54
විවෘත භූමි	0.0045	0.08

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

රූප සටහන 5.6 : මීගමුව වෙරළ තීරය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

රූප සටහන 5.7: බ්‍රවුන්ස් භූමිය සහ ඒතුකාල භූමිය

රූප සටහන 5.8: මෝරවල භූමිය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

W2 මීගමුව කලපුව ක්‍රම ක්‍රමයෙන් අනවසරයෙන් අල්ලා ගැනීම.

මීගමුව කලපුවේ අනවසරයෙන් අල්ලා ගැනීම හේතුවෙන් එහි භූමි ප්‍රමාණය අඩු වෙමින් පවතී. පවතින භූමි ප්‍රමාණය වාර්ෂිකව සැසඳීමේදී මෙම කරුණ පැහැදිලිව හඳුනාගත හැක. 1995 දී මීගමුව කලපුව හෙක්ටයාර් 3200 කින් සමන්විත වූ අතර, 2017 වර්ෂය වන විට එය දළ වශයෙන් හෙක්ටයාර් 2100 දක්වා අඩුවී ඇත. මීගමුව කලපුව අනවසරයෙන් අල්ලා ගැනීම මෙයට හේතුවී ඇත.නිල්සිරිගම ගම්මානය බිහිවීම මෙම සංසිද්ධියේ ප්‍රතිඵලයක් වේ.වර්තමානයේදී මෙම ගම්මානය තුළ ජනාවාස 820 ක් විසිරී ඇත.එය රූප සටහන 3.17 මගින් තවදුරටත් ද සදහන් කරනු ලබයි.

W3 -මීගමුව ප්‍රදේශය අපවිත්‍ර වීම.

බෝට්ටු නැංගුරම් ලෑම හේතුවෙන් මීගමු කලපුව දූෂණය වීම සහ තෙල් කාන්දුව හේතුවෙන් ජලය අපවිත්‍ර වීම.මෝටර් බෝට්ටු හේතුවෙන් මීගමු කලපුව දූෂණය වන අතර, එමගින් ඇතිවන කම්පනය සහ මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ බෝට්ටු ඉදිකිරීමේදී පිට කරන කාබන්ඩයොක්සයිඩ් වායුව හේතුවෙන් කඩොලාන වර්ග අඩුවේ. මේ හේතුවෙන් කඩොලාන වර්ග 10% ක් වේගයකින් අඩුවේ.

රූප සටහන 5.9 :දිස්ත්‍රික්ක අනුව ධීවර යාත්‍රා ගණන



මූලාශ්‍රය - ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

W5 - ධීවර ප්‍රජාව සහ සංචාරක කටයුතු අතර පවතින ගැටීම.

අවස්ථා 01

O1 . වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මීගමුව කලපුව සංරක්ෂිත කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට ගෙන ඇති යෝජනාව.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මීගමුව කලපුව ප්‍රදේශය සංරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට යෝජනා කර ඇත.

O2. බස්නාහිර පළාත් මහනගර සැලැස්ම මගින් හැමිල්ටන් ඇළ ජල ප්‍රවාහන මාධ්‍යයක් ලෙස හඳුනා ගැනීම.

සංචාරක ආකර්ශනය ඇතිකර ගැනීම සඳහා බස්නාහිර පළාත් මහනගර සංවර්ධන සැලැස්ම මගින් හැමිල්ටන් ඇල ඔස්සේ බෝට්ටු මගින් ප්‍රවාහන කටයුතු සිදුකිරීමට යෝජනා කර ඇත.

03. යෝජිත ගුවන් තොටුපළ නගර ව්‍යාපෘතිය මගින් විශාල වශයෙන් දේශීය මෙන්ම විදේශීය ජනගහනයක් ප්‍රදේශය කරා ආකර්ශනය කර ගැනීම.

ගුවන් තොටුපළ නගර ව්‍යාපෘතිය මගින් මීගමුවට යාබදව පිහිටි කටාන ප්‍රදේශයේ අති විශාල සංවර්ධනයක් යෝජනා කර ඇති අතර, ගුවන්තොටුපළ ව්‍යාපාරික නගරය ජාත්‍යන්තර ව්‍යාපාරික පහසුකම්, සම්මේලන මධ්‍යස්ථාන සහ විවිධ උත්සව සහ වැඩ සටහන්, සමාජ සංස්කෘතික, උසස් අධ්‍යාපන සහ නවෝත්පාදන විවිධාකාර වාණිජ සංචාරක ආකර්ශනීය ස්ථාන, සෞඛ්‍ය හා සුවතා පහසුකම් සහිත වාණිජ මිශ්‍රණය මෙයට ඇතුළත් වේ.ගුවන් තොටුපළ ව්‍යාපාරික නගර ව්‍යාපෘතියේ ප්‍රධාන සංවර්ධන අංග වන්නේ වාණිජ හා ව්‍යාපාරික නගර මධ්‍ය සංවර්ධනය, පරිපාලන හා සේවා මධ්‍යස්ථානය, විශ්ව විද්‍යාල සහ අධ්‍යාපන පර්ෂද, ගුවන්සේවා හා නවීන විද්‍යා විශ්ව විද්‍යාල, ව්‍යවසායකත්ව පර්යේෂණ, කර්මාන්ත සහයෝගීවූ අවකාශයන් සංස්කෘතික කොරිඩෝ, කලාව, සංස්කෘතිය, විනෝදාශ්වාදය, සංචාරක හෝටල් සහ මහල් නිවාස, සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන, ව්‍යාපාරික රැස්වීම්, අනෙකුත් රැස්වීම්, විවිධ සිදුවීම්, ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ, ක්‍රීඩා හා විනෝදාත්මක පහසුකම්, සෞඛ්‍ය සංචාරක පර්ශද, සම්භාහන සහ ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන හා සෞඛ්‍ය හා සුවතා පහසුකම්, නාගරික ජනාවාස නංවාලීම, නාගරික නිවාස පොදු පහසුකම්, ප්‍රවේශ මාර්ග, සනීපාරක්ෂක පහසුකම් සහ උද්‍යාන ඇතිකිරීමයි. එය රූපසටහන 5.10 මගින් නිරූපිතය.

රූපසටහන 5.10 : ගුවන් තොටුපළ නගර සැලැස්ම



මූලාශ්‍රය - ගුවන් තොටුපළ නගර සැලැස්ම , 2017-2030

අරමුණු 02

මීගමුව නගරයේ ඇති ප්‍රතිරූපය නගරයට අනන්‍යවූ රෝමානු වාතාවරණය තුළ විශාලනය කිරීම.

O4: ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය මගින් භාරගෙන ඇති මලපවාහන හා සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය ශ්‍රී ලංකාවේ නිරිතදිග නගරවල සනීපාරක්ෂක හා ස්වස්ථතා මූලාරම්භයන් සමඟ ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය යටතේ සන්නද්ධ හමුදා ධජය දින අරමුදල (AFFD) සහ යුරෝපා සංගමය(European Union) ආධාරකරුවන් මගින් රුපියල් බිලියන 20 ක පිරිවැයක් සහිතව ප්‍රතිලාභීන් 75000 ක් කේන්ද්‍ර කරගනිමින් 2022 වර්ෂය තුළ මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කොට ඇත.

තර්ජන (T) :

T1 : කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නිසා මත්ස්‍ය අභිජනනයට හා මත්ස්‍ය ජෛව විවිධත්වයට බාධා ඇතිවීම.

සිතියම් 5.3. පෙන්වන පරිදි මීගමුව කලපුවේ මත්ස්‍ය අභිජනන ස්ථාන 17 ක් ඇති අතර, එමගින් සාරවත් ජෛව විවිධත්වයක් ඇති කරයි. එනමුත් කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය,මීගමුව කලපුව හරහා ගමන් කරන බැවින්, මත්ස්‍ය අභිජනන ස්ථානවලට එමගින් බාධා ඇති කරයි.

රූප සටහන 5.11 : මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ජල ප්‍රභව



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය 2021

T2: මුහුදු අභස් යාත්‍රා කලපුවට ගොඩබෑමේදී මත්ස්‍ය අභිජනන ස්ථානවලට ඇතිවන කම්පනය

මීගමුව කලපුවේ මත්ස්‍ය අභිජනන ස්ථාන 17 ක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇත.මුහුදු අභස් යාත්‍රා කලපුවට ගොඩබෑමේදී ඇතිවන කම්පනය නිසා මත්ස්‍ය අභිජනනයට බාධා ඇතිවන අතර, එමගින් ස්වයංපෝෂිත නගර ආර්ථිකය සඳහා ධීවර අංශයේ දායකත්වය අඩුවීම කෙරෙහි බලපායි.

ශක්තීන් (S) :

S1:මීගමුව මහනගර සභා සීමාව තුළ රෝමානු කතෝලික දේවස්ථාන 83 ක් පවතින අතර, එමගින් කතෝලික සංස්කෘතිය වර්ධනය කිරීමට ඉවහල්වේ.

මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ රෝමානු කතෝලික බලපෑමක් සහිත පල්ලි 83 ක් පවතින අතර ඒවා රෝමානු කතෝලික සංස්කෘතිය වැඩිදියුණු කිරීමට දායක වේ.

S2 : වාස්තු විද්‍යාත්මක ආභාෂය සහිත ගොඩනැගිලි 28 ක් පැවතීම.

රූප සටහන 5.10 මගින් පෙන්වන ආකාරයට මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ රෝම කතෝලික හා වාස්තු විද්‍යාත්මක ආභාෂය සහිත ගොඩනැගිලි 28 ක් පවතියි .

රූප සටහන 5.12 : මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ගෘහ නිර්මාණාත්මක නිරූපණය

ලන්දේසි කොටුව

ලන්දේසි පල්ලිය

ශාන්ත සෙබස්තියන් පල්ලිය

පිටිපන පල්ලිය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

S3 - ප්‍රදේශයේ ජනගහනයෙන් 7% ක් පමණ ප්‍රමාණයක් ඉතාලිය හා යුරෝපීය රටවල රැකියාවේ නිරතවී ඇති නිසා බටහිර නවීකරණ සංස්කෘතික බලපෑම.

S4 - කතෝලික ප්‍රජාවගෙන් 80% ක් පමණ කතෝලික සංස්කෘතියක් ආශ්‍රිත සමෘද්ධිමත් පරිසරයක් සඳහා දායකවීම.

S5 - ප්‍රදේශයේ වාර්ෂික සංචාරකයින් සංඛ්‍යාව වන 350,000 (ශ්‍රී ලංකාවේ මුළු සංචාරක සංඛ්‍යාවෙන් 18% ක්) සහ ස්වදේශිකයන් සමඟ පවතින අන්තර් සම්බන්ධතාවය නිසා නවීකරණය කරන ලද බටහිර සංස්කෘතිය ශක්තිමත් වීම.

S6 - වසර පුරා සිදුවන ආගමික, සමාජීය සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් අට මගින් ප්‍රදේශයට අනන්‍යවූ සංස්කෘතියට දායකවීම.

S7 - දිවා - රාත්‍රී කාලයන්හිදී ක්‍රියාකාරී වන වෙළඳපළ ප්‍රදේශය දැලිසක් ආකාරයෙන් වූ කොටු සැලසුම් මාර්ග ජාලය (grid iron street pattern) හා බැඳීව විශේෂිත ව්‍යාපාර දිස්ත්‍රික්කයක් ලෙස ක්‍රියාකාරීම.

S8 - ජාත්‍යන්තර හා ජාතික වශයෙන් පිළිගත් විලාසිතා, ආහාර, සෞඛ්‍ය, පාසැල් දාමයන් පැවතීම.

S8 - ස්වාභාවික ජල ආශ්‍රිත ආකර්ශණීය ස්ථාන සහ සංස්කෘතික ස්ථාන පැවතීම.

මුහුද, කලපුව, මහඔය, හැමිල්ටන් ඇල හා මුහුදු වෙරළ ආශ්‍රිතව ස්වාභාවික ජල තීරයන්, බුවින්ස් වෙරළ තීරය, මොරවල, කැපුන්ගොඩ, තල්හේන, දුනගල්පිටිය, දූව, වැල්ල වීදිය, ඒත්තු කාල, පෝරුතොට හා කොච්චිකඩේ යන ප්‍රදේශයන්හි නිරීක්ෂණය කළ හැක.

S9 - සංචාරක සම්බන්ධ ක්‍රියාකාරකම් සහ උත්සව ඉහළ මට්ටමක පැවතීම.

වෙළඳපළ ප්‍රදේශය, ආරුක්කු ප්‍රදේශය, පුංචි රෝමය, ලෙල්ලම, දර්ශන ප්‍රදේශය යන ප්‍රදේශයන්හි සංචාරක සම්බන්ධ ක්‍රියාකාරකම් ඒකරාශී වේ.

S10 මීගමුව ප්‍රදේශයට වාර්ෂිකව 350,000 ක් සංචාරකයින් පැමිණීම.

රූප සටහන 5.13: මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහා සංචාරක පැමිණීම



රූප සටහන 5.14: මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ හෝටල්වල පවතින කාමර ධාරිතාව

Room Capacity of All Accommodation Establishments with Grading 2017

	No Establishments	Rooms
Classified Hotel		
1 Star	02	280
2 Star	05	346
3 Star	04	320
4 Star	04	344
5 Star	03	525
Unclassified Hotel	95	2400
Boutique Hotel	23	285
Boutique villa	35	224
Total Hotels	171	4724
Supplementary Establishments		
Guest Houses	200	5400
Home Stays	75	660
Rented Apartments	60	172
Rented Homes	06	19
Heritage Bungalows	04	19
Heritage Homes	02	08
Total(Hotels & Supplementary)	518	11002

මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය, 2017

දුර්වලතා (W)

W2 - දැනට පවතින ලන්දේසි කොටුව, පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ගොඩනැගිලි හා රෝම ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදිවුණ ස්මාරක ක්‍රමයෙන් පිරිහීම.

මීගමුවේ දැනට පවතින ලන්දේසි කොටුව, මීගමුව උසාවිය පාරේ පවතින පැරණි ආයුධ ගබඩාව සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ගොඩනැගි නොසලකා හැර ඇත. පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ගොඩනැගිලි 28 ක් පැවතුනද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ගොඩනැගිලි 6 ක් පමණක් සංරක්ෂණය කර ඇත. නඩත්තුව අඩුවීම සහ නොසැලකිලිමත්කම මෙම ගොඩනැගිලි පරිහානියට හේතු වශයෙන් හඳුනාගෙන ඇත.

රූප සටහන 5.15: මීගමුව ලන්දේසි කොටුව



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

W 3 - පාරිසරික වටිනාකමින් යුත් සහ සංස්කෘතික වශයෙන් වැදගත් වන්නාවූ සංචාරක ආකර්ශනය ඇති ස්ථාන සැඟවී ඇති සහ ආවරණය වූ ස්ථානයන්හි පැවතීම.

W 4 - ජලාශ්‍රිත ප්‍රදේශ දූෂණයවීම හේතුවෙන් ප්‍රදේශය අප්‍රසන්න වීම නිසා ස්වාභාවික දර්ශනීය ස්ථාන ක්‍රමයෙන් අඩුවීම.

අවස්ථා (O) :

O1 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇති පුරා විද්‍යාත්මක වටිනාකමින් යුත් ගොඩනැගිලි 6 ක් සංරක්ෂණය කිරීම සඳහා වැඩ සටහන් ඉදිරිපත් කිරීම.

මීගමුව උසාවිය පාරේ පවතින පුරාණ ආයුධ ගබඩාව මීගමුවේ පිහිටි ස්ටීවන් සාන්තුවරයාගේ පල්ලිය, මීගමුව කොටුව, ශාන්ත මේරි පල්ලිය, පැරණි ඕක් ගස යන අංගයන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කිරීම සඳහා හඳුනාගෙන ඇත.

O2 යෝජිත ගුවන් තොටුපළ නගර ව්‍යාපෘතිය මගින් විශාල වශයෙන් දේශීය මෙන්ම විදේශීය ජනගහනයක් ප්‍රදේශය කරා ආකර්ශනය කර ගැනීම.

03 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව භාරගෙන ඇති යෝජිත නිවාස සංවර්ධන ව්‍යාපෘතිය

නගර වාසීන්ගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් මුන්නක්කරය සහ පිටිපන ප්‍රදේශයන්හි නිවාස වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ ජලය හා විදුලිය මෙන්ම ගුණාත්මකභාවයෙන් යුක්ත නිවාස සැපයීමට යෝජිතය.

04 දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජාත්‍යන්තර සාප්පු සංකීර්ණ ව්‍යාපෘතිය

05 පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම සඳහදා අදාළ පනත් සහ නීතිරීති

පුරාවිද්‍යා ආඥා පනතේ 1 වන හා 2 වන වගන්ති වලින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ හඳුනාගත් පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ගොඩනැගිලි 28 ක් සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා නීතිමය පදනම සපයයි.

06 AFFD හා යුරෝපා සංගමයේ ආධාර සහිතව සිදුකරනු ලබන මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ සිදුකරනු ලබන මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශයේ පවතින නගර සහ මීගමුව මහනගර සභා බල ප්‍රදේශය සඳහා සනීපාරක්ෂක සහ ස්වස්ථතා මූලාරම්භයක් සමඟ ඒකාබද්ධව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කරන අතර, එහි මූල්‍යමය දායකත්වය AFFD සහ යුරෝපා සංගමය දරයි. මේ සඳහා රුපියල් බිලියන 20 ක් සහ ප්‍රතිලාභීන් 75,000 ක් සඳහා 2022 වර්ෂය ඉලක්ක කරගෙන සිදුකරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමයි.

රූප සටහන 5.16: ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශයේ පිහිටි නගර සඳහා සනීපාරක්ෂක සහ ස්වස්ථතා මූලාරම්භයේ ව්‍යාපෘති සංක්ෂිප්තය

මූලාශ්‍රය :ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය,2018

06 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්ම

6 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

6.1 සංකල්පිත සැලැස්ම

මූලික වශයෙන් මීගමුව ප්‍රධාන අංගයන් 6 ක් යටතේ සංවර්ධනයවී ඇත. එනම් ආරුක්කු මාර්ග, ලෙල්ලම, දර්ශන නැරඹුම් තීරය, රෝමානු ආකෘතික ප්‍රදේශ සහිත කලාපය, කඩවීදි (වෙළඳ පොළ) ප්‍රදේශය සහ කලපුව යන අංගයන් වේ. ආරුක්කු ප්‍රදේශය සංචාරක ආකර්ශනීය ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කරනු ලබන අතර, එය හෝටල්, අමුත්තන් සඳහා නැවතීම් මධ්‍යස්ථාන, ප්‍රභූ ආපනශාලා ස්ථාපනය කිරීම ඇතුළත්ය. එසේම දැනට පවතින හරිත පද්ධති ජාලය වන හැමිල්ටන් ඇල, මා ඔය සහ මුහුද සම්බන්ධ කරමින් රේඛීය උද්‍යාන, ගස් වැටි, ප්‍රවේශ මාර්ග සහ මාර්ග දෙපස ගස් වැවුණු මාවත් ඇති කිරීම තුළින් සංචාරක ආකර්ශනය ප්‍රවර්ධනයට කටයුතු යොදා ඇත. දළුවකොටුව, පලඟතුරේ, කට්ටුව, දළුපොත සහ පෙරියමුල්ල යන ප්‍රදේශ රෝම වාතාවරණ ලක්ෂණ සහිත ප්‍රදේශ ලෙස ප්‍රවර්ධනය කෙරේ. ඒ අනුව පෞරාණික පල්ලි ජාලය, කලා සහ ශිල්පීය නිපුණතාවන් සමඟ කතෝලික ප්‍රජාවන්, ඍතුමය කතෝලික උත්සව හා සැණකෙලි, විශේෂ වර්ණ කේතයන් සහ රෝම වාස්තු විද්‍යානුකූල ගොඩනැගිලි මෙම රෝම වාතාවරණ ලක්ෂණ සහිත ප්‍රදේශය තුළ ප්‍රවර්ධනය කෙරේ. කොච්චිකඩේ ප්‍රදේශය රෝම වාතාවරණ ලක්ෂණ සහිත කලාපයේ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කරයි.මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ සක්‍රීය නාගරික ප්‍රදේශයක් වන මාර්ග ජාල වලින් සමන්විත ගල්කන්ද, තල්වත්ත, කොප්පරා හන්දිය යන ප්‍රදේශය කඩවීදි (වෙළඳ පොළ) ප්‍රදේශය ලෙස සංවර්ධනය කෙරේ. මේ මත පදනම්ව පදිකයන් සඳහාවූ මංතීරු සාප්පු වීදි සහ බහු කාර්ය වාණිජ අවකාශ සහ විශේෂිතවූ ප්‍රදේශ කිහිපයක් කඩවීදි (වෙළඳ පොළ) ප්‍රදේශය ලෙස ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.

මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ආර්ථිකයේ ප්‍රධාන මූලාශ්‍රය ධීවර කර්මාන්තය මත පදනම්වී ඇත. එබැවින් මුන්නක්කරේ, පිටිපන, සිරිවර්ධන පෙදෙස සහ වැල්ලවීදිය යන ප්‍රදේශ ඇතුළත්ව ලෙල්ලම ප්‍රදේශය ප්‍රවර්ධනයට යෝජිතය. එමෙන්ම ධීවර වරාය දියුණු කිරීම, ධීවර ගම්මානය, හස්ත කර්මාන්ත අලෙවි මධ්‍යස්ථාන, ගෘහමූලික වියලි මත්ස්‍ය ස්ථාන, සංචාරක නවාතැන් නිවාස, මුහුදු ආහාර සැකසුම් මධ්‍යස්ථාන, ආපනශාලා මෙම ප්‍රදේශය තුළ ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම සංකල්පයේ පස්වන අංගය වන්නේ දර්ශන නැරඹුම් තීරය වන අතර, එය මෝරවල මුහුදු තීරයෙන් ආරම්භවී කැපුන්ගොඩ මුහුදු තීරය දක්වා පවතී. මෝරවල, දූව, තලාහේන සහ සරක්කුකන්ද යන ප්‍රදේශ නීලහරිත ජාලය යටතේ ප්‍රධාන මුහුදු උද්‍යාන හතරක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.මෙම සංකල්පයේ අවසාන අංගය කලපුවයි. එය සංරක්ෂිත ප්‍රදේශයක් සහ විනෝදජනක සංචාරක ආකර්ශනීය ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකි අතර, අනවසරයෙන් කලපුව ආක්‍රමණය කිරීම වැළැක්වීම සඳහා හරිත කලාප සහ ඇවිදීමේ සහ බයිසිකල් මංතීරු ඇති කිරීමට අපේක්ෂා කෙරේ. අවසානයේදී මීගමුව සංකල්පීය සැලැස්ම මගින් "නීල හරිත තලයෙන් නැගෙන පුංචි රෝමය" ලෙස සංවර්ධනයට යෝජිත අතර, එහි ජීවත්වන පිරිස සහ විවිධාකාර අරමුණු උදෙසා මීගමුවට පැමිණෙන සංචාරකයන්ට මතකයේ රැඳෙන ස්ථානයක් බවට පත්කිරීමට බලාපොරොත්තු වේ.

මීගමුව සංකල්පීය සැලැස්ම මීගමුව ප්‍රදේශයට සුවිශේෂීවූ ආර්ථිකය, පූජනීය කතෝලික සංස්කෘතිය සහ නීලහරිත ජාලය හෙවත් මුහුදු වෙරළ කලපු, මා ඔය, හැමිල්ටන් ඇල, ගංගා, කඩොලාන විශේෂ සහ ජෛව විවිධත්වය වැනි සුවිශේෂී කරුණු මත පදනම්ව සකසා ඇත.

රූප සටහන 6.1 - මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහාවූ සංකල්පිත සැලැස්ම



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

මීගමුව සතුව ඇති ප්‍රධාන අංගයන් වන මාර්ග අතර පවතින සම්බන්ධතාව, අතරමැදි භාවය, මධ්‍යයෙහි පිහිටීම හා ස්වයංපෝෂිත ආර්ථිකය යන ප්‍රධාන කරුණු සැලකිල්ලට ගනිමින් එය බස්නාහිර පළාතේ දෙවන ශ්‍රේණයේ නගරයක් ලෙස හඳුනාගෙන ඇත.එසේම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, අපනයන සැකසුම් කලාපය ආසන්නයේ පිහිටා ඇති ප්‍රධානම නගරයද මෙය වේ. මීගමුව කේන්ද්‍රීය වටිනාකම වැඩිදියුණු කිරීම සඳහා මීගමුවට අනුබද්ධවූ සුවිශේෂී ලක්ෂණ පදනම්ව යෝජිත අනාගත ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කර ඇත.මෙම ඉඩම් පරිහරණ සැලැස්ම තුළින් මුළු නාගරික ආකෘතියෙහිම ඉඩම් පරිහරණ සැලැස්ම නියෝජනය වේ.මෙම සැලැස්මේ ඝනත්වයේ වෙනස්වීම්, භූමි භාවිතය, පරිසරය වැඩිදියුණු කිරීම, සංචාරක කර්මාන්තය හා ධීවර කර්මාන්තය ඉහළ නැංවීම, ගොඩනැගිලි ස්වරූපය, වීදි ස්වරූපය වැඩිදියුණු කිරීම දක්වා ඇත.

මීගමුව ප්‍රධාන වශයෙන් කලාප 10ක් යටතේ කලාපීකරණය වන අතර එය සංවර්ධන කලාප 8ක් සහ තෙත්බිම් කලාප 2ක් ලෙස නම් කෙරේ.

1. අඩු ඝනත්ව නීල හරිත සංචාරක කලාපය
2. අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය
3. අධි ඝනත්ව විශේෂ වාණිජ කලාපය
4. අඩු ඝනත්ව සංචාරක උරුම කලාපය
5. අර්ධ ඝනත්ව නීල සංචාරක කලාපය
6. අධි ඝනත්ව ධීවර නේවාසික කලාපය
7. අර්ධ ඝනත්ව නේවාසික කලාපය
8. අඩු ඝනත්ව පාරිසරික සංරක්ෂණ කලාපය
9. තෙත්බිම් ආරක්ෂිත කලාපය (අඩු ඝනත්ව පාරිසරික සංරක්ෂණ කලාපයෙහි සීමාවට අයත්වේ.)
10. තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය

රූප සටහන 6.2 නිරූපණය කරන ආකාරයට මා ඔය ආශ්‍රිත ප්‍රදේශය, රේඛීය උද්‍යාන සංකල්පයට අනුකූලව නීලහරිත ජාලය ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යමින් අඩු ඝනත්ව කලාපයක් ලෙස සංවර්ධනය කෙරේ. එසේම කොච්චිකඩේ ප්‍රදේශය කලාපයේ ප්‍රධාන වාණිජ ප්‍රදේශය ලෙස කටයුතු කරයි.

රූප සටහන 6..2 -අඩු ඝනත්ව නීල හරිත සංචාරක කලාපයේ හරස් පැතිකඩ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021

පලඟතුරේ සිට වැල්ලවීදිය දක්වා මුහුදු තීරය සංයුක්ත ගොඩනැගිලි සහ තට්ටු ගොඩනැගිලි වලින් යුතු සංචාරක ලක්ෂණ සහිත ඉහළ ඝනත්ව සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය. එසේම මෙම කලාපය තුළ විශාල හෝටල්, ආගන්තුක නිවාස හා සංචාරක ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කෙරේ. රූප සටහන 6.3 නිරූපණය කරන ආකාරයට පවතින

ගොඩනැගිලි සහ අලුතින් ඉදිවන ගොඩනැගිලි සඳහා රෝම සාම්ප්‍රදායික ගෘහ නිර්මාණ ආකෘතිය ප්‍රවර්ධනය කරනු ලැබේ. එසේම මෙම කලාපය තුළ පල්ලි ජාලයක් මෙන්ම පරිසර හිතකාමී දෙපස වෘක්ෂලතාදිය සහිත පොදු ඇවිදින මාර්ග ඇති කිරීමට යෝජිතය.

රූප සටහන 6.3 .අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපයේ හරස් පැති කඩ.

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021

රූප සටහන 6.4 නිරූපණය කරන ආකාරයට මීගමු කොටුව, ලන්දේසි පල්ලිය ප්‍රදේශයේ අඩු ඝනත්ව සහිත සංවර්ධනයක් ප්‍රවර්ධනය කරන අතර සංචාරක වීථි ඇති කොට පැරණි අත්කම් භාණ්ඩ සහ විවෘත ආපනශාලා පහසුකම් සපයනු ලැබේ. එසේම පවත්නා මාළු වෙළඳ පොළ හා නාගරික සංවර්ධන අධිකාරිය සතු නානායම දර්ශනීය මෙන්ම සුවපහසු ආකාරයට ප්‍රතිනිර්මාණය කිරීමට අපේක්ෂා කෙරේ.

රූප සටහන 6.4.අඩු ඝනත්ව සංචාරක උරුම කලාපයේ හරස් පැති කඩ

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021.

රූප සටහන 6.5 නිරූපණය කරන ආකාරයට මෝරවල- පිටිපන ප්‍රදේශයේ සිට කැපුන්ගොඩ දක්වා පවත්නා මුහුදු තීරය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත අතර මුහුදේ නැරඹුම් ජැටිය විවෘත කරමින්, වෙරළ ආශ්‍රිත ප්‍රදේශය විවෘත ප්‍රදේශ ලෙස භාවිතා කරමින් මධ්‍ය ඝනත්ව නීල සංචාරක කලාපය ලෙස ප්‍රවර්ධනය කෙරේ. මේ සඳහා නීල හරිත ජාලය යටතේ ප්‍රදේශය මුහුදු ප්‍රදේශය සහ කලපු තීරය නැරඹුම් ජැටිය ලෙස විවෘත කෙරේ. එසේම යෝජිත වෙරළ උද්‍යානය ප්‍රදේශය සංචාරක ආකර්ශනයක් ඇති අම්බලන්මුල්ල - සීදූව ප්‍රදේශ හා සම්බන්ධ වේ.

රූප සටහන 6.5. - අර්ධ ඝනත්ව නීල සංචාරක කලාපයේ හරස් පැති කඩ.

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021.

රූප සටහන 6.6 නිරූපණය කරන ආකාරයට අධි ඝනත්ව ධීවර මූලික නේවාසික කලාපයේ ධීවර කර්මාන්තය, ධීවර ගම්මාන සමඟ මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථාන හා ධීවර පහසුකම්වලින් යුතු ධීවර උද්‍යානය ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

රූප සටහන 6.6. - -අධි ඝනත්ව ධීවර මූලික නේවාසික කලාපයේ හරස් පැති කඩ.

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021

රූප සටහන 6.7 නිරූපණය කරන ආකාරයට අඩු ඝනත්ව පාරිසරික සංරක්ෂණ කලාපය ලෙස වෙනිසියන් දූපත, සිරිවර්ධන පෙදෙස සහ කලපු ප්‍රදේශය ප්‍රවර්ධනය කරනු ලබන අතර, එමගින් කලපු ප්‍රදේශයේ සංවර්ධන පීඩනය පාලනය සහ සංරක්ෂණය කිරීම අපේක්ෂා කෙරේ. එසේම මෙම ප්‍රදේශයේ ඇවිදීමේ සහ බයිසිකල් මංතීරු වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරන අතර, කලපුව අනවසරයෙන් අත්පත් කර ගැනීම් අවසන් කර කලපුව විවෘත කරමින් සෞන්දර්යාත්මක පෙනුමකින් යුත් සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

රූප සටහන 6.7. අඩු ඝනත්ව පාරිසරික සංරක්ෂණ කලාපයේ හරස් පැති කඩ.

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021

රූප සටහන 6.8 නිරූපණය කරන ආකාරයට ඉහළ ඝනත්ව විශේෂ වාණිජ කලාපය ප්‍රධාන වාණිජ මූලස්ථානය ලෙස දියුණු කරන අතර, මාර්ග පුළුල් කිරීම, ගල්කන්ද, කොප්පරා හන්දිය, පෙරියමුල්ල, දළුපොත, කට්ටුව සහ කොච්චිකඩේ යන මංසන්ධි සැලැස්මට අනුව සංවර්ධනය කිරීම යෝජනා කොට ඇත. මහල් නිවාස, සාප්පු සංකීර්ණ, ජලාසන, වාණිජ දිස්ත්‍රික්ක, මහා පාරිමාණ කර්මාන්ත මෙම කලාපයට අයත්වන අතර, මෙම කලාපය මීගමුවේ කේන්ද්‍රීය ව්‍යාපාරික ප්‍රදේශය නියෝජනය කරයි.

රූප සටහන 6.8. -අධි ඝනත්ව විශේෂ වාණිජ කලාපයේ හරස් පැති කඩ.

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021

රූප සටහන 6.9 නිරූපණය කරන ආකාරයට අඟුරුකාරමුල්ල, කුරණ ප්‍රදේශය අර්ධ ඝනත්ව නේවාසික කලාපය ලෙස ප්‍රවර්ධනය කරනු ලබන අතර එහි නේවාසික සහ උද්‍යාන ලක්ෂණ සහිත වේ. මෙම කලාපයේ අනිකුත් සේවා පහසුකම්ද ප්‍රවර්ධනය කරනු ලැබේ.

රූප සටහන 6.9. අර්ධ ඝනත්ව නේවාසික කලාපයේ හරස් පැති කඩ.

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021.

රූප සටහන 6.10 හා සිතියම 6.1 නිරූපණය කරන ආකාරයට යෝජිත භූමි පරිහරණ සැලැස්ම මගින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ තිරසාර නාගරික ආකෘතියක් නිර්මාණය කිරීම සිදු කරනු ලැබේ.

රූප සටහන 6.10.මීගමුව නගර ආකෘතියේ හරස් පැති කඩ.

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021.

සිතියම 6.1 - මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහා යෝජිත භූමි පරිහරණ සැලැස්ම



මූලාශ්‍රය- නාගරික සංවර්ධන අධිකාරිය 2021

6.3 අපර ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම

සමාජ හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ග, ප්‍රවාහනය, ජල සම්පාදනය, විදුලිබල, සමාජීය නිවාස, අධ්‍යාපනය සහ අපද්‍රව්‍ය කළමනාකරණය යන කරුණුවලින් සමන්විත වේ.

6.3.1 සේවා කළමනාකරණ සැලැස්ම

මීගමුව සංවර්ධන සැලැස්මෙහි සේවා කළමනාකරණ සැලැස්ම මීගමුව මහනගර සහා බල ප්‍රදේශයේසෞඛ්‍ය, නිවාස, අධ්‍යාපන හා විනෝදාත්මක අංශ පිළිබඳ අනාගත විද්‍යාත්මක දෘෂ්ටිය අර්ථකතනය කරයි. සමස්ථ සේවා කළමනාකරණ සැලැස්ම මගින් සේවාවෙහි අඩු ලුහුඩුකම් හදුනාගනු ලබන අතර, සෑම ක්ෂේත්‍රයක්ම නිසි ලෙස විශ්ලේෂණය කර හඳුනාගෙන ඇත.මෙම විශ්ලේෂණය සඳහා විවිධ මපසරී ප්‍රමාණයන් භාවිතා කර ඇත.

6.3.1.1. සෞඛ්‍ය පහසුකම්

මීගමුව සංවර්ධන සැලැස්ම මගින් පහත දැක්වෙන ප්‍රමිතීන් හරහා සෞඛ්‍ය පහසුකම් සඳහා විශ්ලේෂණයක් සිදු කොට ඇත.සෞඛ්‍ය අංශවල අඩු ලුහුඩුකම් හඳුනා ගැනීම සහ එක් එක් අංශ සඳහා සැලසුම්කරණ පදනමක් සැපයීම මෙම විශ්ලේෂණය මගින් උපකාරී වේ. *ඇමුණුම 12 - දැනුමිකළු නගර සඳහා කඩඉම්, 2017: (Benchmarks for the SMART Cities).*

වගු අංක 6.1 - සෞඛ්‍ය පහසුකම්වල දුර ප්‍රමාණ සඳහා ප්‍රමිතීන්

සෞඛ්‍ය පහසුකම්	දුර
දිස්ත්‍රික් මූලික රෝහල	කිලෝ මීටර් 10
පළාත් මූලික රෝහල	කිලෝ මීටර් 03
බෙහෙත් ශාලාව	කිලෝ මීටර් 1.5
වෛද්‍ය මධ්‍යස්ථානය	මීටර් 500

මූලාශ්‍රය - දැනුමිකළු නගර සඳහා කඩඉම්,2017. (Bench marks for the SMART Cities)

මීගමුවෙහි දැනට පදිංචි ජනගහනය 155,649 කි. මීරිගම, මිනුවන්ගොඩ, කටාන, දිවුලපිටිය, ගිරිඋල්ල , ජා-ඇල, වෙන්නප්පුව සහ හලාවත යන ප්‍රදේශවල ජනතාවගේ සහ 125,000 ක් වන සංක්‍රමණික ජනතාවගේ සෞඛ්‍ය සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශය මැදිහත්වී ඇත. මීගමුව දිස්ත්‍රික්ක රෝහළ සමස්ථ මීගමුව ප්‍රදේශය සඳහාම සෞඛ්‍ය සේවා සපයන්නා වන අතර, මාතෘ සේවා, ඩෙංගු වැළැක්වීමේ ඒකකය, මධ්‍යම බෙහෙත් ශාලාව සහ රසායනාගාර විශේෂ චැනල් මධ්‍යස්ථාන, සැත්කම්, දන්ත සායන, ඊ.සී.ජී., පවුල් සැලසම් ඒකකය, දැඩි සත්කාර ඒකකය, ලේ බැංකුව, අක්ෂි ශෛල්‍යකර්ම, ගිලන් රථ සේවාව සහ මහජන සෞඛ්‍ය සේවා ඒකක වැනි පහසුකම්වලින් සමන්විත වේ. දිනකට රෝගීන් 1000 කට ආසන්න ප්‍රමාණයක් සඳහා දිස්ත්‍රික් රෝහල මගින් ප්‍රතිකාර කරනු ලැබේ.

එසේම ආයුර්වේද රෝහල් 15 ක්, වෛද්‍ය මධ්‍යස්ථාන 19 ක්, පෞද්ගලික රෝහල් 8 ක්, සාත්තු නිවාස 6 ක් හා බෙහෙත් ශාලා 18 ක් මීගමුවට ආසන්නයේ පිහිටා ඇති අතර, මීගමුවේ අනාගත ජනගහනය වන 166,208 ක ජනගහනයක් සඳහා කිසිදු ගටළු තත්වයකින් තොරව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යහපත් බලපෑමක් ඇති කරයි.

6.3.1.2 අධ්‍යාපන සේවය

මීගමුව තුළ පාසල් 40 ක් පවතින අතර, සිසුන් 56,000 ක් සහ ගුරුවරුන් 2600 ක් සිටී. ඒ අනුව සාමාන්‍ය ගුරු ශිෂ්‍ය අනුපාතය 1:25 ක් වන අතර ඒසඳහා ගුරුවරු 2240 දෙනෙකුගේ සේවය ප්‍රමාණවත්ය. එසේම 360 ක අතිරික්ත ගුරුවරු ප්‍රමාණයක් සිටීන බැවින් මෙහි ගුරුවරු හිගයක් නොමැත. මීරිගම, මිනුවන්ගොඩ, කටාන, දිවුලපිටිය, ගිරිඋල්ල, ජා-ඇල, වෙන්නප්පුව, හලාවත සහ කටුනායක යන ප්‍රදේශවල විශාල සිසුන් සංඛ්‍යාවක් අධ්‍යාපන පහසුකම් ලබාගැනීමට මීගමුව කලාපයට පැමිණෙන අතර, මීගමුව කලාපය කලාපීය අධ්‍යාපන සේවා සපයන්නෙකු බවට පත්ව ඇත.තවදුරටත් අධ්‍යාපනික පෝෂක විශ්ලේෂණය සඳහා අධ්‍යාපනික සේවා සැපයීමේදී ප්‍රධාන ප්‍රමිතීන් අනුගමනය කොට ඇත.

එහිදී ප්‍රාථමික පාසල් සඳහා කිලෝමීටර් 1 ක දුරින් සහ ද්වීතික පාසල් සඳහා කිලෝමීටර් 3 ක දුර ප්‍රමාණයක් සේවා පෝෂක විශ්ලේෂණයේදී යොදාගෙන ඇති අතර, එමගින් 2030 දී ප්‍රාථමික හා ද්වීතීය පාසල්වල හිගයක් නොමැති බව සහතික කර ඇත. එය සිතියම 6.3 මගින් නිරූපණය කරයි.

සිතියම 6.2 - මීගමුව මහානගර සභා බල ප්‍රදේශයේ සෞඛ්‍ය පහසුකම්



මූලාශ්‍රය- නාගරික සංවර්ධන අධිකාරිය 2021

සිතියම් 6.3 - මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහා අධ්‍යාපන සේවා පෝෂක විශ්ලේෂණය



මූලාශ්‍රය- නාගරික සංවර්ධන අධිකාරිය 2021

6.3.1.3 යෝජිත නිවාස ඝනත්වය සහ ව්‍යාප්ති සැලැස්ම

මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහා සේවා සැලැස්මේ තෙවන අංගය නිවාස මුලෝපාය වේ.එමගින් අනාගතයේ මීගමුවෙහි නිවාස සංවර්ධනය පිළිබඳ දැක්ම පිළිබිඹු කරයි. 2030 වර්ෂය වන විට මීගමුවෙහි ප්‍රධාන කලාප 8 ක් සඳහා නිවාස ඒකක ගණනය කොට ඇත. මේ වන විට මීගමුවේ මුළු ජනගහනය 155,649 ක් වන අතර, නිවාස ඒකක 38,912 ක් පවුල් 3869 ක් වාසය කරයි. 2030 වන විට මීගමුවේ ජනගහනය 170,992 ක් ලෙස ගණනය කර ඇති අතර, ඔවුන් සඳහා නිවාස ඒකක 42,748 ක් පහසුකම් සලසයි. එය වගුව 6.2 මගින් නිරූපණය කරයි.

වගු අංක 6.2 - මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ කලාපීය නේවාසික ව්‍යාප්තිය

කලාපය	නිවාස ඒකක (2030)	භූමි ප්‍රමාණය (හෙක්.)	නිවාස ඝනත්වය නිවාස ඒකක/හෙක්. (2030)
අඩු ඝනත්ව නීල හරිත සංචාරක කලාපය	4459	339	13
අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය	8583	365	23
අධි ඝනත්ව විශේෂ වාණිජ කලාපය	14395	934	15
අඩු ඝනත්ව සංචාරක උරුම කලාපය	857	53	16
අර්ධ ඝනත්ව නීල සංචාරක කලාපය	7151	659	11
අධි ඝනත්ව ධීවර මූලික නේවාසික කලාපය	1528	32	48
අඩු ඝනත්ව පරිසර හිතකාමී සංරක්ෂණ කලාපය	1054	367	03
අර්ධ ඝනත්ව නේවාසික කලාපය	4721	55	86
එකතුව	42748		

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021.

සිතියම 6.4 මගින් පෙන්වන ආකාරයට කලාපයේ අනාගත නිවාස ඝනත්වය ගණනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ජාතික භෞතික සැලැස්ම, ස්වාභාවික වර්ධන වේගය සහ මධ්‍යම වර්ධන අනුපාතය යන සැලසුම් පදනම් ත්‍රිත්වය යොදාගෙන ඇති අතර 2030 වර්ෂයේ ජන ඝනත්වය ගණනය කිරීම සඳහාද මෙම සැලසුම් පදනම් යොදාගෙන ඇත. මෙම විශ්ලේෂණයට අනුව හුණුපිටිය, පෙරියමුල්ල, මුන්නක්කරේ, මුන්නක්කරේ නැගෙනහිර, මුන්නක්කරේ බටහිර යන ග්‍රාම නිලධාරී වසම්වල හෙක්ටයාරයකට නිවාස 26 -52 වශයෙන් වැඩි නේවාසික ගණත්වයක් පෙන්නුම් කරයි. එසේම දළුවකොටුව, දළුවකොටුව නැගෙනහිර, දළුපොත, දළුපොත නැගෙනහිර, කඩාපඩව, වැල්ලවීදිය, වැල්ල වීදිය නැගෙනහිර, වැල්ලවීදිය දකුණ, පිටිපන මධ්‍ය කොටස, පිටිපන උතුර යන ග්‍රාම නිලධාරී වසම්වල හෙක්ටයාරයකට නිවාස 19 – 26 ක ප්‍රමාණයක් පෙන්නුම් කරයි. මුන්නක්කරේ උතුර, උදයාර්තෝප්පුව, සිරිවර්ධන පෙදෙස, දූනගල් පිටිය සහ කැපුන්ගොඩ යන ග්‍රාම නිලධාරී වසම් වල හෙක්ටයාරයකට නිවාස 3 – 13 ක් ලෙස අවම ව්‍යාප්තියක් පෙන්වයි.

සිතියම 6.4 - මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේයෝජිත නිවාස ඝනත්වය.



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021.

6.3.1.4 යෝජිත පොදු විනෝද කටයුතු සහ පහසුකම්

සේවා සැලැස්ම තුළදී විනෝදාස්වාද පහසුකම් සඳහාද සේවා සපයනු ලැබේ. එසේම දැනට පවත්නා ප්‍රධාන නගර මධ්‍ය උද්‍යාන, නගර උද්‍යාන, ප්‍රාදේශීය උද්‍යාන, කුඩා උද්‍යාන, සිනමා ශාලා, පොදු වෙළඳ පොළ, නාට්‍ය ශාලා, ක්‍රීඩා පහසුකම්, එනම් ක්‍රීඩාංගන, ක්‍රීඩාගාර සහ ක්‍රීඩා සංකීර්ණ යන පහසුකම් ආවරණය වන පරිදි මෙම සේවා සැලැස්ම සකස් කර ඇත.

සේවා සැලැස්මේ මූලික අරමුණ වන්නේ මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේජනතාවගේ විවේක කාලය තුළ සිදුකරන ක්‍රියාකාරකම් වර්ධනය කිරීමයි. වගු 6.3 සහ සිතියම 6.5 මගින් පෙන්වන ආකාරයට විනෝදජනක සේවා පෝෂක ප්‍රදේශය විශ්ලේෂණය අනුව දැනට පවතින විනෝදාත්මක පහසුකම් හා උද්‍යාන පහසුකම් අනාගත ජනගහනය ආකර්ශනය සඳහා ප්‍රමාණවත් නොවන බව තහවුරුවී ඇත.එබැවින් විනෝද කටයුතු සේවාවන් හා වාහන නැවතීමේ පහසුකම්වල සඳහා පවතින අඩුපාඩු මගහරවා ගැනීම සඳහාත් ,අනාගත ප්‍රජාව ආකර්ශනය කර ගැනීම සඳහාත් මාඹය අවට රේඛීය උද්‍යාන ඉදිකිරීම, වර්ග පහකින් යුත් වෙරළ උද්‍යාන, ඔපෙරා නිවාස සංවර්ධනය හා මීගමුව සැලසුම් ප්‍රදේශය පුනර්ජනනීයකරණය වැනි යෝජනා ඉදිරිපත් කර ඇත.

වගුව 6.3 - පොදු විනෝද කටයුතු පහසුකම්වලට ඇති සම්මත දුර ප්‍රමාණය

විනෝදාත්මක පහසුකම්	දුර ප්‍රමාණය
උද්‍යාන	
නගර මධ්‍ය උද්‍යාන	කිලෝ මීටර් 10
නගර උද්‍යාන	කිලෝ මීටර් 3
ඉතා කුඩා උද්‍යාන	මීටර් 200
කුඩා උද්‍යාන	මීටර් 200
ප්‍රාදේශීය උද්‍යාන	මීටර් 400
ප්‍රජා උද්‍යාන	මීටර් 800
සිනමා ශාලා	කිලෝ මීටර් 3
ක්‍රීඩා	
ක්‍රීඩාගාර	කිලෝ මීටර් 3
ක්‍රීඩා සංකීර්ණය	කිලෝ මීටර් 3

මූලාශ්‍රය - දැනුමිකළු නගර සඳහා කඩඉම්, 2017: (Benchmarks for the SMART Cities)

සිතියම 6.5 - මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ උද්‍යාන හා සිනමා ශාලා පහසුකම්



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021.

ක්‍රීඩා පහසුකම් පෝෂක ප්‍රදේශ විශ්ලේෂණය අනුව දැනට පවතින ලොයාරා ක්‍රීඩා සංකීර්ණය, සැටිසැන්ගාස්, මාරිස්මෙලා ගෘහස්ථ ක්‍රීඩාංගනය, සයිකල් බසාර්, සන් ස්පෝර්ට්, නිගම්බෝ සයිකල්, ජාත්‍යන්තර BH යෝග්‍යතා මධ්‍යස්ථානය, මීගමුව ගෘහස්ථ ක්‍රීඩා අංගනය, ජෙට් වෝටර් ස්පෝර්ට්මන් වැනි පහසුකම් පවතින අතර, දුනගල් පිටිය සහ කැපුන්ගොඩ ප්‍රදේශය හැර මුළු මීගමුව ප්‍රදේශයට මෙමගින් සේවා සපයයි. සිතියම 6.6 මගින් පෙන්වන ආකාරයට මෙම ප්‍රදේශයෙහි ක්‍රීඩා පහසුකම් හිඟයට විසඳුමක් ලෙස කැපුන්ගොඩ ප්‍රදේශයේ ප්‍රධාන වෙරළ උද්‍යානයක් ඉදිකිරීම සඳහා යෝජනා කර ඇති අතර, එමගින් තවත් කිලෝමීටර් 3 ක වපසරියක් සඳහා සේවා සැපයිය හැකිය.

සිතියම 6.6 - ක්‍රීඩා පහසුකම් පෝෂක ප්‍රදේශ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021.

6.3.1.5 පොදු වෙළඳ පොළ

සිතියම 6.7 මගින් පෙන්වන ආකාරයට පොදු වෙළඳපළ පෝෂක ප්‍රදේශ විශ්ලේෂණය කිලෝමීටර් 3 ක වපසරියක සිදුකර ඇත. එමගින් දැනට මීගමුවෙහි පොළ සහ පොදු වෙළඳපොළ, මාළු වෙළඳපොළ, සුපිරි වෙළඳ සැල් සහ ෆුඩ් සිටි ඇතුළුව පොදු වෙළඳපළ 35 ක් ජාලගතව පවතින අතර, එමගින් මීගමුව ප්‍රදේශයටම සේවා සපයා ගැනීමේ හැකියාව පවතී. මෙය 2030 මීගමුව සංවර්ධනය යටතේ බසාර් සංවර්ධන සංකල්පයට දායක කරගත හැක.

සිතියම් 6.7 - මීගමුව පොදු වෙළඳ පොළ පහසුකම් පෝෂිත ප්‍රදේශය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , 2021.

6.3.2 මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම

මීගමුව සංවර්ධන සැලැස්මෙහි ප්‍රවාහන කටයුතු සංවර්ධනය කිරීම පිළිබඳ ප්‍රධාන අන්තර් සම්බන්ධිත උපාය මාර්ග වශයෙන් අර්ථකථනය කොට ඇත.

6.3.2.1 ප්‍රවාහන සංවර්ධන සැලැස්ම

සංවර්ධන ක්ෂේත්‍රෙය් වැඩි සබඳතාවන් පවත්වා ගැනීම සඳහා ප්‍රවාහනය ප්‍රධාන සාධකයක් ලෙස ගත හැකිය. මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේප්‍රවාහන ජාලයේ ගැටළු කිහිපයක් හඳුනාගත හැකි අතර, සේවා සහ ක්‍රියාකාරකම් සඳහා වඩා හොඳ සබඳතා ඇතිකර ගැනීමට පවත්නා සබඳතා ප්‍රාණවත් නොවීම,බොහෝ මාර්ග මුහුදු වෙරළ දක්වා විවෘතවී නොමැති අතර, එමගින් මිනිසුන්ගේ දෘශ්‍ය කොරිඩෝවට බාධා වීම,දැනට පවතින මාර්ගවල පදිකයන් සඳහා සැප පහසු පදික මංතීරු නොමැතිවීම සහ විකල්ප ප්‍රවාහන ක්‍රම නොමැතිවීම වැනි කරුණු ඒ අතර දැකිය හැකිය. එබැවින් පවත්නා ප්‍රවාහන ජාලය හරහා නගරය තුළ උපරිම ප්‍රයෝජන ගැනීමට නොහැකිවී ඇත.

මීගමුව ප්‍රවාහන සංවර්ධන සැලැස්ම යටතේ පවත්නා මාර්ග වැඩිදියුණු කිරීම සඳහා යෝජිත අතර, නව මාර්ග සංවර්ධනය කිරීම, වාහන නැවැත්වීමේ පහසුකම්, දුම්රිය ස්ථාන සහ දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීම, මුහුදු වෙරළ තීරයේ දර්ශනය විවෘත කිරීම සඳහා තිරස් හා සිරස් දෘශ්ටි තිරය සංවර්ධනය කිරීම, දේශීය හා විදේශීය ජනතාව සඳහා ඵලදායී පහසු ගමනාගමනයක් සඳහා විකල්ප ප්‍රවාහන ක්‍රම හඳුන්වාදීම වැනි යෝජනා ක්‍රියාත්මක කෙරේ. ප්‍රවාහන සංවර්ධන සැලසුම පොදු ප්‍රවාහනය සංවර්ධනය, පදිකයන් සඳහා සේවා සංවර්ධනය සහ ප්‍රධාන මංසන්ධි සංවර්ධන යන ප්‍රධාන ක්‍රමෝපායන් තුනක් යටතේ දක්වා ඇත. පොදු ප්‍රවාහනය සංවර්ධන ක්‍රම උපාය පොදු ප්‍රවාහනයට අදාළ සියලු පහසුකම් දියුණු කිරීම සහ උප ක්‍රමෝපායන් හයක් යටතේ සංවර්ධනය වේ.

පළමු උප උපාය මාර්ගය ලෙස මීගමුව සිට මීරිගම දක්වා දුම්රිය මාර්ග ද්විත්ව මාර්ග ලෙස නැවත සංර්ධනය කිරීම සහ 18 වේ කණුව සිට පුත්තලම දක්වා දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම සිදුකෙරේ. දෙවන උප උපාය මාර්ගය ලෙස පවත්නා දුම්රිය ස්ථාන නැවත සංවර්ධනය සහ සැපපහසු ඉඩකඩක් සමඟ සියළු පහසුකම්වලින් යුත් දුම්රිය ස්ථාන ලෙස වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ. එසේම පවතින වාහන තදබදය අවම කර ගැනීම සඳහා විකල්ප ප්‍රවාහන මාර්ගයක් ලෙස හැමිල්ටන් ඇල හරහා බෝට්ටු සේවාවක් සමඟ ජල ප්‍රවාහනය දියුණු කිරීම තෙවන උප උපාය මාර්ගය මගින් සිදු කෙරේ.

හතරවන උප උපාය මාර්ගය ලෙස A 03 පෑලියගොඩ - පුත්තලම මාර්ගය සහ පෝරුතොට මාර්ගය පුළුල් කිරීම මගින් පවතින මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. පස්වන උපාය මාර්ග මගින් වාහන නැවැත්වීමේ ඉඩකඩ අඩුවීමේ ගැටළුවට විසඳුමක් ලෙස රථවාහන නැවතීමේ පහසුකම් සැපයීම වැඩිදියුණු කිරීම සිදුකෙරේ. හයවන උප උපාය මාර්ගය වනුයේ මුහුදු වෙරළ තීරය විවෘත වන ලෙස පදිකයන් සඳහා මාර්ග සංවර්ධනය කිරීමය. මෙම විවෘත ප්‍රවේශ මාර්ග සංවර්ධනයට අමතරව එමගින් මුහුදු සුළං නගරයට ඇතුළුවීම, සිරස් හා තිරස් දෘශ්‍ය ආකර්ශනයක් ලබාදීම සහ ආපදා අවස්ථාවලදී සිදුවන ව්‍යවසනයන්ගෙන් ආරක්ෂාවීම යන කරුණු අපේක්ෂා කෙරේ.

දෙවන ප්‍රධාන උපාය මාර්ගය ලෙස පදිකයන් සඳහා සේවා සංවර්ධනය හඳුනාගෙන ඇති අතර, එය උප උපාය තුනක් යටතේ සිදු කෙරේ. පළමු උප උපාය මාර්ගය ලෙස වෙළඳ පල ප්‍රදේශය බස් නැවතුම්පොල හා දුම්රිය නැවතුම් ස්ථාන අතර සම්බන්ධතාවය වර්ධනය කිරීම සඳහා ඩී.එස්. සේනානායක මාවත පදික මංතීරු සහිත මාර්ගයක් ලෙස පුළුල් කිරීම සිදුකරනු

ලැබේ. දෙවන උප උපාය මාර්ගය ලෙස පවත්නා බස් නැවතුම්පළ හා සාප්පු සංකීර්ණය සම්බන්ධ කරමින් මගී පාලමක් ඉදි කිරීමට යෝජිතය.

තෙවන ප්‍රධාන උපාය මාර්ගය වනුයේ තෝරාගත් මංසන්ධි සංවර්ධනය කිරීමයි. ඒ අනුව කොච්චිකඩේ හන්දිය, දළුවකොටුව, කොප්පරා හන්දිය, ඩොල්පින් හන්දිය පෙරියමුල්ල හන්දිය දලුපොත හන්දිය සහ කට්ටුව හන්දිය මෙම උපාය මාර්ගය යටතේ සංවර්ධනයට යෝජිතය.මෙම යෝජිත වැඩිදියුණු කිරීම යටතේ මංසන්ධි සහ මාර්ග සංවර්ධනය, සංධිස්ථාන සංවර්ධනය, නාම පුවරු සහ නගර පිවිසුම් දොරටු සංවර්ධනය යන උප උපාය මාර්ග යෝජනා කොට ඇත.යෝජිත ප්‍රවාහන සැලැස්මට අනුව මීගමුව ප්‍රදේශයට පැමිණෙන ජනතාවට ඉතා හොඳ සේවාවක් සහ උපරිම සංවර්ධන ප්‍රතිලාභ ලබාගත හැකි ප්‍රදේශයක් බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ. එය රූපසටහන 6.11 හා 6,12 මගින් තවදුරටත් දක්වනු ලබයි.

රූපසටහන 6.11. යෝජිත A 03 පැලියගොඩ - පුත්තලම මාර්ගය හරස්කඩ පෙනුම



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

රූපසටහන 6.12.යෝජිත පෝරුතොට මාර්ගයේ හරස්කඩ පෙනුම



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

සිතියම 6.8 හි සඳහන් කර ඇති මාර්ග සහ ප්‍රවාහන සැලැස්මෙහි සඳහන් යෝජිත ව්‍යාපෘති සහ එක් එක් මාර්ගයේ යෝජිත විශේෂ නියමතා මගින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ හා ඉන් පිටත ජනතාව සදහා වඩාත් හොඳ සේවාවක් සැලසෙනු ඇත. පරිච්ඡේදය 09හි , වගු අංක 9.1 , 9.2 , 9.3 , 9.4 මගින් මීගමු මහ නගර බල ප්‍රදේශයේ යෝජිත මාර්ග පලළ හා ගොඩනැගිලි සීමාවන් තව දුරටත් දක්වා ඇත.

සිතියම 6.8 - මීගමුව මාර්ග සහ ප්‍රවාහන සංවර්ධන සැලැස්ම



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.3.3. ජල සැපයුම් සැලැස්ම

ජල සම්පාදනය යනු මීගමුව මහනගර සභාබල ප්‍රදේශයේ භෞතික සංවර්ධන උපාය මාර්ගයේ වැදගත් සාධකයක් වේ. ගම්පහ දිස්ත්‍රික්කයේ වාණිජ සේවා, ප්‍රවාහන මධ්‍යස්ථාන, අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් සලසන නගර අතර, මීගමුව මහනගර සභා බල ප්‍රදේශයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. එබැවින් ජල සැපයුම් සැලැස්ම මගින් වත්මන් සහ අනාගත පුරවැසියන් සඳහා අඛණ්ඩ ජල සැපයුමක් ලබාදීමට අපේක්ෂා කෙරේ.

ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය මගින් අනුගමනය කරනු ලබන පිළිගත් ප්‍රමිතීන්වලට අනුව වර්තමාන සහ අනාගත නේවාසික ජනගහනය උපයෝගී කොටගෙන වත්මන් ජල අවශ්‍යතාවය සහ අනාගත ජල අවශ්‍යතාව ගණනය කොට ඇත.මේ වන විට මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ජල ඉල්ලුම ඝන මීටර් 27,794 ක් වේ. සංචාරකයින් සහ මත්ස්‍ය කර්මාන්තය වැනි ක්‍රියාකාරකම් නිසා මෙම ජල පරිභෝජනය 2030 දී ඝණ මීටර් 30,534 දක්වා වැඩිවේ. එය වගුව 6.4 මගින් තවදුරටත් දක්වනු ලබයි.

වගුව 6.4 - 2021 හා 2030 වර්ෂ සඳහා ජල ඉල්ලුම ගණනය කිරීම

කලාපයේ නම	ජනගහනය 2021	ජනගහනය 2030	නේවාසික ජල ඉල්ලුම 2021(දිනකට / ලීටර්)	නේවාසික නොවන ජල ඉල්ලුම 2021 15% (දිනකට / ලීටර්)	නේවාසික , නේවාසික නොවන සහ අදායම් නොවන ජල ඉල්ලුම 2021(දිනකට / ලීටර්)	නේවාසික ජල ඉල්ලුම 2030 (දිනකට / ලීටර්)	නේවාසික නොවන ජල ඉල්ලුම 2030 15%	නේවාසික , නේවාසික නොවන සහ අදායම් නොවන ජල ඉල්ලුම 2030(දිනකට / ලීටර්)
අඩු ඝණත්ව නීල හරිත සංචාරක කලාපය	16236	17836	2110645	316597	2912691	2318687	347803	3199788
අධි ඝණත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය	31251	34331	4062625	609394	5606422	4463068	669460	6159034
අධි ඝණත්ව විශේෂ වාණිජ කලාපය	52413	57579	6813647	1022047	9402833	7485253	1122788	10329649
අඩු ඝණත්වයෙන් යුතු උරුමයන් සහිත සංචාරක කලාපය	3121	3429	405734	60860	559913	445726	66859	615102
අධි ඝණත්ව ධීවර නේවාසික කලාපය	26036	28602	3290793	493619	4541294	3615159	542274	4988919
අර්ධ ඝණත්වයෙන් යුතු නීල සංචාරක කලාපය	5565	6114	723495	108524	998423	794808	119221	1096835
අඩු ඝණත්වයෙන් යුතු පාරිසරික සංරක්ෂණ කලාපය	3837	4216	498849	74827	688411	548019	82203	756266
අර්ධ ඝණත්වයෙන් යුතු නේවාසික කලාපය	17190	18885	2234751	335213	3083956	2455025	368254	3387934
මුළු එකතුව	155649	170992	20140538	3021081	27793942	22125746	3318862	30533529
මුළු එකතුව (ඝන මීටර්)			20141	3021	27794	22126	3319	30534

මූලාශ්‍රය - ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ,2021

දැනට මීගමු ප්‍රදේශය සතුව බම්බුකුලිය ජල යෝජනා ක්‍රමය සහ කැළණිය දකුණු ඉවුරේ ජල සම්පාදන යෝජනා ක්‍රමය පවතී.බම්බුකුලිය ජල යෝජනා ක්‍රමය මගින් ඝන මීටර් 360,00 ක ජල සැපයුමක් ලබාදෙන අතර, එසේම කැළණිය දකුණු ඉවුරු ජල යෝජනා ක්‍රමය මගින් ඝන මීටර් 12,000 ක ජල ධාරිතාවක් නිකුත් වේ. එබැවින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන

මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද දැනට පවත්නා ජල සම්පාදන ව්‍යාපෘති මගින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ දැනට පවතින හා අනාගත ජල ඉල්ලුමට අනුව සේවා සැපයිය හැකිය.එය සිතියම 6.9 මගින් තවදුරටත් දක්වනු ලබයි.

සිතියම් අංක 6.9 - 2030 වර්ෂයේ මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ජල සැපයුම් සැලැස්ම



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.3.4 විදුලි සැපයුම් සැලැස්ම

ප්‍රදේශයේ භෞතික සංවර්ධනය සඳහා විදුලිය ඉතා වැදගත් සාධකයකි.මීගමුව මහනගර සහා බල ප්‍රදේශයේ විදුලිබල සැපයුම ප්‍රධාන වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලිබල සමාගම විසින් සිදුකරනු ලබයි. ඒ අනුව මුළු විදුලි ප්‍රමාණයෙන් 99% ක් එනම්, ගෘහස්ථ භාවිතයෙන් 78% වාණිජ භාවිතයන්ගෙන්ද 20% ක් සහ ආගමික ස්ථාන සහ කර්මාන්ත ශාලා භාවිතයන්ගෙන්ද 1% ක් බෝලවත්ත සම්ප්‍රේෂණාගාරය හරහා ලබාදෙති.

රූපසටහන 6.13 මීගමුව මහනගර සභා බල ප්‍රදේශය තුල විදුලි පරිබෝජනය



මූලාශ්‍රය - ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය, 2017

දැනට පවතින විදුලිය සැපයීම නව යෝජනාවලට අනුව කිලෝමීටර් 4.2 ක් දක්වා SC රැකුම් පොල මගින් කිලෝවොට් 11 ක ප්‍රමාණය කිලෝවොට් 33 ට පරිවර්තනය කරමින් පෙරියමුල්ල උප බලාගාරය ඔස්සේ හලාවත මාර්ගය හරහාද කිලෝමීටර් 3.4 ක් දුරින් SC රැකුම් පොල මගින් කිලෝවොට් 11 ක විදුලි ධාරිතාව කිලෝවොට් 33 ට පරිවර්තනය කරමින් කොච්චිකඩේ උප බලාගාරය හරහා හලාවත මාර්ගයටත්, කිලෝමීටර් 2.7 ප්‍රමාණයක් කිලෝවොට් 33 ක ධාරිතාව SC රැකුම් පොල රැහැන් SC ලින්ක්ස් පොල රැහැන් බවට පරිවර්තනය කර බෝලවත්ත Fe 04 ස්ථානය ඔස්සේ පෙරියමුල්ල උප බලාගාරයට සම්බන්ධ කරමින් කොච්චිකඩේ සහ පෙරියමුල්ල උප බලාගාරවල විදුලි සැපයුම් විශ්වාසනීයත්වය වැඩිදියුණු කරමින් පද්ධතියේ කාර්යක්ෂමතාව වර්ධනය කර අඩුපාඩු අවම කිරීමට බලාපොරොත්තු වේ.

දිගුකාලීන යෝජනා මගින් නවීන MV රැහැන්, ගැන්ට්‍රිය, MV රැහැන් පරවර්තක, නව / වැඩි දියුණු කරන ප්‍රාථමික උප බලාගාර කිලෝ වොට් 11 UG කේබල් සහ කිලෝ වොට් 33 UG කේබල්, කිලෝ වොට් 11 උප බලාගාර සහ දෝෂ දර්ශක සහ සම්ප්‍රේෂණ සම්බන්ධ යෝජනා වැඩිදියුණු කිරීම ඇතුලත් වේ. *(ඇමුණුම 13. අධ්‍යන ප්‍රදේශයේ විද්‍යුත් විදුලි සම්ප්‍රේෂණ ජාලය සහ ඇමුණුම 14. අධ්‍යන ප්‍රදේශයේ විදුලිය බෙදා හැරීමේ රටාව).* එය සිතියම 6.10 හා වගුව 6.5 මගින් තවදුරටත් දක්වනු ලබයි.

වගුව 6.5 විදුලිබල සැපයුම සඳහා වන දිගුකලීන යෝජනා

MV රැහැන් යෝජනා				
විස්තරය	වර්ගය	දිග	ඇස්තමේන්තුගත මුදල	
මීගමුව උප බලාගාරයේ සිට මාන්කුළිය දක්වා	11kV SC ලින්ක්ස් කණුව	2.7	9.45	
කටාන පොලිස් ස්ථානයේ සිට ලන්දේසි කුළුණ දක්වා	33kV SC රැකුම් කණුව	0.9	2.25	
මීගමුව GSS සිට සෙල්ලක්කන්ද දක්වා දැනට පවතින 33Kv රැහැන් විදුලි රැහැන්	33kV SC ලින්ක්ස් කණුව	6.5	32.5	
මීගමුව GSS සිට නව ගොඩිගමුව දක්වා (දැනට පවතින 33Kv රැහැන් විදුලි රැහැන්)	33kV SC ලින්ක්ස් කණුව	7.9	39.5	
නව ගැන්ට් / ගැන්ට් අථත් වැඩියා කිරීම				
MV රැහැන්	දැනට පවතින වර්ගය	යෝජනා කර ඇති	දිග	ඇස්තමේන්තුගත
කොච්චිකඩේ බලාගාරයේ සිට අම්බලයාය දක්වා	33kV SC වීසල් කණුව	33kV SC රැකුම්	7.7	15.4
බුවුන්ස් හන්දියේ සිට පලඟතුරේ ආදාහනාගාරය දක්වා	11kV SC රැකුම් කණුව	33kV SC ABC	4	38.2
මීගමුව උප බලාගාරයේ සිට මාන්කුලිය දක්වා (උප බලාගාරයේ සිට කැපුම්ගොඩ)	11kV SC රැකුම් කණුව	33kV SC ABC	12.4	118.5
කොච්චිකඩේ උප බලාගාරයේ සිට පෝරුතොට දක්වා	11kV SC රැකුම් කණුව	33kV ABC	3.5	33.4

ප්‍රාථමික උප බලාගාර ඇතිකිරීම			
විස්තරය	ධාරිතාව (මෙගා වොට්)	ආරම්භක කාලය	සටහන්
කොච්චිකඩේ	2x2	2021	11Kv ප්‍රමාණය 33 Kv පරිවර්තනනය කිරීම
මීගමුව	2x5	2021	Replaced by 2x31.5MVA 132/11kV කටුනායක උප පොලට ආදේශ කර ඇත
පෙරියමුල්ල	2x10	2025	$A = \pi r^2$2x10 2021 11kV to 33kV පරිවර්තනනය කිරීම
දුරස්ථ මෙහෙයුම් පහසුකම් සහිත යෝජිත නව ස්වයං රීක්ලෝසරය			
කොච්චිකඩේ උප බලාගාරය	33kV SF6	1	2.3
නව කොච්චිකඩේ උප බලාගාරය	33kV SF6	1	2.3
සිරකදවුර පාර දක්වා නව N078 කොච්චිකඩේ උප බලාගාරය	33kV SF6	1	2.3
DDLO near Negombo PSS - towards sub N075 substation Side	33kV SF6	1	2.3

මූලාශ්‍රය - ලංකා විදුලි බල මණ්ඩලය,2017

සිතියම 6.10 මධ්‍යම වෝල්ටීයතා විදුලි සැපයුම් පද්ධතිය



මූලාශ්‍රය - ලංකා විදුලි බල මණ්ඩලය,2017.

6.3.5 මළ හා අපජල කළමනාකරණ සැලැස්ම

මීගමුව සැලසුම් ප්‍රදේශයේ භෞතික සංවර්ධන උපාය මාර්ග ලෙස මලාපවාහනය යන සාධකය ඉතා වැදගත් අංගයක් ගනී. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත ගණනය කිරීම් හා ඇස්තමේන්තු වලට අනුව මේ වනවිට මීගමුවේ වර්තමාන නේවාසික ජනගහනය 155,649ක් වන අතර, එය ජාතික ජනගහන වර්ධන වේගය අනුව 2030 වන විට 170,992 දක්වා වර්ධනය විය හැක. එසේම ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගණනය කිරීම් වලට අනුව මීගමුව සැලසුම් ප්‍රදේශයේ දැනට පවතින සහ අනාගත අපජල උත්පාදනය , නේවාසික හා නේවාසික නොවන ජල ඉල්ලුමට අනුව කලාප 8 ක් යටතේ ගණනය කොට ඇත. ඒ අනුව වර්තමාන අපජල ඉල්ලුම ඝන මීටර් 18,529 ක් (දිනකට) වන අතර , 2030 වනවිට අපජල ඉල්ලුම ඝන මීටර් 20,356 ක් (දිනකට) දක්වා වර්ධනය විය හැකි බව හඳුනා ගත හැකිය. මීගමුව සැලසුම් ප්‍රදේශයේ සංචාරක, වාණිජ කටයුතුවල දියුණුව සහ ධීවර ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හේතුවෙන් වර්තමාන ජනගහනය 2030 වර්ෂය වන විට අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය, අධි ඝණත්ව විශේෂ වාණිජ කලාපය, අධි ඝණත්ව ධීවර නේවාසික කලාපය, අඩු ඝනත්ව නීලහරිත සංචාරක කලාපය යන කලාපයන්හි වර්ධනයකින් යුක්තව සංකේන්ද්‍රනය වන බව දැකිය හැකි අතර වැඩිම අනාගත අපජල උත්පාදනයක් එම කලාපයන් තුල හඳුනා ගත හැකිය . මෙම ගණනය කිරීම් පහත වගුව 6.6 මගින් තවදුරටත් දක්වනු ලබයි.

වගුව 6.6 අප ජල ඉල්ලුම ගණනය කිරීම 2021 – 2030

කලාපයේ නම	ජනගහනය 2021	ජනගහනය 2030	වර්තමාන නේවාසික හා නේවාසික නොවන ජල ඉල්ලුම 2021 (ලීටර් / දිනකට)	වර්තමාන අපජල උත්පාදනය (80%) 2021 (ලීටර් / දිනකට)	නේවාසික හා නේවාසික නොවන ජල ඉල්ලුම 2030 (ලීටර් / දිනකට)	අනාගත අපජල උත්පාදනය (80%) (2030) (ලීටර් / දිනකට)
අඩු ඝණත්ව නීල හරිත සංචාරක	16236	17836	2427242	1941794	2666490	2133192
අධි ඝණත්ව සංචාරක ප්‍රවර්ධන	31251	34331	4672018	3737615	5132529	4106023
අධි ඝණත්ව විශේෂ වාණිජ	52413	57579	7835694	6268555	8608041	6886433
අඩු ඝණත්වයෙන් යුතු උරුමයන් සහිත සංචාරක	3121	3429	466594	373275	512585	410068
අධි ඝණත්ව ධීවර නේවාසික කලාපය	26036	28602	3784412	3027529	4157433	3325946
අර්ධ ඝණත්වයෙන් යුතු නීල සංචාරක	5565	6114	832019	665615	914029	731223
අඩු ඝණත්වයෙන් යුතු පාරිසරික සංරක්ෂණ	3837	4216	573676	458941	630222	504178
අර්ධ ඝණත්වයෙන් යුතු නේවාසික	17190	18885	2569963	2055970	2823279	2258623
මුළු එකතුව	155649	170992	23161618	18529295	25444608	20355686
මුළු එකතුව (ඝන මීටර්)			23162	18529	25445	20356

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

දැනට මීගමුව ප්‍රදේශය තුළ ක්‍රමවත් අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් නොමැති අතර, එය මීගමුව මහනගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රධාන ගැටළුවක් බවට පත්ව ඇත.මේ හේතුවෙන් මීගමුව තුළ සෞඛ්‍ය ගැටළු පැනනැගී ඇති බැවින්, අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිරියේදී තිරසාර ශ්‍රී ලංකාවේ නගර සඳහා යෝජිත නව සනීපාරක්ෂක ව්‍යාපෘතිය සඳහා මීගමුව සැලසුම් ප්‍රදේශයේ අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම (එනම් සිතියම 6.11 මගින් පෙන්වනු ලබන) ඇතුළත් කර එමගින් මලාපවාහනය පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතියෙහි ජාතික ජල සම්පත් හා ජලාපවහන මණ්ඩලය ප්‍රධාන රාජ්‍ය ආයතනය ලෙස ක්‍රියා කරන අතර, ප්‍රංශ සංවර්ධන කාර්යාංශය සහ යුරෝපා සංගමය විසින් ව්‍යාපෘතිය සඳහා මුදල් සපයයි. මෙම ව්‍යාපෘතිය යටතේ මීගමුව නගර සභා බල ප්‍රදේශය අදියර දෙකකට වෙන් කිරීමට අරමුණු කරන අතර, පළමු අදියර යටතේ 2022 වර්ෂය වන විට වෙරළබඩ ප්‍රදේශය සහ හෝටල් ආශ්‍රිතව ප්‍රදේශයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් බිලියන 20 ක් වන අතර, ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 75,000 කි.

මෙම අපජල කළමනාකරණ සැලැස්ම මගින් අපජලය නිසිලෙස බැහැර කර මීගමුව සැලසුම් ප්‍රදේශයේ මදුරු ජනගහනයේ ප්‍රතිශතය බිංදුව දක්වා අඩු කර ගනිමින් මීගමුව නගර සභාව තුළ මදුරුවන් රහිත ප්‍රදේශයක් යන දැක්ම ළඟාකර ගැනීම අරමුණු කරයි. මීගමුව සැලසුම් ප්‍රදේශය (මහනගර සීමාව) තුළ කසල හා අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ගුණාත්මක සේවයක් ලබාදෙමින් පදිංචිකරුවන්ට සහ සංචාරකයන්ට සැප පහසු පරිසර හිතකාමී පරිසරයක් ලබාදීම සඳහාද මෙම සැලැස්ම පිළියෙල කර ඇත.

සිතියම 6.11 - අප ජල හා මලාපවාහන කලමණාකරණ සැලැස්ම



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.3.6ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

නාගරික ඝන අපද්‍රව්‍ය යනු නාගරික ප්‍රදේශවලින් එකතුවන්නාවූ විවිධ වර්ගයේ කසලවල එකතුවකි. මේවායෙහි ස්වභාවය කලාපයෙන් කලාපයට වෙනස් වේ.එය කසල එකතු කිරීම, හුවමාරු පිරියම් කිරීම, ප්‍රතිචක්‍රීකරණය, සම්පත් ලෙස ලබාගැනීම සහ නාගරික ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වැනි කටයුතුවලින් යුක්ත වේ.ප්‍රධාන ලෙස නාගරික අපද්‍රව්‍ය කාබනික සහ අකාබනික ලෙස ප්‍රධාන සංරචක දෙකකට වර්ග කළ හැකිය.ඒවා අඩංගු නේවාසික කසල, වාණිජ, කර්මාන්ත, ආයතන, ඉදිකිරීම්, කඩා ඉවත් කිරීම,විවිධ ක්‍රියාවලීන් සහ නාගරික සේවාවන් නිසා ඒකරාශී වේ.ජනගහන ව්‍යාප්තිය හා ආර්ථික සංවර්ධනය සමඟ අපද්‍රව්‍ය ජනනය කිරීම වැඩිවෙන අතර, අවිධිමත් ලෙස ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම මින් මිනිස් සෞඛ්‍යයට සහ පරිසරයට අවදානමක් ඇති කරවයි.අවිධිමත් ලෙස කසල බැහැර කිරීම සහ අනිසි ලෙස කසල පරිහරණය මගින් ජලය දූෂණය වීම, කෘමීන් සහ කරදරකාරී සතුන් බෝවීම සහ කාණු සහ ඇල මාර්ග අවහිරවීම වැනි කරුණු නිසා ජල ගැලීම් වැඩිවීම වැනි ගැටළු ඇතිවේ.මීට අමතරව හරිතාගාර වායු විමෝචනය වැඩිකිරීමට මෙන්ම දේශගුණික විපර්යාස ඇතිවීම සඳහා අපද්‍රව්‍ය හේතුවන අතර, නාගරීකරණය වැඩිවීම අපද්‍රව්‍ය එකතු කිරීම සහ බැහැර කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සැකසීම ප්‍රාදේශීය සභාවල බලධාරීන්ගේ වගකීමකි. මීගමුව නගර සභාවේ දත්ත වාර්තාවලට අනුව දිනකට අපද්‍රව්‍ය ටොන් 110 – 120 ක් අතර ප්‍රමාණයක් රැස්කරන බව වාර්තාවේ. අපද්‍රව්‍ය ජනනයේ සංයුතිය පහත වගුවේ දැක්වේ. එය වගුව 6.7 මගින් නිරූපණය කරයි.

වගුව 6.7. මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පවතින අපද්‍රව්‍ය වර්ග

අපද්‍රව්‍ය වර්ගය	ප්‍රතිශතය
එළවළු සහ කල්තබා ගත නොහැකි ද්‍රව්‍ය	60.00
පොලිතීන් / ප්ලාස්ටික්	20.33
වීදුරු	1.81
යකඩ	2.84
සායනික කසල	2.05
කර්මාන්ත ආශ්‍රිත කසල	1.00
වෙනත්	3.68

මූලාශ්‍රය - මීගමුව මහ නගර සභාව,2018

අපද්‍රව්‍යවල සංයුතිය එහි වෙසෙන ජනතාවගේ තත්ත්වය අනුව වෙනස් වේ. එසේම ශ්‍රී ලංකාවේ අනිකුත් ප්‍රදේශවල මෙන්ම මෙම ප්‍රදේශයද ක්ෂුද්‍ර ජීවීන් නිසා විනාශවන කොටස වැඩිවේ.එය වගුව 6.8 මගින් නිරූපණය කරයි.

වගුව 6.8 මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ ආංශික වශයෙන් ජනනය වන අපද්‍රව්‍ය ප්‍රතිශතය

ජනනය වන ස්ථාන	ප්‍රමාණය
නේවාසික	70
වෙළඳ සංකීර්ණ	25
රෝහල්	02
කර්මාන්ත	02
වෙනත්	01

මූලාශ්‍රය - මීගමුව මහ නගර සභාව ,2018

2017 – 2018 කාලසීමාවේදී මීගමුව මහනගර සභාව විසින් රුපියල් 2375/= ක වියදමින් කොම්පෝස්ට් බඳුන් 500 ක් ලබාදුන් අතර, ප්‍රතිචක්‍රීකරණය කළහැකි කසල මීගමුව නගර සභාව මගින් එකතු කරනු ලැබේ. මීගමුව මහනගර සභාව විසින් ස්වේච්ඡා සේවකයින්ගේ සම්බන්ධීකරණය සමඟ එක්ව හරිත මිතුරු නමින් වැඩ සටහනක් පවත්වනු ලබන අතර, අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම මෙහි අරමුණ වේ.වර්තමානයේදී මීගමුව මහනර සභාව විසින් ඕවිටියාවත්ත, කොච්චිකඩේ ප්‍රදේශවලට අයත් අක්කර 05 කට ආසන්න පෞද්ගලික ඉඩමකට ප්‍රදේශයෙන් එකතු කරනු ලබන අපද්‍රව්‍ය බැහැර කරනු ලබයි. ජෛවමය අපද්‍රව්‍ය ටොන් 40 ක් උපයෝගී කොට ගෙන කුරන කොම්පෝස්ට් අංගනය මගින් මසකට කොම්පෝස්ට් ටොන් 10 ක් නිපදවනු ලබයි. කොම්පෝස්ට් විකිණීම තුළින් මසකට රුපියල් 100,000 – 120,000 ක අතර ආදායමක් මහනගර සභාව විසින් උපයයි.එසේම ප්ලාස්ටික් බෝතල්, පොලිතීන් ප්ලාස්ටික්, ටින්, යකඩ, කඩදාසි, කාඩ්බෝඩ් සහ ප්‍රතිචක්‍රීකරණය කළහැකි අනෙකුත් ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානවලට අලෙවි කරනු ලැබේ. එය වගුව 6.9 මගින් නිරූපණය කරයි.

වගුව 6.9 - 2021 – 2013 වර්ෂවලට අනුව විවිධ කලාපවල ඝන අපද්‍රව්‍ය ජනනය

නම	වර්තමාන නේවාසික පදිංචිකරුවන් සහ පැමිණෙන පිරිස (2021)	ඇස්තමේන්තු නේවාසික පදිංචිකරුවන් සහ පැමිණෙන පිරිස (2030)	ඒක පුද්ගල ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය	වර්තමාන ඝන අපද්‍රව්‍ය ජනනය (2021) (ටොන්)	ඇස්තමේන්තු ඝන අපද්‍රව්‍ය ජනනය (2030) (ටොන්)
අඩු ඝනත්ව නීල හරිත සංචාරක කලාපය	71899	97175	0.000106	7.69	10.40
අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය	348267	948839	0.000106	37.26	101.50
අධි ඝනත්ව විශේෂ වාණිජ කලාපය	374506	380702	0.000106	40.06	40.73
අඩු ඝනත්ව උරුමයන් සහිත සංචාරක උරුම කලාපය	29784	35487	0.000106	3.19	3.80
අර්ධ ඝනත්ව නීල සංචාරක කලාපය	159879	209538	0.000106	17.10	22.42
අධි ඝනත්ව ධීවර මූලික නේවාසික කලාපය	14492	53293	0.000106	1.55	5.70
අඩු ඝනත්ව පාරිසරික සංරක්ෂණ කලාපය	8851	10901	0.000106	0.95	1.17
අර්ධ ඝනත්ව නේවාසික කලාපය	122306	176948	0.000106	13.08	18.93
එකතුව	1129974	1815708		120.87	204.63

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සඳහා 10 R සංකල්පය යොදා ගනිමින් ගෘහස්ථ, වාණිජ හා කර්මාන්ත අංශයේ කසල එම ස්ථානවලම වෙන්කර හඳුනාගෙන සම්පත් ප්‍රතිසාධනය උපරීම කිරීම,ගෘහස්ථ වෙළඳසැල් ආයතනවලින් ජනනය වන ජෛවමය කසල ප්‍රතිචක්‍රීකරණය කළහැකි කසල සමඟ මිශ්‍ර නොකොට වෙන්කරන ලද ජාතික වර්ණ කේතයකට අනුව වෙනම ලේබල් ඇලවූ බදුන්වලට දැමීමට කටයුතු කරන අතර, අවිධිමත් අංශයේ ප්‍රතිචක්‍රීකරුවන්ගේ හෝ පළාත් පාලන ආයතන මගින් මෙම කසල එකතු කිරීම සිදුකරනු ලැබේ. එය වගුව 6.11 මගින් නිරූපණය කරයි.

වගුව 6.10- අපද්‍රව්‍ය වෙන් කිරීම.

වර්ගය	වර්ණ
ක්ෂුද්‍ර ජීවීන් තුළින් දිරාපත් වන (ආහාර)	කොළ
කඩදාසි	නිල්
ප්ලාස්ටික්	තැඹිලි
යකඩ	දුඹුරු
වීදුරු	රතු

මූලාශ්‍රය - මීගමුව නගර සභාව,2018.

දෙවන උපාය මාර්ගය ලෙස නේවාසිකයන්ගේ සංගම් සහ අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව මේ පිළිබඳ අධ්‍යයනය සහ දැනුවත් කිරීම් සැසි සංවිධානය කළයුතුය. එවැනි සැසි තුළින් “වෙන් නොකිරීම එකතු නොකිරීම” ප්‍රතිපත්තිය සන්නිවේදනය කළයුතුය. තෙවන උපාය මාර්ගයට අනුව කෙටි කාලීන කාබනික අපද්‍රව්‍ය කොම්පෝස්ට් බවට පත්කිරීම සහ කොම්පෝස්ට් මගින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම සඳහා ජනතා සහභාගීත්වය දිරිමත් කිරීම අපේක්ෂා කෙරේ. මහා පරිමාණයෙන් කාබනික අපද්‍රව්‍ය ජනනය වන ස්ථාන (හෝටල්, අවන්හල්, රෝහල් සහ වෙළඳ සංකීර්ණ ආදී) සහ නේවාසික කොම්පෝස්ට්කරණය ප්‍රායෝගික නොවන අතර, එය විමධ්‍යගත කොම්පෝස්ට් කම්හල්වල සිදුකළ යුතුය.

සිව්වන උපාය මාර්ගය ලෙස පරිසර හිතකාමී ආර්ථික වශයෙන් යෝග්‍ය ලෙස නිසියාකාර කාබනික අපද්‍රව්‍ය පිරියම් කිරීමේ තාක්ෂණයක් හඳුන්වාදීමට සහ දැනුවත් කිරීමට කටයුතු යොදා ඇත.එහිදී කසල නැවත භාවිතා කළ හැකි අයුරින් සැකසීම සහ ප්‍රතිචක්‍රීකරණය කළහැකි ද්‍රව්‍ය නැවත වෙළඳපලට ලබාදීම සිදුකෙරේ. මේ සඳහා පෞද්ගලික අංශය විසින් සපයසනු ලබන සේවය සඳහා මහනගර සභාව විසින් සේවා සැපයිය යුතුය. මෙය නගරයේ කසල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා ඇති අංශයයි. එබැවින් මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ මූලික අංගයක් ලෙස මෙම සේවා සපයන්නන් ලියාපදිංචි කොට මෙහෙයුම් පහසුකම් ලබාදීම ඔවුන්හට නිරන්තරයෙන් උපදෙස් සැපයීම, රාජ්‍ය නොවන සංවිධානයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ මෙහි සේවයේ යෙදෙන පිරිසට ඔවුන්ගේ නෛතික ආරක්ෂාව උදෙසා සහ ඔවුන් හඳුනා ගැනීම උදෙසා හැඳුනුම්පතක් නිකුත් කළ යුතුය. මෙහිදී ප්‍රතිචක්‍රීකරණය ජීවන උපායක් ලෙස සහ ප්‍රාදේශීය වශයෙන් ව්‍යාපාරයක් ලෙස දිරිමත් කිරීම සහ විවිධ ප්‍රතිචක්‍රීකරුවන් සම්බන්ධීකරණය කරදෙමින් ඔවුන්ගේ ධාරිතාව වැඩි කිරීමට මහනගර සභාව විසින් කටයුතු කළයුතුය. එසේම එය ප්‍රධාන ව්‍යාපාර නිලධාරීන් සහ අනෙකුත් නේවාසික මට්ටමේ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ සහ මිළදී ගැනීමේ නියෝජිතයන් නගා සිටුවීම ප්‍රජාමූල සංවිධාන දිරිගැන්වීම මේ යටතේ සිදුකළ යුතුය.

පස්වන උපාය මාර්ගය මගින් බලපෑම් එල්ල කළ හැකි අන්තරායකර ජෛව වෛද්‍යමය කසල රෝහල් සහ සෞඛ්‍ය මධ්‍යස්ථානවලින් නිකුත්වන කසල අපද්‍රව්‍ය නාගරික අපද්‍රව්‍ය පද්ධතියට එකතුවීම පිළිබඳ සාකච්ඡා කරයි. එනම්

(අ) සෞඛ්‍ය ආශ්‍රිත අපද්‍රව්‍ය වෙන් කිරීම සඳහා අනිවාර්ය ප්‍රභවයක් ඇති කිරීම

(ආ) මෙම සෞඛ්‍ය ආශ්‍රිත අපද්‍රව්‍ය බැහැර කිරීමට හෝ මුදවා හැරීමට පෙර එම අපද්‍රව්‍ය ලෙඩ රෝග කාරක සහ ශරීරයට හානි නොකරන අපද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීම.

(ඇ) සෞඛ්‍ය ආශ්‍රිත අපද්‍රව්‍ය සඳහා අවසාන බැහැර කිරීමේ විකල්පය හඳුන්වාදීම (උදාහරණ : පිළිස්සීම)

(ඇ) සෞඛ්‍ය ආයතනවල පිළිගතහැකි බලයලත් පහසුකමකින් යුක්තව අපද්‍රව්‍ය බැහැර කරන හා ඒ බව තහවුරු කිරීම සඳහා මනා අධීක්ෂණයක් යටතේ පිළිබඳ යාන්ත්‍රනයක් සකස් කිරීම.

හයවන උපාය මාර්ගය අනතුරුදායක ලෙස සැලකෙන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සමඟ සම්බන්ධ වේ. ඇතැම් ඉලෙක්ට්‍රොනික භාණ්ඩවල විවිධ තත්වයන් හා සනත්වයන් අනුව අනතුරුදායක ද්‍රව්‍යයන් අඩංගු වේ.මෙම ද්‍රව්‍යවල අන්තරායකාරී අන්තර්ගතය මිනිස් සෞඛ්‍යයට සහ පරිසරයට තර්ජනයක් වේ. විසන්ධි වූ පරිගණක, රූපවාහිනී, වී.සී.ඩී. තැටි, පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, විදුලි ලාම්පු, ජංගම දුරකථන, ශබ්ද උපකරණ සහ බැටරි නිසි ලෙස බැහැර කළයුතු අතර, එසේ නොකළ හොත් ඊයම් සහ අනෙකුත් ද්‍රව්‍ය පාංශු හා භූගත ජලය වෙත කාන්දුවීම සිදුවේ.මෙම නිෂ්පාදන බොහෝමයක් පරිසර පද්ධතියට අවම හානියක් වන පරිදි පාරිසරිකව යහපත් ලෙස ප්‍රතිචක්‍රීකරණය කිරීම, අලුත්වැඩියා කිරීම කළ හැකිය. මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සුදුසු ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළයුතු අතර, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සඳහා ලියාපදිංචිව ඇති බලයලත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ගැනුම්කරුවෙකු වෙත මෙම අපද්‍රව්‍ය භාරදිය හැකිය.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් ක්‍රම උපායේ හත්වන උපාය මාර්ගය තුළින් අපද්‍රව්‍ය එකතු කිරීම සහ ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන අතර, නිවාස ඒකකයෙන් ඒකකයට කසල එකතු කිරීමේ ක්‍රමවේදය හඳුන්වාදීම, අපද්‍රව්‍ය එකතු කිරීමේ කාලසීමාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, ශබ්දය හෝ යම් දැනුම්දීමකින් අපද්‍රව්‍ය එකතු කිරීමට ලොරි රථ පැමිණෙන බව ජනතාව දැනුවත් කිරීම, කසල එකතු කිරීමට අවශ්‍ය උපකරණ සැකසීම, කොම්පෝස්ට් නිපදවීම සිදුකරන පළාත් පාලන ආයතන සඳහා උපකරණ ලබාදීම, ළගාවිය නොහැකි ස්ථානවල අපද්‍රව්‍ය එකතු කිරීමට අත්වැසුම් සහ වෙන්වූ වාහන සැපයීම මගින් සිදුකරනු ලබයි.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මේ අටවන උපාය මාර්ගය වන්නේ කොම්පෝස්ට් නොවන සහ අපද්‍රව්‍ය පිරිපහදුවේ ක්‍රියාවලිය මගින් නිපදවන ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය සඳහා සනීපාරක්ෂක කසල රඳවන ස්ථාපිත කිරීමයි. මෙම සනීපාරක්ෂක කසල රඳවන සෞඛ්‍ය හා පරිසරය කෙරෙහි ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා වන තාක්ෂණික ක්‍රමයක් යොදා ගනිමින් ඉදිකළ යුතුය.

මෙහි නවවන උපාය මාර්ගය වන්නේ මිනිසුන් මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළබඳ දැනුවත් කිරීමයි. එසේම රාජ්‍ය සංස්ථා සහ මහජන සහභාගීත්වය ඉතා වැදගත් කරුණකි. 10 R සංකල්පය ක්‍රියාත්මක කිරීම මගින් ගෘහ ආශ්‍රිත මට්ටමේ සිට අපද්‍රව්‍ය අවම කර ගැනීමට උත්සාහ කරන්නේ නම් නිසි ලෙස අපද්‍රව්‍ය කළමනාකරණය කළ හැකිය. එසේම භාවිතය අඩු කිරීම සහ නැවත නැවත භාවිතා කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම වැඩමුළුවලදී සිදුකළ යුතුය. එය තවදුරටත් මැන බැලීම සඳහා දහවන උපාය මාර්ගය ලෙස නිතිපතා අධීක්ෂණය,ඇගයීම් ක්‍රියාවලිය සහ එහි සංවර්ධනය පිළිබඳව කටයුතු සිදුකරමින් මීගමුව නගර සහා බල ප්‍රදේශය සහ එහි අවට පරිසර හිතකාමී සංවර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම

ආර්ථික සංවර්ධන සැලැස්ම හා කාර්මික සැලැස්ම ලෙස හඳුනාගෙන හැකි ප්‍රධාන සැලසුම් දෙකක් සමඟ මීගමුව සංවර්ධන සැලැස්මේ ආර්ථික සංවර්ධන උපාය සැකසී ඇත.ආර්ථික සංවර්ධන සැලැස්ම මූලිකවම නගරය මධ්‍ය උපයෝගී කොට ගෙන ඇති අතර, කාර්මික සැලස්ම සංචාරක හා ධීවර සංවර්ධනය ආශ්‍රයෙන් සකසා ඇත.

6.4.1 ආර්ථික සංවර්ධන සැලැස්ම

මීගමුව ප්‍රදේශය එහි පවතින ආර්ථික ලක්ෂණ හේතුවෙන් සුවිශේෂී බවට පත්වී ඇත. මූලික වශයෙන් මීගමුව ආර්ථිකය ප්‍රධාන අංශ 3 ක් යටතේ ව්‍යාප්තව ඇති අතර, 45% ක් ධීවර කර්මාන්තය, 35% ක් සංචාරක කර්මාන්තය සහ 20% ක් වාණිජ අංශය හා වෙනත් සේවා තුළින් පෝෂණය වේ. මේ සාධක මත පදනම්ව මීගමු කලාපය ප්‍රධාන වාණිජ, ප්‍රවාහන මධ්‍යස්ථානය, අධ්‍යාපන පහසුකම් සහ සෞඛ්‍ය සේවා සපයන කලාපයක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කය තුළ ප්‍රධානත්වයක් ගනී.

නගරයේ නගර මධ්‍ය සංවර්ධන සැලැස්මෙහි මීගමුව ආර්ථික සංවර්ධනය දක්වා ඇත.සිතියම 6.12 මගින් එය තවදුරටත් නිරූපණය කරන අතර එය ආර්ථිකයේ වාණිජ අංශ වැඩිදියුණු කරන අතර, ප්‍රධාන උපාය මාර්ගයක් වන බසාර් (වෙළඳපළ) සංකීර්ණ දියුණු කිරීමට පුරෝගාමීව තවත් උපාය මාර්ග 2 ක් යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.වෙළඳපළ ප්‍රදේශය ක්‍රියාකාරී දෘෂ්‍ය නාගරික වාණිජ අවකාශයක් නිර්මාණය කිරීම, වෙළඳපළ සංවර්ධනය කිරීමේ උපාය මාර්ගයේ එක් සුවිශේෂී අරමුණකි. ප්‍රධාන වීදියෙහි සාප්පු සහ වෙළඳපළ ප්‍රදේශය විවිධාකාරවූ බහුවිධ සාප්පු සංකීර්ණ ඇති කරමින් ප්‍රවර්ධනය කිරීම සහ වර්තමාන විශ්ලේෂණවලට අනුව මීගමුව නගර කේන්ද්‍රීයව අඩු වශයෙන් පවතින වාහන නැවැත්වීමේ පහසුකම් සහ වාණිජ පහසුකම් දියුණු කිරීම, ජෝශප් වීදියෙහි බහු මහල් වාහන නැවැත්වීමේ අංගණය සහ කඩ සාප්පු සංකීර්ණවල ක්‍රියාකාරීත්වය ඇති කිරීම,වෙළඳපළ ප්‍රදේශයේ නාගරික වාණිජ දෘෂ්ටි අවකාශයක් ඇති කිරීමට යන ප්‍රධාන ක්‍රියාමාර්ග 4 යටතේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.මීගමුව කොටුව සහ එහි අවට පරිසරය නැවත ප්‍රතිස්ථාපනයන කිරීමත්, පවත්නා මාළු වෙළඳ පළ නැවත නිර්මාණය කිරීමත් තුළින් මෙම උපාය මාර්ගය ක්‍රියාත්මක කළ යුතුය.දැනට මීගමුවේ පවතින බන්ධනාගාරය වැලිහේන බන්ධනාගාරය වෙත ගෙන යන අතර, මීගමුව බන්ධනාගාරය කෞතුකාගාරයක් ලෙස ප්‍රවර්ධනය කරමින් සංස්කෘතික ලක්ෂණ සහ උරුමයන් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.එසේම නාගරික සංවර්ධන අධිකාරිය සතු නිවාඩු නිකේතනය නැවත සංවර්ධනය කරමින් අවට ප්‍රදේශයේ ක්‍රියාකාරීවූ විවෘත උද්‍යාන,පැරණි ආකාරයේ අවන්හල් සහ ඔපෙරා ස්ථාන නිර්මාණය කරමින් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ නාගරික උත්සව පැවැත්වීම දිරිගන්වමින් මීගමුව සැලසුම් ප්‍රදේශය ප්‍රවර්ධනය කිරීමට කටයුතු යොදා ඇත.

සිතියම 6.12 - මීගමුව නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම.



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.4.2 කාර්මික සැලැස්ම

මීගමුව ආර්ථික සංවර්ධන උපාය මාර්ගය තුළ මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේසංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම ප්‍රධාන අංගයක් ලෙස දක්වා ඇති අතර, එය මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම සඳහා දායක වේ. ඒ සදහා මුහුදු, සාගර ආශ්‍රිත ස්වාභාවික විභවයන්, කලපුව, මා ඔය, වැලි සහිත වෙරළ හා හැමිල්ටන් ඇල සහ අනෙකුත් පාරිසරික පද්ධතීන් තිරසාර කළ යුතුය. පැරණි වාර්තාවලට අනුව මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේජාතික මත්ස්‍ය නිෂ්පාදනය සඳහා 16% ක සහ ජාතික සංචාරක පැමිණීමේ ප්‍රතිශතය 14% ක් සඳහා දායකත්වය සපයයි. සංචාරක සංවර්ධන අධිකාරියේ ගණනය කිරීම්වලට අනුව 2030 වර්ෂය වන විට මීගමුව ප්‍රදේශයට 700,000 ක සංචාරකයන් ප්‍රමාණයක අපේක්ෂා කරන අතර, එමගින් රුපියල්,මිලියන 30,729 ක විදේශ විනිමය ප්‍රමාණයක් ලබාගත හැක. එමගින් සංවර්ධන සැලසුමේ පවතින ප්‍රධාන උපාය මාර්ග වන ආරුක්කු මාර්ග හා රෝම ආකෘතික ප්‍රදේශ පරිසරය නිර්මාණය, දර්ශන නැරඹුම් තීරය,කලපු ආශ්‍රිත සංවර්ධනය සහ ලෙල්ලම ආශ්‍රිත සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කළ යුතුය.

දර්ශන නැරඹුම් තීරය හරහා කුඩා සංචාරක නැවතුම් ස්ථාන ජාලයක් නිර්මාණය කිරීම සහ වෙරළ උද්‍යානය අතර විවිධාකාරයෙන් සම්බන්ධතා ඇති කිරීම යන උප උපාය මාර්ග දෙකක් නැරඹුම් ජැටිය උපාය මාර්ගයේ අන්තර්ගත වේ. මුල්ම උප උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම යටතේ දූව සිට කැපුන්ගොඩ දක්වා වෙරළ පරිසරය විවිධාකාර අත්දැකීම් ලබාගත හැකි පරිදි සකස් කිරීම සිදු කෙරේ. දෙවන උප උපාය මාර්ගය යටතේ දූව, පිටිපන සහ තලාහේන මාර්ග සංවර්ධනය සහ වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය කෙරේ. එසේම කලපුව හරහා විවිධවූ අංගයන් සහ ක්‍රීඩාංගනය සැකසීම, රංග භූමි සහ විවෘත ගුවන් සැණකෙලි සහ කළපුවෙන් ආරම්භ කොට කැපුන්ගොඩ සිට සීදූව, අම්බලමුල්ල දක්වා ඇවිදිය හැකි දැව පාලම් සකස් කිරීම යන උප උපාය මාර්ග යටතේ කලපුව දියුණු කිරීමේ උපාය මාර්ගය ප්‍රවර්ධනය කෙරේ. දෙවන උප උපාය මාර්ගය ලෙස නාගරික මාර්ග ජල ආශ්‍රිත වූ ප්‍රවේශ මාර්ගයන් ලෙස ඇවිදීමේ මංතීරු, ව්‍යායාම මංතීරු, බයිසිකල් මංතීරු කලපුවෙහි බටහිර ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම යටතේ යෝජනා කොට ඇත. කාර්මික සැලැස්මේ තවත් ප්‍රධාන අංශයක් ලෙස ධීවර අංශය වෙත අවධානය යොමු කර ඇත. ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩිවීමත් සමඟ වියලි මසුන්, ටින් මාළු ඉල්ලුම මත්ස්‍ය හා ධීවර නිෂ්පාදනයේ අතිරික්තය ඉහළ නංවා ඇත.

ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකාවට මෙට්‍රික් ටොන් 120,046 ක මත්ස්‍ය ආනයනය කොට ඇත. මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේධීවර කර්මාන්තය නැංවීමට ප්‍රයෝජනයට නොගත් සාගර හා වෙරළ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් දේශීය ජනතාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා ප්‍රදේශයට කාර්මික සැලැස්මක් අවශ්‍ය වේ. කාර්මික සැලැස්මෙහි ලෙල්ලම ආශ්‍රිත සංවර්ධන උපාය මාර්ගය මගින් මීගමුවේ ධීවර කර්මාන්තය හා සංචාරක කර්මාන්තය නංවාලීමට අපේක්ෂා කරන අතර, මුන්නක්කරේ නේවාසික වියලි මසුන් කර්මාන්තය සමඟ ලෙල්ලම ප්‍රදේශයේ ධීවර ගම්මානයක් ඇති කිරීම, නේවාසික සංචාරක නවාතැන් සැපයීම, හස්ත කර්මාන්ත නිෂ්පාදනය සහ අලෙවි මධ්‍යස්ථාන, මුහුදු ආහාර සැකසීමේ මධ්‍යස්ථාන සහ ආපන ශාලා ස්ථාන, යාත්‍රා අලුත්වැඩියා මධ්‍යස්ථාන සහ ධීවර යටිතල පහසුකම්, ධීවර වරාය සංවර්ධනය කිරීම, පිටිපන මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථානය සහ ජාතික සහ ජාත්‍යන්තර වෙළඳවලවල මත්ස්‍ය හා ධීවර නිෂ්පාදනය ප්‍රචලිත කිරීම සමඟ ධීවර තොටුපලවල් පහක් සහ බෝට්ටු නැංගුරම් ස්ථාන පහක් වැඩි දියුණු කිරීම, නූතන රෝම ලක්ෂණ,වර්ණය සහ ගෘහ නිර්මාණ ශිල්පය හේතුකොට ගෙන මීගමුව අනන්‍යවූ නගරයක් වී ඇත.

කොච්චිකඩේ නාගරික කේන්ද්‍රය, දළුවකොටුව, කට්ටුව, දළුපොත, පෙරියමුල්ල, කොප්පරා හන්දිය සහ ගල්කන්ද හන්දිය යන ප්‍රදේශ සංචාරකයන් සමඟ ප්‍රදේශය තුළ ඇති රෝම පාරිසරික අත්දැකීම ප්‍රවර්ධනය කිරීම,විශේෂ සලකුණු ,පුවරු සංචාරක හා වෙරළ උද්‍යානය තුළ කාණු සහිත ගොඩනැගිලි විවිධ ක්‍රියාකාරකම් වලින් යුත් රේඛීය තේමා උද්‍යාන, පැරණි ලක්ෂණවලින් යුත් සාප්පු සංකීර්ණ ආගම්, සහ රෝම සම්බන්ධ කෞතුකාගාර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම, මෙම ආරුක්කු මාර්ගය සහ රෝමානු ආකෘතික ප්‍රදේශය පරිසරය දියුණු කිරීමේ උපාය මාර්ගය යටතේ සිදු කෙරේ. මෙම මූලික උපාය මාර්ග හතර මගින් මීගමුවෙහි ආර්ථික වර්ධනය වැඩිදියුණු කර “විවිධ ජල පරිසරයන් හා මුසුවූ ආර්ථික වර්ධිත ස්වයංපෝෂී නගරයක් බිහි කිරීම” යන අභිමතාර්ථය යටතේ මීගමුව සැලසුම් ප්‍රදේශය නගා සිටුවිය යුතුය. එය සිතියම 6.13 මගින් තවදුරටත් නිරූපණය කරයි.

සිතියම 6.13. සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම.

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.5 තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම - 2021-2030

හැඳින්වීම

මීගමුව කලපුව

මීගමුව කලපුව ශ්‍රී ලංකාවේ වඩාත් සශ්‍රීක හා සංවේදී පරිසර පද්ධතිවලින් එකකි. අත්තනගලු ඔය ජලප්‍රවාහන ද්‍රෝණියේ සිට දඩුගම් ඔය සහ ජා ඇල හරහා තනි පටු මාර්ගයකින් මුහුදු ජලය සමඟ සම්බන්ධ වී ඇත. මීගමු කලපුවේ ලවණතාවය මෝසම් වැසි සමග සම්බන්ධතාවයක් ඇති අතර, එය ශුන්‍යයේ සිට ආසන්න සාගර ලවණතාවය දක්වා වෙනස්වේ. එසේම නිවර්තන තත්වයට අනුව මීගමුව කලපුව මෙසෝ නිවර්තන කලාපයට අයත්වේ. මීගමුව කලපුව සහ එහි වෙරළබඩ පරිසරය ධීවර කර්මාන්තය සමඟ සමීප සබඳතාවක් පවතී. මත්ස්‍ය විශේෂ 140, අපෘෂ්ඨවංශීන් 89 ක්, කඩොලාන විශේෂ 29 ක් සහ මුහුදු තෘණ විශේෂ 7 ක් මෙහි වාර්තාවී ඇත. කලපුව සහ යාබද ගල්පර ප්‍රදේශය විශේෂයෙන් අනුශ්‍රෝතගාමී විශේෂයන්ට ඊකවරණ සහ පෝෂණය සපයන ස්ථානකි.

මෝය ආශ්‍රිත සුන්දරත්වය නිසා සංචාරක නිකේතන විශාල ප්‍රමාණයක් ප්‍රදේශයට ආකර්ෂණය වී ඇති අතර මෝය ආශ්‍රිත බෝට්ටු සවාරිය සංචාරකයින්ගේ ප්‍රධාන ආකර්ෂණයකි. (ඇමුණුම 26)

ගැටළු සහ තර්ජන

මෙම මෝය ප්‍රදේශය ප්‍රධාන වශයෙන් යොදා ගෙන ඇත්තේ මෝය ආශ්‍රිත කටයුතු, ධීවර බෝට්ටු නැංගුරම් දැමීම සහ මෝය සංරක්ෂණ කටයුතු සඳහා (විශේෂයෙන් කඩොලාන දූපත් පහ) භාවිතා කරයි. එහි අවට පරිසරය ප්‍රධාන වශයෙන් ජනාවාස සහ කර්මාන්ත සඳහා යොදා ගනී. පසුගිය වසර 50 ක කාලය තුළ විවිධ මිනිස් ක්‍රියාකාරකම් සඳහා මෝය ආශ්‍රිත හෙක්ටයාර 800 ක් පමණ මිනිසුන් විසින් ගොඩකර ඇත. මෝය ආශ්‍රිත නොගැඹුරු වැලි තලාවන් මත අනවසර පදිංචිකරුවන් ව්‍යාප්ත වීම මෝය ආශ්‍රිත ජල විද්‍යාත්මක තත්ත්වයට බරපතල ලෙස බලපෑම් එල්ල කොට ඇත. අවිධිමත් ජැටි සහ ධීවර බෝට්ටු නැවතීමේ ස්ථාන ඉදිකිරීම හේතුවෙන් ජලය ගලා යාමේ රටාව හා අවසාදිත තැන්පත් වීම වෙනස් කිරීමට හේතු වී තිබේ.

අත්තනගලු ඔය සහ එහි ඉහළ ප්‍රදේශයේ අවිධිමත් සංවර්ධනය සහ අනවසර ගොඩකිරීම් හේතුවෙන් ඇති වූ අවසාධිත තැන්පත් වීමෙන් මෝය ප්‍රදේශය පටු වීමත් එහි ගැඹුර අඩුවීමත් අඛණ්ඩව සිදුවෙමින් පවතී. 1980 දශකයේ මුල් භාගයේ සිට අවිධිමත් ජැටි සහ බෝට්ටු නැවතීමේ ස්ථාන හේතුවෙන් කලපුවෙහි ජලය ගලායාමේ රටාව වෙනස්වී කලපු පතුලේ අවසාදිත තැන්පත් වීම වැඩි වී තිබේ. ජලය ඇතුළුවීම සහ පිටවීම අඩුවීමත්, වඩදිය හා බාදිය නිසි අයුරින් ක්‍රියාත්මක නොවීමත් නිසා කලපු ජලයේ ගුණාත්මක බව අඩු කරන අතර, වියළි කාලවලදී ඇල්ගී වර්ග බෝවීම මේ හේතුවෙන් සිදුවේ. මීට අමතරව ධීවර යාත්‍රාවලින් පිටවන තෙල් නිසා ජලය දූෂණය, පුළුල් ධීවර කටයුතු, කඩොලාන කපා දැමීම සහ තෙත්බිම් ප්‍රදේශ අනවසරයෙන් අල්ලා ගැනීමද සිදුවේ. මේ අයුරින් පවතින තර්ජන අවම කිරීම සඳහා හදිසි පියවර ගත යුතුය. ඒ හේතුවෙන් මෙම සංවේදී පරිසර පද්ධතිය තිරසාර ලෙස සංවර්ධනය කර ආරක්ෂා කිරීම කළ යුතුය.

යෝජිත සංරක්ෂණ කටයුතු

1994 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉදිරිපත් කරන සංරක්ෂණ කළමනාකරණ සැලැස්මට අනුව ඇතැම් සංරක්ෂණ ක්‍රියාමාර්ග නිර්දේශ කොට ඇත. මීට අමතරව ආර්ථික කොමිසම (ආයෝජන මණ්ඩලය) සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව කළමනාකරණ සැලැසුම් හා ඒ හා සමාන නිර්දේශ ඉදිරිපත් කර ඇත. (මූලාශ්‍රය : මධ්‍යම පරිසර අධිකාරිය - ශ්‍රී ලංකා ජාතික තෙත්බිම් නාමාවලිය - 2006)

හැමිල්ටන් ඇල

1802 දී බ්‍රිතාන්‍ය ආදායම් හා වාණිජ කටයුතු නියෝජිතයෙකු වන ගාර්වින් හැමිල්ටන් ලන්දේසීන් සහ සිංහල රජු විසින් කලින් සකසන ලද ඇලට නැගෙනහිරින් නව ඇලක් ආරම්භ කරන ලදී. මෙම ඇළෙන් අදහස් කළේ ලන්දේසි ඇළ සහ මුතුරාජවෙල ජලාපවහනය සඳහා නිර්මාණය කරන ලද සමාන්තර ඇළ මාර්ග මාලාවක් සම්බන්ධ කිරීමයි. මේ අනුව හැමිල්ටන් ඇළ උපත ලැබුවේ ගාර්වින් හැමිල්ටන්ගේ නමින් වන අතර එය කිලෝමීටර් 14.5 ක් කොළඹ සිට මීගමුව දක්වා ගලා බසී.(ඇමුණුම 27) (මූලාශ්‍රය: මීගමුව මහනගර සභාව සම්පත් සමුදාය - 2016).

මෝරවල

මෝරවල (මො - රා - ව - ල) සහ මීගමු වෙරළ උද්‍යානය සංචාරකයන් අතර, ඉතා වැදගත් ස්ථාන වේ. මෙම ස්ථානයේ මුහුදු පතුලේ වඩාත් ස්වාභාවික ගොඩබෑමක් ලෙස ජල ස්නානයට සුදුසු ස්වරූපයෙන් පවතී. අතීතයේ මුහුදු කලපුව කුඩා ගඟෙන් මෙම ස්ථානය සම්බන්ධ වී තිබේ. අතීතයේදී මෝර යන නම දිගු කිම්දුම් මෝරා ලෙස විශේෂ මාළු විශේෂයක් හේතුවෙන් මෙම නම පටබැඳී ඇත. ලෝකය පුරා දුර ප්‍රදේශවල සිට පිහිනා එන මාළුන් සහ මෝරෙකුගේ සිරුරක් සොයා ගැනීම නිසා මෙම ප්‍රදේශය ප්‍රසිද්ධවී ඇත. පමුණුගම සිට දූව දක්වා කිලෝමීටර් 12 ක් පමණ මුහුද දිය නෑම සඳහා ආරක්ෂිත ප්‍රදේශයක් වන අතර, යෝග්‍ය වෙරළ පිහිටීම නිසා සංචාරක කටයුතු සඳහා පහසු වේ. (ඇමුණුම 28)

(මූලාශ්‍රය : මීගමුව මහනගර සභාව සම්පත් සමුදාය - 2016)

දර්ශනීය ස්ථාන

මීගමුව නගර සභා බල ප්‍රදේශයේ බොහෝ මාර්ග දර්ශනීය ස්ථාන හරහා ගමන් කරයි. ඒ අනුව වෙරළ තීරයේ හඳුනාගත් දර්ශනීය ස්ථාන සංරක්ෂණය කිරීමට යෝජනා කෙරේ. එසේම මෙම ස්ථානවල දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රදේශයෙහි දර්ශනීය අලංකාරයට බාධා ඇති වන සංවර්ධන ක්‍රියාකාරකම් සීමා කරන අතර, මෙම දර්ශනීයත්වය මගින් වක්‍ර විනෝදාස්වාදය ලබාදෙයි.

නිසි කළමනාකරණය

මීගමුව පාරිසරික කළමනාකරණ සැලැස්ම මගින් නිසි කළමනාකණයෙන් යුතු නීලහරිත විවෘත ප්‍රදේශ සංරක්ෂණය කිරීම අපේක්ෂා කෙරේ. මීගමුවෙහි හෙක්ටයාර් 11850.28 ක භූමි ප්‍රමාණයක ජල මූලාශයන් සහ හෙක්ටයාර් 920.6 ක පමණ කඩොලාන විශේෂ, තෙත්බිම්, විවිධ ගස්, සහ හරිත ආවරණයක් පවතී. එය වගුව 6.11 මගින් තවදුරටත් නිරූපණය කරයි.

වගුව 6.11 මීගමුව සැලසුම් ප්‍රදේශයේ නීල හරිත බිම් ප්‍රදේශ

වර්ගය	ප්‍රදේශයේ ප්‍රමාණය
ජල මූලාශ්‍ර	11850.28
කඩොලාන	77.11
තෙත්බිම්	367.76
විවිධ ගස් වර්ග	113.42
රබර්	5.99

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2021

තවදුරටත් මීගමුව පාරිසරික කළමනාකරණ සැලැස්මෙහි ඇල මාර්ග සඳහා පාරිසරික සංරක්ෂණ පරාසයක් හඳුන්වාදී ඇති අතර, ඒ සඳහා 2006 අංක 35 දරණ ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (සංශෝධිත) පනතේ 1 වන වගන්තියට අනුව දන්වා ඇත.ඒ අනුව හැමිල්ටන් ඇල සඳහාද මෙම විධිවිධානය අනුගමනය කර ඇත. එම විධිවිධාන සහ අදාළ රෙගුලාසි පරිච්ඡේදය 9 හි දීර්ඝව සාකච්ඡා කෙරේ.

6.5.1. මීගමුව මහ නගරසභා බල ප්‍රදේශය සඳහා වන තෙත් බිම් සැලැස්ම

මීගමුව නගර සභා බල ප්‍රදේශයේ පවතින තෙත්බිම් පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.

i. කඩොලාන ප්‍රදේශ
ii. වගුරු බිම්
iii. ජල දේහ (මෝය, මුහුදු තෘණභූමි, මීගමු කලපුව, මා ඔය සහ අනෙකුත් ජල මාර්ග)

මීගමුව නගර සභා බල ප්‍රදේශයෙහි තෙත්බිම් කලාපීය සැලැස්මෙහි අරමුණ වන්නේ , තෙත්බිම් කලාපයේ අත්‍යවශ්‍ය ගංවතුර රැඳවුම් ධාරිතාව සහ අනෙකුත් පාරිසරික වාසි පවත්වා ගන්නා අතරතුර, එහි අත්‍යවශ්‍ය වටිනාකම්, පරිසර පද්ධතිය සහ අවට ජනතාවගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, තෙත්බිම් වල තිරසාර භාවයත් ආර්ථිකමය වටිනාකමත් සපයා දීමයි.

මීගමුව මහනගර සභා ප්‍රදේශයන්හි ඇති තෙත් බිම් කලාප

1. තෙත්බිම් ආරක්ෂණ කලාපය
2. තෙත්බිම් ස්වාභාවික සංරක්ෂණ කලාපය

මීගමුව කලපු ප්‍රදේශයට අයත් මිරිස්අන්දුව , කඩොල්ගස්නැලැල්ල, මහඋප්පල්ලම කැලේ , බරවසේන , වෙඩිකන්ද දූපත , කාක්කදූවේ අලඹ හෙවත් කඩොල්ගහ අලඹ සහ මණ්ඩලගස් අලඹ , කාක්කදූව දැනටමත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කොට ඇති අතර මෙම ප්‍රදේශ “තෙත්බිම් ආරක්ෂණ කලාපය ” අයත්වේ.(ගැසට් අංක: 1258/03 - 2002 ඔක්තෝම්බර් 14 වැනි සඳුදා).ජෛව විවිධත්වයේ වැදගත්කමක් සහ ගංවතුර රඳවා ගැනීමේ ප්‍රදේශය ලෙස හඳුනා ගත හැකි බොහොමයක් ගැඹුරු වගුරු බිම්, “තෙත්බිම් ස්වාභාවික සංරක්ෂණ කලාපය” ලෙස කලාපීකරණයට ලක් කල යුතුය යුතුය. මෙම කලාපය සොබාදහම මත පදනම් වූ සංචාරක හා විනෝදාස්වාදය සඳහා විශාල වශයෙන් පහසුකම් සපයනු ඇති අතර තෝරාගත් ප්‍රදේශ පාරිසරික සංචාරක ව්‍යාපාරයට සුදුසු විය හැකි අතර එම කලාපය තුළ ඇති සමහර ප්‍රදේශයන් වියළි කාලගුණික තත්ත්වයන්හිදී ක්‍රීඩා කල හැකි උද්‍යාන හෝ ක්‍රීඩා පිටි ලෙස නම් කළ හැකිය. එසේම තෙත්බිම් වාසස්ථාන සංරක්ෂණය හෝ ප්‍රතිස්ථාපනය කර ඇත්නම් එම ස්ථාන වික්‍රමාන්විත හෝ තේමා උද්‍යාන සඳහා සුදුසු විය හැකිය. සිතියම 6.14 මගින් මිගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ තෙත්බිම් කලාපීකරණ සැලැස්ම සහ පරිච්ඡේදය 08 හි තෙත්බිම් කලාපයන්ට අදාළ අනුමත භාවිතයන් සහ තෙත්බිම් කලාපයන්ට අයත් මාර්ගෝපදේශ දක්වා ඇත.

සිතියම 6.14 මීගමුව මහ නගර බල ප්‍රදේශයේ තෙත්බිම් කලාපීකරණ සැලැස්ම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.5.2 භූදර්ශන කළමනාකරණ සැලැස්ම

මෙම සැලැස්ම මගින් ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූදර්ශන ලක්ෂණ සංරක්ෂණය සහ තීව්‍ර කිරීම ප්‍රධානම අරමුණ වේ. එමගින් නගරයට පවතින අනන්‍යතාවය ආරක්ෂා කරගත හැකිවේ.

එයට අමතරව පාරිසරික වශයෙන් සංරක්ෂණය පෙරදැරි කරගත් ක්‍රමවත් සැලසුම් මගින් විවිධ පරිසර පද්ධති මං මාවත් ආදිය තිරසාර ලෙස භූදර්ශන සංවර්ධනය මෙම සැලැස්ම මගින් අපේක්ෂිතය.

ගෝලීය කාලගුණ විපර්යාස සඳහා අනාගතයේ මුහුණ දීමට මීගමුව මහා නගර සභා බල ප්‍රදේශයේ භූදර්ශන සැලසුම පහත අරමුණු අනුව සැකසෙනු ඇත.

(අ) නාගරික උෂ්ණත්ව වැඩිවීම, කාබන් පියසටහන වැඩිවීම වායු දූෂණය වැඩිවීම, ජල ගැලීම් වැඩිවීම වැනි ආපදා තත්ත්වයන් අවම කිරීමට නාගරික වන ගහනය වැඩි කිරීම.

(ආ) නාගරික ජෛව විවිධත්වය වර්ධනය සඳහා පරිසරයට ආවේණික වූ දේශීය ශාක විවිධත්වයක් සහිතව එක් කිරීම.

(ඇ) අවිදින්නන් තවත් දිරිමත් කිරීමට සහ පදිකයන්ගේ ආරක්ෂාව සඳහා වෙන්වූ පදික මං තීරු සෙවන හා ආසන සහිතව ලබාදීම.

(ඈ) සංවේදී පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම සහ ඥානාන්විත භාවිතයන් (Wise use) හඳුන්වා දීම මඟින් තිරසර ලෙස පරිසර හිතකාමී විනෝද කටයුතු සඳහා යොදා ගැනීම.

(ඉ) නාගරික චතුරස්‍ර, පොදු උද්‍යාන වැනි අපරවසුහ පහසුකම් සහිත මනාව සැලසුම් කල විවෘත භූමි ප්‍රදේශ ජනතාව වෙනුවෙන් නිර්මාණය.

(ඊ) විවිධ උද්‍යාන, මං තීරු, සුදුසු දැන්වීම් පුවරු, විදුලි ආලෝකය එක් කිරීම මගින් නගරයට අලංකාරයක්, අනන්‍යතාවයක් මෙන්ම, ආර්ථිකමය සංවර්ධනයක්ද ලබාදීම.

6.5.3. ආපදා අවධානම් අවම කිරීමේ සැලැස්ම

මීගමුව මහනගර සභා බල ප්‍රදේශය තුල පසුගිය වසරවල සැලකිය යුතු ලෙස වාර්තා වූ ආපදා තත්ත්වයන් හදුනාගත නොහැක.. 2008 වර්ෂය දක්වා ජලගැලීම් තත්ත්ව වාර්තා වූ නමුත් ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීමෙන් පසු එම තත්වය අඩු වී ඇත .

2016 සහ 2018 වසර වලදී ඇතිවූ සැඩ සුළං තත්ත්වය හේතුවෙන් පවුල් 50 කට අයත් පුද්ගලයින් 200 කට වැඩි පිරිසක් පීඩාවට පත්විය.

2004 වසරේදී ඇතිවූ සුනාමි බලපෑමට මීගමුව මහ නගරසභා බල ප්‍රදේශයද මුහුණ දුන් අතර වාර්තාගත දත්ත වලට අනුව පුද්ගලයින් 13,350 ක් පමණ පීඩාවට පත් විය (ඇමුණුම අංක 25)

6.5.3.1. ජල ගැලීම්

උපායමාර්ග

I. ජල ගැලීම්වලට ලක්වන ප්‍රදේශවල නිසි ජලාපවාහන පද්ධතියක් ස්ථාපිත කළ යුතු අතර එය කළමනාකරණ හා අධීක්ෂණ කළ යුතුය.
II. දෙපා ඇල , හැමිල්ටන් ඇළ සහ මහ ඔය, මීගමු කලපුවෙහි රක්ෂිත ප්‍රදේශ නිසි පරිදි නඩත්තු කල යුතුය.

6.5.3.2. සැඩ සුළං

උපාය මාර්ග

I. සුළං ආරක්ෂණ බාධක ස්ථාපිත කළ යුතුය (සුළං බාධක සඳහා ශාක රෝපණය)

6.5.3.3. සුනාමි

උපාය මාර්ග

I. ඉඩම් සංවර්ධනය - වෙරළ කලාපයේ සංවර්ධන කටයුතු සඳහා වෙරල සංරක්ෂණ සහ වෙරල සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය (මධ්‍යන්‍ය මුහුදු මට්ටමේ සිට මීටර් 300 ක් ගොඩබිමට) සහ මීගමුව මහ නගර සභා වෙරළ තීරයේ මීටර් 100/200 වෙන් කිරීම සහ සංවර්ධන කටයුතු සීමා කිරීම.
II. මීටර 100/200 අතර වෙන්කිරීම් සඳහා ජාතික වැදගත්කමක් ඇති සංවර්ධනයන් සඳහා වෙරල සංරක්ෂණ සහ වෙරල සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ උපදේශක කමිටුවෙහි අනුමැතිය ලබා ගත හැකිය,.
III. මීටර් 100/200 ක කලාපයක් තුළ ඇති ඕනෑම ගොඩනැගිල්ලක් සුනාමියෙන් සිදුවන හානි වළක්වා ගැනීම සඳහා සකස් කරන ලද මාර්ගෝපදේශ සමඟ ඉදිකර ගත යුතුය.
IV. වෙරළබඩ තීරයේ සහ කලපු ප්‍රදේශයෙහි කඩොලාන නැවත සිටුවීම හෝ සංරක්ෂණය කිරීම.
V. වෙරළබඩ ප්‍රදේශයට යෝග්‍ය වෘක්ෂලතාදිය ස්ථාපිත කළ යුතුය.
VI. දියකඩනය , ආරුක්කු බැමි, වෙරළ පෝෂණය සහ වෙරළට ඔබ්බෙන් ඇති බාධක ආදිය යොදාගෙන වෙරල ආරක්ෂා කල යුතුය.

6.5.4. යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 2021 -2030

නාගරික සංවර්ධන අධිකාරියේ පිළිගත් ප්‍රමිතී මට්ටම් අනුව මිනිසුන් 1000 ක් සඳහා හෙක්ටයාර් 1.4 ක් අවම වශයෙන් පොදු එළිමහන් විනෝද කටයුතු පිලිබඳ අවකාශීය සැලැස්ම සැකසීමේදී වෙන් කල යුතු වුවත් පවතින ඉඩම් හිඟ තාවය නිසා මීගමුව නගර සභා බල ප්‍රදේශයට මෙම ප්‍රමිති මට්ටම ජන ගහණය 1000 කට හෙක්ටයාර් 1 ලෙස යොදා ගෙන ඇත. මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ මේ වන විට ජනහගනය 155,649 ක් වන අතර , සංවර්ධන සැලැස්ම දත්ත විශ්ලේෂණයන්ට අනුව 2030 වසර වන විට ජනගහනය 170992 ක් බවට පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වර්ෂය වන විට පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා ඉඩම් හෙක්ටයාර 171 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය.

6.5.4.1. මීගමු මහනගර සභා බල ප්‍රදේශයේ පවතින පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම්

ඍජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන අංශ දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. ඍජු විනෝද පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍යය. එනම් ,

I. ක්‍රීඩා කිරීම
II. පිහිනීම
III. දිවීම
IV. ඇවිදීම
V. බෝට්ටු පැදීම
VI. සම්ප්‍රදායික මසුන් ඇල්ලීම ආදිය දැක්විය හැකිය.

මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ ඉහත අවශ්‍යතාවයන් සපුරා ගත හැකි ස්ථාන ප්‍රමාණවත් නොවන අතර දැනට පවතින එම ස්ථාන පිළිබද විස්තර පහත වගු අංක 6.12 හි , සිතියම් අංක 6.15 හි සහ ඇමුණුම් අංක 23 හි දක්වා ඇත. පහත වගු අංක 6.12හි සදහන් තොරතුරුවලට අනුව මීගමු මහා නගර සභා බල ප්‍රදේශය තුල හෙක්ටයාර 29.5 ක් පොදු එළිමහන් විනෝද කටයුතු සදහා විවෘත භූමි ලෙස පවතින අතර වර්තමාන ජනගහනය වන 155,649 සඳහා පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම් ලෙස හෙක්ටයාර් 156 ක් වෙන්ව තිබිය යුතුය. නමුත් ඉහත වගුවට අනුව වර්තමාන ජනගහනයට ප්‍රමාණවත් පොදු එළිමහන් විවෘත භූමි පහසුකම් මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ නොමැති අතර දැනට පවතින ස්ථානවලද පහසුකම් ප්‍රමාණවත් නොවේ.

වගුව 6.12 දැනට පවතින පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම් සපුරා ගත හැකි ස්ථාන

	උද්‍යානයේ වර්ගය	ප්‍රමාණය (හෙක්ටයාර්)
1	පවතින ඉතා කුඩා උද්‍යාන	0.7
2	පවතින කුඩා උද්‍යාන	6.0
3	පවතින ප්‍රාදේශීය උද්‍යාන	11.4
4	පවතින ප්‍රජා උද්‍යාන	8.2
5	පවතින වෙරළ උද්‍යාන	3.2
6	එකතුව	29.5

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය 2021

6.5.4.2. යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම

මීගමුව මහනගර සභා බල ප්‍රදේශය තුළ 2030 වසර වන විට ජනගහණය 170,992ක් ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වසර වනවිට පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා ඉඩම් හෙක්ටයාර 171 ක් වෙන් කල යුතුය. මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ වසර 2030 වනවිට යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිලිබඳ අවකාශීය සැලැස්ම සඳහා වන වැඩිදුර විස්තර සිතියම් අංක 6.16 යටතේ ද වගු අංක 6.13 සහ 6.14 , ඇමුණුම් අංක 24 මගින් ද දක්වා ඇත.

වගුව 6.13 .2021 – 2030 සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම් සපුරා ගත හැකි ස්ථාන

අංක	උද්‍යානයේ වර්ගය	ප්‍රමාණය (හෙක්ටයාර්)
1	යෝජිත කුඩා උද්‍යාන	3.9
2	යෝජිත ප්‍රාදේශීය උද්‍යාන	8.6
3	යෝජිත වෙරළ උද්‍යාන	33.5
4	යෝජිත රේඛීය උද්‍යාන	62.5
	එකතුව	108.0
	දැනට පවතින පොදු එළිමහන් විනෝද කටයුතු	29.5
	සම්පූර්ණ එකතුව	137.5

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2021

වගු අංක 6.14 පොදු එළිමහන් සහ විනෝද කටයුතු ස්ථාන සඳහා අවසරලත් ක්‍රියාකාරකම්

අංකය	උද්‍යාන වර්ගය	ඉඩම් ප්‍රමාණය	අවසරලත් භාවිතය
1	කුඩා උද්‍යාන	හෙක්ටයාර් 0.2 – 1.0 (අක්කර 0.5 – 2.5)	• ළමා ක්‍රීඩාංගන, කුඩා තෘණ බිම් ක්‍රීඩා පිටි, රේඛීය වනාන්තර උද්‍යාන, නිදහස් උද්‍යාන
2	ප්‍රාදේශීය උද්‍යාන	හෙක්ටයාර් 1.0 – 3.0 (අක්කර 2.5 - 7.5)	• ළමා ක්‍රීඩාංගනය සමඟ පාපන්දු තණතීරුවක් සහ සැලසුම් නොකළ නිදහස් අවකාශයන් • ළමා ක්‍රීඩාංගනයක් සහිත විශාල තෘණභූමි ප්‍රදේශ • කුඩා වනාන්තර උද්‍යාන සහ සැලසුම් නොකළ ධාවන පුහුණු ස්ථාන • හෙක්ටයාර් 0.25 ක ළමයින් සඳහාවූ විශේෂ ක්‍රීඩාංගන • හෙක්ටයාර 0.25 - අලංකාරවත් උද්‍යාන • හෙක්ටයාර 0.5 - විවේකය සහ අධ්‍යාපනය
3	වෙරළ උද්‍යාන	හෙක්ටයාර් 79 (අක්කර 195)	• අවන්හල් සහ කබානා • කුඩා කැබින් • සිහිවටන සහිත සාප්පු • ඇඳුම් මාරු කිරීම් ස්ථාන සහ ස්නානය කිරීමේ පහසුකම් • ළමා උද්‍යාන, පොලිස් මුරපොළ,අසුන් ගන්නා ස්ථාන
	රේඛීය උද්‍යාන	හෙක්ටයාර් 62.5 (අක්කර 153)	• ඇවිදීම, ව්‍යායාම කිරීම, බයිසිකල් පැදීම, ස්වාභාවික මංපෙත්

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.5.4.3. පොදු එළිමහන් සහ විනෝද කටයුතු සඳහා යෝජිත උපාය මාර්ග

I. පවත්නා උද්‍යාන හා ක්‍රීඩාපිටි නැවත සංවර්ධනය කිරීම

සුදුසුකම්ලත් පුද්ගලයන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ නිසි භූදර්ශන සැලැස්මකට අනුව දැනට පවතින උද්‍යාන හා ක්‍රීඩාංගන ප්‍රති සංවර්ධනය කළ යුතුය.

II. රේඛීය උද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කිරීම

මා ඔය රක්ෂිත ප්‍රදේශය, හැමිල්ටන් ඇල රක්ෂිතය, දඬුගම් ඔය රක්ෂිතය, ජා ඇල ඇල රක්ෂිතය සහ මීගමුව කලපුව රක්ෂිතය ආශ්‍රිත ප්‍රදේශ හැකි උපරිමයෙන් රේඛීය උද්‍යාන ලෙස සංවර්ධනය කළ යුතුය. එමගින් ප්‍රදේශයේ නාගරික ගංවතුර උවදුර අවම කර ගැනීම සහ ජනතාව අතර, විනෝදාත්මක පහසුකම් බෙදා හැරීම වර්ධනය කිරීම තුලින් රක්ෂිත ප්‍රදේශවල අනවසර සංවර්ධන කටයුතු පාලනය කිරීම.

III. ජල ගැලීම් රඳවා ගැනීම් සහ වැළැක්වීමේ ප්‍රදේශ

ප්‍රදේශයේ ජල ගැලීම් උවදුර සැලකිල්ලට ගනිමින් පවත්නා කලපුව, කඩොලාන ප්‍රදේශ, වගුරු බිම් ජලය රඳවා ගැනීම් සහ වැළැක්වීම් ප්‍රදේශ ලෙස සංරක්ෂණය කළ යුතුය.

IV. වෙරළ උද්‍යාන සංවර්ධනය

මීගමුව නගර සහා ප්‍රදේශයේ පවතින වෙරළ ප්‍රදේශ නිසි භූදර්ශන සැලැස්මක් යටතේ සැලසුම් කළ යුතුය.

- i. වෙරළ ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා මහජනතාවට වෙරළට ඍජු දර්ශනීය පැහැදිලි ප්‍රවේශයක් නිර්මාණය කිරීම.
- ii. වෙරල සංරක්ෂණය හා වෙරල සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ වෙන් කිරීම්වලට අනුව වෙරළ තීරයේ සෙවණ සහිත ගස් කලාපයක් නිර්මාණය කිරීම.
- iii. පොදු පහසුකම් සැපයීම.
  - ආසන පහසුකම්
  - කසල බඳුන්
  - වෙරළ ආලෝකමත් කිරීම
- iv. වෙරළ තීරය ප්‍රවර්ධනය හා එහි අවට ප්‍රජාව සඳහා රැකියා උත්පාදනය කිරීමේ අරමුණින් කුඩා කැබින්, සිහිවටන විකුණුම් සාප්පු ඉදිකිරීම
- v. ඇදුම් මාරුකිරීමේ ස්ථාන ඉදිකිරීම .
- vi. ළමා උද්‍යාන
- vii. වෙරළබඩ පරිසරයට අනුකූලව හෝටල්, ආපනශාලා සහ කබානා ඉදිකිරීම. (මුහුදු වෙරළ සහ මුහුදේ දර්ශනයට බාධාවන අයුරින් ඉදිකිරීම් සිදු නොකළ යුතුය)

පිරිසිදු වෙරළ උද්‍යානයක් පවත්වාගෙන යාම සඳහා නිසි කාණු පද්ධතියක් සහ කසල බැහැර කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම.

V. මාර්ග දෙපස රුක් රෝපණය තීර ප්‍රදේශ ඇති කිරීම

පෝරුතොට මාර්ගය, ලුවිස් පෙදෙස මාර්ගය, මුහුදු වීදිය, රේගු නිවාස මාර්ගය, සෙල්බි මාර්ගය, පමුණුගම මාර්ගයේ සිට කැපුන්ගොඩ මාර්ගය දක්වා රුක් රෝපණය කළයුතුය. (වාත බංග, ගංසූරිය ,දොඹ,මුදිල්ල , මැයි මොර , ඇහැල , කදුරු, කොබෝලීල , අරලිය , වැටකෙයියා , තක්කඩ වැනි ශාක මේ සඳහා සුදුසු වේ)

සිතියම 6.15. මීගමුව මහ නගර බල ප්‍රදේශයේ පවතින පොදු එළිමහන් සහ විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම.



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2021

සිතියම 6.16. මීගමුව මහ නගර බල ප්‍රදේශයේ යෝජිත පොදු එළිමහන් සහ විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.6 සංස්කෘතික හා ජාතික උරුමයන් කළමනාකරණ උපාය මාර්ගය

6.6.1 ජාතික උරුමයන් ආශ්‍රිත ප්‍රදේශ

6.6.1.1. අගුරුකාරමුල්ල විහාරය - මීගමුව

මීගමුව ප්‍රදේශයෙහි පිහිටි අගුරුකාරමුල්ල විහාරය වසර 300 ට වඩා පැරණි විහාරයකි. එහි ඇතුළුවීම සඳහා මකර කටක් පවතින අතර, ඓතිහාසික පුස්තකාලයක නටඹුන් ඇත.(ඇමුණුම 15) අගුරුකාරමුල්ල විහාරස්ථානය මීගමුවේ ඇති සුන්දර ස්ථානයකි. එහි ඇති බුදුන් වහන්සේගේ පිළිමය සහ මකර පිවිසුම ඉතා ප්‍රසිද්ධ වන අතර, ශත වර්ෂ ගණනාවක් පැරණි බිතු සිතුවම් මෙහි සොයාගත හැකිය. මෙහි අවුරුදු 300 කට වඩා පැරණි නෂ්ඨාවශේෂ ඇති අතර, ඒවා පාසි වලින් වැසී ඇත. ඉදිරිපස මීටර් 6 ක් උස බුදු පිළිමයක් පවතී. මකර මුඛය හරහා විහාරස්ථානයට ගිය විට මකරා විසින් අශුද්ධ ආත්මයන් දුරුකර ගැනීමට කටයුතු කරයි. මෙම ප්‍රදේශය විශාල ගස් සහිත විශාල ඉඩක පිහිටා ඇති අතර, විහාරස්ථානය මධ්‍යයෙහි පොකුණක් පවතී. ඓතිහාසික ගෘහ නිර්මාණ ශිල්පයට ඇලුම් කරන උරුමයන් හා පැරණි බිතු සිතුවම් සහ මූර්තිවලට ඇලුම් කරන්නන්හට අගුරුකාරමුල්ල විහාරය යනු අලංකාරවත් ස්ථානයකි. (මූලාශ්‍රය : මීගමුව මහනගර සභාව - සම්පත් පැතිකඩ 2016)

6.6.1.2. මීගමුවේ ලන්දේසි බලකොටුව

ලන්දේසීන් විසින් 1646 දී පෘතුගීසීන්ගෙන් මීගමුව අල්ලාගෙන වසර දහයක් තිස්සේ පෘතුගාලය සමඟ සාම ගිවිසුමක් පැවැත් විය. මේ කාල සීමාවත තුළ මහනුවර පාලනය කල රජු විසින් ජාතීන් දෙක අතර ගැටුමක් ඇති කිරීමට උත්සාහ දැරීය. එක් අවස්ථාවකදී ඔහු මීගමුව බලකොටුව අල්ලාගත් අතර, ලන්දේසි සේනාපති ඇඩ්‍රියන් වැන්ඩර් ස්ටූවෙල්ගේ ප්‍රධානියා ගාල්ල ප්‍රදේශයට යැවීය. රජු විසින් රාජ්‍ය පාලනය ලබාගත්තද එය ලන්දේසීන් අත්පත් කරගත් අතර, ඔවුන්ගේ සටන දිගටම පැවතිණි. විශේෂයෙන් කුරුඳු වෙළඳාම විනාශ කර දැමීම මගින් රජු ලන්දේසීන්ට හිරිහැර කරදර කරන ලදී. ලන්දේසි යටත් විජිත යුගයේ පැවති උරුමය 1672 දී ලන්දේසීන් ඉදිකර ඇති ලන්දේසි කොටුවෙහි දක්නට ලැබේ. අද වන විට ඕලන්ද කොටුව මීගමුව බන්ධනාගාරයේ කොටසක් බවට පත්ව ඇත. (මූලාශ්‍රය :- මීගමුව මහනගර සභාවේ සම්පත් පැතිකඩ 2016) (ඇමුණුම 16)

6.6.1.3.මීගමුවේ ශාන්ත ස්ටීවන් පල්ලිය

18 වන ශත වර්ෂයේ ශ්‍රී ලංකාවේ බොහෝ ජනාවාස ලන්දේසීන්ගේ සිට බ්‍රිතාන්‍ය යටත් විජිතයන් බවට පත්වී තිබුණි. නමුත් මහනුවර රාජධානියේ කඩා වැටීමෙන් අනතුරුව 1815 දී මුළු දිවයිනම බ්‍රිතාන්‍යයන්ගේ ආධිපත්‍යයට යටත් විය. 1845 ජේම්ස් චැෂ්මන් කොළඹ ප්‍රථම බිෂොප්වරයා විය. 18 වන සියවසේ මීගමුව තුළ පල්ලියක් ඉදිකිරීමට එංගලන්ත සභාවට අවශ්‍යවූ අතර, 1816 දී ඒ සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට කටයුතු කෙරිණි. මෙම තෝරාගත් භූමිය කලින් ලන්දේසි කොටුව ලෙස හැදින්වේ. කොළඹ බිෂොප්තුමා පූජක රෙජිනෝල් ස්ටීවන් කොප්ස්ටන් විසින් 1876 සැප්තැම්බර් මස 23 වන දින පල්ලියක් ගොඩනගා ගැනීම සඳහා රාජ්‍ය දීමනා පත්‍රයක් ලබාගන්නා ලදී. මීගමුව පල්ලියේ භාරකරුවන් වූයේ හෙන්රි බෙල්, චාර්ල්ස් කාරලන්බර්ග් සහ හැරී මලෝ ෆීඩිය. මෙම භූමිය රූඩ් 02 සහ පර්චස් 17 කින් යුක්ත වේ. 1877 අග භාගය වන විට පල්ලියේ කටයුතු අවසන් කළ අතර, එය ඉදිකරන තුරු පල්ලි කටයුතු පවත්වන ලදී. 1979 ජූලි මස 31 දින උත්සවාකාරයෙන් විවෘත කිරීමේ උත්සවය පැවැත්විණි. පැරණි යුරෝපීය වාස්තු විද්‍යාත්මක ශෛලීන් උපයෝගී කොට ගෙන මෙම පල්ලිය ගොඩනගා ඇත. කුඩා ප්‍රමාණයේ ගල් කුරුසයක් ඉහළ උඩුවහලේ උළුවල කපා ඇත. පල්ලිය තුළ අභ්‍යන්තර අවකාශය අඩි 24 කි. පල්ලියේ

අභ්‍යන්තර අවකාශයේ ඉතා හොඳ ආලෝකයක් සපයන ජනේල රාශියක් ඇත. දේවස්ථානයේ උතුරු කොටසේ පසුකාලීනව විවිධ නටඹුන් සහ සන්ධාරයක් ඉදිකරන ලදී.(ඇමුණුම 17)

6.6.1.4.මීගමුව ශාන්ත මරියා පල්ලිය

ශාන්ත මරියා පල්ලිය මීගමුව මධ්‍යයේ ග්‍රෑන්ඩ් වීදියෙහි පිහිටා ඇත. පෘතුගීසීන් මීගමුව ආක්‍රමණය සිදු කල කාලය වන විට කිතුණු ආගමික ඇදහිල්ල එහි පැවතිණි. නගරයේ බොහෝ පල්ලි පැවතීම හේතුවෙන් එය පුංචි රෝමය ලෙස හැඳින්විණි. (ඇමුණුම 18)

මෙය 1874 ඉදිකිරීමට ආරම්භ කර ඇති අතර, දීර්ඝ කාල පරතරයකින් පසුව 1922 දී මෙහි ඉදිකිරීම් අවසන් කරන ලදී. මෙම පල්ලියේ කලාත්මක බව සහ ගෘහ නිර්මාණ ශිල්පය ශ්‍රී ලංකාවේ පල්ලි කිහිපයකට සමාන වන අතර, 20 වන ශතවර්ෂයේ මුල් අවධියේ ශ්‍රී ලංකීය කලාව සහ ගෘහ නිර්මාණ ශිල්පය සමඟ යුරෝපීය සංස්කෘතියෙහි ඒකාබද්ධතාවයන් මෙහි දක්නට ඇත. මෙම පල්ලිය නව සම්භාව්‍යවාදී ආකාරයේ කණු සහ හිස් බිත්ති වලින් සාදා ඇත. එහි සිවිලිම බොහෝ සාන්තුවරයන්ගේ කිරිගරුඬ රූපවලින් වර්ණාලේප කර ඇත. ඉහළ මට්ටම්වල බිත්තිවල ආගමික සාන්තෘවරුන්ගේ මූර්ති සවිකර ඇත. සිවිලිම මත ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ අද්විතීය සිදුවීම් ශ්‍රී ලාංකික බෞද්ධ චිත්‍ර ශිල්පියෙකු වූ එන්. එස්. ගොඩමාන්න මහතා විසින් සිතුවම් කර ඇත. පලිල්යෙහි මැද කොටසෙහි සිතුවම්වල අලංකාරය “ගිගිරුම් සහිත” ලෙස විස්තර වේ. මෙහි ඇති පූජාසනය යුරෝපයෙන් ආනයනය කරන ලද්දකි.(මූලාශ්‍රය -මීගමුව මහනගර සභාවේ : සම්පත් පැතිකඩ 2016)

6.6.1.5.මීගමුව ශාන්ත සෙබස්තියන් පල්ලිය

මෙම පල්ලිය මීගමුවෙහි ශාන්ත සෙබස්තියන් වීදියෙහි පිහිටා ඇත. මෙම පල්ලිය නිර්මාණය කරන ලද්දේ මුහුදු වීදියේ පූජකවරයෙකු වූ ජී. ගොන්නන් පූජකයා විසිනි. 1936 පෙබරවාරි මස 02 දින කොළඹ අගරදගුරු පියරේ - ගුල්ලුමේ මාර්ක් විසින් මුල් ගල තැබූ නමුත් මුල් අවුරුදු දහයේදී එහි ඉදිකිරීම් සිදු නොවුණි. කතෝලිකයන් බහුතරයක් වාසය කරන මෙම කලාපයේ වැඩි වන කතෝලිකයන් සංඛ්‍යාව සඳහා පවතින කුඩා පල්ලියේ ප්‍රතිස්ථාපනයක් ලෙස මෙය ඉදිවිය. මෙය පැරණි යුරෝපීය ක්‍රමය හා ප්‍රංශයේ රීම්ස් ප්‍රධාන දේවස්ථානයේ ආභාෂය සමඟ ඉදිකොට ඇත. මෙම පල්ලියෙහි සෙවනැල්ල මීගමුව කලපුව තුළ දැකිය හැකිය. කතෝලික පල්ලි ඉතිහාසයේ වීරයෙකු ලෙස සලකන ශාන්ත සෙබස්තියන් වෙනුවෙන් මෙම පල්ලිය ඉදිකළ අතර, මෙය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පල්ලි අතුරින් එකකි. ඔහු විශේෂයෙන් සමරනු ලබන්නේ ජනවාරි මාසයෙහි මෙහි “ශාන්ත සෙබස්තියන්” මංගල්‍යය නමින් උත්සවයක් පැවැත්වේ. 1950 ට පෙර සෙබස්තියන්ගේ ජීවිතය ගැන විස්තර කරන ලද ටෙලි නාට්‍යයක් මෙහිදී භාවිත කරයි. සිංහලයේ නාට්‍යක් වන “රජ තුන් කට්ටුව” නාට්‍ය නත්තල් සමයේදී මෙහි පැවැත්වේ. ශාන්ත සෙබස්තියන් කැප කිරීම සඳහා ශාන්ත සෙබස්තියන් මංගල්‍ය මෙම දේවස්ථානයේදී ජනවාරි 20 වන දින වාර්ෂිකව පැවැත්වේ. මෙම අවස්ථාව සඳහා පල්ලිය පරිශ්‍රයේ සැරසූ කොඩියක් ඔසවා ඇත. මෙහි පෙරහැර සංවිධානය කරන අතර, එහිදී දුප්පත් ජනතාවට ආහාර ලබාදෙයි. (මූලාශ්‍රය - මීගමුව මහනගර සභාව - සම්පත් පැතිකඩ 2016) (ඇමුණුම 19)

6.6.1.6. මීගමුව ශ්‍රී සිතී විනයාගර් විහාරය

මෙම විහාරස්ථානය දෙවියන්ගේ විජාතිකයන් සඳහා වෙන්වී ඇත. මෙහි ගජ ලක්ෂ්මී, කතරගම දෙවියන්, නාග දෙවියන් සහ එහි විප්ලවය සහිත රූප දක්නට ඇත. මෙහි ප්‍රධාන වාර්ෂික මංගල්‍යය අගෝස්තු මාසයේ පැවැත්වේ. මෙම දිනය දෙවියන්ගේ උපන් දිනය නොහොත් හිරු බැස යන දිනය ලෙස හඳුන්වයි. මෙම උත්සවය දින 09 ක් පුරා පවත්වන අතර, එහි පෙරහැර 10 වන දිනයේ සැමරේ. එය තෙරෙයි ලෙස හඳුන්වයි. දේව මාළිගයේ ආරම්භය ඈත අතීතයේ සිට පැමිණෙන අතර, වර්තමාන තොරතුරු අනුව එය 1754 සිදුවීමක් ලෙස සැලකේ.(මූලාශ්‍රය : මීගමුව මහනගර සභාව - සම්පත් පැතිකඩ - 2016) (ඇමුණුම 20)

මීගමුව නගර සභා බල ප්‍රදේශයේ අනෙකුත් ආගමික ස්ථාන, පුරාවිද්‍යා ගොඩනැගිලි හා ජාතික උරුමයන් පිළිබද වැදගත් ස්ථාන, කඩොල්කැලේ, මීගමුව, පරණ බැටරි ගබඩාව, පැරණි ඕක් ගස, මෙතෝදිස්ත පල්ලිය, ශාන්ත බාබරා පල්ලිය, පැරණි තානායම, නව තානායම, සියලු සංස්කෘතික උරුම හා ගොඩනැගිලි සංරක්ෂණය කළයුතු අතර, පැරණි තානායම් හා නව තානායමේ පහසුකම් ලබාදෙමින් දේශීය සහ විදේශිකයන් සඳහා සංවර්ධනය කළ යුතුය.

(මූලාශ්‍රය - මීගමුව මහනගර සභාව - සම්පත් පැතිකඩ - 2016) (පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීමේ ලැයිස්තුව - 2012.12.12 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)

උපායමාර්ග

I. සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන ස්ථන පුරාවිද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව සංරක්ෂණය කිරීම.
II. සංරක්ෂණය කරන ලද ස්ථාන නිසි පරිදි නඩත්තු කිරීම.
III. මෙම ස්ථාන වල ඓතිහාසික හා සංස්කෘතික පුරාවිද්‍යාත්මක වටිනාකම් පිළිබඳව දැනුවත් භාවයක් ඇතිකිරීම සහ දේශීය විදේශීය සංචාරක වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම තුලින් ප්‍රදේශයේ ජනතාවට ආර්ථිකමය වශයෙන් දායකත්වයක් ලබා ගැනීමට කටයුතු කිරීම.

6.7 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය

"නීල හරිත තලයෙන් නැගෙන පුංචි රෝමය" යන මීගමුව සංවර්ධන සැලැස්මේ දැක්ම සාක්ෂාත් කර ගැනීම මෙම අරමුණු ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයේ අරමුණයි. සැලසුම් කිරීමේ අරමුණු, සංකල්ප, සමාජීය පාරිසරික ප්‍රතිලාභ හා ව්‍යාපෘති පිරිවැය අනුව මෙම ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබාදෙයි.අදාළ ක්‍රියාකාරී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ආයතන මෙම ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක වන අතර, පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය, පෞද්ගලික අංශයේ හා පොදු හවුල්කාරීත්වය යටතේ මෙම උපාය මාර්ගික ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි.

උපායමාර්ගික සැලසුම් ව්‍යාපෘති

"නීල හරිත තලයෙන් නැගෙන පුංචි රෝමය "යන දැක්ම ලඟාකර ගැනීමට සඳහා ප්‍රධාන සැලසුම් උපාය මාර්ගික ව්‍යාපෘති කිහිපයක් හඳුනාගෙන තිබේ.

6.7.1.1 සරක්කුකන්ද මධ්‍යම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපාතිය, දර්ශන නැරඹුම් තීරය සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතියේ නම	සරක්කුකන්ද මධ්‍යම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	සරක්කුකන්ද මධ්‍යම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය දර්ශන නැරඹුම් තීරය සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය යටතේ මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	පළාත	බස්නාහිර පළාත	දිස්ත්‍රික්කය	ගම්පහ
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මීගමුව	පලාත් පාලන ආයතනය	මීගමුව
මායිම් සීමාව	උතුරු	නැගෙනහිර	දකුණ	බටහිර
				✓
ප්‍රවේශය	මීගමුව- පමුණුගම පාර			

පිහිටීම් සිතියම

ව්‍යාපෘතියේ තාර්කිකත්වය

ව්‍යාපෘති වර්ගය	නව ඉදිකිරීමක්	✓	වැඩිදියුණු කිරීම		ව්‍යාපෘතිය		ඉඩම් සංවර්ධනය පමණි	

ව්‍යාපෘති වර්ගය	සංරක්ෂණ	වෙළඳ	භූදර්ශනය	උරුමය	නිවාස	ප්‍රතිස්ථාපනය	වෙනත්
							✓

ව්‍යාපෘතියේ තාර්කිකත්වය	මීගමුව නගරය, ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ බටහිර වෙරළ තීරය තුළ මීගමුව මහනගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ වාණිජ අගනුවර වන කොළඹ නගරයට කිලෝ මීටර් 35 ක් දුරින් සහ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලින් සහ නිදහස් වෙළඳ කලාපයෙන් කිලෝමීටර් 7 ක් දුරින් පිහිටා ඇත.ජාතික සන්දර්භය තුළ මීගමුව සැලසුම් ප්‍රදේශය උප නගරයක් වන අතර, මීගමුව ප්‍රදේශය පළාතෙහි ප්‍රධාන ආර්ථික නගරයක් ලෙස දැක්විය හැකිය. එහිදී ආර්ථිකයෙන් 45% ක් ධීවර කර්මාන්තයද, 35% ක් සංචාරක ව්‍යාපාරයද, ආර්ථිකයෙන් 20% ක් වාණිජ හා වෙනත් සේවා මත පදනම් වේ. එසේම ගම්පහ ප්‍රධාන දුම්රිය මාර්ග සහ මාර්ග පද්ධතිය එක්ව ප්‍රධාන වාණිජ, ප්‍රවාහන මධ්‍යස්ථාන, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් සැපයුම් කරුවෙකු ලෙස මීගමුව කටයුතු කරයි. 80% ක් පමණ කැපී පෙනෙන කතෝලික ජන ප්‍රතිශතයක් මීගමුව තුළ වාසය කරන අතර, එය විශේෂ සංස්කෘතික සැමරීම්, නාගරික උත්සව මගින් සජීවී නගරයක් බවට පවත්වා ගැනීම සඳහා දායක වේ. ඉහත සඳහන් කරුණුවලට සමගාමීම මීගමුව 2021-2030 කාලය තුළ ප්‍රධාන සංකල්පිත සංරචක හයක් සහිතව "නීල හරිත තලයෙන් නැගෙන පුංචි රෝමය " යන දැක්ම ලඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ. මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්මෙහි ප්‍රධාන උපාය මාර්ගයන් හතරක් වන නැරඹුම් ජැටිය, කලපුව, ආරුක්කු සහ රෝමාණු ආකෘතික ප්‍රදේශ ඇතුලත් වන සැලැස්මක් වන අතර එමගින් සංචාරක හා ධීවර කර්මාන්තය දියුණු කිරීම අරමුණු කරයි. මුහුදු වෙරළ තීරයේ විවිධාකාර අත්දැකීම් නිර්මාණය කිරීම දර්ශන නැරඹුම් තීරය උපාය මාර්ග යටතේ යෝජනා කර ඇති අතර, සරක්කුකන්ද මධ්‍යම වෙරළ උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය දර්ශන නැරඹුම් තීරය උපාය මාර්ගයට අයත් ක්‍රියාකාරී ව්‍යාපෘති වලින් එකක් වන අතර එය මීගමුවේ සංචාරකයන් සහ පුද්ගලයන් ගේ විනෝදය සඳහා ඉඩකඩ වෙන් කරනු ලබයි.
ව්‍යාපෘතියේ අරමුණු	මධ්‍යම වෙරළ උද්‍යානයක් හා ඊට සම්බන්ධ ක්‍රියාකාරකම් සහ ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම මගින් මීගමුව ප්‍රදේශයට පැමිණෙන නරඹන්නන් ආකර්ෂණය කර ගැනීම.

ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (1>වසර)		මධ්‍ය කාලීනව (1-3 වසර)		දිගු කාලීන (3 වසර)	✓	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	රු. මිලියන 200
මූල්‍ය ප්‍රතිපාදන	නාගරික සංවර්ධන අධිකාරියහා භාණ්ඩාගාර අරමුදල් සම්පාදනය							
සංරචකයන්	✓ විනෝදාස්වාදක අවකාශයන් සහිත වෙරළ උද්‍යාන සංවර්ධනය කිරීම ✓ වෙරළ ප්‍රදේශය භූමි අලංකරණය කිරීම ✓ පදික වේදිකා ✓ ආසන සහ ගෘහ භාණ්ඩ ✓ ආපනශාලා සහ අවන්හල් සංවර්ධනය කිරීම ✓ වැසිකිලි සංවර්ධනය ✓ විවේක කාමර සංවර්ධනය කිරීම ✓ ආලෝකකරණය සහ අනෙකුත් යටිතල පහසුකම් සැපයීම.							
6.7.1.16 මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම අනුව පදික සේවා සංවර්ධන උපාය මාර්ගය යටතේ ඩී. එස්. සේනානායක මාවතෙහි පදිකයන් සඳහා ඇවිදීමේ ප්‍රදේශ වැඩිදියුණු කිරීම.

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතියේ නම	ඩී. එස්. සේනානායක මාවතෙහි පදිකයන් සඳහා ඇවිදීමේ ප්‍රදේශ වැඩිදියුණු කිරීම
ව්‍යාපෘති යෝජනාව	ඩී. එස්. සේනානායක මාවතෙහි පදිකයන් සඳහා ඇවිදීමේ ප්‍රදේශ වැඩිදියුණු කිරීම පදික සේවා සංවර්ධන උපාය මාර්ගය මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	පළාත	බස්නාහිර පළාත	දිස්ත්‍රික්කය	ගම්පහ
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මීගමුව	පලාත් පාලන ආයතනය	මීගමුව
මායිම් සීමාව	උතුරු	නැගෙනහිර	දකුණ	බටහිර
		✓		
ප්‍රවේශය	ඩී. එස්. සේනානායක මාවත			
පිහිටීම් සිතියම				

ව්‍යාපෘතියේ තාර්කිකත්වය

ව්‍යාපෘති වර්ගය	නව ඉදිකිරීමක්		ඩිදියුණු කිරීම	✓	ව්‍යාප්තිය		ඉඩම් සංවර්ධනය පමණි

ව්‍යාපෘති වර්ගය	සංරක්ෂණ	වෙළඳ	භූදර්ශනය	උරුමය	නිවාස	ප්‍රතිස්ථාපනය	වෙනත්
							✓

ව්‍යාපෘතියේ තාර්කිකත්වය	වර්තමාන නිරීක්ෂණයට අනුව ඩී. එස්. සේනානායක මාවත වාහන සහ පදිකයින් සඳහා සුදුසු තත්ත්වයක නොමැත.මාර්ගයේ පළල ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් නොවේ. පදික මාර්ගයද ඉතා දුර්වල තත්වයක පවතී. එබැවින් මෙම මාර්ගය පුළුල් කිරීම සහ පදිකයන් සඳහා ඇවිදීමට පහසු ලෙස සංවර්ධනය කිරීම මෙහි අපේක්ෂාව වේ.

ව්‍යාපෘතියේ අරමුණු	රියදුරන් මෙන්ම පදිකයින් සඳහා පහසු ප්‍රවාහනය පහසුකම් ලබා දීම.

ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (1>වසර)		මධ්‍ය කාලීනව (1-3 වසර)		දිගු කාලීන (3 වසර)	✓	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	රු. මිලියන 200
මූල්‍ය ප්‍රතිපාදන	නාගරික සංවර්ධන අධිකාරිය- භාණ්ඩාගාර අරමුදල් සම්පාදනය							
ව්‍යාපෘති විස්තර	මෙම මාර්ගයේ වර්තමාන පළල මීටර් 6 කි.මෙම මාර්ගය මීටර් 6 ක ගොඩනැගිලි සීමාවක් සහිතව පුළුල් කර, පදික වේදිකා,මාර්ග ආලෝක පද්ධති,පදික මාරුවීම් සමඟ මාර්ගය උපරිම මීටර් 12ක් දක්වා වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාභ ලබා ගත හැකිය. • පදික මාර්ගවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම. • මගීන්ට වඩා හොඳ සහ සුවපහසු පහසුකම් සැපයීම. • මාර්ගයේ තදබදය අවම කිරීම.							
පිරිසැලසුම් සැලැස්ම								
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	මෙම ව්‍යාපෘතිය ඉදි කිරීමෙන් පසු නාගරික සංවර්ධන අධිකාරිය අධීක්ෂණය යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කර පවත්වාගෙන යනු ලැබේ.							

6.7.1.17 මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම අනුව පරිසර සංරක්ෂණ උපාය මාර්ගය යටතේ හැමිල්ටන් ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතියේ නම	හැමිල්ටන් ඇල පුනරුත්නාපන ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	හැමිල්ටන් ඇල පුනරුත්ථාපන ව්‍යාපෘතිය පරිසර සංරක්ෂණ ක්‍රම උපාය මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	පළාත	බස්නාහිර පළාත	දිස්ත්‍රික්කය	ගම්පහ
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මීගමුව	පලාත් පාලන ආයතනය	මීගමුව
මායිම් සීමාව	උතුරු	නැගෙනහිර	දකුණ	බටහිර
		✓		
ප්‍රවේශය	ප්‍රධාන වීදිය, මුහුදු වීදිය සහ පෝරුතොට පාර,			
පිහිටීම් සිතියම				

ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති වර්ගය	නව ඉදිකිරීමක්	✓	වැඩිදියුණු කිරීම		ව්‍යාප්තිය		ඉඩම් සංවර්ධනය පමණි	

ව්‍යාපෘති වර්ගය	සංරක්ෂණ	වෙළඳ	භූදර්ශනය	උරුමය	නිවාස	ප්‍රතිස්ථාපනය	වෙනත්
			✓				

ව්‍යාපෘතියේ තාර්කිකත්වය	හැමිල්ටන් ඇල කිලෝමීටර් 14 ක් පමණ දිගින් යුක්ත වන අතර එය මීගමුව පසු කරමින් පුත්තලම සිට කොළඹ දක්වා ගමන් කරයි.අතීතයේ මෙම ඇල මාර්ගයේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ප්‍රවාහන මාධ්‍යයක් ලෙස භාවිතා කරන ලදී.වර්තමානයේ මෙම ඇල මාර්ගය විවිධාකාරයෙන් දූෂණය වී ඇත. බොහෝ කර්මාන්ත වල අපද්‍රව්‍ය හා නිවාස වල අපද්‍රව්‍ය මෙම ඇලට පිට කරයි. ඇල මාර්ග, ගේබියන් බිත්ති ද ඉතා දුර්වල තත්ත්වයක පවතී. එබැවින්, පරිසර සංරක්ෂණ ක්‍රම උපාය යටතේ මෙම ඇල මාර්ගය පුනරුත්ථාපනය කිරීමට සහ දර්ශනීය ගුණාත්මක භාවය වැඩි කිරීමට මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරයි.
ව්‍යාපෘතියේ අරමුණු	හැමිල්ටන් ඇළෙහි පෙනුම සහ දර්ශනීය ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම.

ව්‍යාපෘතියේ තාර්කිකත්වය

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (1>වසර)		මාධ්‍ය කාලීනව (1-3 වසර)		දිගු කාලීන (3 වසර)	✓	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	රු. මිලියන 750
මූල්‍ය ප්‍රතිපාදන	නාගරික සංවර්ධන අධිකාරිය - භාණ්ඩාගාර අරමුදල් සම්පාදනය							
ව්‍යාපෘති විස්තර	මෙම ව්‍යාපෘතියට වැඩි වශයෙන් සංචාරකයින් ආකර්ෂණය වනු ඇත. ගංවතුර තත්ත්වය අවම කිරීම සඳහා නිසි ගේබියන් බිත්ති (canal banks) ඇති කිරීමට යෝජිතය.ව්‍යාපෘතිය හරහා බෝට්ටු සවාරි,පාපැදි ධාවනය සහ රාත්‍රී ක්‍රියාකාරකම් වැනි විනෝදාත්මක පහසුකම් යෝජනා කරනු ලැබේ. ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාභ ලබා ගත හැකිය ✓ ජල ප්‍රභවයේ භෞතික පෙනුම වැඩි කිරීම ✓ ගංවතුර තත්ත්වය අවම කිරීම ✓ විනෝදාස්වාද ක්‍රියාකාරකම් සැපයීම (බෝට්ටු ධාවනය, බයිසිකල් පැදීම, ඇවිදීම , ආපනශාලා සහ රාත්‍රී ක්‍රියාකාරකම්)							
පිරිසැලසුම් සැලැස්ම								
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කළ පසු , නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ මීගමුව නගර සභාවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ඇත.							

6.7.1.18 මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්මෙහි , කලපු සංවර්ධන උපාය මාර්ගය යටතේ දැව පාලම් සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතියේ නම	දැව පාලම් සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	දැව පාලම් සංවර්ධන ව්‍යාපෘතිය කලපු සංවර්ධන උපාය මාර්ගය මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	පළාත	බස්නාහිර පළාත	දිස්ත්‍රික්කය	ගම්පහ
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මීගමුව	පලාත් පාලන ආයතනය	මීගමුව
මායිම් සීමාව	උතුරු	නැගෙනහිර	දකුණ	බටහිර
			✓	
ප්‍රවේශය	මිගමුව - පමුණුගම මාර්ගය			
පිහිටීම් සිතියම				

ව්‍යාපෘතියේ තාර්කිකත්වය

ව්‍යාපෘති වර්ගය	නව ඉදිකිරීමක්	✓	වැඩිදියුණු කිරීම		ව්‍යාජිතිය		ඉඩම් සංවර්ධනය පමණි	

ව්‍යාපෘති වර්ගය	සංරක්ෂණ	වෙළඳ	භූදර්ශනය	උරුමය	නිවාස	ප්‍රතිස්ථාපනය	වෙනත්
							✓

ව්‍යාපෘතියේ තාර්කිකත්වය	නවීන නාගරික ජල ආශ්‍රිත කළමණාකරණය කලපු අශ්‍රිත ප්‍රදේශය දියුණු කිරීමේ ක්‍රමවේදයට අයත් වන අතර , දැව පාලම් සංවර්ධන කිරීම මෙහි එන ක්‍රියාකාරී ව්‍යාපෘති වලින් එකකි. මෙම කිලෝමීටර 5 ක් දිගැති දැව පාලම මගින් නව දැකුම්කලු දර්ශනයක් දැක ගැනීමට නරඹන්නන්ට අවස්ථාව ලබා දේ. මීගමුවට පැමිණෙන සංචරකයන් හා ප්‍රදේශවාසීන් සඳහා පොදු විනෝදාත්මක අවකාශයක් හා නූතන ජල ආශ්‍රිත සංවර්ධනයක් සැපයීම සිදුකෙරේ.
ව්‍යාපෘතියේ අරමුණු	ප්‍රදේශයට වැඩි සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සහ අද්විතීය අත්දැකීමක් ලබා දීම.

ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (1>වසර)		මධ්‍ය කාලීනව (1-3 වසර)		දිගු කාලීන (3 වසර)	✓	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	රු. මිලියන 3000
මූල්‍ය ප්‍රතිපාදන	නාගරික සංවර්ධන අධිකාරියහා භාණ්ඩාගාර අරමුදල් සම්පාදනය							
ව්‍යාපෘති විස්තර	මෙම ව්‍යාපෘතිය මගින් වෙරළ පරිසරය හරහා විවේකයක් ලබා ගැනීමට අපේක්ෂා කරන බොහෝ විදේශීය සංචාරකයින් හා දේශීය ජනතාවගේ අවශ්‍යතා සපුරාලනු ඇත. මීටර් 3 ක් පළල දැවමය දර්ශන ජැටියක් කැපුන්ගොඩ සිට අම්බලමුල්ල, සීදූව දක්වා නිර්මාණය කිරීමටත් , එමගින් වෙරල උද්‍යානය වෙත ළගා වීමට බලාපොරොත්තු වන අමුත්තන්ට දර්ශනීය දර්ශන තලයක් සමඟ , දිගු අඩිතාලමක් සපයයි. ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාබ ගත හැකිය. • විනෝද කටයුතු සඳහා විනෝදාත්මක අවකාශයක් නිර්මාණය කිරීම. • වෙරළ උද්‍යානය වෙත පැමිණෙන මහජනතාවට දර්ශන තල වේදිකාවක් ලබා දීම • ආසන පහසුකම් සහ ආපනශාලා පහසුකම් සහිතව භූමි අලංකරණය කිරීම							
පිරිසැලසුම් සැලැස්ම								
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	නාගරික සංවර්ධන අධිකාරිය සහ මීගමුව මහ නගරසභා අධීක්ෂණය යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මෙම ව්‍යාපෘතිය නඩත්තුකර පවත්වාගෙන යනු ලැබේ.							

6.7.1.19 මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම අනුව ලෙල්ලම ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ උපාය මාර්ග යටතේ ලෙල්ලම ධීවර ගම්මානය සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය .

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතියේ නම	ලෙල්ලම ධීවර ගම්මානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	ලෙල්ලම ධීවර ගම්මානය සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය ලෙල්ලම ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය කිරීම උපාය මාර්ග මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	පළාත	බස්නාහිර පළාත	දිස්ත්‍රික්කය	ගම්පහ
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මීගමුව	පලාත් පාලන ආයතනය	මීගමුව
මායිම් සීමාව	උතුරු	නැගෙනහිර	දකුණ	බටහිර
	✓			
ප්‍රවේශය	මිගමුව - පමුණුගම මාර්ගය			
පිහිටීම් සිතියම				

ව්‍යාපෘතියේ තාර්කිකත්වය

ව්‍යාපෘති වර්ගය	නව ඉදිකිරීමක්	✓	වැඩිදියුණු කිරීම		ව්‍යාප්තිය		ඉඩම් සංවර්ධනය පමණි	

ව්‍යාපෘති වර්ගය	සංරක්ෂණ	වෙළඳ	භූදර්ශනය	උරුමය	නිවාස	ප්‍රතිස්ථාපනය	වෙනත්
							✓

ව්‍යාපෘතියේ තාර්කිකත්වය	ලෙල්ලම ධීවර ගම්මානය සංවර්ධනය ලෙල්ලම ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ උපාය මාර්ග යටතේ දැක්වේ. මිගමුවේ ආර්ථිකයෙන් 45% ක් ධීවර කර්මාන්තය මත පදනම් වී ඇති අතර එය ප්‍රදේශයේ ප්‍රධාන සංරචකයකි. එහෙත් මෙම විභවය කිසිදු සංවර්ධන කටයුත්තක් මගින් දියුණු කිරීමට කටයුතු යොදා නොමැත. මෙම ව්‍යාපෘතිය මගින් මෙම කර්මාන්තය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම සහ ප්‍රදේශය සඳහා ආදායම් මාර්ගයක් ජනිත කිරීම, සංචාරක ප්‍රවර්ධනය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ.
ව්‍යාපෘතියේ අරමුණු	සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම හා ප්‍රදේශයේ ධීවර කර්මාන්තයේ ආදායම වැඩි කිරීම.

ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (1>වසර)		මධ්‍ය කාලීනව (1-3 වසර)		දිගු කාලීන (3 වසර)	✓	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	රු. මිලියන 200
මූල්‍ය ප්‍රතිපාදන	නාගරික සංවර්ධන අධිකාරිය- භාණ්ඩාගාර අරමුදල් සම්පාදනය							
ව්‍යාපෘති විස්තර	මෙම අක්කර 1.03 භූමි පමාණයක ඉඩම සංචාරක ගම්මානය සංවර්ධනය කිරීම යෝජිතව ඇත. ධීවර ප්‍රජාව සඳහා විධිමත් වැඩපිළිවෙළක් පමණක් නොව, මෙම කර්මාන්තයට වඩාත් හොඳ ආදායම් මාර්ගයක් සැපයීමටත් පහසුකම් සැලසීම සිදු කෙරේ.මෙමගින් ධීවර කර්මාන්තය සහ සංචාරක ව්‍යාපාරය යන දෙකම සංවර්ධනය කර ගැනීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාබ ලබා ගත හැකිය. • මුන්නක්කරයෙහි පිහිටි ගෘහ පදනම් කරගත් වියළි මත්සය ස්ථාන සංවර්ධනය කිරීම • මුන්නක්කරයෙහි සංචාරක නිවාස ප්‍රවර්ධනය • මුහුදු ආහාර සැකසුම් මධ්‍යස්ථාන සහ ආපනශාලා ස්ථාන ඇති කිරීම							
පිරිසැලසුම් සැලැස්ම								
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු නාගරික සංවර්ධන අධිකාරිය සහ මීගමුව මහ නගර සභාව විසින් සහ අධීක්ෂණය යටතේ නඩත්තු කර පවත්වාගෙන යනු ලැබේ.							

6.7.1.20 මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම අනුව බසාර් සංවර්ධන උපාය මාර්ගික වැඩසටහන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය සතු තානායම ප්‍රතිසංවර්ධනය කිරීම

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතියේ නම	නාගරික සංවර්ධන අධිකාරිය සතු තානායම ප්‍රතිසංවර්ධනය කිරීම
ව්‍යාපෘති යෝජනාව	නාගරික සංවර්ධන අධිකාරිය සතු තානායම ප්‍රතිසංවර්ධනය කිරීම බසාර් සංවර්ධන උපාය මාර්ගික වැඩසටහන යටතේ මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	පළාත	බස්නාහිර පළාත	දිස්ත්‍රික්කය	ගම්පහ
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මීගමුව	පලාත් පාලන ආයතනය	මීගමුව
මායිම් සීමාව	උතුරු	නැගෙනහිර	දකුණ	බටහිර
	✓			
ප්‍රවේශය	රේගු නිවාස මාර්ගය			
පිහිටීම් සිතියම				

ව්‍යාපෘතියේ තාර්කිකත්වය

ව්‍යාපෘති වර්ගය	නව ඉදිකිරීමක්	✓	වැඩිදියුණු කිරීම		ව්‍යාප්තිය		ඉඩම් සංවර්ධනය පමණි	

ව්‍යාපෘති වර්ගය	සංරක්ෂණ	වෙළඳ	භූදර්ශනය	උරුමය	නිවාස	ප්‍රතිස්ථාපනය	වෙනත්
							✓

ව්‍යාපෘතියේ තාර්කිකත්වය	නාගරික සංවර්ධන අධිකාරිය සතු තානායමේ අඩු ක්‍රියාකාරීත්වය නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර සමීක්ෂණයෙන් තහවුරුවිය. පහසුකම් නොමැතිකම සහ අඩු නඩත්තු කිරීම මෙයට හේතු වී ඇති බව දැකගත හැක. මේ සඳහා තානායම ක්‍රියාකාරී අවකාශයක් බවට පත් කිරීමටත් මේ මෙයට වැඩි ආගන්තුක පිරිසක් ආකර්ශනය කරගැනීමටත් මේ ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කෙරේ.
ව්‍යාපෘතියේ අරමුණු	මෙම තානායමේ ආකර්ෂණය වැඩි කර වඩා ක්‍රියාකාරී ස්ථානයක් බවට පත්කිරීම.

ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (1>වසර)		මාධ්‍ය කාලීනව (1-3 වසර)		දිගු කාලීන (3 වසර)	✓	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	රු. මිලියන 1000	
මූල්‍ය ප්‍රතිපාදන	නාගරික සංවර්ධන අධිකාරිය- භාණ්ඩාගාර අරමුදල් සම්පාදනය								
ව්‍යාපෘති විස්තර	මෙම අක්කර 3 පර්චස් 19 ක මෙම ඉඩම මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වේ. නවීන පහසුකම් සහිතව මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට යෝජනා කෙරේ. ආපන ශාලා, වාහන නැවැත්වීමේ පහසුකම් සහ ළමා ක්‍රීඩාංගන සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාභ ලබා ගත හැකිය. • නානායම සඳහා වඩා හොඳ සැලසුමක් සැපයීම. • නේවාසික නිවාඩු නිකේතනයක් ලෙස සංවර්ධනය කිරීම. • ආසන පහසුකම් සහිතව භූමි අලංකරණය. • ගොඩනැගිල්ලේ අභ්‍යන්තර පහසුකම් සංවර්ධනය කිරීම.								
පිරිසැලසුම් සැලැස්ම									
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණයෙන් පසු මෙම ව්‍යාපෘතිය නඩත්තු කර පවත්වාගෙන යනු ලැබේ.								

6.7.1.21 මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම අනුව පොදු ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගය යටතේ දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතියේ නම	දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය පොදු ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගය මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	පළාත	බස්නාහිර පළාත	දිස්ත්‍රික්කය	ගම්පහ
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මීගමුව	පළාත් පාලන ආයතනය	මීගමුව
මායිම් සීමාව	උතුරු	නැගෙනහිර	දකුණු	බටහිර
ප්‍රවේශය	ඩී.එස්. සේනානායක මාවත			
පිහිටීම් සිතියම				

ව්‍යාපෘතියේ තාර්කිකත්වය

ව්‍යාපෘති වර්ගය	නව ඉදිකිරීමක්		වැඩිදියුණු කිරීම	✓	ව්‍යාප්තිය		ඉඩම් සංවර්ධනය පමණි	

ව්‍යාපෘති වර්ගය	සංරක්ෂණ	වෙළඳ	භූදර්ශනය	උරුමය	නිවාස	ප්‍රතිස්ථාපනය	වෙනත්
							✓

ව්‍යාපෘතියේ තාර්කිකත්වය	මීගමුවෙහි ප්‍රධාන දුම්රිය ස්ථානය මෙයයි. එහෙත් දැනට පවතින පහසුකම් ප්‍රමාණවත් නොවේ. දුම්රිය ස්ථානය ද අබලන්ව ඇති අතර මගීන් සඳහා සුදුසු ආසන පහසුකම් නොමැත. එබැවින් මෙම දුම්රිය ස්ථානය නැවත සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.
ව්‍යාපෘතියේ අරමුණු	දුම්රිය ස්ථානයේ පහසුකම් වැඩිදියුණු කිරීම සහ මගීන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීම

ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (1>වසර)		මාධ්‍ය කාලීනව (1-3 වසර)		දිගු කාලීන (3 වසර)	✓	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	රු. මිලියන 1500
මූල්‍ය ප්‍රතිපාදන	නාගරික සංවර්ධන අධිකාරිය							
ව්‍යාපෘති විස්තර	මීගමුව දුම්රිය ස්ථානයට පැමිණෙන මගීන් සඳහා මෙම ව්‍යාපෘතිය මගින් පහසුකම් සපයනු ඇත. මගීන් සඳහා සුදුසු ආසන පහසුකම්, ආපනශාලාව, වැසිකිළි පහසුකම් සහ අවශ්‍ය පහසුකම් සැපයෙනු ඇත. ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාබ ලබා ගත හැකිය. • දුම්රිය ස්ථානයේ භෞතික පෙනුම වැඩි කිරීම. • මගීන්ට වඩා හොඳ සහ සැපපහසු පහසුකම් සැපයීම.							
පිරිසැලසුම් සැලැස්ම								
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	නාගරික සංවර්ධන අධිකාරිය සහ මීගමුව නගර සභාව අධීක්ෂණය යටතේ මෙම ව්‍යාපෘතිය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරනු ලැබේ.							

6.7.1.22 මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම අනුව ආරුක්කු සහ රෝම පරිසරය සංවර්ධනය කිරීම උපාය මාර්ගය යටතේ ඒත්තුකාල කුඩා වෙරළ උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතියේ නම	ඒත්තුකාල කුඩා වෙරළ උද්‍යානය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	ඒත්තුකාල කුඩා වෙරළ උද්‍යානය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආකේඩ් සහ රෝම පරිසරය සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	පළාත	බස්නාහිර පළාත	දිස්ත්‍රික්කය	ගම්පහ
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මීගමුව	පලාත් පාලන ආයතනය	මීගමුව
මායිම් සීමාව	උතුරු	නැගෙනහිර	දකුණ	බටහිර
		✓		
ප්‍රවේශය	පෝරුතොට මාර්ගය			
පිහිටීම් සිතියම	 			

ව්‍යාපෘතියේ විස්තරය

ව්‍යාපෘති වර්ගය	නව ඉදිකිරීමක්		වැඩිදියුණු කිරීම	✓	ව්‍යාප්තිය		ඉඩම් සංවර්ධනය පමණි	

ව්‍යාපෘති වර්ගය	සංරක්ෂණ	වෙළඳ	භූදර්ශනය	උරුමය	නිවාස	ප්‍රතිස්ථාපනය	වෙනත්
							✓

ව්‍යාපෘතියේ තාර්කිකත්වය	2021 – 2030 කාලය තුළ ප්‍රධාන සංකල්පිත සංරචක 6 ක් සහිතව "නීල හරිත තලයෙන් නැගෙන පුංචි රෝමය" වන දැක්ම ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ. ප්‍රධාන උපාය මාර්ග 4 ක් වන දර්ශන නැරඹුම් තීර දියුණු කිරීම, කලපුව, ආරුක්කු සහ රෝමානු ආකෘතික ප්‍රදේශය සංවර්ධනය කිරීම සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්මෙහි අරමුණයි.ආරුක්කු සහ රෝමානු ආකෘතික ප්‍රදේශය දියුණු කිරීම උපාය මාර්ගය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් ලෙස ඒතුකාල කුඩා වෙරළ උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය මගින් රට වැසියන්ට සහ සංචාරකයන්ට මුහුදු වෙරළ තීරයේ විවිධාකාර අත්දැකීම් සමඟ විනෝදජනක අවකාශයක් ලබාදීමට සැලසුම් කර ඇත.
ව්‍යාපෘතියේ අරමුණු	✓ දැනට පවත්නා වෙරළ උද්‍යානය නැවත නගා සිටුවමින් මීගමුවට වැඩි සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම. ✓ විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා ඉඩකඩ සැපයීම.

ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (1>වසර)		මධ්‍ය කාලීනව (1-3 වසර)		දිගු කාලීන (3 වසර)	✓	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	රු. මිලියන 100
මූල්‍ය ප්‍රතිපාදන	නාගරික සංවර්ධන අධිකාරිය- භාණ්ඩාගාර අරමුදල් සම්පාදනය							
සංරචක	• විනෝදාත්මක අවකාශයන් සහිතව වෙරළ උද්‍යානය සංවර්ධනය කිරීම. • ඇවිදීමේ මාර්ග , ආසන පහසුකම් , තණකොළ සහ තණ බිම් සමඟ භූමි අලංකරණය කිරීම. • කබානා කුටි සංවර්ධනය කිරීම. • ක්‍රීඩා ප්‍රදේශ , පිහිනුම් තටාකය, ශ්‍රවනාගාර නැවත සංවර්ධනය කිරීම. • වාහන නැවතීමේ ස්ථාන සංවර්ධනය කිරීම.							
ව්‍යාපෘති විස්තර	මෙම අක්කර 4 ක ඉඩමේ / වැලි වෙරළ තීරයෙහි යෝජිත ඉඩමෙහි ඒතුකාල කුඩා වෙරළ උද්‍යානයක් හා ඊට අදාළ පහසුකම්, භූමි අලංකරණය, ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ පිවිසුම් මාර්ග සංවර්ධනය කෙරේ. මෙම ව්‍යාපෘතිය මගින් වෙරළ තීරය වෙතට දිනපතා නරඹන්නන් 10000 ක් පමණ අපේක්ෂා කරන අතර විවේකය හා ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා පැමිණෙන විදේශිකයන් මෙන්ම දේශීය ජනතාවට සේවා සපයයි.වැසිකිළි සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව මාර්ග, කබානා, පිහිනුම් තටාක, ක්‍රීඩාංගන , ශ්‍රවනාගාර , සාප්පු සංකීර්ණ, වාහන නැවතීමේ ස්ථාන , ආපන ශාලා , තෘණ බිම්වල නිර්මාණය කල ආසන සමඟ භූමි අලංකරණය කිරීම.මෙම ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාබ ලබා ගත හැකිය. • කබානා , ඇවිදීමේ මංතීරු , වෙළඳ කුටි සමඟ වෙරල තීරය සංවර්ධනය කිරීම. • වොලිබෝල්, පිහිනුම්, තටාක යනාදිය වැනි ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා ඉඩකඩ ලබා දීම • ප්‍රදේශය ඇවිදීමේ මංතීරු , ආසන සහ ගස් සමග භූමි අලංකරණය කිරීම • අමුතන් සඳහා කබානා පහසුකම් ලබාදීම. • සාප්පු අත්දැකීම් සහ අමුත්තන් සඳහා ආහාර ආපන ශාලා සැපයීම.							
පිරිසැලසුම් සැලැස්ම								
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	වෙරළ සංරක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ, මීගමුව මහ නගර සභාව විසින් මෙම ඒත්තුකාල වෙරල සංවර්ධන ව්‍යාපෘතිය නඩත්තු කර පවත්වාගෙන යා යුතුය.							

6.7.1.23 මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම අනුව කලපුව සංවර්ධනය කිරීමේ උපාය මාර්ග යටතේ කිංග්ස් දූපත පුනර්ජීවන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතියේ නම	කිංග්ස් දූපත පුනර්ජීවන ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	කිංග්ස් දූපත පුනර්ජීවනය ව්‍යාපෘතිය කලපුව සංවර්ධනය කිරීමේ උපාය මාර්ග මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	පළාත	බස්නාහිර පළාත	දිස්ත්‍රික්කය	ගම්පහ
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මීගමුව	පලාත් පාලන ආයතනය	මීගමුව
මායිම් සීමාව	උතුරු	නැගෙනහිර	දකුණු	බටහිර
	✓			
ප්‍රවේශය	පෝරුතොට මාර්ගය			
පිහිටීම් සිතියම				

ව්‍යාපෘතියේ තාර්කිකත්වය

ව්‍යාපෘති වර්ගය	නව ඉදිකිරීමක්		වැඩිදියුණු කිරීම	✓	ව්‍යාප්තිය		ඉඩම් සංවර්ධනය පමණි	
ව්‍යාපෘති වර්ගය	සංරක්ෂණ	වෙළඳ	භූදර්ශනය	උරුමය	නිවාස	ප්‍රතිස්ථාපනය	වෙනත්	
			✓				✓	
ව්‍යාපෘතියේ තාර්කිකත්වය	මීගමුව නගරය, ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ බටහිර වෙරළ තීරය තුළ මීගමුව මහනගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ වාණිජ අගනුවර වන කොළඹ නගරයට කිලෝ මීටර් 35 ක් දුරින් සහ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලින් සහ නිදහස් වෙළඳ කලාපයෙන් කිලෝමීටර් 7 ක් දුරින් පිහිටා ඇත.ජාතික සන්දර්භය තුළ මීගමුව සැලසුම් ප්‍රදේශය උප නගරයක් වන අතර, මීගමුව ප්‍රදේශය පළාතෙහි ප්‍රධාන ආර්ථික නගරයක් ලෙස දැක්විය හැකිය. එහිදී ආර්ථිකයෙන් 45% ක් ධිවර කර්මාන්තයද, 35% ක් සංචාරක ව්‍යාපාරයද, ආර්ථිකයෙන් 20% ක් වාණිජ හා වෙනත් සේවා මත පදනම් වේ. එසේම ගම්පහ ප්‍රධාන දුම්රිය මාර්ග සහ මාර්ග පද්ධතිය එක්ව ප්‍රධාන වාණිජ, ප්‍රවාහන මධ්‍යස්ථාන, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් සැපයුම් කරුවෙකු ලෙස මීගමුව කටයුතු කරයි.ඉහත සඳහන් කරුණුවලට සමගාමීම මීගමුව 2021-2030 කාලය තුළ ප්‍රධාන සංකල්පිත සංරචක හයක් සහිතව “නිල හරිත තලයෙන් නැගෙන පුංචි රෝමය” යන දැක්ම ලඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ. මීගමුව සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්මෙහි ප්‍රධාන උපාය මාර්ගයන් හතරක් වන දර්ශන නැරඹුම් තීර, කලපුව, ආරුක්කු සහ රෝමාණු ආකෘතික ප්‍රදේශය ඇතුලත් වන සැලැස්මක් වන අතර එමගින් සංචාරක හා ධීවර කර්මාන්තය දියුණු කිරීම අරමුණු කරයි. වර්තමානයේදී, කිංග්ස් දූපත ප්‍රදේශ අනිසි ලෙස භාවිතා කිරීම හේතුවෙන් අඩු ප්‍රතිසංස්කරණයකට ලක්ව ඇත. එනම් ධීවරයාත්‍රා හා මත්සය අපද්‍රව්‍ය හේතුවෙන් මෙම ප්‍රදේශය දුර්ගන්ධ වීම නිසා එම ප්‍රදේශයේ ආකර්ෂණය අඩුවීමට බලපා ඇත. කලපු සංවර්ධන උපාය								

	මාර්ගය යටතේ කිංග්ස් දූපත ප්‍රතිසංස්කරණය කිරීම එක් ක්‍රියාකාරී ව්‍යාපෘතියක් වන අතර එතුලින් තුලින් මෙහි දර්ශන ගුණාත්මක භාවය වැඩි කිරීමටත් රට වැසියන්ට සහ සංචාරකයන්ට කලපු ප්‍රදේශයේ සංචාරක අත්දැකීම් සමඟ විනෝදජනක අවකාශයක් ලබාදීමට සැලසුම් කර ඇත.
ව්‍යාපෘතියේ අරමුණු	• මීගමුවට වැඩි සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රදේශය පුනර්ජවනනය කිරීම • විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා ඉඩකඩ සැපයීම

ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (1>වසර)		මධ්‍ය කාලීනව (1-3 වසර)	✓	දිගු කාලීන (3 වසර)		මුළු ඇස්තමේන්තුගත පිරිවැය	රු. මිලියන 200
මූල්‍ය ප්‍රතිපාදන	නාගරික සංවර්ධන අධිකාරිය හා භාණ්ඩාගාර අරමුදල් සම්පාදනය							
සංරචක	✓ කිංග්ස් දූපත ප්‍රදේශය විනෝදාත්මක ප්‍රදේශයක් සමග සංවර්ධනය කිරීම . ✓ කිංග්ස් දූපත භූමි ප්‍රදේශය ඇවිදීමේ මංතීරු සමඟ භූමි අලංකරණය නිර්මාණය. ✓ බෝට්ටු අංගනය සංවර්ධනය කිරීම. ✓ ටිකට්පත් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම . ✓ ආහාර ආපන ශාලා සංවර්ධනය. ✓ දර්ශන නැරඹුම් තීර සංවර්ධනය කිරීම. ✓ පොකුණු ප්‍රදේශ සංවර්ධනය කිරීම .							

ව්‍යාපෘති විස්තර	පර්චස් 100 වන මෙම භූමිය සංවර්ධනය කර සංචාරක කටයුතු ආශ්‍රිත පහසුකම්, භූමි අලංකරණය, විනෝදාත්මක ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමට යෝජනා වී ඇත.කලපු පරිසරය තුළ විවේක හා ක්‍රීඩා කටයුතු සඳහා අපේක්ෂා කරන විදේශිකයන් හා දේශීය ජනතාව 10000 කට පමණ දිනපතා පැමිණෙන්නන් ලෙස මෙම ව්‍යාපෘතිය මගින් පහසුකම් සපයනු ලැබේ.මෙම ව්‍යාපෘතියේ විනෝදාත්මක ස්ථාන, ධාවන පථය, බෝට්ටු අංගනය, ටිකට්පත් මධ්‍යස්ථාන, ආහාර ආපන ශාලා , දර්ශන නැරඹුම් තීර සහ පොකුණු ප්‍රදේශ සංවර්ධනය කෙරේ.ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාබ ලබා ගත හැකිය • ධාවන පථය , විනෝදාත්මක ස්ථාන , බෝට්ටු අංගන, ටිකට්පත් මධ්‍යස්ථාන, ආහාර ආපන ශාලා , දර්ශන නැරඹුම් තීර සහ පොකුණු ප්‍රදේශ සමග කිංග්ස් දූපත වැඩි දියුණු කිරීම. • විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා ඉඩකඩ සැපයීම. • ක්‍රීඩාංගන,බැංකු ,ගස් යන අංග වලින් භූමි අලංකරණය කිරීම .
පිරිසැලසුම් සැලැස්ම	
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම සහ උපදේශනය නාගරික සංවර්ධන අධිකාරිය , වෙරළ සංරක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර , මීගමුව මහ නගර සභාව විසින් නඩත්තුකර පවත්වාගෙන යා යුතුය.

6.7.2 ආයතනික සැකැස්ම

වගුව 6.15 ආයතනික සැකැස්ම

සැලසුම	උප සැලසුම් හා ක්‍රියාකාරී ව්‍යාපෘතිය	ආදාළ ආයතන (ඇමුණුම 11)	ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනයන්හි වගකීම්	දළ ඇස්තමේන්තුගත පිරිවැය (මිලියන)
කාර්මික සැලැස්ම (ආර්ථික කටයුතු සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය යටතේ)	සංචාරක හා ධීවර සංවර්ධන සැලැස්ම			
	දර්ශන නැරඹුම් තීර උපාය මාර්ගය දියුණු කිරීමේ උපාය මාර්ගය			
	ක්‍රියාකාරී ව්‍යාපෘති 01 : දූව කුඩා වෙරළ උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	75
	ක්‍රියාකාරී ව්‍යාපෘතිය 02 :- තලාහේන කුඩා වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	100
	ක්‍රියාකාරී ව්‍යාපෘතිය 03 :- මෝරවල කුඩා වෙරළ උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය		SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	100
	ක්‍රියාකාරී ව්‍යාපෘතිය 04 :- සරක්කුකන්ද කැපුන්ගොඩ ප්‍රධාන වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	200
	කලපුව සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය			

	ක්‍රියාකාරී ව්‍යාපෘති 01 : කිංග්ස් දූපත නැවත සංවර්ධනය කිරීම සහ විවෘත රංගභූමි සංවර්ධනය	නාගරිකසංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරිම	50
	ක්‍රියාකාරී ව්‍යාපෘති 02 : කැපුන්ගොඩ සිට අම්බලන්මුල්ල, සීදූව දක්වා කලපුව හරහා දැව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	නාගරිකසංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙරළ සංරක්ෂණ අධිකාරිය කලපු සංවර්ධන අධිකාරිය මාර්ග සංවර්ධන අධිකාරිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරිම	3000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 03 : කලපුවේ බස්නාහිර ප්‍රදේශයේ ඇවිදින මංතීරු සහ බයිසිකල් මංතීරු සංවර්ධන ව්‍යාපෘතිය (පළමු අදියර - මුන්නකරේ උතුර)	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරිම	3000
	ලෙල්ලම සංවර්ධන උපාය මාර්ගය			
	ක්‍රියාකාරී ව්‍යාපෘති 01 : ලෙල්ලම ප්‍රදේශයේ ධීවර ගම්මානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරිම	100

	ක්‍රියාකාරී ව්‍යාපෘති 02 : දැනට පවතින ධීවර වරාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	2000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 03 : ධීවර නැවතුම් ස්ථාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - පිටිපන, කුඩාපඩුව නගර I, නගර II, නගර III	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව කලපු සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	400
	ක්‍රියාකාරී ව්‍යාපෘති 04 : බෝට්ටු නැවතුම් ස්ථාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, රේගුව මාර්ගය, පොරුතොට රුපිනි වීදිය	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	500 M
	ආරුක්කු ප්‍රදේශය සහ රෝම ආකෘතික ප්‍රදේශය දියුණු කිරීමේ උපාය මාර්ගය			
	ක්‍රියාකාරී ව්‍යාපෘති 01: නාගරික මංසන්ධි වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - කොච්චිකඩේ, දළුව කොටුව, කොප්පරා හන්දිය, කට්ටුව, දළුපතන, ඩොල්පින් හන්දිය, පෙරියමුල්ල.	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	2000 M
	ක්‍රියාකාරී ව්‍යාපෘති 02: නාගරික සන්ධිස්ථාන ගොඩනැගීමේ ව්‍යාපෘතිය - කොච්චිකඩේ, කොප්පරා හන්දිය, දළුවකොටුව, කට්ටුව, දළුපතන, ඩොල්පින් හන්දිය	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	1000

	ක්‍රියාකාරී ව්‍යාපෘති 03 : නාම පුවරු සහ නගර පිවිසුම් ගොඩනැගිලි ව්‍යාපෘතිය - කොච්චිකඩේ, කොප්පරා හන්දිය, දළුවකොටුව, කට්ටුව, දළුපත, ඩොල්පින් හන්දිය	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව මාර්ග සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	1000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 04: ගොඩනැගිලි ස්ථම්භ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - බොලන්ජි මාර්ගයේ සිට පෝරුතොට මාර්ගය දක්වා	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව මාර්ග සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	
	ක්‍රියාකාරී ව්‍යාපෘති 05: පලඟතුරේ කුඩා වෙරළ උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ධීවර හා ජල සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙරළ සංරක්ෂණ අධිකාරිය වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	200 M
	ක්‍රියාකාරී ව්‍යාපෘති 06: ඒත්තුකාල කුඩා වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ධීවර හා ජල සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙරළ සංරක්ෂණ අධිකාරිය වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම.	100
ආර්ථික සංවර්ධන සැලැස්ම (ආර්ථික සංවර්ධන උපාය මාර්ග යටතේ)	නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම			
	බසාර් ප්‍රදේශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති			
	ක්‍රියාකාරී ව්‍යාපෘති 01: ප්‍රධාන වීදිය වෙළඳ තිරයක් සහිත විදියක් බවට පත්කිරීම	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	

	ක්‍රියාකාරී ව්‍යාපෘති 02: ජෝශප් වීදිය සාප්පු සංකීර්ණය සංවර්ධන ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	3000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 03: බහු මහල් වාහන නැවැත්වීමේ පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	2000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 04: නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ධීවර හා මත්ස්‍ය කටයුතු සංවර්ධන අධිකාරිය වෙරළ සංරක්ෂණ අධිකාරිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	5000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 05: මාළු වෙළඳ සංකීර්ණය ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	1500
	ක්‍රියාකාරී ව්‍යාපෘති 06: දැනට පවතින මීගමුව බන්ධනාගාරය වැලිහේන බන්ධනාගාරයට මාරු කර එම භූමියෙහි මීගමුව කෞතුකාගාරය ලෙස නැවත සංවර්ධන ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මීගමුව මහනගර සභාව බන්ධනාගාර දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	2000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 07: නාගරික සංවර්ධන අධිකාරියේ ස්ථානයම නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය සේවා සැපයීම ඉදිකිරීම	1000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 08: නාගරික පුනර්ජනනීය ප්‍රදේශවල ක්‍රියාකාරී විවෘත අවකාශයන් සංවර්ධන ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	5000

	ක්‍රියාකාරී ව්‍යාපෘති 09: නාගරික පුනර්ජීවන ප්‍රදේශය තුළ නාට්‍ය ශාලා සංවර්ධන ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ජලජ හා ධීවර සම්පත් දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	5000
ප්‍රවාහන සැලැස්ම (භෞතික සංවර්ධන උපාය මාර්ගය යටතේ)	ප්‍රවාහන සංවර්ධන සැලැස්ම			
	පොදු ප්‍රවාහන සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය			
	ක්‍රියාකාරී ව්‍යාපෘති 01: කොළඹ - පුත්තලම ප්‍රධාන මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	මාර්ග සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	5000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 02 : පෝරුතොට මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	මාර්ග සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	3000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 03: මීගමුව - මීරිගම දුම්රිය මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	
	ක්‍රියාකාරී ව්‍යාපෘති 04: මීගමුව - පුත්තලම දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම (18 කණුවේ සිට පුත්තලම දක්වා ද්විත්ව මාර්ග	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	2000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 05: දුම්රිය ස්ථාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	1500
	ක්‍රියාකාරී ව්‍යාපෘති 06: ලෙල්ලම ප්‍රදේශය ඇතුළත වාහන නැවතුම් ස්ථානය සංවර්ධන ව්‍යාපෘතිය	ධීවර හා ජලජ හා සම්පත් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය මීගමුව මහනගර සභාව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	500
	පදික සේවා පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය			

	ක්‍රියාකාරී ව්‍යාපෘති 01 : බස් නැවතුම්පොළ හා යෝජිත සාප්පු සංකීර්ණය යා කරමින් ගුවන් පාලමක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය	මාර්ග සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	2000
	ක්‍රියාකාරී ව්‍යාපෘති 02: පදිකයන් සඳහා ඩී ඩී .එස්.සේනානායක මාවත තුළ පදික මංතීරුවක් ඇති කිරීමේ ව්‍යාපෘතිය	මාර්ග සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	150
පොදු විවෘත අවකාශ සංරක්ෂණය කිරීමේ සැලැස්ම (තිරසර පරිසර උපාය මාර්ගය යටතේ)	පාරිසරික සංරක්ෂණ සහ කළමනාකරණ සැලැස්ම	වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව නාගරික සංවර්ධන අධිකාරිය ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	
පාරිසරික සංරක්ෂණ උපාය මාර්ගය				
	ක්‍රියාකාරී ව්‍යාපෘති 01: හැමිල්ටන් ඇල හරහා ප්‍රවාහන සංවර්ධනය කිරීම	සංචාරක සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	
	ක්‍රියාකාරී ව්‍යාපෘති 02: හැමිල්ටන් ඇල පුනර්ජනනය කිරීමේ ව්‍යාපෘතිය	සංචාරක සංවර්ධන අධිකාරිය ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වාරිමාර්ග දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	750
	ක්‍රියාකාරී ව්‍යාපෘති 03: කඩොල්කැලේ කඩොලාන උද්‍යානය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කලපු සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය සංචාරක සංවර්ධන අධිකාරිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	100

	අපද්‍රව්‍ය කළමනාකරණ උපාය මාර්ගය			
	ක්‍රියාකාරී ව්‍යාපෘති 01: ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශයේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව මූලික කරගනිමින් සිදුකරනු ලබන SHIFT ව්‍යාපෘතිය	ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය මීගමුව මහනගර සභාව නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	20
සමාජ සංවර්ධනය	සමාජ සංවර්ධන උපාය මාර්ගය			
	කොච්චිකඩේ - මීගමුව සාප්පු සංකීර්ණය සහ නිවාස සංවර්ධන ව්‍යාපෘතිය	ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය මීගමුව මහනගර සභාව නාගරික සංවර්ධන අධිකාරිය	SWOTඅධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	2000
	තලාදූව නිවාස සංවර්ධන ව්‍යාපෘතිය	ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය මීගමුව මහනගර සභාව නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	2000
	කොච්චකඩේ- දලුවකොටුව නිවාස සංවර්ධන ව්‍යාපෘතිය	ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය මීගමුව මහනගර සභාව නාගරික සංවර්ධන අධිකාරිය	SWOT අධ්‍යයනය නිර්මාණ කරණය සහ උපදේශනය ඉදිකිරීම	2000

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය 2021

II වන කොටස

ඉඩම් හා ගොඩනැගිලි උපායමාර්ගික සංවර්ධන සැලැස්ම

07 වන පරිච්ඡේදය

සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා

07 වන පරිච්ඡේදය

සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා

7.1.හැඳින්වීම

මීගමුව සංවර්ධන සැලැස්ම (2021-2030) " නීල හරිත තලයෙන් නැගෙන පුංචි රෝමය " යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් කරන ලද සැලැස්මකි. ඉදිරි වසර 10 සඳහා වූ ඉදිරි දැක්ම සාක්ෂාත් කර ගැනීමෙහිලා සකස් කරන ලද මෙම සංවර්ධන සැලැස්ම යටතේ ස්වභාවික පාරිසරික විභවතාවයන් ප්‍රශස්ත අයුරින් යොදාගැනීම තුළින් සංචාරක හා ධීවර කර්මාන්තය වැඩි දියුණු කිරීම මෙන්ම ඒ ඔස්සේ ආර්ථික සංවර්ධනය කේන්ද්‍ර කර ගැනීමත් ඒ සඳහා අවැසි අරමුණු හා පරමාර්ථයන් හඳුන්වා දී ඇත. ඒ අනුව ප්‍රදේශයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය 'යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ග හරහා ද, පරිසර සංරක්ෂණය හා ඒ ආශ්‍රිත උපද්‍රවයන් අවම කිරීම තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ගයන් හරහා ද, ආර්ථික සංවර්ධනය ඊට අදාළ උපාය මාර්ගයන් හරහා මෙන්ම සංස්කෘතිය හා උරුමයන් කළමනාකරණය ද ඒ ආශ්‍රිත උපාය මාර්ගයන් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට උපාය මාර්ගික සැලසුම් හඳුන්වා දී ඇත.මෙම විවිධ සැලසුම් යටතේ යෝජිත ව්‍යාපෘතිවලට අමතරව යෝජිත ඉඩම් පරිහරණ සැලැස්මේ දැක්වෙන පරිදි ප්‍රදේශයේ නොනවතින භෞතික සංවර්ධනය, හා කොටස 01 හි විස්තර කෙරෙන පරිදි මීගමුව ප්‍රදේශය සඳහා වන ඉදිරි දැක්මට අනුකූල වන පරිදි විදිමත් සංවර්ධනයක් අපේක්ෂවෙන් සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා මෙන්ම යෝජිත කලාපීකරණ නියමතා හඳුන්වා දී ඇත.

7.2 සංවර්ධන කලාප

මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ 2030 වසර සඳහා වන දැක්ම හි විස්තර කෙරෙන පරිදි එම අපේක්ෂිත භෞතික සංවර්ධනය ලඟා කර ගැනීම උදෙසා යෝජිත ඝනත්වයන් හා එම එක එක ප්‍රදේශයන්ට ආවේණික ලක්ෂණයන් මත පදනම්ව දීර්ඝ විද්‍යාත්මක විශ්ලේෂණයන් ද පාදක කර ගනිමින් මෙම ප්‍රදේශය ප්‍රධාන සංවර්ධන කලාප 08කට සහ තෙත්බිම් කලාප 02කට බෙදා වෙන් කොට ඇත. යෝජිත සංවර්ධන කලාප සැලැස්ම පහත සිතියම 7.1 හි දැක්වේ.

1.අඩු ඝණත්ව නීල හරිත සංචාරක කලාපය - Low Dense Blue GreenTourism Zone

2.අධි ඝණත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය - High Dense Promotional Tourism Zone

3.අධි ඝණත්ව විශේෂ වාණිජ කලාපය - High Dense Spceial Commercial Zone

4.අඩු ඝණත්වයෙන් යුතු උරුමයන් සහිත සංචාරක කලාපය - Low Dense Heritage Tourism Zone

5. අධි ඝණත්ව ධීවර නේවාසික කලාපය - High Dense Fishery Oriented Residential Zone

6. අර්ධ ඝණත්වයෙන් යුතු නීල සංචාරක කලාපය - Modarate Dense Blue Tourism Zone

7.අඩු ඝණත්වයෙන් යුතු පාරිසරික සංරක්ෂණ කලාපය - Low Dense Eco Conservation Zone

8.අර්ධ ඝණත්වයෙන් යුතු නේවාසික කලාපය - Moderate Dense Residential Zone

9. තෙත්බිම් ආරක්ෂිත කලාපය - Wetland Protection Zone

10.තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය - Wetland Nature Conservation Zone

7.2.1. යෝජිත කලාපීකරණ සැලැස්ම 2021 -2030

සිතියම 7.1 යෝජිත සංවර්ධන කලාපීකරණ සැලැස්ම



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය 2021

7.3 කලාප සංගුණකය

ඝණත්වය පදනම් කරගෙන කරනු ලැබූ කලාපිකරණ සැලැස්මට අනුකූලව එම එක් එක් කලාපය සඳහා බලපැවැත්වෙන ඝණත්වය නිර්ණය කිරීම උදෙසා කලාප සංගුණකය ගණනය කර ඇත. මේ සඳහා එක් එක් කලාප අනුව වර්තමානයේ සංවර්ධනය වී තිබෙන භාවිතයට ගැනෙන මුළු ඉඩකඩ තුල සංසරණය වන මුළු ජනගහනයක් එම එක් එක් ප්‍රදේශවල ජීවත් වන නේවාසික ජනගහනය මෙන්ම 2030 වසර වන විට පැවතිය හැකි මුළු සංසරණ හා නේවාසික ජනගහනය සලකා බැලෙන අතර එසේ පුරෝකථනය කරන ලද මුළු ජනගහනයට අනුව ප්‍රදේශ තුල පවතින සංවර්ධනය කල හැකි වපසරිය කොතෙක් දුරට සංවර්ධනය විය යුතු දැයි හඳුනා ගැනීම සිදු කෙරේ.

මෙහිදී සංවර්ධනය කල හැකි (Developable Space) භූමි ලෙස පවතින, වාණිජ , නේවාසික, ආයතනික, සංචාරක,හිස් ඉඩම් හා වෙනත් වගාවන් සඳහා යොදාගෙන තිබෙන භූමි ප්‍රමාණය සලකා බැලෙන අතර පරිසර සංරක්ෂණ ප්‍රදේශ, ජලාශ්‍රිත ප්‍රදේශ ආගමික හා පුරා විද්‍යාත්මක ප්‍රදේශ හා මහා මාර්ග සහ සියලු භූමි පරිභෝගයන් සංවර්ධනය කළ නොහැකි (Un-developable Lands) භූමි ලෙස සලකා ඉවත් කරනු ලැබිය**.**

මෙසේ ඒ ඒ කලාප වල යෝජිත ඝනත්වය අනුව කලාප සංගුණකය සෙවීම සංකීර්ණ පියවර 5 ක් ඔස්සේ සිදු කරනු ලැබීය. එම පියවර වලට අදාලව කලාප සංගුණකය ගණනය කල ආකාරය ඇමුණුම 22 මගින් විස්තරාත්මකව පැහැදිලි කර ඇත. ඒ අනුව මීගමුව සැලැසුම් බල ප්‍රදේශයේ යෝජිත කලාපීකරණ සැලැස්ම යටතේ එක් එක් කලාපයට අදාල වන කලාප සංගුණකය පහත වගු අංක 7.1 මගින් ඉදිරිපත්කර ඇත.

වගුව 7.1 කලාප සංගුණකය සහ ඒවායේ වර්ග ප්‍රමාණය

අංකය	කලාපය	සංගුණකය
1.	අඩු ඝණත්ව නීල හරිත සංචාරක කලාපය	1.5
2.	අධි ඝණත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය	2.5
3.	අධි ඝණත්ව විශේෂ වාණිජ කලාපය	2.3
4.	අඩු ඝණත්වයෙන් යුතු උරුමයන් සහිත සංචාරක කලාපය	0.5
5.	අධි ඝණත්ව ධීවර නේවාසික කලාපය	1.7
6.	අර්ධ ඝණත්වයෙන් යුතු නීල සංචාරක කලාපය	2.0
7.	අඩු ඝණත්වයෙන් යුතු පාරිසරික සංරක්ෂණ කලාපය	-
8.	අර්ධ ඝණත්වයෙන් යුතු නේවාසික කලාපය	1.8
9.	තෙත්බිම් ආරක්‍ෂිත කලාපය (අඩු ඝණත්වයෙන් යුතු පාරිසරික සංරක්ෂණ කලාපය)	-
10	තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය	-

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සංවර්ධනයන් සඳහා අවසරලත් ගෙබිම් ප්‍රමාණය නිර්ණය කිරීම 2021 ජූලි මස 08 බ්‍රහස්පතින්දා දින අංක 2235/54 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ IV වන කොටසේ 6 වන උප ලේඛනයේ “අ” , “ආ” යන ආකෘති පත්‍රයන්ට අනුකූලව මීගමුව සංවර්ධන සැලැස්මට අදාල වන සංගුණකයන් වගු අංක 7.2, 7.3 මගින් දක්වා ඇත.

එකී අවසරලත් ගෙබිම් ප්‍රමාණයට අදාළ ගොඩනැගිල්ලේ විවෘත අවකාශය නිරණය කිරීම ඉහත ගැසට් පත්‍රයේ ‘ඉ’ ආකෘතිය මගින් දැක්වෙන අතර එය මීගමුව සංවර්ධන සැලැස්මේ වගු අංක 7.4 මගින් දක්වා ඇත.

උපලේඛනය 01

වගු අංක 7.2 "අ" පෝරමය - අවසරලත් ගෙබිම් අනුපාතයන්

"අ" පෝරමය - අවසරලත් ගෙබිම් අනුපාතයන්																								
ඉඩමේ ප්‍රමාණය (ව. මීටර්)	කලාපිය සංගුණකය = 0.50 - 0.74				කලාපිය සංගුණකය= 1.50-1.74				කලාපිය සංගුණකය = 1.75-1.99				කලාපිය සංගුණකය = 2.00-2.24				කලාපිය සංගුණකය = 2.25-2.49				කලාපිය සංගුණකය = 2.50-2.74			
	මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල			
	7 මීටර්	9 මීටර්	12 මීටර්	15මීටර් සහ වැඩි	7 මීටර්	9 මීටර්	12 මීටර්	15මීටර් සහ වැඩි	7 මීටර්	9 මීටර්	12 මීටර්	15මීටර් සහ වැඩි	7 මීටර්	9 මීටර්	12 මීටර්	15මීටර් සහ වැඩි	7 මීටර්	9 මීටර්	12 මීටර්	15මීටර් සහ වැඩි	7 මීටර්	9 මීටර්	12 මීටර්	15මීටර් සහ වැඩි
150 - 250ට අඩු	0.8	0.9	0.9	0.9	2.4	2.6	2.7	2.8	2.8	3.0	3.2	3.3	3.0	3.4	3.6	3.8	3.0	3.4	3.6	4.0	3.0	3.4	3.6	4.0
250 - 375 ට අඩු	0.9	1.0	1.2	1.3	2.6	3.2	3.6	4.0	3.0	3.4	4.3	4.7	3.2	3.6	4.5	4.5	3.5	3.8	4.5	5.0	3.5	4.0	5.0	5.5
375 - 500 ට අඩු	0.9	1.0	1.2	1.4	2.7	3.3	3.8	4.2	3.2	3.5	4.5	5.0	3.4	3.7	4.8	5.2	3.6	4.5	4.7	5.5	3.6	4.6	5.2	6.0
500 - 750 ට අඩු	1.0	1.1	1.3	1.5	2.8	3.4	4.0	4.5	3.4	3.6	4.7	5.5	3.5	4.0	5.0	6.0	3.7	5.0	5.0	6.0	3.7	5.1	5.5	6.5
750 - 1000 ට අඩු	1.0	1.2	1.4	1.7	3.1	3.6	4.3	5.0	3.5	3.8	5.1	6.0	3.6	4.5	5.7	6.5	3.8	5.1	6.0	6.5	3.8	5.2	6.5	7.0
1000 - 1500 ට අඩු	1.1	1.3	1.5	1.8	3.2	3.8	4.6	5.5	3.6	4.0	5.4	6.5	3.7	5.0	6.1	8.0	3.9	5.3	6.5	8.5	3.9	5.4	7.0	9.0
1500 - 2000 ට අඩු	1.1	1.4	1.7	2.0	3.4	4.0	5.0	6.0	3.7	4.2	5.8	7.0	3.8	5.1	6.7	9.0	4.0	5.4	7.0	*10	4.0	5.5	7.5	*10.5
2000 - 2500 ට අඩු	1.2	1.5	1.8	2.1	3.5	4.2	5.2	6.5	3.8	4.4	6.2	7.5	3.9	5.2	7.1	*10	4.0	5.5	7.5	*10.5	4.0	5.6	7.5	*11
2500 - 3000 ට අඩු	1.2	1.6	2.0	2.4	3.6	4.4	5.5	7.0	3.9	4.6	6.5	8.0	4.0	5.3	7.4	*10.5	4.0	5.6	7.5	*11	4.0	5.7	8.0	*11.5
3000 - 3500 ට අඩු	1.3	1.7	2.1	2.5	3.7	4.6	6.0	7.5	4.0	4.8	6.9	8.5	4.0	5.4	7.6	*11	4.0	5.7	8.0	*11.5	4.0	5.8	8.0	*12
3500 - 4000 ට අඩු	1.4	1.8	2.2	2.6	3.8	4.8	6.3	7.7	4.0	5.0	7.3	9.0	4.0	5.5	7.8	*11.5	4.0	5.8	8.0	*12	4.0	5.9	8.0	*12
4000ට වැඩි	1.5	1.9	2.3	2.8	4.0	5.0	6.5	8.0	4.0	5.2	7.5	9.5	4.0	5.6	8.0	*12	4.0	5.9	8.0	*UL	4.0	6.0	8.0	*UL

- UL - අසීමිතයි
- වාහන නැවතුම් සඳහා වෙන්කර ඇති ගෙබිම් ප්‍රමාණයන් ගෙබිම් අනුපාතය සඳහා ගණනය නොකරයි
- කලාපීය රෙගුලාසි යටතේ මහල් ප්‍රමාණය හෝ ගෙබිම් අනුපාතය දකවා ඇති විටකදී ඉහත ගෙබිම් අනුපාතයන් අදාළ නොවේ.
- සංවර්ධන සැලැස්ම යටතේ ඉඩමේ ආනතියට අනුව ඉහත ගෙබිම් අනුපාතයන් වෙනස් විය හැක
- ඉඩමේ ආනතිය අංශක 11ට වඩා වැඩිවනවිට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබාගත යුතුය
- * ගෙබිම් අනුපාතය 10.0 හෝ ඊට වැඩි ප්‍රමාණයක් සඳහා අවසර ලැබෙනුයේ අවම වශයෙන් මීටර් 12ක(මාර්ගයේ මැද සිට) ගොඩනැගිලි සීමාවක් පනවා ඇති ප්‍රවේශ මාර්ගය සඳහා පමණි. එසේ නොවන අවස්ථාවක උපරිම ගෙබිම් අනුපාතය 9.0 ට සීමා විය යුතුය.
- **සංවර්ධන සැලැස්මේ මීටර් 7 ක් පළල මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති මාර්ග සඳහා අවම මාර්ග පළල මීටර් 7 ක් ලෙස සලකනු ලැබේ

වගු අංක 7.3 "ආ" පෝරමය - මීටර් 3 සහ 4.5 මාර්ග සඳහා මහල් ප්‍රමාණයන්

"ආ" පෝරමය - මීටර් 3 සහ 4.5 මාර්ග සඳහා මහල් ප්‍රමාණයන්						
මාර්ගයේ අවම පළල	ඉඩමේ මුහුණතෙහි අවම පළල	ගෙබිම් ආවරණ ප්‍රතිශතය*	උපරිම මහල් ප්‍රමාණය			
			කලාපිය සංගුණකය 0.5 - 0.74	කලාපිය සංගුණකය 0.75 - 1.24	කලාපිය සංගුණකය 1.25 - 3.49	කලාපිය සංගුණකය 3.50 - 4.00
3.0 මීටර්	6 මීටර්	65%	1 (G)	2 (G+1)	3 (G+2)	3 (G+2)
4.5 මීටර්	6 මීටර්	65%	1 (G)	2 (G+1)	3 (G+2)	4 (G+3)

වාහන නැවතුම් ඉඩකඩද ඇතුලත්ව ඉහත මහල් ප්‍රමාණයන් දක්වා ඇත.

එක් එක් මාර්ග සඳහා නියමිත නිවාස ඒකක ප්‍රමාණයන් වෙනස් නොවේ .

* කලාපීය රෙගුලාසි යටතේ ගෙබිම් ආවරණ ප්‍රතිශතයන් දක්වා නොමැති විටකදී

වගු අංක 7.4 "ඉ" පෝරමය - විවෘත අවකාශයන්

"ඉ" පෝරමය - විවෘත අවකාශයන්											
ගොඩනැගිලි කාණ්ඩය	ගොඩනැගිල්ලේ උස (මීටර්)	ඉඩමේ මුහුණතෙහි අවම පළල (මීටර්)	ගෙබිම් ආවරණ ප්‍රතිශතය*		පසුපස අවකාශය (මීටර්)		පැති අවකාශය (මීටර්)		ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබාගන්නා වාලිං සඳහා	
			නේවාසික නොවන	නේවාසික	මෙම අන්තයෙන් ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා නොගන්නාවිට	මෙම අන්තයෙන් ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගන්නාවිට	මෙම අන්තයෙන් ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා නොගන්නාවිට	මෙම අන්තයෙන් ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගන්නාවිට	අවම පළල	අවම ගෙබිම් ප්‍රමාණය
අඩු උස	7ට අඩු	6	80%**	65%	2.3 මීටර්	2.3 මීටර්	-	2.3 මීටර්	2.3 මීටර්	5 ව. මීටර්
	7 - 15ට අඩු	6	65%	65%	3.0 මීටර්	3.0 මීටර්	-	3.0 මීටර්	3.0 මීටර්	9 ව. මීටර්
අතරමැදි උස	15 - 30ට අඩු	12	65%	65%	4.0 මීටර්	4.0 මීටර්	1.0 මීටර් සහ 3.0 මීටර්	4.0 මීටර්	4.0 මීටර්	16 ව. මීටර්
මධ්‍යම උස	30 - 50ට අඩු	20	65%	65%	4.0 මීටර්	5.0 මීටර්	3.0 මීටර් දෙපසින්	5.0 මීටර්	5.0 මීටර්	25 ව. මීටර්
අධි උස	50 - 75ට අඩු	30	50%***	50% ***	5.0 මීටර්	6.0 මීටර්	4.0 මීටර් දෙපසින්	6.0 මීටර්	6.0 මීටර්	36 ව. මීටර්
	75 සහ ඊට වැඩි	40ට වැඩි	50%***	50% ***	5.0 මීටර්	6.0 මීටර්	5.0 මීටර් දෙපසින්	6.0 මීටර්	6.0 මීටර්	****

ගොඩනැගිල්ලේ උස - ප්‍රවේශ මාර්ගය මට්ටමේ සිට ඉහල සදලු තලය හෝ වහලය මට්ටම දක්වා උස (වාහන නැවතුම් මහල්ද ඇතුලත්ව)

* කලාපීය රෙගුලාසි යටතේ ගෙබිම් ආවරණ ප්‍රතිශතයන් දක්වා නොමැති විටකදී

** සම්පූර්ණයෙන්ම නේවාසික නොවන සංවර්ධන කටයුතු සඳහා

*** ගොඩනැගිලි උසේන් 20% හෝ මහල් 12 යන දෙකෙන් අවම උසක් සහිත පොඩියම් (Podium) මහල් සඳහා 65% ගෙබිම් ආවරණ ප්‍රතිශතයක් ලබා දියහැක

**** අමතර සෑම උස මී 3ක් සඳහාම අවම ගෙබිම් ප්‍රමාණය ව. මීටර් 1 කින් වැඩිවිය යුතුය

සිතියම 7.2 යෝජිත සංවර්ධන කලාප සංගුණක සිතියම



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය 2021

7.4 සංවර්ධන ප්‍රදේශයට අදාළ පොදු නියමතා

යෝජිත කලාපීකරණ සැලැස්මේ එක් එක් කලාප සඳහා හඳුන්වාදී ඇති භාවිත සහ නියමතා වලට අමතරව එම සියළු කලාප සඳහා අදාළ වන පොදු නියමතා මෙම පරිච්ඡේදයෙන් විස්තර වේ. යෝජිත කලාපකරණ සැලැස්මේ සෑම කලාපයකම හඳුන්වා දී ඇති අවසර ලත් භාවිත සහ කලාපීකරණ නියමතා 8 වන පරිච්ඡේදයේ දක්වා ඇත.

7.4.1 වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ අංක 1000/3 හා 1989.11.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති මීගමුව මහා නගර සභා බල ප්‍රදේශයේ පරිපාලන සීමාවන් තුල පිහිටි සියලුම ප්‍රදේශයන් සඳහා මෙම නියමතා බල පැවැත්වේ.

7.4.2 කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී ඊට අදාලවන සැලසුම් හා සංවර්ධන නියමතා සඳහා මෙම කලාපීකරණ සැලැස්මේ නියමතාවන්ට අමතරව 2021 ජුලි මස 08 දිනැති හා අංක 2235/54 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති සැලසුම් හා සංවර්ධන රෙගුලාසි මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය සඳහා බලාත්මක වේ.

7.4.3 සංවර්ධන කටයුතු යටතේ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී එක් එක් භූමි ප්‍රමාණය තුල අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා සමීකරණයක් හඳුන්වාදී ඇති අතර, එය පරිච්ඡේද - 7 හි සැලසුම් හා ගොඩනැගිලි නියමතා තුල සඳහන් කර ඇත.සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදෙන මුළු ගෙබිම් ප්‍රමාණය තීරණය කිරීමේදී ගැටළු පැන නැගෙන අවස්ථාවල ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය ලබාදීම නාගරික සංවර්ධන අධිකාරිය සතුවේ. සංවර්ධන පාලිත කලාප සඳහා මෙම නියමතා ය අදාළ නොවේ. ස්ථානගත සුවිශේෂිතාව මත සංවර්ධනය පාලනය කිරීම සඳහා හදුනාගන්නා ලද විශේෂ නියමතා අදාළ වේ.

7.4.4 ජල මූලාශ්‍ර ආශ්‍රිතව සිදුකරනු ලබන සංවර්ධන කටයුතුවලදී අවට පරිසරය හා ගැළපෙන ලෙස ගොඩනැගිලි ඉදිකළ යුතුය. මෙහිදී ගොඩනැගිල්ලෙහි වර්ණය, ගොඩනැගිලි සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය (පරාවර්තනය නොවන අමුද්‍රව්‍ය) යොදා ගැනීමට කටයුතු කළ යුතුය. (ජල මූලාශ්‍ර ආශ්‍රිත සංවර්ධන කටයුතු වලදී නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණය ලබා ගත යුතුය)

7.4.5 ජලාභිමුඛ, වර්ග අඩි 4000 (වර්ග මීටර 371.612)ඉක්මවන නේවාසික නොවන ඉදිකිරීම් සඳහා අපජල කළමනාකරණ සැලැස්මක් ඉදිරිපත් කර, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුකූලව අපජල කළමනාකරණය කළ යුතුය. එසේම ඉදිරිපත් කරනු ලබන ගොඩනැගිලි සැලසුම්වලදී භූදර්ශන සැලැස්මක් සමඟ සැලසුම් ඉදිරිපත් කළ යුතුය.

7.4.6 මීගමුව සැලසුම් සීමාව තුල කලාප දෙකක් වෙන්වන මායිමක පිහිටි ඉඩම් කොටසක් සඳහා ඒ ඒ බිම් කට්ටිය අයිතිකරුගේ අභිමතය පරිදි යාබද කලාපයේ භාවිතය සහ එම කලාප සංගුණකය සඳහා අයදුම් කළ හැකි වේ. එය පළමු බිම් කට්ටිය හෝ පළමු බිම් කට්ටියේ ගැඹුර මීටර් 50 දක්වා සීමා විය යුතුය. (සංවර්ධන පාලිත කලාපවලට මෙය අදාළ නොවේ.

7.4.7 නව ආගමික ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී නියෝජනය විය යුතු ජන පිරිස තීරණය කිරීම අධිකාරිය සතුවන අතර, අදාළ ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අනුමැතිය සහ අදාළ ප්‍රාදේශීය ලේකම්තුමාගේ අනුමැතිය ලබාගත

යුතුය. එසේම, ආගමික ප්‍රදර්ශන පැවැත්වීම ප්‍රාදේශීය ලේකම්තුමාගේ අනුමැතියෙන් සිදු විය යුතුය. සැලසුම් බල ප්‍රදේශයේ මංසන්ධි මාර්ග දෙපස ගොඩනැගිලි සීමා හා රක්ෂිත තුල විවිධ ආගමික ප්‍රතිමා, කුරුස හා වෙනත් සලකුණු ඉදිකිරීම සඳහා අවසර දෙනු නොලැබේ. ආගමික ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී එවැනි ගොඩනැගිල්ලක භූමිභාගයේ සිට කිලෝ මීටර් 0.5 ක අරයකින් යුත් ප්‍රදේශයේ ජනතාවගෙන් සියයට හැට හයක් (66%) එම සංවර්ධන කාර්යයට විරුද්ධ නොවන බවට අදාල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මගින් ප්‍රදේශයේ ජනතාවගේ කැමැත්ත ලබාගෙන ප්‍රාදේශීය ලේකම් මගින් ඉදිරිපත් කල යුතුය.

7.4.8 ගොඩනැගිල්ලක් සඳහා අවශ්‍ය බලශක්ති සූර්ය කෝෂ, සුළං හා මුහුදු රළ හෝ වෙනත් පරිසර හිතකාමී බලශක්ති ක්‍රමවේද උපයෝගීකරගෙන සපයා ගන්නේ නම් එවැනි සංවර්ධන කටයුතු වලදී 5% අමතර ගෙබිම් ප්‍රමාණයක් ලබා දී සලක බලනු ලැබේ. අනුකූලතා සහතිකය ලබාදෙන අවස්ථාවේ මෙම කොන්දේසි ඉටු කර නොමැති නම් අතිරේකව ලබා දෙන වර්ග මීටර ප්‍රමාණය සදහා අනවසර ඉදි කිරීම වෙනුවෙන් අයකරන සේවා ගාස්තු මෙන් දෙගුණයක සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.

7.4.9 මෙම ප්‍රදේශ තුළ පිහිටි විශේෂ සංවර්ධන ව්‍යාපෘති සහ විශේෂ සංවර්ධන ප්‍රදේශ සඳහා එම ප්‍රදේශවලට සහ ව්‍යාපෘතිවලට හඳුන්වා දී ඇති නියමතා බලපැවැත්වේ.

7.4.10 මෙම සැලසුම් කලාප තුළ සංවර්ධන කටයුතු කිරීමේදී වෙනත් රජයේ ආයතන මගින් නිකුත් කරන ලද, නිකුත් කරනු ලබන අණපනත්, ගැසට් නිවේදන හා චක්‍රලේඛ තවදුරටත් බල පැවැත්වේ.

7.4.11 මෙම කලාපවල පළාත් පාලන ආයතනයන් , මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයන්ගේ ගොඩනැගිලි සිමාව තුල මායිම් තාප්ප ඉදිකිරීම සඳහා අවසර දෙනු නොලබන අතර, ප්‍රවේශ මාර්ග පුළුල් කිරීමට අවශ්‍ය අවම ඉඩකඩ තබා මායිම් තාප්ප වෙනුවට විනිවිද පෙනෙන දැල් වැටක් හෝ වෙනත් ක්‍රමවේදයක් අනුව ඉදිරිපත් කරන සැලසුම් සඳහා අනුමැතිය සලකා බලනු ලැබේ

7.4.12 යෝජිත කලාප සැලැස්ම තුල පවත්නා භාවිතයන් තවදුරටත් පවත්වාගෙන යාම සඳහා අවසරදීම සලකා බලනු ලැබේ. එසේ වුවද එම භාවිතයන් වෙනස්කිරීමක් හෝ පුළුල් කිරීමක් සිදුකරන්නේ නම් ඒ සඳහා අනුමැතිය නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයක් ලබා ගත යුතුය. එමෙන්ම කලාපයේ භාවිතයන් අතර නොගැලපෙන යම් භාවිතයක් හා මෙහි සදහන් භාවිතයන්ට අමතර භාවිතයන් සලකා බැලීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගැනීම මගින් සිදු කල යුතුය.

7.4.13 අධිකාරිය විසින් උචිත යැයි සලකනු ලබන අවස්ථාවකදී සංවර්ධන ප්‍රදේශ අඩංගු කිසියම් ප්‍රදේශයක් විශේෂ ව්‍යාපෘති ප්‍රදේශයක්, ප්‍රතිසංවර්ධන ප්‍රදේශයක්, විශේෂ නිවාස ව්‍යාපෘති ප්‍රදේශයක්, මධ්‍ය වාණිජ ප්‍රදේශයක්, දර්ශනීය ප්‍රදේශයක්, සංරක්ෂණ ප්‍රදේශයක්, සංස්කෘතික ප්‍රදේශයක් හෝ වෙනත් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ හැක.

7.4.14 ඉහත XVIII හි සඳහන් ප්‍රදේශ තුළ කිනම් හෝ විශේෂිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා බිම් ප්‍රදේශ භාවිතා කිරීම, සීමා කිරීම හෝ තහනම් කිරීම, මෙම පනත්වලින් පනවා ඇති තහනම් ලිහිල් කිරීම හෝ ප්‍රදේශ සඳහා නියම කර ඇති කර්තව්‍යයන් ඉටුකර ගැනීම සඳහා වෙනත් නීතිරීති පැනවීම හෝ අධිකාරිය විසින් සිදුකරනු ලැබිය හැකිය.

7.4.15 කලාපීය සැලැස්මේ පෙන්වා දී ඇති කලාප මායිම් භූගෝලීය ඛණ්ඩාංක (Google Earth) මගින් පෙන්වා දී ඇත.

7.4.16 තැබෑරුම් , සමාජ ශාලා , ආගන්තුක නිවාස සඳහා අවසර ලබාදීමට ආගමික ස්ථාන සහ පාසැල්වල සිට අවම වශයෙන් මීටර් 500 ක් දුර පැවතිය යුතුය.

7.4.17 පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (PORS) හෝ තෙත් බිම් කලාප සැලැස්ම තුල හඳුනාගෙන නොමැති පහත් බිම්, වගුරු බිම්, කුඹුරු හෝ ඕවිට හෝ වෙනත් එවැනි ඉඩම් සඳහා අවසර දීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නිරවුල් සහතිකයක් ලබාගත යුතුය.

7.4.18 පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (PORS) හඳුනාගෙන ඇති භූමි එම කටයුතු සඳහා පමණක් භාවිතා කළ යුතුය.

7.4.19 කිසියම් සංවර්ධන කටයුත්තක්, ඉදිකිරීමක් ආරම්භ කිරීමට පෙර පරිසර නිර්දේශ ලබාගත යුතු අවස්ථා;

7.4.19.1 වර්ග මීටර් 10,000 ට වැඩි ගොඩනැගිලි සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර උපදේශන කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීම.

7.4.19.2 ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය ව.මී. 10,000 ට අඩු ගොඩනැගිලිවල අපජල කළමනාකරණය සඳහා පොදු අපජල පිරිපහදු පද්ධති යෝජනා වන අවස්ථාවලදී.

7.4.19.3 පාරිසරික ආරක්ෂණ කලාප ලෙස ගැසට් කර ඇති ස්ථානවල එම ගැසට්පත්‍ර මගින් අවසර ලබාදී ඇති ක්‍රියාකාරකම් සඳහා.

7.4.19.4 මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජාතික පාරිසරික පනත යටතේ අංක 1533/16 හා 2008.01.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇති පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු නියමිත කර්මාන්ත පිහිටුවීමේදී “A” හා “B” වර්ගීකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබාගැනීම. එසේම “C” වර්ගීකරණයේ කර්මාන්ත සඳහා අදාළ පළාත් පාලන ආයතනයේ පරිසර කමිටුවෙන් හෝ මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබාගත යුතුය.

7.4.19.5 සුසාන භූමියක්, එහි ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී හෝ එවැනි ගොඩනැගිල්ලක් සංවර්ධනය කිරීමේදී සුසාන භූමි ආඥා පනතේ සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

7.4.19.6 පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව විසින් හඳුනාගෙන ඇති ස්ථානයන්හි සංවර්ධන කටයුතු සඳහා එම දෙපාර්තුමේන්තුවේ නිර්දේශය ලබා ගත යුතුය.

7.4.19.7 ප්‍රදේශයේ පවතින අනිකුත් සියලුම ඇල මාර්ග සහ ජල මාර්ග සඳහා 2010/07/14 අංක 1662/17 දරණ ගැසට් නිවේදනය ගැසට් නිවේදනයට අනුව රක්ෂිතයන් වෙන් කළ යුතුය.

7.4.20 තෙත්බිම් කලාප සඳහා වූ මාර්ගෝපදේශ

7.4.20.1 දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන්වල තීව්‍රතාවය වැඩිවීම හා තෙත් බිම්වල සිදු කර ඇති ගොඩ කිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්‍රතාවය සැළකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු පහත උපලේඛනයේ සඳහන් ආයතනවල සම්බන්ධීකරණය තුළින් ලබා ගන්නා තීරණ අනුව සිදු කළ යුතුය.

7.4.20.2 පහත් බිම් / පුරන් කුඹුරු සහ වගා කුඹුරු සංවර්ධනය කිරීමට පෙර උපලේඛනය 02 හි සඳහන් අංක. 01, 03,04, 06 හා 10 දරණ ආයතනවලින් අනුමැතිය ලබා ගත යුතුයි. එසේම විවිධ පනත් මඟින් තෙත් බිම්වල අයිතිය අදාළ

ආයතනවල විෂය පථයට අයත් වන අවස්ථාවලදී උපලේඛනය 02 හි සඳහන් ආයතනවලින් සහ අනෙකුත් අදාළ ආයතනවලින් අවශ්‍ය නිර්දේශය සහ අනුමැතිය ලබා ගත යුතුය

7.4.20.3 තෙත් බිම් ආශ්‍රිත පරිසරයට බලපෑම් ඇති විය හැකි ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා උපලේඛනය 02 හි සඳහන් අංක. 03 හා 06 දරණ ආයතනවලින් පරිසර නිරවුල් කිරීමේ සහතිකය හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු අතර නියමිත කාලය ඉක්මවීමට පෙර එකී බලපත්‍රය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය.

7.4.20.4 උපලේඛනය 02 හි සඳහන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් තෙත් බිමක් සංවර්ධන කාර්යයක් සඳහා ලබා දෙන නිර්දේශ/අනුමැතිය (අවසන් නිරවුල් සහතිකය) එම සැලසුම් කමිටු තීරණය පරිදි වාර්ෂිකව අලුත් කළ යුතුය.

7.4.20.5 වෙරළ කලාපය තුළ ඇති තෙත් බිම් ආශ්‍රිතව ඕනෑම සංවර්ධන කාර්යයක් සිදු කිරීමට පෙර උපලේඛනය 02 හි සඳහන් අංක. 05,12 දරණ ආයතනයෙන් නිර්දේශ/අනුමැතිය/බලපත්‍ර ලබා ගත යුතුය.

7.4.20.6 උපලේඛනය 02 හි සඳහන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට මඟින් අංක. 1662/ 17 හා 2010.07.14 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ඇල මාර්ග/ ජලාශ රක්ෂිත බිම් තීරු සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශ සඳහා අදාළ රක්ෂිත බිම් තීරු පවත්වා ගත යුතුය.

7.4.20.7 ජල බැස යාම් හා ගංවතුර රැඳවුම් ධාරිතාවයන්ට බාධා වන කිසිම ඉදිකිරීමක් තෙත් බිමක ජලාශ්‍රිතව හෝ ජල මාර්ගවල සිදු නොකළ යුතුය.නමුත් මහා සැලසුමකට (Master Plan) හෝ නිර්මාණ උපදේශක මාර්ගෝපදේශ සැලැස්මකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අනුමත කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ට හෝ ජල ගැලීම්වලට හා ගංවතුර ඉසිලුම් ධාරිතාවයන්ට බාධා නොවන ලෙස අනුමත ඉදිකිරීම් උපලේඛනය 02 හි සඳහන් අංක. 01 දරණ ආයතනයෙන් හා අංක. 02 සිට 22 දක්වා ඇති අදාළ ආයතනයන්වල නිර්දේශය හා අනුමැතියට යටත්ව සිදු කළ යුතුය.

7.4.20.8 පාරිසරික සංවේදී වටිනාකම සහිත තෙත් බිම්වල ආගන්තුක ආක්‍රමණශීලී ශාක හා සතුන් හැර වෙනත් වන ජීවීන් ඉවත් නොකළ යුතුය.

7.4.20.9 තෙත් බිම් කලාපවල අවසරලත් සෑම ඉදිකිරීමක්ම නියම කරන ලද ශිල්පීය ප්‍රමිතීන් සහිත හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිර්මාණය විය යුතුය

7.4.20.10 ජල රැඳවුම් ධාරිතාවය විශේෂයෙන් වැදගත් වන සෑම තෙත් බිමකම සිදු කරන අනුමත භාවිතයකදී ජල රැඳවුම් ධාරිතාව අඩුවීම සහ (අනෙකුත් බලපෑම් සිදුවන) පාරිසරික සේවාවන්ට සිදුවන බලපෑමට හිලව් වන සේ විකල්ප ස්ථාන සුදුසු ලෙස ස්ථාපනය කල යුතුය. ඒ සඳහා උපලේඛනය 02 හි සඳහන් අදාළ ආයතනවල අනුමැතිය ලබාගත යුතුය

7.4.20.11.මසුන් හෝ වෙනත් ජලජ ජීවීන් ඇල්ලීමේ ක්‍රියාවලියේදී යාන්ත්‍රික බෝට්ටු, ධීවර ආම්පන්න,ඉන්ධන හෝ වෙනත් යාත්‍රා භාවිතා නොකළ යුතුය. යාන්ත්‍රික බෝට්ටු සඳහා අවසර දී ඇති එකී ස්ථානවල ධීවර ආම්පන්න සහ ඉන්ධන සඳහා උපලේඛනය 02 හි සඳහන් අංක 03,05,06,12,21,22, ආයතනවල අනුමැතිය ලබාගත යුතුය.

7.4.20.12 තෙත්බිම් පිරවීම සඳහා නිර්දේශ වන උපලේඛනයේ අංක 01 හි සඳහන් ආයතනයට අයත් ප්‍රදේශවල තිරසාර වැසි ජල බැස යාමේ ක්‍රම භාවිතා කල යුතුයි. තෙත්බිම් පිරවීම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබා ගත යුතුය.

7.4.20.13 පැහැදිලිව හඳුනාගත හැකි භූ දර්ශන / සංස්කෘතික / පුරා විද්‍යාත්මක / ජෛව විවිධත්වය ඉහළ අගයන් ඇති ප්‍රදේශ සංරක්ෂණය කල යුතුය.

7.4.20.14 තෙත් බිම්වල අනුමත කාර්යයන්වලදී නීත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා සුදුසු ළඟම ස්ථානයක ස්ථාන ගත කල යුතුයි.

7.4.20.15 සංවර්ධනකරුවන් විසින් සැලසුම් සකස් කිරීම හා නිර්මාණ සහ අධීක්ෂණ කටයුතු කිරීම සඳහා වෘත්තීය සුදුසුකම්ලත් වෘත්තීයවේදීන්ගේ සේවය ලබා ගත යුතුය.

7.4.20.16 මසුන් සහ අනෙකුත් ජලජ ජීවීන් අභිජනනය වන සියලු ප්‍රදේශ විශේෂයෙන් ආරක්ෂා කල යුතුය.

7.4.20.17 තෙත් බිම්වලට කසළ බැහැර කිරීම සඳහා අවසර නොදිය යුතුය.(ගෘහස්ථ, ආයතනික, කාර්මික, වෙළඳ, විද්‍යුත්, සහ සායනික අපද්‍රව්‍ය)

7.4.20.18 තෙත්බිම්වලට අපජලය බැහැර නොකළ යුතුය. නමුත් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයට යටත්ව පිරිපහදු කළ ජලය පමණක් මුදාහැරිය හැකිය.

7.4.20.19 තෙත්බිම්හි ධීවර කටයුතු මිනිස් ශ්‍රමය භාවිතා කරන ඔරු,බෝට්ටු මඟින් පමණක් සිදු කල යුතුය.

- තෙත්බිම් කලාපයන් සම්බන්ධයෙන් සංවර්ධන කටයුතු සිදුකිරීමේදී උපලේඛනය 02 හි සදහන් ආයතනයන්හි බලපත්‍ර නිකුත් කිරීමේදී මෙම මාර්ගෝපදේශයන් එම බලපත්‍රයට කොන්දේසි ලෙස ඇතුලත් කල යුතු අතර එකී කොන්දේසි කඩකිරීම එකී බලපත්‍රය අවලංගු කිරීමට හෝ දඩුවම් නියම කිරීමට හේතුවනු ඇත .

08 වන පරිච්ඡේදය



කලාපීකරණ නියමතා

08 වන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

8.1. අඩු ඝණත්ව නීල හරිත සංචාරක කලාපය

මෙම කලාපය තුළ අඩු ඝනත්වයක් පවතින සංචාරක කටයුතු සඳහා දිරිගැන්වීමක් ලබා දෙමින් නීල හරිත සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂිතය

8.1.1. අඩු ඝණත්ව නීල හරිත සංචාරක කලාපය සඳහා වන කලාපීකරණ නියමතා සහ අනුමත භාවිතයන්

වගු අංක 8.1 සහ 8.2 මගින් මෙම කලාපයට අදාළ නියමතා සහ අනුමත භාවිතයන් විස්තර කරනු ලබයි.

වගුව අංක 8.1. අඩු ඝණත්ව නීල හරිත සංචාරක කලාපයෙහි කලාපීකරණ නියමතා

(ආ)	මායිම (භූ ඛණ්ඩාංක)	ඇමුණුම 22 - කලාප මායිම්, භූ ඛණ්ඩාංක හා සිතියම් අධ්‍යනය කරන්න
(ඇ)	කලාප සංගුණකය	1.5
(ඈ)	අනුමත උස සීමාව	කලාප සංගුණකය හා මාර්ගයේ පළල සාධක වනු ඇත. (උපලේඛනය 01 : වගු අංක 7.3 "ආ" පෝරමය - අනුකූල වියයුතුය)
(ඉ)	අනුමත බිම් කට්ටි ආවරණය	නේවාසික 50% , නේවාසික නොවන 65%
(ර්)	කලාපයට අදාළ පොදු නියමතා	▪ පෝරුතොට ප්‍රධාන මාර්ග සහ මුස්ලිම් පල්ලිය හ මුහුදු වෙරළ අතර ඉදිකරනු ලබන ගොඩනැගිලි වල බිම් මහල මුහුද දර්ශනය වන පරිදි ඉදිකළ යුතුය. ▪ නව ඉඩම් අනුබෙදුම් කිරීමේදී අවම බිම් ප්‍රමාණය පර්.10 විය යුතු අතර බිම් කැබලි ආවරණය 50% කි. (නේවාසික කටයුතු සඳහා) ▪ පෝරුතොට ප්‍රධාන මාර්ග සෙවනකල ආරුක්කු මාර්ගය දිරිගැන්වීම කරනු ලැබේ. ▪ වෙරළ පිටුපස ප්‍රදේශ සඳහා තැබිය යුතු රක්ෂිතයන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ අංක 2072/58 සහ 2008.05.25 දින දරණ ගැසට් නිවේදන පත්‍රයට හා එහි වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මට අනුගත විය යුතුය. ▪ මුහුදු වෙරළ මහජනයාට භාවිතා කල හැකි වන පරිදි විවෘතව තැබිය යුතුය. ▪ පෝරුතොට මාර්ගය,සාන්ත මේරි මාර්ගය,සිල්වාසැන්ඩි මාර්ගය , මාසලස් මාර්ගය ,මහා විද්‍යාල මාවත,සොයිසවත්ත මාර්ගය ,පල්ලිය මාර්ගය ,මඩම්පැල්ල මාර්ගය , වැලිහේන මාර්ගය,සාන්ත ආනා මාර්ගය යන මාර්ග දෙපස හරිත තිරයක් ව්‍යාප්ත කළ යුතුය. ▪ පවතින ගොඩනැගිලි සංචාරක කටයුතු සඳහා භාවිතය වෙනස් කරන්නේනම් භාවිතය වෙනස් කිරීමේ ගාස්තුවලින් නිදහස් කරනු ඇත. ▪ දුම්රිය මාර්ග රක්ෂිතය දුම්රිය මාර්ගයේ දෙපසටම ආසන්නතම පීල්ලේ සිට මීටර් 9 ක සීමාවක් තැබිය යුතුය. ▪ මහ ඔය සදහා ගං ඉවුරේ පවතින වෘක්ෂලතා තිරයේ සිට මීටර් 18 ක රක්ෂිතයක් තැබිය යුතුය ▪ හැමිල්ටන් ඇල සදහා ඇල ඉවුරේ සිට මීටර් 4.5 ක රක්ෂිතයක් තැබිය යුතුය.

වගුව අංක 8.2 අඩු ඝණත්ව නීල හරිත සංවාරක කලාපයෙහි හි අනුමත භාවිතන්

භාවිතය	අවම බිම් ප්‍රමාණය (පර්චස්)	වෙනත් කරුණු
නේවාසික		
නිවාස ඒකක	10	
නේවාසිකාගාර	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
නිවාස සංකීර්ණ (මහල් 4 වැඩි, තිරස් ඒකක)	30	
නිල නිවාස / සේවක නිවාස	10	
ළමා සුරැකුම් මධ්‍යස්ථාන	20	
ළමා නිවාස	20	
වැඩිහිටි නිවාස	40	
අබාධිත නිවාස	40	
සෞඛ්‍ය		
වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන	20	
ළමා හා මාතෘ සායනය	20	
සත්ත්ව සායන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	10	
අධ්‍යාපනික		
පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ප්‍රාථමික අධ්‍යාපන මධ්‍යස්ථාන	40	
කාර්මික පාසැල්/වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන	40	
ද්විතීක අධයාපන මධ්‍යස්ථාන	40	
පෞද්ගලික උපකාර පන්ති	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
කලායතන/රංගායතන	10	
පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන	10	
ආයතනික		
වෘත්තීය කාර්යාල	10	
කාර්යාල	10	
බැංකු, රක්ෂණ හා මූල්‍ය ආයතන	10	
කාර්යාල සංකීර්ණ	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
සමාජසේවා හා පොදු පහසුකම්		

ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	10	
සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	40	
පුස්තකාල	10	
පුනරුත්ථාපන මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
වාණිජ		
වෙළඳසැල්	10	
තොග ගබඩා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
සුපිරි වෙළඳසැල්	40	
සාප්පු සංකීර්ණ	20	
බෝජනාගාර	10	
විවෘත වෙළඳසැල්	20	
ඔසුසැල්	10	
රසායනාගාර සේවා සහ එකතු කිරීමේ මධ්‍යස්ථාන	10	
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	10	
ප්‍රදර්ශණාගාර	10	
මස් සහ මාළු අලෙවි සැල්	10	
මත්පැන් අලෙවිසැල්	10	
ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැල්	10	
ඉන්ධන පිරවුම් හල් (ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.මුහුණත පළල අඩි100 ක් විය යුතුයි. .
ඉන්ධන පිරවුම්හල් හා වාහන සේවා මධ්‍යස්ථාන (ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	30	
අවමංගල්‍ය ශාලා	30	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
විදුලි ආරෝපණ මධ්‍යස්ථාන	10	
ගොඩනැගිලි මත සන්නිවේදන කුළුණු	10	
සන්නිවේදන කුළුණු	10	
බහු මහල් රථගාල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
විවෘත රථගාල්	20	

රථ වාහන ප්‍රදර්ශනා ගාර	20	
ලොන්ඩරි/ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථාන/ඇඹරුම්හල්	10	
ඉන්ධන පිරවුම් හල් හා වෙලඳ සංකීර්ණ (ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය. මුහුණත පළල අඩි100 ක් විය යුතුයි.
ගෑස් පිරවුල්හල් හා විදුලි ආරෝපන මධ්‍යස්ථාන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
සංචාරක		
නිවාඩු නිකේතන	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ආගන්තුක නිවාස	10	
ලැගුම්හල්	10	
සංචාරක හෝටල්	20	
නාගරික හෝටල්	20	
සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	10	
ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
කබානා හෝටල්	10	
මංගල උත්සව ශාලා	40	
නිෂ්පාදන කර්මාන්ත		
ගෘහස්ථ කර්මාන්ත	10	
කුඩා හා මධ්‍යම පරිමාණයේ දූෂ්‍යකාරක නොවන කර්මාන්ත	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන	40	
ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරන කර්මාන්ත	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
මාළු සැකසීම	40	
සේවා කර්මාන්ත		
ගෘහස්ථ කර්මාන්ත	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
වාහන සේවා මධ්‍යස්ථාන	20	
වාහන අලුත්වැඩියා මධ්‍යස්ථාන	20	
කුලී රථ සේවා මධ්‍යස්ථාන	10	
ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන	10	
ලියවන පට්ටල්, වෑල්ඩින් වැඩපොලවල්	20	

පොදු විවෘත අවකාශ සහ විනෝද කටයුතු පහසුකම්		
ඉතා කුඩා උද්‍යාන (Pocket Park)		ව්‍යාපෘතියට අදාළව තීරණය කරනු ලැබේ
කුඩා උද්‍යාන (Mini Park)		
ප්‍රාදේශීය උද්‍යාන (Local Park)	පර්චස් 80	
ප්‍රජා උද්‍යාන (Community Park)		
නගර උද්‍යාන (Town Park)		
රේඛීය උද්‍යාන (Linear Park)		ව්‍යාපෘතියට අදාළව තීරණය කරනු ලැබේ
මධ්‍ය නාගරික උද්‍යාන (Central Urban Park)		
නගර උද්‍යාන (City Park)		
ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථාන	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
වෙරළ උද්‍යාන (Beach Park)		
සිනමා ශාලා	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
සමාජ ශාලා	පර්චස් 20	
කලාගාර / කෞතුකාගාර	පර්චස් 20	
එළිමහන් රංග ශාලා	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
බෝට්ටු ජැටි /පාරු නවාතැන්		ව්‍යාපෘතියට අදාළව තීරණය කරනු ලැබේ
නැංගුරම් තොටුපොළවල්		
මාදැල් වරාය		
ධීවර තොටුපොළවල්		

8.2 අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය

මෙම කලාපය මීගමුව සංචාරක පුරවය ලෙස හදුනාගත හැක. ඒ අනුව මෙම ප්‍රදේශය තුළ අධි ඝනත්වයක් සහිත සංචාරක ව්‍යාපාරයට අදාලවූ සිරස් සංවර්ධනයක් අපේක්ෂා කෙරේ

8.2.1. අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය සඳහා වන කලාපීකරණ නියමතා සහ අනුමත භාවිතයන්

වගු අංක 8.3 සහ 8.4 මගින් මෙම කලාපයට අදාළ නියමතා සහ අනුමත භාවිතයන් විස්තර කරනු ලබයි.

වගුව අංක 8. 3 අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපයෙහි කලාපීකරණ නියමතා

(ආ)	මායිම (භූ ඛන්ඩාංක)	ඇමුණුම 22 - කලාප මායිම්, භූ ඛණ්ඩාංක හා සිතියම් අධ්‍යනය කරන්න
(ඇ)	කලාප සංගුණකය	2.5
(ඈ)	අනුමත උස සීමාව	කලාප සංගුණකය හා මාර්ගයේ පළල සාධක වනු ඇත. (උපලේඛනය 01 : වගු අංක 7.3 "ආ" පෝරමය - අනුකූල වියයුතුය)
(ඉ)	අනුමත බිම් කට්ටි ආවරණය	නේවාසික 65% නේවාසික නොවන 50%
(ඊ)	කලාපයට අදාළ පොදු නියමතා	▪ පෝරුතොට ප්‍රධාන මාර්ග සහ මුස්ලිම් පල්ලිය හ මුහුදු වෙරළ අතර ඉදිකරනු ලබන ගොඩනැගිලි වල බිම් මහල මුහුද දර්ශනය වන පරිදි ඉදිකළ යුතුය. ▪ නව ඉඩම් අනුබෙදුම් කිරීමේදී අවම බිම් ප්‍රමාණය පර්.15 විය යුතු අතර බිම් කැබලි ආවරණය 65 % කි. (නේවාසික කටයුතු සඳහා) ▪ පෝරුතොට ප්‍රධාන මාර්ග සෙවනකල ආරුක්කු මාර්ගය දිව්ගැන්වීම කරනු ලැබේ. ▪ වෙරළ පිටුපස ප්‍රදේශ සඳහා තැබිය යුතු රක්ෂිතයන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ අංක 2072/58 සහ 2008.05.25 දින දරණ ගැසට් නිවේදන පත්‍රයට හා එහි වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මට අනුගත විය යුතුය. ▪ මුහුදු වෙරල මහජනයාට භාවිතා කල හැකි වන පරිදි විවෘතව තැබිය යුතු අතර තම ඉඩමේ මායිම තෙක් ආරක්ෂිත වැටක් ඉදිකළ හැකිය. ▪ පෝරුතොට මාර්ගය දෙපස හරිත තිරයක් ව්‍යාප්ත කළ යුතුය. ▪ පවතින නේවාසික ගොඩනැගිලි සංචාරක කටයුතු සඳහා භාවිතය වෙනස් කරන්නේනම් භාවිතය වෙනස් කිරීමේ ගාස්තුවලින් නිදහස් කරනු ඇත.. ▪ විශේෂ ව්‍යාපෘති ලෙස ඉදිරිපත් කරනු ලබන සංවර්ධන යෝජනා වල 50% සංචාරක කටයුතු වලට අදාල විය යුතු අතර ඉතිරි ප්‍රමාණය සංචාරක කටයුතු ආශ්‍රිත මහල් නිවාස සඳහා යොදා ගත හැක. ▪ දුම්රිය මාර්ග රක්ෂිතය දුම්රිය මාර්ගයේ දෙපසටම ආසන්නතම පීල්ලේ සිට මීටර් 9 ක සීමාවක් තැබිය යුතුය. ▪ මහ ඔය සඳහා ගං ඉවුරේ පවතින වෘක්ෂලතා තිරයේ සිට මීටර් 18 ක රක්ෂිතයක් තැබිය යුතුය. ▪ හැමිල්ටන් ඇල සඳහා ඇල ඉවුරේ සිට මීටර් 4.5 ක රක්ෂිතයක් තැබිය යුතුය.

වගුව අංක 8.4 අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපයෙහි අනුමත භාවිතයන්

භාවිතය	අවම බිම් ප්‍රමාණය (පර්චස්)	වෙනත් කරුණු
නේවාසික		
නිවාස ඒකක	15	
නිවාස සංකීර්ණ	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09ක් විය යුතුය.
නේවාසිකාගාර	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
නිල නිවාස / සේවක නිවාස	15	
සෞඛ්‍ය		
වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන	20	
ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	15	
අධ්‍යාපනික		
තෘතීයික අධ්‍යාපන මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09ක් විය යුතුය.
පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන	40	
කාර්මික පාසැල්/වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ආයතනික		
බැංකු, රක්ෂණ හා මූල්‍ය ආයතන	15	
ස්වයංක්‍රීය මුදල් ගනුදෙනු මධ්‍යස්ථාන	-	
කාර්යාල	10	
සමාජ සේවා හා පොදු පහසුකම්		
සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
පුස්තකාල	15	
වාණිජ		
වෙළඳසැල්	15	
සුපිරි වෙළඳසැල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
සාප්පු සංකීර්ණ	20	
භෝජනාගාර	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
විවෘත වෙළඳසැල්	15	
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	15	
ඔසුසැල්	15	
මත්පැන් අලෙවිසැල්	15	
මස් මාළු අලෙවිසැල්	15	
වාහන සේවා මධ්‍යස්ථාන සහිත ඉන්ධන පිරවුම්හල් (ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	
වාණිජ සංකීර්ණ සහිත ඉන්ධන පිරවුම්හල් (ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	
ගෑස් පොළ සහ විදුලි ආරෝපණ මධ්‍යස්ථාන	20	
ගොඩනැගිලි මත සන්නිවේදන කුළුණු	15	
සන්නිවේදන කුළුණු	15	

බහු මහල් රථගාල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
විවෘත රථගාල්	20	
වාහන ප්‍රදර්ශනාගාර	20	
සංචාරක		
නිවාඩු නිකේතන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ආගන්තුක නිවාස	15	
ලැගුම්හල්	15	
සංචාරක හෝටල්	20	
නාගරික හෝටල්	15	
සම්භාහන මධ්‍යස්ථාන	20	
සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	15	
ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
කබානා හෝටල්	30	
නිෂ්පාදන කර්මාන්ත		
ගෘහස්ථ කර්මාන්ත	15	
සේවා කර්මාන්ත		
වාහන සේවා මධ්‍යස්ථාන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
කුලී රථ සේවා මධ්‍යස්ථාන	15	
ලොන්ඩරි/ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථාන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන	15	
පොදු විවෘත අවකාශ සහ විනෝද කටයුතු පහසුකම්		
ඉතා කුඩා උද්‍යාන (Pocket Park)		වයාපෘතියට අදාළව තීරණය කරනු ලැබේ
කුඩා උද්‍යාන (Mini Park)		
ප්‍රාදේශීය උද්‍යාන (Local Park)	පර්චස් 80	
ප්‍රජා උද්‍යාන (Community Park)		
නගර උද්‍යාන (Town Park)		
මධ්‍ය නාගරික උද්‍යාන(Central Urban Park)		
රේඛීය උද්‍යාන (Linear Park)		වයාපෘතියට අදාළව තීරණය කරනු ලැබේ
වෙරළ උද්‍යාන(Beach Park)		
ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
සිනමා ශාලා	40	
සමාජ ශාලා	20	
කලාගාර / කෞතුකාගාර	20	
එළිමහන් රංග ශාලා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
බෝට්ටු ජැටි /පාරු නවාතැන්		වයාපෘතියට අදාළව තීරණය කරනු ලැබේ
මාදැල් වරාය		
ධීවර තොටුපොළවල්		

8.3 අධි ඝනත්ව විශේෂ වාණිජ කලාපය

මෙම කලාපය හරිත ආවරණය සහිත අධි ඝනත්වයකින් යුත් නාගරික පරිසරයක් ගොඩනැගීම අපේක්ෂා කෙරේ.මෙම කලාපය තුල 80% ක බිම් ආවරණය අනුපාතයක් ලබාදී අධි ඝනත්වයෙන් යුතු වාණිජ හා ඒ ආශ්‍රිත කටයුතු දිරිගන්වන අතර, මෙම කලාපය තුල දැනට පවතින වෘක්ෂලතා හා හරිත ආවරණය ආරක්ෂා වන පරිදි සංවර්ධන කටයුතු සිදු කිරීම කළ යුතුය.මෙම කලාපය තුළ වාණිජ කටයුතු වැඩි වශයෙන් දිරිගැන්වීමට සැලසුම් කෙරේ. ඒ ඔස්සේ නව රැකියා අවස්ථාවන් බහුල වීමත්, පවතින භූමියෙන් ඉහළම ප්‍රතිලාභයක් ලගාකරගැනීමට අපේක්ෂා කෙරේ.

8.3.1 අධි ඝනත්ව විශේෂ වාණිජ කලාපයෙහි කලාපීකරණ නියමතා හා අනුමත භාවිතයන්

වගු අංක 8.5 සහ 8.6 මගින් මෙම කලාපයට අදාළ නියමතා සහ අනුමත භාවිතයන් විස්තර කරනු ලබයි.

වගුව අංක 8.5 අධි ඝනත්ව විශේෂ වාණිජ කලාපයෙහි කලාපීකරණ නියමතා

(ආ)	මායිම (භූ ඛන්ඩාංක)	ඇමුණුම 22 - කලාප මායිම්, භූ ඛණ්ඩාංක හා සිතියම් අධ්‍යනය කරන්න
(ඇ)	කලාප සංගුණකය	2.3
(ඈ)	අනුමත උස සීමාව	කලාප සංගුණකය හා මාර්ගයේ පළල සාධක වනු ඇත. (උපලේඛනය 01 : වගු අංක 7.3 "ආ" පෝරමය - අනුකූල වියයුතුය)
(ඉ)	අනුමත බිම් කට්ටි ආවරණය	නේවාසික 80%, නේවාසික නොවන65%
(ඊ)	කලාපයට අදාළ පොදු නියමතා	▪ හරිත ගොඩනැගිලි ඉදිකිරීම දිරිගැන්වීම අරමුණු කරමින් අමතර 10% ගෙබිම් අනුපාතයක් ලබා දෙනු ලැබේ. ▪ නව ඉඩම් අනුබෙදුම් කිරීමේදී අවම බිම් ප්‍රමාණය පර්.10 විය යුතුය. ▪ ස්වභාවික බල ශක්ති ප්‍රභවයන් එනම් සූර්යබල ශක්ති ,සුළං හා මුහුදු රළ උපයෝගී කර ගන්නා සංවර්ධන කටයුතු දිරිගැන්වීම සිදුකරනු ලැබේ ▪ දුම්රිය මාර්ග රක්ෂිතය දුම්රිය මාර්ගයේ දෙපසටම ආසන්නතම පීල්ලේ සිට මීටර් 9 ක සීමාවක් තැබිය යුතුය. ▪ හැමිල්ටන් ඇල සඳහා ඇල ඉවුරේ සිට මීටර් 4.5 ක රක්ෂිතයක් තැබිය යුතුය. ▪ මීගමු කලපුව සඳහා මීටර් 10 ක රක්ෂිතයක් වෙන් කල යුතුය..

වගුව අංක 8.6 අධි ඝනත්ව විශේෂ වාණිජ කලාපයෙහි අනුමත භාවිතයන්

භාවිතය	අවම බිම් ප්‍රමාණය (පර්චස්)	වෙනත් කරුණු
නේවාසික		
නිවාස ඒකක	10	
නිවාස සංකීර්ණ	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
නේවාසිකාගාර	10	
නිල නිවාස / සේවක නිවාස	10	
වැඩිහිටි/ ආබාධිත නිවාස	20	
ළමා සුරැකුම් මධ්‍යස්ථාන	20	
ළමා නිවාස	20	
සෞඛ්‍ය		
රෝහල්	160	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.

වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය යුතුය.
වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන	20	
ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන	20	
සත්ත්ව රෝහල්	20	
සත්ත්ව සායන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන	20	
ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	10	
අධ්‍යාපන		
පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ප්‍රාථමික අධ්‍යාපන මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09ක් විය යුතුය.
ද්වීතියික අධ්‍යාපන මධ්‍යස්ථාන	40	
තෘතීයික අධ්‍යාපන මධ්‍යස්ථාන	40	
කාර්මික පාසැල්/වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
පෞද්ගලික උපකාර පන්ති	20	
කලායතන/රංගායතන	10	
පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන	20	
ආයතනික		
කාර්යාල	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
බැංකු, රක්ෂණ හා මූල්‍ය ආයතන	10	
වෘත්තීය ආයතන	10	
ස්වයංක්‍රීය මුදල් ගනුදෙනු මධ්‍යස්ථාන	10	
කාර්යාල සංකීර්ණය	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
සමාජ සේවා හා පොදු පහසුකම්		
සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	10	
ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
ආගමික මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
පුස්තකාල	10	

වාණිජ		
වෙළඳසැල්	10	
මස් මාළු වෙළඳසැල්	10	
සුපිරි වෙළඳසැල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
ඉන්ධන පිරවුම්හල් (ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ඉන්ධන පිරවුම් හල් සහ වෙළඳ සංකීර්ණය (ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	
ඉන්ධන පිරවුම් හල් සහ වාහන සේවා මධ්‍යස්ථාන (ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	
සාප්පු සංකීර්ණ	20	
භෝජනාගාර	20	
විවෘත වෙළඳසැල්	10	
ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැල්	10	
ඔසුසැල්	10	
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	10	
තොග භාණ්ඩ මධ්‍යස්ථාන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
මත්පැන් අලෙවිසැල්	10	
ගෑස් පිරවුම්හල් හා විදුලි ආරෝපණ මධ්‍යස්ථාන	20	
ගොඩනැගිලි මත සන්නිවේදන කුළුණු	10	
සන්නිවේදන කුළුණු	10	
අවමංගල්‍ය ශාලා	10	
බහු මහල් රථගාල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
විවෘත රථගාල්	20	
රථ වාහන ප්‍රදර්ශනාගාර	10	

සංචාරක		
නිවාඩු නිකේතන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06කේ විය යුතුය.
ආගන්තුක නිවාස	20	
ලැගුම්හල්	40	
නාගරික හෝටල්	10	
සංචාරක හෝටල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	10	
ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 20 ක් විය යුතුය.
කබානා හෝටල්	40	
මංගල උත්සව ශාලා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
නිෂ්පාදන කර්මාන්ත		
ගෘහස්ථ කර්මාන්ත	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ස්වභාවික කෙඳි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත	40	
ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත	40	
මාළු සැකසීම	40	
සේවා කර්මාන්ත		
වාහන සේවා මධ්‍යස්ථාන	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
වාහන අලුත් වැඩියා මධ්‍යස්ථාන / විසිරි පින්තාරු සිදුකරන මධ්‍යස්ථාන	20	
කුලී රථ සේවා මධ්‍යස්ථාන	10	
ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන	10	
ලියනවන පට්ටල්, වෑල්ඩින් වැඩ පොලවල්	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
තෙල් පිරිපහදු හා ඛනිජ තෙල් ආශ්‍රිත රසායනික ද්‍රව්‍ය සහ ආසවන කර්මාන්ත	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
රසායන ද්‍රව්‍ය, පොලිතීන්, ප්ලාස්ටික්, රබර් සහ වීදුරු ආශ්‍රිත කර්මාන්ත	40	.
සිමෙන්ති, කොන්ක්‍රීට් සහ පිඟාන් මැටි ආශ්‍රිත නිෂ්පාදන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත	20	
රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාකාරකම් ආශ්‍රිත කර්මාන්ත	40	.

බර යන්ත්‍රෝපකරණ සහ එකලස් කිරීමේ කර්මාන්ත	80	
විදුලි සහ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
කඩදාසි නිෂ්පාදන සහ මුද්‍රණ කටයුතු ආශ්‍රිත කර්මාන්ත	40	
දැව /දැව භාණ්ඩ සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත	20	
ආහාර සහ මධ්‍යසාර රහිත පාන කර්මාන්ත	20	
මධ්‍යසාර /දේශීය ඖෂධ ස්ප්‍රීතු සහ සාරයන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත	20	
කර්මාන්ත ආශ්‍රිත යටිතල පහසුකම් සම්පාදිත මධ්‍යස්ථාන	20	
ගෘහස්ථ කර්මාන්ත	10	
ඇඹරුම්හල්	10	
ලොන්ඩරි/ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථාන	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
පොදු විවෘත අවකාශ සහ විනෝද කටයුතු පහසුකම්		
ඉතා කුඩා උද්‍යාන (Pocket Park)		වයාපෘතියට අදාළව තීරණය කරනු ලැබේ
කුඩා උද්‍යාන (Mini Park)		
ප්‍රාදේශීය උද්‍යාන (Local Park)	80	
ප්‍රජා උද්‍යාන (Community Park)		
නගර උද්‍යාන (Town Park)		
රේඛීය උද්‍යාන (Linear Park)		
ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
සිනමා ශාලා	40	
ඉදිකිරීම් සහිත සත්ත්ව/ වගා	40	
ධීවර කර්මාන්තය		
බෝට්ටු ජැටි /පාරු නවාතැන්		වයාපෘතියට අදාළව තීරණය කරනු ලැබේ
මාදැල් වරාය		
ධීවර තොටුපොළවල්		
ශීතාගාර	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය

8.4 අඩු ඝණත්වයෙන් යුතු උරුමයන් සහිත සංචාරක කලාප

පැරණී ඕලන්ද කොටුව හා ඕලන්ද දේවස්ථාන කේන්ද්‍රකර ගනිමින් සංචාරක කටයුතු ප්‍රවර්ධනය කරමින් හා සංචාරක උරුමයන් ආරක්ෂා කරගනිමින් අඩු ඝනත්වයෙන් යුතු කලාපයක් බවට පත් කිරීම.

8.4.1. අඩු ඝණත්වයෙන් යුතු උරුමයන් සහිත සංචාරක කලාපයෙහි කලාපීකරණ නියමතා සහ අනුමත භාවිතයන්

වගු අංක 8.7 සහ 8.8 මගින් මෙම කලාපයට අදාළ නියමතා සහ අනුමත භාවිතයන් විස්තර කරනු ලබයි.

වගුව අංක 8.7. අඩු ඝණත්වයෙන් යුතු උරුමයන් සහිත සංචාරක කලාපයෙහි කලාපීකරණ නියමතා

(ආ)	මායිම (භූ ඛන්ඩාංක)	ඇමුණුම 22 - කලාප මායිම්, භූ ඛණ්ඩාංක හා සිතියම් අධ්‍යනය කරන්න
(ඇ)	කලාප සංගුණකය	0.5
(ඈ)	අනුමත උස සීමාව	කලාප සංගුණකය හා මාර්ගයේ පළල සාධක වනු ඇත. (උපලේඛනය 01 : වගු අංක 7.3 "ආ" පෝරමය - අනුකූල වියයුතුය)
(ඉ)	අනුමත බිම් කට්ටි ආවරණය	50 %
(ඊ)	කලාපයට අදාළ පොදු නියමතා	▪ ඉඩම් අනුබෙදුම් කිරීමේදී අවම බිම් ප්‍රමාණය පර්.15 විය යුතු අතර බිම් කැබලි ආවරණය 50% කි. (නේවාසික කටයුතු සඳහා) ▪ පුරා විද්‍යාත්මක වටිනාකමින් යුත් ගොඩනැගිලි සංරක්ෂණය කරමින් ඒ තුලින් ආර්ථික ප්‍රතිලාභයක් ලබාගැනීමට හැකිවන පරිදි සංවර්ධනය කිරීම. ▪ නගරය තුල පොදු විවේක හා විනෝද කටයුතු සඳහා පවතින පහසුකම් පුළුල් කිරීම ▪ පෞරාණික වටිනාකමින් යුත් පැරණි නේවාසික ගොඩනැගිලි සංචාරක ව්‍යාපාර සඳහා භාවිතය වෙනස් කරන්නේනම් භාවිතය වෙනස් කිරීමේ ගාස්තුවලින් නිදහස් කරනු ඇත. ▪ වෙරළ පිටුපස ප්‍රදේශ සඳහා තැබිය යුතු රක්ෂිතයන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ අංක 2072/58 සහ 2008.05.25 දින දරණ ගැසට් නිවේදන පත්‍රයට හා එහි වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මට අනුගත විය යුතුය. ▪ මීගමු කලපුව සඳහා මීටර් 10 ක රක්ෂිතයක් වෙන් කල යුතුය.

වගුව අංක 8.8. අඩු ඝණත්වයෙන් යුතු උරුමයන් සහිත සංචාරක කලාපයෙහි අනුමත භාවිතයන්

භාවිතය	අවම බිම් ප්‍රමාණය (පර්චස්)	වෙනත් කරුණු
නේවාසික		
නිවාස ඒකක	15	
සමාජ සේවා හා පොදු පහසුකම්		
කලායතන/රංගායතන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ස්වයංක්‍රීය මුදල් ගනුදෙනු මධ්‍යස්ථාන	15	
සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	15	
පුස්තකාල	20	

වාණිජ		
සුපිරි වෙළඳසැල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
සාප්පු සංකීර්ණ	40	
බෝජනාගාර	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
විවෘත වෙළඳසැල්	15	
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	15	
විදුලි ආරෝපණ මධ්‍යස්ථාන	15	
ගොඩනැගිලි මත සන්නිවේදන කුළුණු	15	
සන්නිවේදන කුළුණු	15	
බහු මහල් රථගාල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
විවෘත රථගාල්	20	
සංචාරක		
ලැගුම්හල්	15	
නාගරික හෝටල්	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	15	
ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ඔපෙරා රඟහල්	40	
නිෂ්පාදන කර්මාන්ත		
ගෘහස්ථ කර්මාන්ත	15	
සේවා කර්මාන්ත		
ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන	15	
පෙදු විවෘත අවකාශ සහ විනෝද කටයුතු පහසුකම්		
ඉතා කුඩා උද්‍යාන (Pocket Park)		
කුඩා උද්‍යාන (Mini Park)		
ප්‍රජා උද්‍යාන (Community Park)		
නගර උද්‍යාන (Town Park)		
ප්‍රාදේශීය උද්‍යාන (Regional Park)	160	
රේඛීය උද්‍යාන (Linear Park)		
සිනමා ශාලා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
සමාජ ශාලා	15	
කලාගාර / කෞතුකාගාර	15	
එළිමහන් රංග ශාලා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
ධීවර කර්මාන්තය		
බෝට්ටු ජැටි /පාරු නවාතැන්		
මාදැල් වරාය		ව්‍යාපෘතියට අදාළව තීරණය කරනු ලැබේ
ධීවර තොටුපොළවල්		

8.5 අධි ඝණත්ව ධීවර නේවාසික කලාපය

අධි ඝනත්වයෙන් යුතු ධීවර කටයුතු සමග සම්බන්ධවූ ධීවර කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

8.5.1 අධි ඝණත්ව ධීවර නේවාසික කලාපයෙහි කලාපීකරණ නියමතා හා අනුමත භාවිතයන්

වගු අංක 8.9 සහ 8.10 මගින් මෙම කලාපයට අදාළ නියමතා සහ අනුමත භාවිතයන් විස්තර කරනු ලබයි.

වගුව අංක 8.9 අධි ඝණත්ව ධීවර නේවාසික කලාපයෙහි කලාපීකරණ නියමතා

(ආ)	මායිම (භූ ඛන්ඩාංක)	ඇමුණුම 22 - කලාප මායිම්, භූ ඛණ්ඩාංක හා සිතියම් අධ්‍යනය කරන්න
(ඇ)	කලාප සංගුණකය	1.7
(ඈ)	අනුමත උස සීමාව	කලාප සංගුණකය හා මාර්ගයේ පළල සාධක වනු ඇත. (උපලේඛනය 01 : වගු අංක 7.3 "ආ" පෝරමය - අනුකූල වියයුතුය)
(ඉ)	අනුමත බිම් කවරේ ආවරණය	80 %
(ඊ)	කලාපයට අදාළ පොදු නියමතා	▪ මෙම කලාපය තුළ ඉදිකිරීම් සඳහා බිම් කොටසක අවම පර්චස් ප්‍රමාණය පිළිබද අවධානය යොමු නොකෙරේ. ▪ සියලු ප්‍රවේශ මාර්ගවල අවම පළල මීටර් 3ක් වියයුතු අතර ඉන් ඉඩම් කට්ටි සීමාවකින් තොරව ප්‍රවේශකත්වය ලබාගත හැකිය. ▪ සනීපාරක්ෂක පහසුකම් ආශ්‍රිත ඉදිකිරීම් සිදු කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරිය හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ නිර්දේශයට යටත් විය යුතුය. ▪ වෙරළ හා කලපුවට යාබද බිම් තීරුවල පුතික ටැංකි ඉදිකිරීමේදී ජල මුද්‍රිත වැසිකිළි මහජන සෞඛ්‍යය නිර්දේශය මත ඉදිකිරීම් සිදුකළ යුතුය. ▪ මීගමුව කලපුව සඳහා මී.10 ක රක්ෂිතයක් තැබිය යුතුය.

වගුව අංක 8.10 හි අධි ඝණත්ව ධීවර නේවාසික කලාපයෙහි අනුමත භාවිතයන්

භාවිතය	අවම බිම් ප්‍රමාණය (පර්චස්)	වෙනත් කරුණු
නේවාසික		
නිවාස ඒකක	15	
සමාජ සේවා හා පොදු පහසුකම්		
කලායතන/රංගායතන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ස්වයංක්‍රීය මුදල් ගනුදෙනු මධ්‍යස්ථාන	15	
සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	15	
පුස්තකාල	20	
වාණිජ		
සුපිරි වෙළඳසැල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
සාප්පු සංකීර්ණ	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
බෝජනාගාර	15	
විවෘත වෙළඳසැල්	15	
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	15	

විදුලි ආරෝපණ මධ්‍යස්ථාන	15	
ගොඩනැගිලි මත සන්නිවේදන කුළුණු	15	
සන්නිවේදන කුළුණු	15	
බහු මහල් රථගාල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
විවෘත රථගාල්	20	
සංචාරක		
ලැගුම්හල්	15	
නාගරික හෝටල්	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	15	
ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ඔපෙරා රඟහල්	40	
නිෂ්පාදන කර්මාන්ත		
ගෘහස්ථ කර්මාන්ත	15	
සේවා කර්මාන්ත		
ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන	15	
පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම්		
ඉතා කුඩා උද්‍යාන (Pocket Park)		
කුඩා උද්‍යාන (Mini Park)		
ප්‍රාදේශීය උද්‍යාන (Local Park)	160	
ප්‍රජා උද්‍යාන (Community Park)		
නගර උද්‍යාන (Town Park)		
රේඛීය උද්‍යාන (Linear Park)		
සිනමා ශාලා	40	
සමාජ ශාලා	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
කලාගාර / කෞතුකාගාර	15	
එළිමහන් රංග ශාලා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
ධීවර කර්මාන්තය		
බෝට්ටු ජැටි /පාරු නවාතැන්		
මාදැල් වරාය		
ධීවර තොටුපොළවල්		

8.6 අර්ධ ඝනත්වයෙන් යුතු නීල සංචාරක කලාපය

ජලය මූලික කරගත් පරිසරයක් තුල විවේක හා විනෝද කටයුතු හා ඒකාබද්ධවූ සංචාරක කලාපයක් බවට පත් කිරීම.

8.6.1 අර්ධ ඝනත්වයෙන් යුතු නීල සංචාරක කලාපයෙහි කලාපීකරණ නියමතා

වගු අංක 8.11 සහ 8.12 මගින් මෙම කලාපයට අදාළ නියමතා සහ අනුමත භාවිතයන් විස්තර කරනු ලබයි.

වගුව අංක 8.11 අර්ධ ඝනත්වයෙන් යුතු නීල සංචාරක කලාපයෙහි කලාපීකරණ නියමතා

(ආ)	මායිම (භූ ඛන්ඩාංක)	ඇමුණුම 22 - කලාප මායිම්, භූ ඛණ්ඩාංක හා සිතියම් අධ්‍යනය කරන්න
(ඇ)	කලාප සංගුණකය	2.0
(ඈ)	අනුමත උස සීමාව	කලාප සංගුණකය හා මාර්ගයේ පළල සාධක වනු ඇත. (උපලේඛනය 01 : වගු අංක 7.3 "ආ" පෝරමය - අනුකූල වියයුතුය)
(ඉ)	අනුමත බිම් කට්ටි ආවරණය	නේවාසික 65% නේවාසික නොවන 50%
(ඊ)	කලාපයට අදාළ පොදු නියමතා	▪ නව ඉඩම් අනුබෙදුම් කිරීමේදී අවම බිම් ප්‍රමාණය පර්.10 විය යුතුය. ▪ මීගමුව කලපුව සඳහා මී.10 ක රක්ෂිතය තැබිය යුතුය. ▪ වෙරළ පිටුපස ප්‍රදේශ සඳහා තැබිය යුතු රක්ෂිතයන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ අංක 2072/58 සහ 2008.05.25 දින දරණ ගැසට් නිවේදන පත්‍රයට හා එහි වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මට අනුගත විය යුතුය. ▪ පවතින නේවාසික ගොඩනැගිලි සංචාරක කටයුතු සඳහා භාවිතය වෙනස් කරන්නේනම් භාවිතය වෙනස් කිරීමේ ගාස්තුවලින් නිදහස් කරනු ඇත. ▪ මුහුදු වෙරල මහජනයාට භාවිතා කල හැකි වන පරිදි විවෘතව තැබිය යුතු අතර තම ඉඩමේ මායිම තෙක් ආවරණය කල හැක. ▪ පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව විසින් හදුනාගෙන ඇති ස්ථානයන්හි සංවර්ධන කටයුතු සදහා එම දෙපාර්තුමේන්තුවේ නිර්දේශය ලබා ගත යුතුය ▪ සනීපාරක්ෂක පහසුකම් ආශ්‍රිත ඉදිකිරීම් සිදු කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරිය හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ නිර්දේශයට යටත් විය යුතුය. ▪ වෙරළ හා කලපුවට යාබද බිම් තීරුවල පුතික ටැංකි ඉදිකිරීමේදී ජල මුද්‍රිත වැසිකිලි මහජන සෞඛ්‍යය නිර්දේශය මත ඉදිකිරීම් සිදුකළ යුතුය. ▪ ගොඩනැගිලි පිරිවිතරව සම්කරණයට අනුකූලව හා එහි අවශ්‍යතාවයට අනුව ගොඩනැගිලි සැලසුම් පිරවිතර ආකෘති පත්‍ර II ට අනුකූල විය යුතුය. ▪ කලාපයේ භාවිතයන් අතර නොගැලපෙන යම් භාවිතයක් හා මෙහි සඳහන් භාවිතයන්ට අමතර භාවිතයන් සලකා බැලීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගැනීම මගින් සිදු කල යුතුය. ▪ කර්මාන්ත සඳහා අවසර ලබාදීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ අංක 1533/16 සහ 2008.01.25 දින දරණ ගැසට් නිවේදනය පරිදි "B හා C" කාණ්ඩයට අයත් කර්මාන්තවලින් අදාළ කලාපයේ අනුමත භාවිතයන් සදහා මෙහිදී අනුමැතිය ලබාදිය යුතුය. ▪ ප්‍රදේශයේ පවතින අනිකුත් සියලුම ඇල මාර්ග සහ ජල මාර්ග සදහා 2006 අංක 35 දරණ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ වගු අංක 1 හි දක්වා ඇති (සංශෝධිත) ඇල රක්ෂිත සඳහා විශේෂ විශේෂ විධි විධාන සහ නිර්දේශයන්ට යටත් විය යුතුය.

වගුව අංක 8.12 අර්ධ ඝනත්වයෙන් යුතු නීල සංචාරක කලාපයෙහි අනුමත භාවිතයන්

භාවිතය	අවම බිම් ප්‍රමාණය (පර්චස්)	වෙනත් කරුණු
නේවාසික		
නිවාස ඒකක	10	
නිවාස සංකීර්ණ	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09ක් විය යුතුය.
නේවාසිකාගාර	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
නිල නිවාස / සේවක නිවාස	10	
වැඩිහිටි/ ආබාධිත නිවාස	40	
ළමා නිවාස	40	
ළමා සුරැකුම් මධ්‍යස්ථාන	20	
සෞඛ්‍ය		
රෝහල්	160	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09ක් විය යුතුය.
ආයුර්වේද රෝහල්	80	
වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන	10	
වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන	20	
ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
සත්ත්ව රෝහල්	20	
සත්ත්ව සායන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන	10	
ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	20	
අධ්‍යාපන		
පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ප්‍රාථමික අධ්‍යාපන මධ්‍යස්ථාන	80	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09ක් විය යුතුය.
ද්විතියික අධ්‍යාපන මධ්‍යස්ථාන	80	
තෘතීයික අධ්‍යාපන මධ්‍යස්ථාන	80	
කාර්මික පාසැල්/වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන	80	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන	10	
පෞද්ගලික උපකාර පන්ති	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
කලායතන/රංගායතන	20	
කාර්යාල		
කාර්යාල	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
කාර්යාල සංකීර්ණ	30	

වෘත්තීය කාර්යාල	10	
බැංකු, රක්ෂණ හා මූල්‍ය ආයතන	10	
ස්වයංක්‍රීය මුදල් ගනුදෙනු මධ්‍යස්ථාන		
සමාජ සේවා හා පොදු පහසුකම්		
සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	10	
ආගමික මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
පුනරුත්ථාපන මධ්‍යස්ථාන	40	
ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
පුස්තකාල	10	
වාණිජ		
වෙළඳසැල්	10	
සුපිරි වෙළඳසැල්	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
සාප්පු සංකීර්ණ	30	
බෝජනාගාර	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
විවෘත වෙළඳසැල්	10	
ඔසුසැල්	10	
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	10	
මස් සහ මාළු අලෙවි සැල්	10	
මත්පැන් අලෙවිසැල්	10	
ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැල්	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
ඉන්ධන පිරවුම්හල් හා වාහන සේවා මධ්‍යස්ථාන(ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	
ඉන්ධන පිරවුම්හල් හා වෙළඳ සංකීර්ණ(ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	
විදුලි ආරෝපණ මධ්‍යස්ථාන	10	
ඉන්ධන පිරවුම්හල් හා ගෑස් පිරවුම්හල්(ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
ගොඩනැගිලි මත සන්නිවේදන කුළුණු	10	
සන්නිවේදන කුළුණු	10	
බහු මහල් රථගාල්	15	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
විවෘත රථගාල්	15	

රථ වාහන ප්‍රදර්ශනාගාර	15	
සංචාරක		
නිවාඩු නිකේතන	10	
ලැගුම්හල්	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
සංචාරක හෝටල්	30	
නාගරික හෝටල්	10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන	20	
කබානා හෝටල්	20	
ආගන්තුක නිවාස	10	
සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	10	
නිෂ්පාදන කර්මාන්ත		
තෙල් පිරිපහදු හා ඛනිජ තෙල් ආශ්‍රිත රසායනික ද්‍රව්‍ය සහ ආසවන කර්මාන්ත	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
බර යන්ත්‍රෝපකරණ සහ එකලස් කිරීමේ කර්මාන්ත	40	
රසායන ද්‍රව්‍ය, පොලිතීන්, ප්ලාස්ටික්, රබර් සහ වීදුරු ආශ්‍රිත කර්මාන්ත	40	
සිමෙන්ති, කොන්ක්‍රීට් සහ පිඟාන් මැටි ආශ්‍රිත නිෂ්පාදන	40	
රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන	20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
විදුලි සහ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත	20	
කඩදාසි නිෂ්පාදන සහ මුද්‍රණ කටයුතු ආශ්‍රිත කර්මාන්ත	20	
දැව /දැව භාණ්ඩ සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත	20	
ආහාර සහ මධ්‍යසාර රහිත පාන කර්මාන්ත	40	
මධ්‍යසාර /දේශීය ඖෂධ ස්ප්‍රීතු සහ සාරයන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත	40	
ගෘහස්ථ කර්මාන්ත	20	
සේවා කර්මාන්ත		
වාහන සේවා මධ්‍යස්ථාන	20	
වාහන අලුත් වැඩියා මධ්‍යස්ථාන / විසිරි පින්තාරු සිදුකරන මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
කුලී රථ සේවා මධ්‍යස්ථාන	10	
ඇඹරුම්හල් / වී මෝල්	10	
ලියවන පට්ටල්, වෑල්ඩින් වැඩපොලවල්	10	

ලොන්ඩරි/ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථාන	10	
ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන	10	
ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරන කර්මාන්ත	40	
පෙදු විවෘත අවකාශ සහ විනෝද කටයුතු පහසුකම්		
ඉතා කුඩා උද්‍යාන (Pocket Park)		
කුඩා උද්‍යාන (Mini Park)		
ප්‍රාදේශීය උද්‍යාන (Local Park)	160	
ප්‍රජා උද්‍යාන		
නගර උද්‍යාන (Town Park)		
රේඛීය උද්‍යාන (Linear Park)		
ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථාන	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
සමාජ ශාලා	15	
කලාගාර / කෞතුකාගාර	20	
එළිමහන් රංග ශාලා	40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
සිනමා ශාලා	40	
ධීවර කර්මාන්තය		
බෝට්ටු ජැටි /පාරු නවාතැන්		
නැංගුරම් තොටුපොළවල්		
ධීවර තොටුපොළවල්		
ලෙල්ලම		

8.7 අර්ධ ඝනත්වයෙන් යුතු නේවාසික කලාපය

අර්ධ ඝනත්වයෙන් යුතු නේවාසික කටයුතු සමග සේවා කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.එමෙන්ම මෙහිදී විශාල ගෙවත්තක් සහිත නේවාසික කලාපයක් වශයෙන් සංවර්ධනය කිරීමට යෝජිතය.

8.7.1 අර්ධ ඝනත්වයෙන් යුතු නේවාසික කලාපයෙහි කලපීකරණ නියමතා සහ අනුමත භාවිතයන්

වගු අංක 8.13 සහ 8.14 මගින් මෙම කලාපයට අදාළ නියමතා සහ අනුමත භාවිතයන් විස්තර කරනු ලබයි.

වගුව අංක 8. 13 අර්ධ ඝනත්වයෙන් යුතු නේවාසික කලාපයෙහි කලාපීකරණ නියමතා

(ආ)	මායිම (භූ බන්ඩාංක)	ඇමුණුම 22 - කලාප මායිම්, භූ ඛණ්ඩාංක හා සිතියම් අධ්‍යනය කරන්න
(ඇ)	කලාප සංගුණකය	1.8
(ඈ)	අනුමත උස සීමාව	-
(ඉ)	අනුමත බිම් කට්ටි ආවරණය	නේවාසික 50 % නේවාසික නොවන 65%
(ඊ)	කලාපයට අදාළ පොදු නියමතා	▪ නව ඉඩම් අනුබෙදුම් කිරීමේදී අවම බිම් ප්‍රමාණය පර්.12 විය යුතු අතර නේවාසික කටයුතු සඳහා බිම් කැබලි ආවරණය 50% කි. ▪ මීගමුව කලපුව සඳහා රක්ෂිතයකලපු මායිමේ සිට මීටර් 10 කි. ▪ කලපුවට මායිම්වන බිම් කොටස් සංවර්ධනය කිරීමේදී වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගත යුතුය. ▪ කලපුවට යාබද බිම් තීරුවල පුතික ටැංකි ඉදිකිරීමේදී ජල මුද්‍රිත වැසිකිලි මහජන සෞඛ්‍යය නිර්දේශය මත ඉදිකිරීම් සිදුකළ යුතුය..

වගුව අංක 8. 14 අර්ධ ඝනත්වයෙන් යුතු නේවාසික කලාපයෙහි අනුමත භාවිතයන්

භාවිතය	අවම බිම් ප්‍රමාණය (පර්චස්)	වෙනත් කරුණු
නේවාසික		
නිවාස ඒකක	පර්චස් 10	
නිවාස සංකීර්ණ	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09ක් විය යුතුය.
නේවාසිකාගාර	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
නිල නිවාස / සේවක නිවාස	පර්චස් 10	
වැඩිහිටි/ ආබාධිත නිවාස	පර්චස් 20	
ළමා නිවාස	පර්චස් 40	
ළමා සුරැකුම් මධ්‍යස්ථාන	පර්චස් 20	
සෞඛ්‍ය		
වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන	පර්චස් 20	
ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන	පර්චස් 20	
සත්ත්ව රෝහල්	පර්චස් 20	
සත්ත්ව සායන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන	පර්චස් 10	
ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	පර්චස් 20	

අධ්‍යාපන		
පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	පර්චස් 20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ප්‍රාථමික අධ්‍යාපන මධ්‍යස්ථාන	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09ක් විය යුතුය.
ද්වීතියික අධ්‍යාපන මධ්‍යස්ථාන	පර්චස් 40	
තෘතීයික අධ්‍යාපන මධ්‍යස්ථාන	පර්චස් 80	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
කාර්මික පාසැල්/වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන	පර්චස් 40	
පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
පෞද්ගලික උපකාර පන්ති	පර්චස් 20	
කාර්යාල		
කාර්යාල	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
වෘත්තීය කාර්යාල	පර්චස් 10	
බැංකු, රක්ෂණ හා මූල්‍ය	පර්චස් 10	
ස්වයංක්‍රීය මුදල් ගනුදෙනු මධ්‍යස්ථාන		
කාර්යාල සංකීර්ණ	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය
සමාජ සේවා හා පොදු පහසුකම්		
සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	පර්චස් 10	
ආගමික මධ්‍යස්ථාන	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
පුස්තකාල	පර්චස් 10	
සුසාන භූමි	පර්චස් 40	
වාණිජ		
වෙළඳසැල්	පර්චස් 10	
සුපිරි වෙළඳසැල්	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
සාප්පු සංකීර්ණ	පර්චස් 30	
බෝජනාගාර	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ඔසුසැල්	පර්චස් 10	
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	පර්චස් 10	
මස් සහ මාළු අලෙවි සැල්	පර්චස් 10	
මත්පැන් අලෙවිසැල්	පර්චස් 10	
අවමංගල්‍ය ශාලා	පර්චස් 10	
ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැල්	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
විදුලි ආරෝපණ මධ්‍යස්ථාන	පර්චස් 10	
ගොඩනැගිලි මත සන්නිවේදන කුළුණු	පර්චස් 10	

ඉන්ධන පිරවුම්හල් හා වෙළඳ සංකීර්ණ(ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	පර්චස් 40	
ඉන්ධන පිරවුම් හල් සහ වෙළඳ සංකීර්ණය (ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	පර්චස් 40	
ඉන්ධන පිරවුම්හල් හා ගෑස් පිරවුම්හල්(ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල සිට මීටර් 500 ඇතුලත අනුමත භාවිතයක් නොවේ.)	පර්චස් 40	
සන්නිවේදන කුළුණු	පර්චස් 10	
බහු මහල් රථගාල්	පර්චස් 30	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06කේ විය යුතුය.
රථ වාහන ප්‍රදර්ශනාගාර	පර්චස් 15	
ගබඩා	පර්චස් 20	
රැස්වීම් ශාලා	පර්චස් 20	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
ගුදම්	පර්චස් 40	
සංචාරක		
නිවාඩු නිකේතන	පර්චස් 10	
ආගන්තුක නිවාස	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ලැගුම්හල්	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
සංචාරක හෝටල්	පර්චස් 40	
නාගරික හෝටල්	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
නිෂ්පාදන කර්මාන්ත		
විදුලි සහ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
කඩදාසි නිෂ්පාදන සහ මුද්‍රණ කටයුතු ආශ්‍රිත කර්මාන්ත	පර්චස් 40	
දැව /දැව භාණ්ඩ සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 09 ක් විය යුතුය.
ආහාර සහ මධ්‍යසාර රහිත පාන කර්මාන්ත	පර්චස් 40	
ගෘහස්ථ කර්මාන්ත	පර්චස් 10	
සේවා කර්මාන්ත		
වාහන සේවා මධ්‍යස්ථාන	පර්චස් 30	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
වාහන අලුත් වැඩියා මධ්‍යස්ථාන / විසිරි පින්තාරු සිදුකරන මධ්‍යස්ථාන	පර්චස් 30	
කුලී රථ සේවා මධ්‍යස්ථාන	පර්චස් 10	.

ඇඹරුම්හල් / වී මෝල්	පර්චස් 10	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය.
ලියවන පට්ටල්, වෑල්ඩින් වැඩපොලවල්	පර්චස් 20	
ලොන්ඩරි/ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථාන	පර්චස් 10	
ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන	පර්චස් 10	
පෙදු එළිමහන් විනෝද කටයුතු පහසුකම්		
ඉතා කුඩා උද්‍යාන (Pocket Park)		
කුඩා උද්‍යාන (Mini Park)		
ප්‍රාදේශීය උද්‍යාන (Local Park)	පර්චස් 160	
ප්‍රජා උද්‍යාන (Community Park)		
නගර උද්‍යාන (Town Park)		
රේඛීය උද්‍යාන (Linear Park)		
ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථාන	පර්චස් 40	ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර් 06 ක් විය යුතුය
සිනමා ශාලා	පර්චස් 40	
ධීවර කර්මාන්තය		
බෝට්ටු ජැටි /පාරු නවාතැන්		
නැංගුරම් තොටුපොළවල්		
ධීවර තොටුපොළවල්		

8.8 අඩු ඝනත්ව පරිසර සංරක්ෂණ කලාපය / තෙත්බිම් ආරක්ෂිත කලාපය

මෙම කලාපය බොහෝ දුරට ඉහළ ජෛව විවිධත්වයක් සහිත ගැඹුරු වගුරු බිම් වලින් සමන්විත වන අතර තෙත්බිම් ආරක්ෂණ කලාපයක් ලෙස මෙන්ම අඩු ඝනත්ව පරිසර සංරක්ෂණ කලාපයක් ලෙස සලකනු ලබන අතර එම පරිසර පද්ධතිය ආරක්ෂා කරන අතරම අධ්‍යාපන, පර්යේෂණ සහ විවේක කටයුතු සඳහා පරිසරය භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

8.8.1 අඩු ඝනත්ව පරිසර සංරක්ෂණ / තෙත්බිම් ආරක්ෂිත කලාපය කලාපීකරණ නියමතා හා අනුමත භාවිතයන්

වගු අංක 8.15 මගින් මෙම කලාපයට අදාළ නියමතා සහ අනුමත භාවිතයන් විස්තර කරනු ලබයි.

වගුව අංක 8.15. අඩු ඝනත්ව පරිසර සංරක්ෂණ / තෙත්බිම් ආරක්ෂිත කලාපයෙහි කලාපීකරණ නියමතා හා අනුමත භාවිතයන්

<table>
<tr><td>(ආ)</td><td>මායිම (භූ ඛණ්ඩාංක)</td><td>බස්නාහිර පළාත් තෙත්බිම් මහ සැලැස්මෙහි සඳහන් මීගමුව මහනගර සභා බල ප්‍රදේශයට අදාළ GPS ඛණ්ඩාංක අධ්‍යනය කරන්න</td></tr>
<tr><td>(ඇ)</td><td>අනුමත භාවිතයන්</td><td>විවෘත අවකාශය සහ විනෝදාත්මක පහසුකම් සහ අධ්‍යාපනික පහසුකම්
• බෝට්ටු ජැටි
• නැංගුරම් වරාය
• මසුන් ඇල්ලීමේ ස්ථාන
• ලී නැරඹුම් තට්ටු
• විවෘත කඳවුරු
• පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන</td></tr>
<tr><td colspan="3">කලාපයට අදාළ පොදු නියමයන්</td></tr>
<tr><td colspan="3">• වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනයට අනුව මෙම කලාපය තුළ අවසර ලත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය - 2002.10.14 දිනැති 1258/03 ගැසට් පත්‍රය වනජීවී අභයභූමි, පාරිසරික සංවේදී ප්‍රදේශ ආදිය.
• මෙම කලාපය තුළ ස්ථිර ඉදිකිරීම් සඳහා අවසර නැත.
• සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම සඳහා දැව අමුද්‍රව්‍ය භාවිතා කළ යුතු අතර මධ්‍යම පරිසර අධිකාරිය සහ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ යුතුය.
• කලපුවට යාබද බිම් තීරුවල පුතික ටැංකි ඉදිකිරීමේදී ජල මුද්‍රිත වැසිකිලි මහජන සෞඛ්‍යය නිර්දේශය මත ඉදිකිරීම් සිදුකළ යුතුය.</td></tr>
</table>

8.9 තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය

බොහෝ ගැඹුරු වගුරු බිම්, සැලකිය යුතු ජෛව විවිධත්ව වටිනාකමක් ඇති ප්‍රදේශ සහ විවේචනාත්මක ගංවතුර රැඳවුම් ප්‍රදේශ "තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය" ලෙස කලාපකරණය කළ යුතුය.

8.9.1 තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය කලාපීකරණ නියමතා

වගු අංක 8.16 මගින් මෙම කලාපයට අදාළ නියමතා සහ අනුමත භාවිතයන් විස්තර කරනු ලබයි.

වගුව අංක 8.16 තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපයෙහි කලාපීකරණ නියමතා හා අනුමත භාවිතයන්

(ආ)	මායිම (භූ ඛන්ඩාංක)	බස්නාහිර පළාත් තෙත්බිම් මහ සැලැස්මේහි සඳහන් මීගමුව මහනගර සහා බල ප්‍රදේශයට අදාළ GPS ඛණ්ඩාංක අධ්‍යනය කරන්න
(ඇ)	අනුමත භාවිතයන්	i. තෙත්බිම් ස්වභාවික උද්‍යාන ii. පරිසර හිතකාමී අවන්හල්- වර්ග අඩි 1200 (කුළුණු මත ඉදිවූ) iii. කුඩා පරිමාණයේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන - (කුළුණු මත ඉදිවූ) වර්ග අඩි 1500, ආසන ධාරිතාවය - 75, වේදිකාව - 30'X 50' iv. එලිමහන් ශරීර සුවතා ප්‍රදේශ / ශාරීරික ව්‍යායාම් පහසුකම් ඇති ස්ථාන v. තෙත්බිම් කෞතුකාගාර - වර්ග අඩි 1000 (කුළුණු මත ඉදිවූ) vi. කබානා (කුළුණු මත ඉදිවූ) vii. වියලි කාලගුණ තත්ත්වයේදී පමණක් ක්‍රීඩා කළ හැකි ස්ථාන viii. සම්ප්‍රදායික ධීවර කර්මාන්තය ix. මල් එකතු කිරීම x. ජලාශ්‍රිත ගමනාගමනය xi. ජාතික වැදගත්කමක් සහිත රජයේ අනුමත පොදු අපරවයුහ ව්‍යාපෘති xii. නව වාරිමාර්ග ඉදිකිරීම /ගංවතුර ආරක්ෂණ ඉදිකිරීම xiii. අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු ❖ මෙම කලාපයේ වෙනත් කිසිදු භාවිතයක් සඳහා අවසර නොමැත ❖ තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපයේ ඉදිකරන සියලු ඉදිකිරීම් කුළුණු මත ඉදිවිය යුතුය.
කලාපයට අදාළ පොදු නියමයන්		
ගංවරතුර රැඳවුම් ධාරිතාව		ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව මගින් අනුමත මුලික සැලැස්මට අනුව පාලනය විය යුතු අතර, එය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ද අනුකූල විය යුතුය.
ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වන අවම බිම් කට්ටි ප්‍රමාණය		හෙක්ටයාර් 4(අක්කර 10) කුඩා බිම් කට්ටි සඳහා ද අනුමත භාවිතයන් සමාන වන නමුත්, ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩ දෙනු නොලැබේ
උපරිම පිරවීම සඳහා අවසර දෙනු ලබන බිම් සීමාවන්		බිම් ප්‍රමාණයෙන් 2 %

	මාර්ග, වාහන නැවතුම් , වැසිකිළි සහ අපද්‍රව්‍ය බැහැර කිරීම් / ප්‍රතිකර්මයන් වැඩ බිම පාලනය සඳහා අවශ්‍ය නම් යොදා ගත හැකිය.
උපරිම බිම් කට්ටි ආවරණය (ගොඩනැගිලි සඳහා යට වන ප්‍රදේශ)	මුළු ව්‍යාපෘති ප්‍රදේශයෙන් 1 % කි. කුළුණු මත සියළුම ගොඩනැගිලි අනුමත වේ . (වැසිකිළි හැර)
අවසර ඇති උපරිම යටිතල පහසුකම් ව්‍යාපෘති (විදුලිය, ජලසැපයුම, දුරකථන, මහා මාර්ග ආදිය)	මුළු ව්‍යාපෘති ප්‍රදේශයෙන් 4% කි.
වෙන වෙනම ගොඩනැගිලි සඳහා අනුමත උපරිම බිම් මහල විශාලත්වය	වර්ග මීටර් 100
අවසර ඇති උපරිම ගොඩනැගිලි උස	පිහිටි පොළව මට්ටමේ සිට මීටර් 7 කි. (ප්‍රධාන සංකල්පයට ගැලපෙන පරිදි කුළුණු / නිරීක්ෂණ මධ්‍යස්ථාන, සැඟවී සිට සතුන් නිරීක්ෂණය කල හැකි මධ්‍යස්ථාන හැර)
ගොඩනැගිලි වර්ගය	සියළු ගොඩනැගිලි (වැසිකිලි හැර) තෙත්බිමෙහි කුළුණු මත ඉදිවිය යුතුය.(නොපිරවූ ප්‍රදේශ) ගොඩනැගිලි තනි තනිව පිහිටි හෝ දර්ශනීය සිත් ඇදගන්නා වූ වහල වලින් සමන්විත පොකුරු ලෙස තැබිය යුතුය. එහි දර්ශනීයත්වය විවෘත ප්‍රදේශයන්ට යාබද පොදු මාර්ග වලින් හා පොදු ප්‍රදේශ වලින් ආවරණය නොවන පරිසර හිතකාමී ලෙස පැවැතිය යුතුය
අනු බෙදුම්	අනුමැතිය නොමැත
සීමා මායිම් ලකුණු කිරීම	මායිම් තාප්ප සඳහා අවසර නැත. පවතින උස් බිමකට යාවූ මායිමක් දිගේ පමණක් වැසි වතුර ගලා යාමට බාධා නොවන ලෙස, භූ දර්ශනයට ගැලපෙන, මායිම් වැටකට අනුමැතිය ලබා දිය හැක. අනෙකුත් මායිම් වල සීමාව සලකුණු කිරීම, භූ දර්ශනයට ගැලපෙන සලකුණු (මීටර් 10 ක අවම පරතරය සිටින සේ) යොදා සිදු කළ යුතුය. ඉහත අවස්ථා දෙකෙහිම එම වැඩ බිම විශේෂිත වන පදනමින් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියට යටත්ව සිදු කල යුතුය
විශේෂ අවස්ථාවන්හිදී ඉහත කොන්දේසි ලිහිල් කිරීම	වැදගත් පොදු අපර ව්‍යුහ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ දුර්ලභ අවස්ථාවකදී, ඉහත කොන්දේසි ලිහිල් කළ හැක.

අඩු ඝනත්ව පරිසර සංරක්ෂණ කලාපය (තෙත්බිම් ආරක්ෂිත කලාපය) හා තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපයන්හි අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම සඳහා යටත් කරනු ලබන කොන්දේසි

(අ). වැදගත් පොදු අපර ව්‍යුහ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ දුර්ලභ අවස්ථාවකදී, ඉහත කොන්දේසි ලිහිල් කළ හැක.(අවසර ඇති උපරිම යටිතලපහසුකම් ව්‍යාපෘති -විදුලිය, ජලසැපයුම, දුරකථන, මහා මාර්ග,දුම්රිය මාර්ග ආදිය)

(ආ). තෙත්බිමක් ආශ්‍රිතව හෝ තෙත්බිමක් තුල උස්බිම් ප්‍රදේශ (Highland areas) පවතින අවස්ථාවේදී යෝජිත සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීමට පෙර සීමා මායිම් නිර්ණය කර ගැනීම සඳහා මිනුම්දෝරු සැලැස්ම (Survey Plan) සලකා බැලිය යුතුය.

(ඇ). තෙත්බිම් කලපීකරණයට අනුව යම් තෙත්බිම් කලාපයක මායිමේ සිට පිටතට මීටර් 20 ක දුර ප්‍රමාණයක පවතින තෙත්බිම් ප්‍රදේශ ආසන්න තෙත් බිම් කලාපයට අයත් වන අතර එම කලාපයේ අදාළ නීති නියමතා සහ අනුමත භාවිතයන්ට යටත්ව ක්‍රියාකල යුතුය. (භූ ගෝලීය පිහිටුම් පද්ධතියට අනුව ස්ථානීය පිහිටීම නිවැරදිව නිර්ණය කරගැනීමේදී පවතින දෝෂ සහගත තත්ත්වය මගහරවා ගැනීම සඳහා)

සැ.යු.

(අ). අවශ්‍ය අවස්ථාවන්හිදී පරිසර පනත යටතේ පවතින “ නියමිත ව්‍යාපෘති “ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී ආයතනයන්ගේ අතිරේක වැඩ බිම් විශේෂිත තත්වයන් ආරෝපනය කල හැක.

කිසියම් තෙත්බිමක් සංවර්ධනය වීමේදී ඉහත කොන්දේසින් උල්ලංඝනය වීමක් සිදු වුවහොත් මධ්‍යම පරිසර අධිකාරිය, ගොවිජනසේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව සහ නාගරික සංවර්ධන අධිකාරිය ආයතන සතු බලතල යටතේ නීතිමය පියවර ගනු ලැබේ.

09 වන පරිච්ඡේදය

යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත

09 වන පරිච්ඡේදය

යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත

I.යෝජිත මාර්ගය යනු මාර්ගය පළල් කරන උපරිම සීමාව වේ. යෝජිත මාර්ගයක් වශයෙන් සලකන ප්‍රවේශ මාර්ගයක භෞතික අවම පළල මීටර් 7 ක් විය යුතුය.

II. ගොඩනැගිලි සීමාව යනු යෝජිත මාර්ගයේ ඉමට පිටුපසින් පනවනු ලබන සීමාවක් වන අතර, යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීමට ඇති උපරිම සීමාව වේ. මාර්ගයේ ඇතිවන කම්පන තත්වයන් වැළැක්වීමටත්, නගර අලංකරණ කටයුතු සහ පරිසර දූෂණය, ශබ්ද දූෂණය වැලැක්වීමට, භූදර්ශන කටයුතු සඳහා සහ රිය අනතුරු වැළැක්වීමේ ආරක්ෂිත ක්‍රමයක් ලෙසද, මාර්ගය දුර සිට නිරීක්ෂණය කිරීමේ අවස්ථාවද මේ තුලින් උදාවේ. ගොඩනැගිල්ලේ පදිංචි අයගේ සෞඛ්‍ය ආරක්ෂාවටද හේතුවේ.

මාර්ග සංවර්ධන අධිකාරිය සහ අනෙකුත් ආයතන මගින් සිදු කරන මාර්ග පුළුල් කිරීම් සීමාවන් සහ යෝජනාවන් සැලකිල්ලට ගෙන, මෙම අධිකාරිය මගින් යෝජිත මාර්ගයෙහි පළල ගොඩනැගිලි සීමාවන් පනවා ඇති අතර, එහි සීමාවන්ට අනුකූල විය යුතුය . එම සීමාවන් වගු අංක 9.1 , 9.2 ,9.3 සහ 9.4 හි දක්වා ඇති අතර පහත රූපසටහන් මගින් තව දුරටත් පැහැදිලි කරනු ලබයි.

9.1 මීගමුව සැලසුම් ප්‍රදේශය සඳහා යෝජිත මාර්ග පළල සහ ගොඩනැගිලි සීමාවන්

වගු අංක 9.1. මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පළමු ප්‍රමුඛතා මාර්ග සඳහා යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන්

මාර්ගයේ නම	යෝජිත මාර්ගයේ පළල (මීටර්)	යෝජිත ගොඩනැගිලි සීමාව (මීටර්)
පළමු ප්‍රමුඛතා මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය අයත්)		
A 03 පෑලියගොඩ - පුත්තලම මාර්ගය	30	15

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය - 2021

රූප සටහන 9.1. මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ පළමු ප්‍රමුඛතා මාර්ග සඳහා යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන්



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය - 2021

වගු අංක 9.2. මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ දෙවෙන ප්‍රමුඛතා මාර්ග සඳහා යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන්

මාර්ගයේ නම	**යෝජිත මාර්ගයේ පළල (මීටර්)**	**යෝජිත ගොඩනැගිලි සීමාව (මීටර්)**
දෙවන ප්‍රමුඛතා මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරියට අයත්)		
B 27 දුම්රිය ස්ථානය ප්‍රවේශ මාර්ගය	30	15
B 228 කොච්චිකඩේ හල්පේ මාර්ගය		
B 321 මීගමුව - අලුතේපොළ මාර්ගය		
B 322 මීගමුව - ගිරිඋල්ල මාර්ගය		
B 425 තුඩැල්ල - පමුණුගම - තලාහේන - මීගමුව මාර්ගය		
B 468 වැලිහේන - කටාන මාර්ගය		

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය - 2021

රූ ප සටහන 9.2. මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ දෙවෙන ප්‍රමුඛතා මාර්ග සඳහා යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන්



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය - 2021

වගු අංක 9.3 මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ තෙවෙන ප්‍රමුඛතා මාර්ග සඳහා යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන්

මාර්ගයේ නම	**යෝජිත මාර්ගයේ පළල (මීටර්)**	**යෝජිත ගොඩනැගිලි සීමාව (මීටර්)**
තුන්වන ප්‍රමුඛතා මාර්ග (පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත්)		
C 19 කොච්චිකඩේ පල්ලසෙන මාර්ගය	15	7.5
C 22 පළඟතුරේ මාර්ගය		
D 03 අවේ මරියා මාර්ගය		
D 11 දූව පල්ලිය මාර්ගය		
D 19 දළුපොත කොච්චිකඩේ වැලිහේන		
D 24 ලෙවිස් මාර්ගය - මීගමුව		
D 27 මෛත්‍රීපාල සිරිසේන මාවත		
D 35 පිටිපන ධීවර මාර්ගය		
D 38 මුහුදු මාර්ගය		

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය - 2021

